**ශ්‍රීලංකන් එයාර්ලයින්ස්**

වාර්ෂික වාර්තාව 2020/21





# පටුන


**දළ විශ්ලේෂණය**

අපගේ දැක්ම සහ මෙහෙවර 2
මූල්‍ය විශේෂ තොරතුරු 4

**කළමනාකරණ වාර්තා**

සභාපතිවරයාගේ පණිවුඩය 5
ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය 7
අධ්‍යක්ෂ මණ්ඩලය 11
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 14
ව්‍යාපාර අවදානම් කළමනාකරණය 18
ආයතනික පාලන වාර්තාව 19
කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය 21

**මූල්‍ය ප්‍රකාශ**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 42
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 2020/21 46
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 47
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 48
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 52
ලාභ අලාභ ප්‍රකාශය 53
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 54
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 55
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 56
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 57

**ඇමුණුම්**

පාරිභාෂික ශබ්ද මාලාව 108
දස අවුරුදු සමාලෝචනය 110
ගුවන් මාර්ග සිතියම 112
විශේෂ කඩඉම් 114
සාංගමික තොරතුරු 116

වාර්ෂික මහා සභා රැස්වීම් නිවේදනය 117
පෙරකලාසි පත්‍රය 119


**සටහන:**

**මෙම සිංහල වාර්තාව ඉංග්‍රීසි වාර්තාවේ පරිවර්තනයක් වන අතර, පරිවර්තන ගැටළු පවතින සෑමවිටම ඉංග්‍රීසි වාර්තාව පරිශීලනය කරන්න.**

## අපගේ දැක්ම

ආසියාවේ වඩාත්ම
පාරිභෝගික කේන්ද්‍රීයගත
ගුවන් සේවය බවට පත්වීම.

## අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ක්‍රමයට උණුසුම්
ආගන්තුක සත්කාරයෙන්
සපිරි විශ්වාසනීය වූත්
ප්‍රසන්න වූත් ගුවන්
ගමන් අත්දැකීමක් තුළින්
අපගේ පාරිභෝගිකයන්
සංතෘප්තියට පත් කිරීම.

අපි මූල්‍යමය වශයෙන්
ස්ථාවර වූ දක්ෂ, දූරදර්ශී
සහ කැපවීමෙන් ක්‍රියාකරන
සමාගමක් වශයෙන්
අපගේ පාර්ශවකරුවන්ගේ
අපේක්ෂාවන් සපුරාලීම
පිණිස කැපවී සිටින්නෙමු.




ENG 1
ENG 2
FIRE
FIRE
HYD
HYD
FUEL
FUEL
ELEC
ELEC
AIR
AIR
APU
MAINTENANCE MENU 1/2
<FLIGHT REPORT----PRINT*
<AVIONICS STATUS--PRINT*
<SYSTEM REPORT/TEST
<SERVICING REPORT

# මූල්‍ය විශේෂ තොරතුරු

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2021 | 2020 | 2021 | 2020 |
| **මූල්‍යමය** | | | | | |
| ආදායම | රු. මිලියන | 50,928.92 | 183,531.82 | 50,693.85 | 180,151.02 |
| මෙහෙයුම් වියදම | රු. මිලියන | 82,450.50 | 188,699.06 | 81,405.99 | 190,321.69 |
| බදු වලට පෙර අලාභය | රු. මිලියන | (49,761.57) | (44,104.72) | (45,231.46) | (47,197.86) |
| වසර සඳහා ශුද්ධ අලාභය | රු. මිලියන | (49,704.51) | (44,139.40) | (45,231.46) | (47,197.86) |
| මුළු වත්කම් | රු. මිලියන | 157,882.79 | 186,428.56 | 154,381.41 | 181,189.60 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | රු. මිලියන | (281,490.87) | (261,173.54) | (289,265.27) | (273,369.08) |
| **ගමනාගමනය** | | | | | |
| මඟී ධාරිතාව | ASK මිලියන | | | 3,816.40 | 18,041.41 |
| සමස්ත ධාරිතාව | ATK මිලියන | | | 794.52 | 2,454.30 |
| ප්‍රවාහනය කරන ලද මඟීන් | RPK මිලියන | | | 748.13 | 14,547.97 |
| සමස්ත පැටවුම | RTK මිලියන | | | 312.26 | 1,664.49 |
| මඟී පැටවුම් සාධකය | % | | | 19.60 | 80.64 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 39.30 | 67.82 |
| සමතුළිත පැටවුම් සාධකය | % | | | 71.65 | 74.95 |
| **කාර්ය මණ්ඩල ඵලදායීතාවයන්** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,981 | 7,709 | 5,965 | 6,693 |
| එක් සේවකයෙකුගේ ආදායම | රු. මිලියන | 7.30 | 23.81 | 8.50 | 26.92 |
| **ගුවන් යානා** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | | | 5 | 5 |
| A321-200 | සංඛ්‍යාව | | | 1 | 2 |
| A320 NEO | සංඛ්‍යාව | | | 2 | 2 |
| A321 NEO | සංඛ්‍යාව | | | 4 | 4 |
| A330-200 | සංඛ්‍යාව | | | 5 | 5 |
| A330-300 | සංඛ්‍යාව | | | 7 | 7 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | | | 24 | 25 |

# සභාපතිවරයාගේ පණිවුඩය

"වසංගත තත්වයෙහි සැලකිය යුතු අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පවුලේ සාමාජිකයින් විසින් සමාගම සහ ජාතිය වෙනුවෙන්, ආරක්ෂිත සහ විශ්වාසදායක අත්‍යවශ්‍ය ගුවන් ගමන් සේවා ලබා දීම මගින් විශිෂ්ට යුතුකමක් ඉටු කර ඇත. "

ගුවන් සේවා කර්මාන්තය කෝවිඩ් 19 වසංගත තත්වයට එරෙහිව සටන් කළ හෙයින්, 2020/21 මූල්‍ය වර්ෂය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉතිහාසයේ වඩාත් අභියෝගාත්මක වසරක් විය.

විශේෂයෙන්ම සමාලෝචිත වර්ෂයේ මුල් භාගයේදී බොහෝ වෙළෙඳපොළවල ජාත්‍යන්තර සංචාර මාස කිහිපයකට සීමා වූ හෙයින්, සංචාරක සේවය සඳහා ඇති ඉල්ලුමට වසංගත තත්වය දැඩි බලපෑමක් ඇති කරන ලදී. අනපේක්ෂිත ලෙස දේශසීමා වසා දැමීම් සහ සංචරණ සීමා හේතුවෙන් වසර තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගී ධාරිතාව 79% කින් පහළ බසින ලදී. කෙසේ වෙතත්, එම අභියෝගයට මුහුණ දෙමින් සහ ශ්‍රී ලංකාවේ අපනයන අවශ්‍යතා ඉටු කරමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය මගී ගුවන් යානාවල ධාරිතාව උපයෝගී කරගනිමින්, විශේෂිත භාණ්ඩ ප්‍රවාහන ජාලයක් කඩිනමින් දියත් කරන ලදී. එම පියවර මගින් වසර තුළ ගුවන් සමාගමේ භාණ්ඩ ආදායම 74% කින්, රුපියල් බිලියන 27.3 දක්වා වර්ධනය කිරීමට සමත් වන ලදී. භාණ්ඩ ඉල්ලුම සපුරාලීම සඳහා නව මාර්ග කිහිපයක් දියත් කළ අතර, වර්තමානයේ එම මාර්ග මගී ගමනාගමනයට සේවය කිරීම සඳහා පරිවර්තනය වෙමින් පවතී.

මගී ව්‍යාපාරයේ සැලකිය යුතු අලාභය පියවා ගැනීමට භාණ්ඩ ප්‍රවාහන ආදායමේ වර්ධනය පමණක් ප්‍රමාණවත් නොවූ අතර, 2019/20 පූර්ව COVID වර්ෂයට සාපේක්ෂව සමූහයේ ආදායම 72% කින් අඩු විය. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සපයනු ලබන ඇතැම් වෙළෙඳපළවල සංචාරක සීමා ලිහිල් කිරීම හේතුවෙන් 2021 අග සිට ආරම්භ වන ගුවන් ගමන්වල සැලකිය යුතු යහපත් තත්වයක් ඇති වුවද, ගුවන් සේවා කර්මාන්තයට සිදු වූ ආදායම් අලාභය තවමත් දැකගත හැකිය.

සමූහයේ පිරිවැයට පෙර ඉපැයුම්, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය (EBITDA) අගය පසුගිය වසරේ ධනාත්මක අගයක් වූ රුපියල් බිලියන 14.2 සමග සසඳන කළ රුපියල් බිලියන 14.8 ක ඍණ අගයක් දක්වමින් අපගේ පරිපාලිතය, ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් ඇතුළුව අපගේ ගුවන් සේවා සමග සෘජුවම සම්බන්ධ වී ඇති සියලුම ව්‍යාපාරික ඒකක සඳහා අහිතකර වෙළෙඳපළ තත්වය බලපාන ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් රැඳවුම් බද්දෙන් නිදහස් කර ඇති බැවින්, පෙර වසරෙහි රුපියල් බිලියන 16.4 ක් ලෙස වූ රැඳවුම් බද්දෙහි ආපසු ලැබීම් ඇතුළත් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ ශුද්ධ අලාභය රුපියල් බිලියන 49.7 ක් වන ලදී.

වසංගතයේ අභියෝග ජය ගැනීම සහ තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉහළ දායකත්වය සහිතව අනපේක්ෂිත අවස්ථා සඳහා සැලසුම් සකස් කරන ලදී. මෙම සැලසුම් මත පදනම්ව, වසංගතය තත්වය නිසාවෙන් වන අභියෝගවලින් මිදීම සඳහා වසර තුළ එහි පිරිවැය පදනම වැඩිදියුණු කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මහත් ප්‍රයත්නයක් ගත් අතර, එහි සියලුම කොන්ත්‍රාත්තු සහ ක්‍රියාවලි පිළිබඳ ප්‍රධාන සමාලෝචනයක් සිදු කරන ලදී. සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත්තු සහ ගුවන් යානා බදු ගිවිසුම් ඇතුළුව සියලු පිරිවැය නැවත සාකච්ඡා කිරීමට පියවර ගන්නා ලදී. මුදල් ප්‍රවාහයට උපකාර කිරීම සඳහා ගෙවීම් විලම්බනය කිරීමට අමතරව, සමාගම විසින් සිදු කරන ලද කල්බදු ප්‍රතිව්‍යුහගත කිරීම මගින් ගුවන් යානා හිමිකාරිත්වයේ පිරිවැය සැලකිය යුතු ස්ථිර අඩුවීමක් පෙන්නුම් කරන ලදී. උපායමාර්ගික මූලපිරීම්හි ඇති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් මගින් පවතින ඒකක පිරිවැය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු ප්‍රතිලාභ ලබා දී ඇත. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගුවන් සේවය යථා තත්වයට පත් කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ, දුෂ්කර නමුදු කාලෝචිත තීරණ රැසක් මෙම ප්‍රයත්නයන්ට ඇතුළත් විය. 2021 වසර අවසානයේ සිට මාස කිහිපයක් සඳහා සමාගම සහ සමූහය යන දෙපිරිසම ලාභදායීත්වය කරා ළඟා වීමත් සමග මෙම මූලපිරීම්හි ප්‍රතිඵල මේ වන විට දැක ගත හැකි වීම පිළිබඳ මම සතුටු වෙමි. කඩිනමින් මූල්‍ය ස්ථාවරත්වය කරා ළඟා වීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආරම්භ කර ඇති ක්‍රියාමාර්ග රැකුලක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

වසංගත තත්වයෙහි සැලකිය යුතු අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පවුලේ සාමාජිකයින් විසින් සමාගම සහ ජාතිය වෙනුවෙන්, ආරක්ෂිත සහ විශ්වාසදායක අත්‍යවශ්‍ය ගුවන් ගමන් සේවා ලබා දීම මගින් විශිෂ්ට යුතුකමක් ඉටු කර ඇත. වසර තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් ආපසු ගෙන්වා ගැනීම සඳහා ගුවන් ගමන් 259 ක් ක්‍රියාත්මක කළ අතර, අවශ්‍ය කෝවිඩ් 19 එන්නත් තොග සහ අනෙකුත් අත්‍යවශ්‍ය වෛද්‍ය ද්‍රව්‍ය ආරක්ෂිතව ආනයනය සඳහා ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

# සභාපතිවරයාගේ පණිවුඩය

ඓතිහාසික වශයෙන්, අර්බුදකාරී කාලවලදී, ජාතික ගුවන් සේවයෙන් බලාපොරොත්තු වනු ලබන අත්‍යවශ්‍ය සේවා සෑම විටම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සපයා ඇත. වසංගත කාලසීමාව තුළ සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අභියෝග නිසාවෙන් ඇති වූ සියලු විපත් ජය ගැනීම මේ සඳහා තවත් නිදසුනකි. අපගේ වටිනා සේවකයින් විසින් මෙතෙක් ඔවුන්ගේ වෘත්තීය ජීවිතයේ මුහුණ දුන් දුෂ්කරම කාලය මධ්‍යයේ වුවද, දක්වන ලද දරා ගැනීමේ හැකියාව පෙන්නුම් කිරීමට මෙය මම අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි.

වසංගත තත්වය, වාණිජ ගුවන් සේවා කර්මාන්තය විසින් එහි දිගු ඉතිහාසය තුළ මුහුණ දුන් විශාලතම අභියෝගය බවට පත්වී තිබේ. මෙම අර්බුදයෙන් පසුව, ගෝලීය එන්නත් ලබා දීම සහ සංචාරක සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම මගින් ඉල්ලුම යථා තත්වයට පත්වනු ඇතැයි විශ්වාස කෙරේ. ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරන අතර, එම අංශයේ මෙන්ම ජාතික ආර්ථිකයේ පුනර්ජීවනයට සහය වීමට පූර්ණ වශයෙන් කැපවී සිටී.

ආයතනය විසින් එහි ඉතිහාසය තුළ මුහුණ දෙන ලද මහත් අභියෝගාත්මක වසරක් ලෙස සැලකිය හැකි කාලයක දක්වන ලද කැපවීම සහ සහයෝගය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙසු සාමාජිකයින්ට සහ හිටපු ප්‍රධාන විධායක නිලධාරීතුමා, විපුල ගුණතිලක මහතාට ස්තූතිය පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ගුවන් සේවා ක්ෂේත්‍රයේ අත්දැකීම් සම්භාරයක් ඇති වැඩබලන ප්‍රධාන විධායක නිලධාරීතුමා වන රිචඩ් නට්ල් මහතා පිළිගැනීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ඉතා අභියෝගාත්මක තත්වයන් මධ්‍යයේ වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කෙරෙහි දක්වන අඛණ්ඩ සහයෝගය සහ විශ්වාසය වෙනුවෙන් මම ශ්‍රී ලංකා රජයට ස්තූතිවන්ත වෙමි. සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ, හිමිකම් අරමුදලින් රුපියල් බිලියන 27.7 ක් සහ වත්මන් මූල්‍ය වර්ෂයේ දී තවත් රුපියල් බිලියන 18 ක් වූ හිමිකම් අරමුදල් මගින් ලැබුණු සහයෝගය, මෙම දුෂ්කර කාල පරිච්ඡේදය තුළ මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගෙන යාමට සමාගමට උපකාරී වූවා පමණක් නොව, වඩාත් මූලික වශයෙන් එය අනෙකුත් සියලුම පාර්ශවකරුවන්, සමාගම සමග අඛණ්ඩව ව්‍යාපාර පවත්වා ගෙන යාමට අවශ්‍ය විශ්වාසය ලබා දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමා, ගරු සංචාරක අමාත්‍යතුමා, ගරු ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ දෙකෙහි ලේකම්වරුන් සහ අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය සඳහා මාගේ අවංක ප්‍රශංසාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ ගුවන් සේවය කෙරෙහි සැමවිටම විශ්වාසය තබන ලද සහ එයට ලැදියාවක් දක්වන ලද අපගේ වටිනා ගණුදෙනු කරුවන්ට ද මාගේ ප්‍රශංසාව පලකිරීමට කැමැත්තෙමි. අවසාන වශයෙන්, මෙම අභියෝගාත්මක කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වටිනා මගපෙන්වීමද කළමනාකරණ මණ්ඩල සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සහ එහි පරිපාලිතයේ සියළුම සේවාදායකයින්ගේ නිරන්තර සහය දැක්වීම හා කැපවීම ද, වෘත්තීය සමිති වල වගකීම් සහගත හැසිරීම ද වෙනුවෙන් මම මාගේ අවංක ප්‍රශංසාව පල කරමි.

**අසෝක පතිරගේ**
*සභාපති*

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

"කෝවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසර, ගුවන් සමාගම විසින් එහි වසර 41 ක කාලය තුළදී මුහුණපාන ලද වඩාත් අභියෝගාත්මක වසර විය. පසුගිය වසර එකහමාරක කාලය තුළ අපගේ මූලික පරමාර්ථය වූයේ වසංගත තත්වය සමග අපගේ ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීමයි."

**ගුවන් ගමන් කර්මාන්තය පිළිබඳ විමසුම**

දෙවන ලෝක යුද්ධයෙන් පසු ගෝලීය ගුවන් සේවා ඉතිහාසයේ විශාලතම බිඳවැටීමක් වාර්තා කරමින්, 2020 වසරේ කෝවිඩ්-19 වසංගතයේ අනපේක්ෂිත බලපෑම්වලට ගුවන් සේවාවන් මුහුණ දෙන ලදී.

සමස්ත ආදායම් මගී කිලෝමීටර (RPKs) 66%කින් පසුබෑමකට ලක් වූ අතර ගුවන් ගමන් කර්මාන්තයේ වැඩි ප්‍රමාණයක් මගී ප්‍රවාහන සේවා නොකෙරුණි. ජාත්‍යන්තර සංචාරකයින්ගෙන් කෝවිඩ්-19 වසංගත තත්වය පැතිරී යාම වැළැක්වීමට රටවල් අතර සම්බාධක පැනවූ හෙයින් ජාත්‍යන්තර ගුවන් ගමන් වසර පුරා අඩු මට්ටමක පැවතුණි. මෙය පෙර වසර සමග සසඳන කල, 2020 අප්‍රේල් මාසයේ ගෝලීය අර්බුදයේ ඉහළම තත්වයේදී ජාත්‍යන්තර ආදායම් මගී කිලෝමීටර (RPKs) 98% කින් පසුබෑමක් ඇති කරන ලදී. වසංගත තත්වය පැතිරීම වැඩි වීමත් එන්නත් ලබා දීම ප්‍රමාදයත් හේතුවෙන් ජාත්‍යන්තර ගුවන් සේවාවන් අවම තත්වයක පැවති අතර, එබැවින් 2020 වසරේ සාමාන්‍ය ජාත්‍යන්තර ආදායම් මගී කිලෝමීටර (RPKs) 2019 වසර හා සසඳන කල 24% ක් වන ලදී. කෙසේවෙතත් චීනය සහ එක්සත් ජනපදය වැනි විශාල දේශීය වෙළඳපොලවල් ඉක්මනින් යථා තත්වයට පත් වීමක් පෙන්නුම් කරමින්, වසර පුරා යහපත් තත්වයක් පවත්වා ගෙන යනු ලැබූ අතර, 2021 දෙවන භාගයේදී දේශීය ආදායම් මගී කිලෝමීටර (RPKs) 2019 වසරේ පූර්ව අර්බුද තත්වය සමග සංසන්දනාත්මකව බලන කල 96% ක මට්ටමක දියුණුවක් අපේක්ෂිතය.

මගී ප්‍රවාහනය හා සසඳන විට, ගෝලීය සැපයුම් ජාලයේ ගමනාගමන ප්‍රවාහයන්වල අවශ්‍යතා සහ අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ සහ ඖෂධ ප්‍රවාහනය නිසාවෙන්, ගුවන් භාණ්ඩ කර්මාන්ත සඳහා කෝවිඩ්-19 බලපෑම සැලකිය යුතු ලෙස අඩු විය. ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටර් (CTKs) 2020 අප්‍රේල් වන විට 66% කින් අඩු වූ අතර වසර අවසානයේදී සම්පූර්ණ ප්‍රතිසාධන මට්ටමට ළඟා වීමට සමත් විය.

2021 වසරෙත් ගුවන් සේවා සඳහා කෝවිඩ්-19 බලපෑම තවදුරටත් පැවති හෙයින්, 2019 පූර්ව  අර්බුද තත්වය සමග සංසන්දනාත්මකව බලන කල ගෝලීය ආදායම් මගී කිලෝමීටර (RPKs) 43% ක් පමණක් ළඟා වනු ඇතැයි IATA පුරෝකථනය කරයි. ඉහළ ප්‍රතිලාභ මට්ටම් සහිතව ගුවන් සේවා සඳහා භාණ්ඩ ප්‍රවාහනය ශක්තියක් වනු ඇතැයි බලාපොරොත්තු වන අතර, පූර්ව අර්බුද තත්වයේ පැවති 10%-15% ක භාණ්ඩ ප්‍රවාහනයේ පැවති දායකත්වයට සාපේක්ෂව ගුවන් ගමන් කර්මාන්තයේ ආදායමෙන් තුනෙන් එකක් උත්පාදනය කිරීමටද බලාපොරොත්තු වේ. ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්වයට පත් වීම හේතුවෙන් ඉන්ධන මිල ඉහළ යාමේ ප්‍රවණතාවය අනුව, පිරිවැය කළමනාකරණය ගෝලීය ගුවන් සේවා සඳහා තවදුරටත් අභියෝගයක් වන අතර, 2021 වසරේ ඇති විය හැකි හානිය වළක්වා ගැනීමට මූල්‍ය පිරිවැය අවම කිරීමට අමතර ක්‍රියාමාර්ග අවශ්‍ය වනු ඇත.

**ගුවන් සමාගමේ කාර්යසාධනය**

කෝවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසර, ගුවන් සමාගම විසින් එහි වසර 41 ක කාලය තුළදී මුහුණපාන ලද වඩාත් අභියෝගාත්මක වසර විය. පසුගිය වසර එකහමාරක කාලය තුළ අපගේ මූලික පරමාර්ථය වූයේ වසංගත තත්වය සමග අපගේ ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීමයි. සංචාරණ සීමා සහ ගුවන් තොටුපල වසා දැමීම හමුවේ වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම ජාතික ගුවන් ප්‍රවාහනකරු ලෙස ගෝලීය ව්‍යාපාර නොකඩවා පවත්වා ගනිමින්, ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වීමට ගුවන් යානා ප්‍රමාණය වැඩි කරමින්, නියමිත භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාත්මක කරමින් අප පරමාර්ථ පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී.

වසර සඳහා මූල්‍ය ප්‍රතිඵල පසුගිය වසරේ රුපියල් බිලියන 14.2 ක ධනාත්මක EBITDA අගයට ප්‍රතිවිරුද්ධව, රුපියල් බිලියන 14.8 ක EBITDA (පොලී, බදු, ක්ෂයවීම් සහ ක්‍රමක්ෂයවීම් පිරිවැයට පෙර ඉපැයීම්) සෘණාත්මක අගයක් වාර්තා කර ඇත. මූල්‍ය පිරිවැය සහ රඳවා ගැනීමේ බද්දෙන් පසු, වසර අවසානයේදී සමූහයේ අලාභය, පෙර වසරේ රුපියල් බිලියන 44.1 ට සාපේක්ෂව රුපියල් බිලියන 49.7 ක් විය. සමූහය විසින් මූල්‍ය පිරිවැය ලෙස රුපියල් බිලියන 35.9 ක් වැය කරන ලද අතර, අවසාන භාගයේ අහිතකර විනිමය සංචලනය හේතුවෙන් රුපියල් බිලියන 19.7 ක විනිමය අලාභයක් සිදු විය. වසර සඳහා 40% ක ශුද්ධ අලාභයක් ඇති කරමින් සමූහයේ ආදායමට අහිතකර ලෙස බලපෑ ණය සහ කල්බදු ඇතුළු විදේශ මුදල් වගකීම් පරිවර්තනය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

සමස්ත මගී මැදිරි සාධකය 61% කින් අඩු කරමින් ගුවන් ගමන් සඳහා පනවා ඇති කෝවිඩ්-19 ආශ්‍රිත සීමා කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ, ගුවන් සමාගමේ වෙළඳපළ ධාරිතාව පසුගිය වසරට වඩා 79% කින් සංකෝචනය විය. ආදායම් පහත වැටීම ප්‍රධාන වශයෙන් කෝවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් ඇති වුවකි.

සමූහයේ මුළු වියදම් රුපියල් බිලියන 118.3 ක් වූ අතර, ප්‍රධාන වශයෙන් මෙහෙයුම් අවම වීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

48% ක සැලකිය යුතු පිරිවැය අඩුවීමක් පිළිබිඹු කරනු ලබයි. සමූහය රුපියල් බිලියන 50.9 ක ආදායමක් වාර්තා කර ඇති අතර, එය පසුගිය වසරට වඩා 72% ක අඩුවීමකි. මෙහෙයුම් වියදම් 56% කින් අඩු කරන ලද බොහෝ කළමනාකරණ මුලපිරීම් මගින් ආදායම පහත වැටීම පියවා ගන්නා ලදී. ගුවන් සමාගමේ ඉන්ධන පිරිවැය රුපියල් බිලියන 44.8 කින් අඩු කරන ලද අතර, ඉන් 11% ක් ඉන්ධන මිල අඩු කිරීම (විනිමය අනුපාත බලපෑම ඇතුළුව) සහ 89% ක් මෙහෙයුම් අඩුවීම හේතුවෙන් සිදු විය. පිරිවැය ඉතුරුම් මුලපිරීම් සහ කෝවිඩ්-19 හේතුවෙන් ඉංජිනේරු, මඟී සේවා සහ ස්ථානීය ගමනාගමනය හේතුවෙන් අඩු මට්ටමේ මෙහෙයුම් හරහා තවදුරටත් ඉතුරුම් සාක්ෂාත් කර ගන්නා ලදී. රුපියල් බිලියන 9.1 ක අඩුවීමක් දක්නට ලැබුණු ඉංජිනේරු කටයුතු ආශ්‍රිත වියදම්වලින් මෙහෙයුම්වල අඩුවීම පිළිබිඹු විය. සේවක පිරිවැයට අදාළව ක්‍රියාත්මක කරන ලද මුලපිරීම් වලින් ලබා ගත් ඉතිරිය රුපියල් බිලියන 5.8 කි. තවදුරටත්, ගුවන් තොටුපළ අතරමැදි සහ මඟී වියදම් සහ විකුණුම්, අලෙවිකරණ සහ ප්‍රචාරණ වියදම් පිළිවෙළින් 71% සහ 86% කින් ගුවන් ගමන් සංඛ්‍යාව සහ මඟීන් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් සංකෝචනය විය.

භාණ්ඩ ප්‍රවාහනය පුළුල් කිරීම, මගීන්ගේ ගමන් බිමන් කෙරෙහි කෝවිඩ්-19 හි අහිතකර බලපෑම අවම කිරීම සඳහා ගුවන් සමාගම විසින් ගන්නා ලද තවත් මුලපිරීමකි. හොංකොං, මිලාන්, ෆ්‍රැන්ක්ෆර්ට්, පැරිස් සහ සිඩ්නි වැනි නව ගමනාන්ත කිහිපයක් එකතු කිරීමත් සමග වත්මන් භාණ්ඩ ප්‍රවාහන ජාලය ගමනාන්ත 18 කින් සමන්විත වේ. ගෝලීය වසංගතය මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාවට අඛණ්ඩ විදේශ මුදල් ගලා ඒම සහතික කිරීම සහ ශ්‍රී ලංකා අපනයනකරුවන් ශක්තිමත් කිරීම සඳහා ඉහළ නැංවීමේ ධාරිතාවයෙන් 70% කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා අපනයන සඳහා වෙන් කරන ලදී. 2020 මැයි මාසයේ සිට, ඉක්මණින් විනාශ විය හැකි ද්‍රව්‍ය අපනයනය කරන්නන්ට තම ව්‍යාපාර එලදායී ලෙස කළමනාකරණය කල හැකි වන පරිදි භාණ්ඩ ප්‍රවාහනය සඳහා කැප වූ ගුවන් ගමන් කාලසටහනක් හඳුන්වා දෙන ලදී.

තවද, A330-200 මඟී ප්‍රවාහන ගුවන් යානයක් භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානයක් බවට පරිවර්තනය කල අතර, එය දැනට භාණ්ඩ මෙහෙයුම් සඳහා පමණක් භාවිත කරනු ලබයි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් භාණ්ඩ ප්‍රවාහන අංශය විසින් සැලකිය යුතු භාණ්ඩ ප්‍රවාහන විභවයේ ප්‍රතිලාභ අත් කර ගැනීම සඳහා, පවතින සහ වාණිජ ශක්‍යතා මත පදනම්ව තෙත්/වියළි කල්බදු ආකෘතියක් හරහා භාණ්ඩ ප්‍රවාහනය ආරම්භ කිරීම මගින් පවත්නා ව්‍යාපාර ආකෘතිය නැවත උපාය මාර්ගගත කිරීම අරමුණු කරයි. සීමිත පුළුල් පරාසයක් සහිත යානා කිහිපයක් සමග කටයුතු කරමින් සිදු කළ මෙම මුලපිරීම මගින් ශ්‍රී ලංකාවේ වර්ධනය වන ජාත්‍යන්තර වෙළඳාමේ මෙන්ම ගුවන් යානාවකින් තවත් ගුවන් යානාවකට හුවමාරු කිරීම් සහ ගෝලීය අවස්ථාවන් සඳහාද ශ්‍රීලංකන් ගුවන් සේවයට ඉඩ සලසමින් ගුවන් සමාගමේ ආදායම වෙත ශ්‍රීලංකන් භාණ්ඩ ප්‍රවාහනයේ දායකත්වය සැලකිය යුතු ලෙස වර්ධනය කිරීමට අපේක්ෂිතය.

ගුවන් ගමන් කර්මාන්තයේ ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම් සහ සමගාමීව සිය නිල මාර්ගගත අලෙවි වේදිකාව ගෙන ඒමේ අරමුණින්, එහි පරිශීලක අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය වෙබ් අඩවිය වන www. srilankan.com නව පෙනුමකින් නැවත සකස් කරන ලදී. මෙම වෙබ් අඩවිය ගුවන් ගමන් කර්මාන්තයේ ප්‍රමිතීන්ට සහ හොඳම භාවිතයන්ට අනුකූලව සියලුම උපාංග හරහා වඩාත් ඉහළ කාර්යසාධනයක් සහතික කරන සැලසුමක් දක්වයි. වෙබ් අඩවි පරිශීලක අත්දැකීම් සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබා දීමට ඉඩ සලසමින් විද්‍යුත් වාණිජ්‍ය ක්‍රියාකාරකම් උසස් කරමින් Srilankan.com විසින් Google Analytics සමගින් කාර්යසාධනය භාවිත කිරීමේ හැකියා වැඩිදියුණු කර ඇත. WeChat Pay, Alipay (චීනය) සහ POLi (ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය) යන නව ගෙවීම් විකල්ප හඳුන්වාදීමත් සමග අපගේ "srilankan.com" ප්‍රතිනිර්මාණය කරන ලද වෙබ් අඩවියෙන් දැන් අන්තර්ජාලය හරහා ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමට විවිධාකාර වූ විකල්ප සමගින් නම්‍යශීලී බවක් ලබා දෙයි. මෙයට අමතරව දේශීය බැංකුවලට ප්‍රමුඛත්වය දෙමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අන්තර්ජාල නාලිකා සඳහා නව මාර්ගගත ගෙවීම් ක්‍රමයක් ආරම්භ කරන ලදී. පසුගිය වසර තුළ, වත්මන් වසංගත තත්වය හේතුවෙන්, අන්තර්ජාල ක්ෂේත්‍රයේ මඟී ප්‍රවේශය පෙර වසරේ ගුවන් සමාගමේ මුළු මඟී ආදායමෙන් 15.5% සිට 4.2% දක්වා සංකෝචනය වී ඇත්තේ ආදායම ඇ.ඩො. මිලියන 2.94 ක් ලෙස සටහන් කරමිනි. තවත් වැඩිදියුණු කිරීම් සමගින්, ලෝකය ඇඟිලි තුඩක දුරට සමීප කරවමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය මාර්ගගත නාලිකාවේ පාරිභෝගික අත්දැකීම ශක්තිමත් කිරීමට අරමුණු කරනු ලබයි.

පිරිවැය අවම කර ගැනීමේ උත්සාහයක් ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නව බෙදාහැරීමේ හැකියාව (NDC) වේදිකාවේ නියෝජිතායතන වෙන්කරවා ගැනීමේ පිවිසුමෙහි සංවර්ධන කටයුතු සම්පූර්ණ කරන ලදී. මෙමගින් අතරමැදි ගෝලීය බෙදාහැරීමේ පද්ධති (GDS) මගහැර සංචාරක නියෝජිතයන් වෙත ළඟා වීමට ශ්‍රීලංකන් ගුවන් සමාගමට ඉඩ සැලසෙන අතර, ඉන් විකුණුම් පිරිවැය අඩු වේ. NDC වේදිකාව ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත වඩාත් එලදායි වෙළඳ භාණ්ඩකරණය, තරඟකාරී යෝජනා සහ කාලය-වෙළඳපොළ නිෂ්පාදන වෙනස සමගින් ලබා දෙනු ලබයි. මෙම වේදිකාව වෙනුවෙන් IATA විසින් NDC සඳහා 4 මට්ටමේ සහතිකය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත පිරිනමන ලදී. 4 මට්ටමේ සහතිකය යනු NDC සඳහා ඉහළම මට්ටමයි. ඉදිරි වසර සඳහා පිරිවැය ඉතිරිකිරීම් ලබා ගැනීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් Travelport සහ Amadeus Global Distribution Systems සමග ගිවිසුම් නැවත සාකච්ඡා කල අතර, ගුවන් ගමන් කර්මාන්තයේ භාවිතයන්ට අනුකූලව GDS වෙන්කරවා ගැනීමේ ප්‍රතිපත්තිය නැවත දියත් කරන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කළමනාකාරිත්වය විසින් ලීසිං පිරිවැයෙහි සැලකිය යුතු අඩුවීමක් අත්කර ගත් අතර, ගුවන් යානා බදු දෙන්නන් සහ සේවා සපයන්නන් සමග සිදු කරන ලද විශේෂ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ගෙවීම් කොන්දේසි වැඩිදියුණු කිරීම සඳහා සියලුම නඩත්තු සේවා සපයන්නන් සමග සම්බන්ධ වන ලදී. එහි තෙවන පාර්ශව පාරිභෝගික නඩත්තු ආදායම ඉහළ නංවා ගැනීමට පියවර ගෙන ඇති අතර, අංශය විසින් පිරිනමනු ලබන සිය සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ගුවන් ගමන් කර්මාන්තයේ ප්‍රමුඛයන් සමග හවුල් වීමේ නව උපාය මාර්ගයක් ආරම්භ කර ඇත. දැනුම බෙදාගැනීම, නඩත්තු සේවා සහ පුහුණුව සම්බන්ධයෙන් බෝයිං සමග මෑතකදී ඇති වූ හවුල්කාරීත්වයන් මීට ඇතුළත් ය. කලාපයේ රේඛීය නඩත්තුව, පදනම් නඩත්තු සේවා සහ වැඩමුළු සහයෙහි සැලකිය යුතු වර්ධනයක් දැකිය හැකි හවුල් ව්‍යාපාර සහ ඒකාබද්ධ ව්‍යාපාර සඳහා ගුවන් සේවා සහ නඩත්තු අලුත්වැඩියා සහ පිරිවැඩියා (MRO) සපයන්නන් ගණනාවක් සමග සාකච්ඡා සිදු වෙමින් පවතී.

ශ්‍රී ලාංකීය සිසුන්ට ගුවන් සේවා පිළිබඳ ගෝලීය මට්ටමින් අධ්‍යාපනය ලබා ගැනීමට මංපෙත් විවර කිරීමේ අරමුණින්, SLAC දැනට උපාධි පිරිනමනු ලබන උසස් අධ්‍යාපන ආයතනයක් (රාජ්‍ය නොවන) ලෙස අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. SLAC ආයතනය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ආයතනික සටහන නෛතික ව්‍යුහය සමග අවසන් කිරීමට කටයුතු කරමින් සිටින අතර, මෙය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් සිටී. උපාධි පාඨමාලා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ "පොළී රහිත

ශිෂ්‍ය ණය" යෝජනා ක්‍රමයේ ලියාපදිංචි කරනු ලබන අතර, එමගින් රටේ අපේක්ෂිත තරුණ තරුණියන් හට මෙම වැඩසටහනේ සැපයුම ඉහළ නංවනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් කෝවිඩ්-19 වසංගතයේ මුල් අවධියේ මෙහෙයුම් පරිමාණයට අනුකූල වීම සඳහා සමාගමට ඉහළ පිරිවැයක් දැරීමට වන සේවකයන් ඉවත් කිරීමට ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් (VRS 2020) හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කැබිනට් අනුමැතිය ඇතිව VRS 2020 හඳුන්වා දෙන ලදී. ස්වේච්ඡාවෙන් විශ්‍රාම ඉල්ලා සිටින සේවක අයදුම්පත් 286 ක් ද ඇති අතර, අයදුම්පත් සමාලෝචනයෙන් පසුව, VRS 2020 හරහා අයදුම්පත් 240 ක් ඉවත් කිරීමට අනුමත කරන ලදී. වන්දි ගෙවීම සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 546 කි.

එමෙන්ම, සමාගමට වලංගු CBAs තිබූ සියලුම වෘත්තීය සමිති 5 සමග සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් (CBAs) 2021 මාර්තු වන විට ප්‍රතික්ෂේප කර ඇත. CBA කොන්දේසි හේතුවෙන් පවතින පරිසරය සහ වෙළඳපළ මත පදනම්ව මෙහෙයුම් තීරණ ගැනීමේදී සමාගම දැඩි ලෙස සීමා කර ඇති බැවින්, මෙම තීරණය මූලික වශයෙන් ගෙන ඇත. ඊට අමතරව, CBAs හි යාවත්කාලීන සහ සංශෝධනය කිරීමට අවශ්‍ය, යල් පැන ගිය සහ ඵලදායි නොවන වැටුප් ප්‍රතිපත්ති අඩංගු වේ. 2019/20 හි මෙහෙයුම් මට්ටම මත පදනම්ව CBAs හි දක්වා ඇති වැටුප් ප්‍රතිපත්තිවල හඳුනාගත් වෙනස් කිරීම් මගින් දළ වශයෙන් ඇ.ඩො මිලියන 10 ක වාර්ෂික පිරිවැය ඉතිරියක් ලබා ගත හැකිය. කෙසේ වෙතත්, මෙම ඉතුරුම්වලින් කොටසක් සමාගමේ ව්‍යාපාරික අරමුණුවලට අනුකූල වන කාර්ය සාධනය පදනම් කරගත් දිරිගැන්වීම් සහ දීමනා හරහා කාර්ය මණ්ඩලය වෙත ආපසු ගෙවීම සඳහා නැවත ආයෝජනය කිරීමට නියමිතය.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි CSR අංශය මගින් ප්‍රජාවගේ සමාජ, අධ්‍යාපනික සහ සෞඛ්‍ය සම්බන්ධ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා ළමා, පෘථිවි සහ කුසලතා යන ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම, ගුණාත්මක අධ්‍යාපනය සහ පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සම්බන්ධ විවිධ වැඩසටහන් රටෙහි තිරසාර සංවර්ධන ඉලක්ක කරනු ලබයි.

ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය අනුව ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට කළමනාකරණය මෙම කාලසීමාව අවස්ථාවක් කරගෙන ඇත. ඒ අනුව, කාර්යසාධනය පදනම් කරගත් සංවිධානය, පාරිභෝගික කේන්ද්‍රය, ආදායම් සහ ආන්තික ගොඩනැගීම්, ඩිජිටල් පරිවර්තනය සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රීලංකන් එයාලයින්ස් වෙනසක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලබන ව්‍යාපෘති 5 ක් හඳුනාගෙන ඇත.

ආසියාවේ වඩාත්ම පාරිභෝගික කේන්ද්‍රීය ගුවන් සමාගම වීමේ අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, නිෂ්පාදන සංවර්ධනය විසින් සමාගම තුළ "පාරිභෝගික කේන්ද්‍රීය" ව්‍යාපෘතිය මෙහෙයවන ලද්දේ අපගේ මගී කණ්ඩායම් වඩාත් හොඳින් විස්තර කිරීම, පරිපූර්ණ අවබෝධය සඳහා දත්ත රැස් කිරීම සහ එමගින් පුද්ගලීකරණය කල මගීන් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමිනි. බහු-විනයානුකූල ප්‍රවේශයක් තුළ, ව්‍යාපෘතිය මගින් පාරිභෝගික සේවා පුහුණුකරුවන්ගේ ප්‍රථම අභ්‍යන්තර කණ්ඩායම සියලුම පෙරටුගාමී කාර්ය මණ්ඩලයට හොඳම භාවිතය පිළිබඳ ඔවුන්ගේ දැනුම ලබා දීම, පිරිවැය ඉතිරි කිරීම සහ සේවා බෙදා හැරීමේ පළමු අත්දැකීම පිළිබඳ අවබෝධය ලබා දීම සිදු විය.

එමෙන්ම අපි සන්නාම පක්ෂපාතිත්වය, අපගේ මගීන් කණ්ඩායමක් සමග ශුද්ධ ප්‍රවර්ධක ලකුණු (NPS) පිළිබඳ අධ්‍යයනයක් සිදු කල අතර, ගුවන් ගමන් කර්මාන්තයේ සාමාන්‍යය 47% ක් ලෙස ළඟා වන ලදී. අඛණ්ඩ පදනමක් මත ලුහුබැඳීම සහ මෙම ලකුණු වැඩි කිරීම සඳහා අඛණ්ඩ මුලපිරීම් බහු පාර්ශවකරුවන් සමග ක්‍රියාත්මක වේ.

නිෂ්පාදනයට නව්‍යකරණය සීමා කරන කෝවිඩ්-19 සේවාවන් සමගින්, මගී අවශ්‍යතා පිළිබඳ නවමු ආකාරයේ ඉදිරිදර්ශනයක් ලබා දෙමින් ආහාර සහ පාන වර්ග, ගුවන් තොටුපළ අත්දැකීම් සහ ආසන සුවපහසුව පිළිබඳ විවිධකාර විගණන වෙත අවධානය යොමු විය. මෙම සොයාගැනීම් දැනට දෙපාර්තමේන්තු කිහිපයක ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවලට ඇතුළත් කර ඇත.

ගුවන් ගමන් ආරක්ෂිත බවට මගීන්ගේ විශ්වාසය නැවත ලබා ගැනීමේ අරමුණින් සහ ගෝලීය ප්‍රමිතියක් ස්ථාපිත කිරීමේ අරමුණින්, ජාතික ගුවන් සේවය වෙත ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX), SimpliFlying සමගින් සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කරමින් ගුවන් සේවා පිළිබඳ ස්වාධීන විගණනයක් සිදු කරන ලදී. මගී ගමන පුරාවට අපගේ සෞඛ්‍ය සහ ආරක්ෂිත ක්‍රියා පටිපාටි සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් දරන සූක්ෂම ප්‍රයත්නයන් නිසාවෙන් ප්‍රමිතිය ශ්‍රේණිගත කිරීමේ දෙවන ඉහළම මට්ටම සහ එම තත්වය හිමි කර ගත් දකුණු ආසියාවේ ප්‍රථම ගුවන් සේවය ලෙස පත් වීමටත්, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගෝලීය ප්‍රමුඛයෙකු ලෙස අපව තහවුරු කර ගැනීමටත් හැකි විය. ගෝලීය ආකර්ෂණය අඛණ්ඩව පෙන්නුම් කරමින්, සිය අලෙවි සන්නිවේදන විශිෂ්ටත්වය උදෙසා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් PATA ස්වර්ණ සම්මානය හිමි කර ගන්නා ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ඉන්දීය උප මහාද්වීපයේ ප්‍රමුඛතම ගුවන් සමාගමක් ලෙස සිය අභිමානය යළිත් තහවුරු කරමින්, World Travel Awards Asia and Oceania හි කීර්තිමත් 'ලොව ප්‍රමුඛතම ගුවන් සමාගම' සහ 'ඉන්දීය සාගරයේ ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සමාගම' යන ගෞරව නාමය දිනා ගන්නා ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ජාතික ගුවන් සේවයට විශාල අභිමානයක් එක් කරමින් ගෝල්ඩන් සිටී ගේට් සම්මානය ITB - බර්ලින් 2020 හිදී කාණ්ඩ 3 කින් ("එයාර්ලයින් ඉන්ටර්නැෂනල්", "මියුසික් ඉන්ටර්නැෂනල්" සහ "කැම්පේන්") ෆස්ට් ස්ටාර් සම්මාන ලබා ගන්නා ලදී. අනෙකුත් ඉහළම ජාත්‍යන්තර ගුවන් සමාගම් සමග තරඟ වැදුණු කීර්තිමත් සහ ප්‍රබල CondeNast Traveler '2020 Readers Choice Awards' හීදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලොව ඉහළම ජාත්‍යන්තර ගුවන් සේවා අතර හයවැනි ස්ථානයට පත් විය.

IATA, සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ ගුවන් සේවයේ වෛද්‍ය මධ්‍යස්ථානය සමග සම්බන්ධීකරණයෙන් පාරිභෝගික ගමන පුරා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග හේතුවෙන් අවදානම් තක්සේරු කණ්ඩායම් පිහිටුවා ඇති අතර, එමගින් නිෂ්පාදන පිරිනැමීම අවදානම් කාණ්ඩයට අනුව වෙනස්කම් කිරීමට හැකි විය. ශ්‍රී ලංකා රජය සමග සම්බන්ධීකරණයෙන් මූලික කණ්ඩායම් සඳහා ප්‍රමුඛතා එන්නත් කිරීම මගින්, අපගේ ඉදිරි පෙළ කාර්ය මණ්ඩලයෙන් 95% කට වැඩි පිරිසකට එන්නත් මාත්‍රා දෙකම ලබා ගැනීමට හැකි විය.

මගී ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම අඩුවීමත් හේතුවෙන් ගෝලීය ගුවන් භාණ්ඩ මෙහෙයුම් 2020 දී ඉහළ ප්‍රතිලාභයක් සහ පරිමාව මත පදනම් වූ වෙළඳපළවල ස්ථාවර වර්ධනයක් සමග සමෘද්ධිමත් විය. අනෙකුත් බොහෝ මගී ගුවන් සමාගම් මෙන්ම, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ද භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවස්ථා ගවේෂණය කරන ලද්දේ එහි පුළුල් බඳ සහිත ගුවන් යානා ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමේ අරමුණ ඇතිවය. ගුවන්සේවා අතර පැවති දැඩි තරඟකාරිත්වය හේතුවෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට කඩිනමින් ක්‍රියා කිරීමටත්, පවතින සහ නව ගමනාන්තයන් ඇතුළත් විභවයන් සහිත වෙළඳපල තුළ ධාරිතාව යෙදවීමටත් සිදු විය. ඒ අනුව, අලුතින් ආරම්භ කරන ලද ගමනාන්ත අතරට සිඩ්නි, සයිගොන්, ෆ්‍රැන්ක්ෆර්ට්, හොංකොං, මිලාන්, පැරිස්

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

සහ නයිරෝබි ඇතුළත් විය. සිය කම්කරු ගිවිසුම් අවසන් කරමින් සිටින ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිතිපතා ආපසු ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා Seoul හඳුන්වා දෙන ලදී. මෙම ගමනාන්තයන් බොහොමයක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මාර්ග පුළුල් කිරීමේ සැලැස්ම තුළ මගී වෙළඳපොළ ලෙස හඳුනාගෙන තිබුණද, 2020 සහ 2021 දී ඒවා හඳුන්වාදීමේ දියුණුව හුදෙක් භාණ්ඩ ප්‍රවාහන ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා විය. මෙම වෙළඳපළ සමහරක් සැබෑ මූල්‍ය ප්‍රතිඵල සහ දුර්වල වර්ධන විභවය මත පදනම්ව අත්හිටුවන ලද අතර පසුව භාණ්ඩ ඉල්ලුම සහ ප්‍රතිලාභ මට්ටම් පහත වැටීම හේතුවෙන් මාර්ග අකර්මණ්‍ය විය. ගුවන් සේවයේ සම්පූර්ණ පුළුල් ගුවන් යානා කාණ්ඩය භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා වැඩි වශයෙන් භාවිතා කරන ලදී. ගුවන් ගමන් මගී ගමනාගමනය සඳහා සීමිත ධාරිතාවක් ලබා දී ඇති අතර එය ඉල්ලුම ක්‍රියාත්මක වූ විට භාවිත කරන ලදී. භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන්වලට අමතරව, පිටරට සිටින ශ්‍රී ලාංකික ජාතිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා සහ ජාත්‍යන්තර ගනුදෙනුකරුවන් වෙනුවෙන් වරලත් මෙහෙයුම් සඳහා තාවකාලික නැවත ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් රැසක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ක්‍රියාත්මක කරන ලදී.

මගී ඉල්ලුමේ පශ්චාත් කෝවිඩ් ප්‍රතිසාධනය පිළිබඳ අවිනිශ්චිතතාවයන් අඛණ්ඩව පවතින බැවින්, විශ්වාසදායක වෙළඳපළ පුරෝකථනයන් නොමැති නිසාවෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2021/22 සඳහා ඉදිරි දැක්ම පිළිබඳ සාධාරණ උපකල්පනයක් කිරීමට මගී ගමනාගමනයේ ගෝලීය ඉල්ලුම ප්‍රතිසාධනය පිළිබඳ IATA (ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය) පුරෝකථනය යොදාගන්නා ලදී. 2021 වසර සඳහා, IATA විසින් 2019 පූර්ව කෝවිඩ් මට්ටම්වලින් 45% - 55% ක සමස්ත (ජාත්‍යන්තර සහ දේශීය) කලාපීය මගී ඉල්ලුම ප්‍රතිසාධනයක් පුරෝකථනය කරයි. ඒ අනුව, කලාපයේ සැලකිය යුතු මට්ටමක පැවති දේශීය ගමනාගමනය සැලකිල්ලට ගෙන ජාත්‍යන්තර ගමනාගමනය 40% ක් පමණක් යථාතත්වයට පත්වීම උපකල්පනය කරමින්, 2021/22 සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගුවන්යානා ජාලයේ පියාසැරි කාලසටහන සකස් කරන ලදී. මෙම කාලසටහනට අනුව, අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා ගිම්හාන සමය ප්‍රධාන වශයෙන් භාණ්ඩ ඉල්ලුම ප්‍රක්ෂේපණය මත පදනම් වූ අතර පුළුල් බඳ සහිත ගුවන් යානා ධාරිතාව මත සීමිත ධාරිතාවක් ඉන්දියානු උපමහාද්වීපය, මැද පෙරදිග සහ ඈත පෙරදිග යන තෝරාගත් වෙළඳපළ සඳහා යෙදවීමට නියමිත විය. 2021/22 ශීත සෘතුවේ දී 40% ක් වැනි විශාල ප්‍රමාණයක ඉල්ලුම් ප්‍රතිසාධනයක් සිදු වනු ඇතැයි උපකල්පනය කරන ලද අතර, එම නිසා ගිම්හානයේදී භාණ්ඩ ප්‍රමුඛ ගුවන් ගමන් බොහොමයක් ශීත සෘතුවේ සිට මගී ගුවන් ගමන් ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු විය. දැනට පවතින ගුවන් ගමන් වලට අමතරව, සංචාරක ගමනාගමනය ඇති කිරීමේ හැකියාව හේතුවෙන් 2021/22 ශීත සෘතුවේ සිට මගී ගුවන් යානයක් ලෙස රුසියාවේ මොස්කව් වෙත සෘජු මෙහෙයුම් හඳුන්වා දීමට සැලසුම් කර ඇත.

කෙසේ වෙතත්, 2021 දී වසංගත තත්වය උග්‍ර වීම හේතුවෙන් මගී ඉල්ලුම යථා තත්වයට පත්වීමට බලපෑ බැවින්, මගී ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමට ආදායම් උත්පාදනය ප්‍රශස්ත කිරීම සඳහා සහ මගී වෙළඳපළ හැසිරීම් අඛණ්ඩව සමාලෝචනය කිරීම සඳහා භාණ්ඩ මත පදනම් වූ වත්මන් කාලසටහන දිගටම පවත්වා ගෙන යාමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් තීරණය කරන ලදී. මූල්‍යමය වශයෙන් සාධාරණීකරණය කළ හැකි මට්ටමකට මගී ඉල්ලුම යථා තත්වයට පත් වන තෙක් වර්තමාන භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් කාලසටහන දිගටම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2020/21 සහ 2021/22 මූල්‍ය වර්ෂවලදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නව මාර්ග හඳුන්වාදීමට සම්පූර්ණයෙන්ම පදනම් වූයේ කඩිනම් වෙළඳපළ ප්‍රතිචාරයක් අවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාරික අවස්ථා මතය.

2022 ජනවාරි 1 වන දින සිට වැඩබලන ප්‍රධාන විධායක නිලධාරීතුමා ලෙස මා හට භාර දී ඇත්තේ මෙම ගුවන් සේවය වඩාත් ඉහළ තලයකට ගෙන යාමට සහ අප කෝවිඩ් රෝගයෙන් යථා තත්වයට පත් වන විට ලාභදායී ව්‍යාපාරයක් නැවත ගොඩ නැගීම සඳහාය. 2021 අවසානය වන විට අපගේ ඇතැම් ප්‍රධාන වෙළඳපළ කර්මාන්තය යථා තත්වයට පත් වීමට පටන් ගත් අතර, අර්බුදය තුළ සිදු කරන ලද බොහෝ මුලපිරීම් මත පදනම්ව, ගුවන් සේවා ප්‍රතිඵල ශක්තිමත් ලෙස වර්ධනය විය. 2021 දෙසැම්බර් මාසය සඳහා ගුවන් සමාගම ඇ.ඩො මිලියන 9.25 ක සමාගම් ලාභයක් සහ ඇ.ඩො මිලියන 10.66 ක සමූහ ලාභයක් ඉපැයීම මගින් මෙය මනාව පිළිබිඹු විය. 2020 මුල් භාගයේ වසංගතය ආරම්භ වූ පසු ගුවන් සමාගම ලාභ ලැබූ පළමු මාසය මෙය විය. පසුගිය වසරේ එම කාලපරිච්ඡේදය සමග සසඳන විට 200% කට ආසන්න ප්‍රමාණයකින් ආදායම ඉහළ ගොස් ඇති අතර පූර්ව වසංගත මට්ටමින් 80% දක්වා ළඟා විය. තවද, ගුවන් සමාගම 2021 දෙසැම්බර් මාසය සඳහා ගුවන් ප්‍රවාහන මට්ටමින් ඇ.ඩො මිලියන 11.43 ක ලාභයක් වාර්තා කර ඇති අතර එය වසර 20කට වැඩි කාලයක් තුළ ගුවන් ප්‍රවාහනයෙන් වාර්තා වූ ඉහළම ලාභය වේ.

ඉදිරියේදී, රට තුළ නව ඔමික්‍රෝන් ප්‍රභේදයේ ව්‍යාප්තිය හේතුවෙන් ඉදිරි මාස 2 සිට 3 දක්වා කාලය පිළිබඳව මම අනපේක්ෂිතාවයකින් පසුවෙමි. කෙසේ වෙතත්, අප මේ සමග ජීවත් වන විට, සංචාරක ව්‍යාපාරය නැවත ශක්තිමත් වනු ඇතැයි මම විශ්වාස කරන අතර, අප නැවත යථා තත්වයට පත්වනු ඇතැයි මම ශුභවාදීව සිතමි.

මගේ පූර්වගාමියා වූ නික්ම යන ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ නොපසුබට උත්සාහයට ස්තූතිය පළ කරන අතරම, සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ කණ්ඩායම, සේවකයින්, ව්‍යාපාරික හවුල්කරුවන්, ශ්‍රී ලංකා රජය සහ අපගේ කොටස් හිමියන් යන පාර්ශවයන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ අනුග්‍රහය වෙනුවෙන් මම ස්තූතිය පළ කරමි. ආසියාවේ වඩාත්ම පාරිභෝගික කේන්ද්‍රීය ගුවන් සේවය බවට පත්වීමේ දැක්ම කරා ළඟා වීම සඳහා වන ප්‍රයත්නයන්හිදී අප නිරන්තරයෙන් නොසැලී නොපසුබටව සිටින බව මම විශ්වාස කරමි. ගුවන් සමාගමක් ලෙස අපි ජාතියට අඛණ්ඩ සේවයක් සපයන්නෙමු.

**රිචඩ් නටල්**
*වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන වාණිජ නිලධාරි*

# අධ්‍යක්ෂ මණ්ඩලය

## අසෝක පතිරගේ මහතා

2019 දෙසැම්බර් 16 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු අසෝක පතිරගේ මහතා, පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වන ලදී. හෙතෙම සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි සර්ජිකල් හොස්පිට්ල්ස් පීඑල්සී සහ ඔඩෙල් පීඑල්සී හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයා වේ. පතිරගේ මහතා සමූහයේ සෙසු සමාගම් වලට අමතරව, සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී සහ සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සභාපතිවරයා වශයෙන් සේවය කරයි. ඒ මහතා සීමාසහිත එන්.ඩී.බී කැපිටල් හෝල්ඩින්ග්ස් හි සභාපතිරවරයාද වේ.

ශ්‍රී ලංකාවේ ආයතනික ක්ෂේත්‍රය තුළ පැහැදිලි දර්ශනයක් සහිත ව්‍යාපාරික නියමුවකු වශයෙන් ඇගයුමට පාත්‍ර වන ඒ මහතා, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමූහ ව්‍යාපාරයක් වන සොෆ්ට්ලොජික් සමූහයේ නිර්මාතෘවරයා ද වේ. ඔහු සතු මනා ප්‍රායෝගික දැනුම් සම්භාරය තුළින්, සේවකයින් 10,000 කට අධික සේවක පිරිසකට රැකියා අවස්ථා උදාකරමින්, සමාගම් 50 කට අධික සංඛ්‍යාවක් කළමනාකරණය කරනු ලබයි. ප්‍රධාන වෙළඳපොළකට හිමිකම් කියන, සිල්ලර වෙළඳ සහ විදුලි සංදේශ, සෞඛ්‍යාරක්ෂණ සේවා, මූල්‍ය සේවා සහ තොරතුරු තාක්ෂණය, සහ සංචාරක සමූහයට සහ මෝටර් රථවාහන යන සමගාමී ක්ෂේත්‍රයන් හතරක පතිරගේ මහතා විසින් ක්‍රමෝපායික මඟපෙන්වීමක් ලබාදෙයි.

## මලික් ජේ. ප්‍රනාන්දු මහතා

2020 ජනවාරි 08 වැනි දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු මලික් ප්‍රනාන්දු මහතා පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණ.

ප්‍රනාන්දු මහතා ඩිල්මා තේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රථම සුඛෝපභෝගී නිකේතන සන්නාමය වන 'රෙස්ප්ලෙන්ඩන්ට් සිලෝන්' හි කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකි. එමගින් සංචාරකයින් වෙත නියම දේශීය අත්දැකීමක් ලබාදෙමින් MJF පදනම සහ "ඩිල්මා කන්සවේෂන්" ඔස්සේ දේශීය ප්‍රජාවන් සහ පරිසරය වෙත දායකත්වය සපයයි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු, ඒ මහතා 'ලව් ශ්‍රී ලංකා' "Love Sri Lanka" තේමාව යටතේ පෞද්ගලික සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කළේය.

ප්‍රනාන්දු මහතා ඇමරිකා එක්සත් ජනපදයේ බැබ්සන් විද්‍යාලයේ (Babson College) ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ BSc විද්‍යාවේදී උපාධිධරයෙකි.

## ජනාධිපති නීතීඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා

ජනාධිපති නීතීඥ මනෝහර ආර්. ද සිල්වා මහතා, 2020 ජනවාරි 8 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කෙරුණු අතර පසුව හෙතෙම සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කෙරුණි.

මනෝහර ආර්. ද සිල්වා මහතා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවයෙහි නියුතු ජනාධිපති නීතීඥවරයෙකි. 1988 වසරේදී නීතීඥයෙකු වශයෙන් දිවුරුම් දුන් ඒ මහතා, 2006 වසරේදී ජනාධිපති නීතීඥවරයෙකු වශයෙන් පත්කෙරුණි. ඒ මහතා නීති කොමිසමේ සහ නීති ආධාර කොමිසමේ සාමාජිකයෙකි. හෙතෙම වසර කීපයක් නීති අධ්‍යාපනය පිළිබඳ සංස්ථාපිත කවුන්සිලයේ සේවය කළේය. 2006 වසරේදී රජය මගින් ඒ මහතා ව්‍යවස්ථාව සම්බන්ධ සර්ව පාක්ෂික නියෝජිත කමිටුවෙහි විශේෂඥ මණ්ඩලයෙහි සේවය සඳහා පත්කරන ලදී.

ජනාධිපති නීතීඥ ද සිල්වා මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාල කවුන්සිල සාමාජිකයෙකු වන අතර, හෙතෙම ඊට පෙරාතුව එම විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් සේවය කළේය. වසර ගණනාවකට පෙර ඒ මහතා නීතීඥ සංගමයෙහි සාමාජිකයෙකු වශයෙන් ද ශ්‍රී ලංකා නීතීඥ සංගමයෙහි විධායක කමිටු සාමාජිකයෙකු වශයෙන් ද, එමෙන්ම SAARC LAW හි සේවය කළේය. ජනාධිපති නීතීඥ ද සිල්වා මහතා ව්‍යවස්ථාව සම්බන්ධ ග්‍රන්ථ හා පත්‍රිකා කීපයක් රචනා කොට ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා

ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා 2020 ජනවාරි 8 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කරන ලදී.

හෙතෙම සිවිල් නීතිය සම්බන්ධ මනා පළපුරුද්දක් සහිත ජනාධිපති නීතිඥවරයෙකි. ඒ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර එහි නීති පීඨයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් ද සේවය කොට ඇත. හෙතෙම ශ්‍රී ලංකා නීති කොමිසමෙහි සාමාජිකයෙකු ද වේ.

ඔහුගේ සේවාවන් පුද්ගලික නීතිය, ඉඩම් නීතිය සහ වාණිජමය ආරවුල් සම්බන්ධ පුළුල් පරාසයක පැතිරුණු සේවාදායක පිරිසක් වෙත සැලසුණි. ඒ මහතා දිවයින පුරා මූලික අධිකරණ සහ අභියාචනාධිකරණයන්හි හසල අත්දැකීම් ඇති ප්‍රකට නීතිඥවරයෙකු වේ.

සිවිල් ගැටළු සම්බන්ධයෙන් වන සංකීර්ණ නීතිමය තත්වයන් සම්බන්ධයෙන් ඔහු සතු විශේෂිත නිපුණත්වය හේතුවෙන් ආයතන සහ පුද්ගලයින් බොහෝමයක් එම මහතාගේ සේවාවන් ලබාගැනීම කෙරෙහි යොමුවේ. හෙතෙම මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ සිය ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනය හදාරන ලදී.

## ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා

ආචාර්ය හංස විජයසූරිය මහතා, 2020 ජනවාරි 23 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කරන ලදී.

ඒ මහතා දැනට ආසියාටා සමූහයේ විදුලි සංදේශ ව්‍යාපාරයෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කරන අතර මැලේසියාව, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, නේපාලය, ශ්‍රී ලංකාව සහ කාම්බෝජයේ වෙළඳපොළ පුරා පැතිරුණු සමූහයේ කලාපීය විදුලි සංදේශ මෙහෙයුම් වල ප්‍රධානත්වය උසුලයි. ආසියාටා, ආසියාවේ දෙවන විශාලතම විදුලි සංදේශ සමූහය වේ.

ආසියාටා සමූහයේ කලාපීය පරිපාලිතයන් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට අමතරව, ආචාර්ය විජයසූරිය ඩයලොග් ආසියාටා පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි. 2016 වර්ෂය දක්වා, ආචාර්ය විජයසූරිය මහතා, ඩයලොග් ආසියාටා පීඑල්සී සමූහයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළේය. එමෙන්ම ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ජෝන්කීල්ස් හෝල්ඩින්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කරයි.

2016 වර්ෂයේදී, "ආසියානු ජංගම සන්නිවේදන ක්ෂේත්‍රයට විශිෂ්ඨ දායකත්වය" සම්මානයෙන් පිදුම් ලද ප්‍රථමයා වශයෙන් ආචාර්ය විජයසූරිය GSM සංගමයෙහි ගෞරවයට පාත්‍රවිය. ආචාර්ය විජයසූරිය මහතා GSM සංගමයෙහි කලාපීය කණ්ඩායම වන GSM ඒෂියා පැසිෆික් හි හිටපු සභාපතිවරයෙකු වේ. ආචාර්ය විජයසූරිය මහතා 2008 වර්ෂයේදී 'ප්‍රීමියර් බිස්නස් ජර්නල්, LMD' සඟරාව මගින් "වසරේ ශ්‍රී ලාංකිකයා" වශයෙන් නම් කෙරිණි. ආචාර්ය විජයසූරිය මහතා මේ වනවිට ශ්‍රී ලංකා වාණිජ මණ්ලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.

## සංජය මොහොට්ටාල මහතා

සංජය මොහොට්ටාල මහතා 2020 පෙබරවාරි 1 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ද ඉන් අනතුරුව ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ද පත්කෙරිණි. හෙතෙම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සහ ශ්‍රීලංකන් කේටරින් යන ආයතන දෙකෙහිම තාවකාලික විගණන කමිටු සභාපතිවරයා වේ.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට අමතරව, මොහොට්ටාල මහතා BOI හි සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලය සහ සහස්‍ය (Sahasya) හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. එමෙන්ම ඔහු ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධන බලකායේ සාමාජිකයෙක් විය.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට පෙර සංජය මොහොට්ටාල මහතා බොස්ටන් කන්සල්ටින් සමූහයේ ප්‍රවාහන සහ නැව් බඩු ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි ආසියා ශාන්තිකර සම්බන්ධීකාරකවරයා විය. හෙතෙම දකුණු ආසියානු ආයතනික සංවර්ධන යහ ප්‍රධාන ආයෝජකයින් සහ පෞද්ගලික ස්කන්ධ ක්‍රියාකාරකම් වල ප්‍රමුඛ සාමාජිකයෙකු ද වේ.

ක්‍රමෝපාය, ඒකාබද්ධකරණ, අත්පත් කර ගැනීම් සහ ආයෝජන, ප්‍රතිව්‍යුහගතකරණය, මෙහෙයුම් වැඩිදියුණු කිරීම, විකුණුම් සහ අලෙවි, විශ්ලේෂණ සහ සංවිධානමය සැකසුම් සම්බන්ධයෙන් ඔහුට මනා පළපුරුද්දක් ඇත. මොහොට්ටාල මහතා විසින් බහුවිධ ඒකාබද්ධකරණ සාකච්ඡා සහ පශ්චාත් ඒකාබද්ධකරණ ප්‍රයත්නයන් සඳහා නායකත්වය ලබාදෙන ලදී. එමෙන්ම ඔහු මහා පරිමාණ පරිවර්තනීය සමාගම් වල සේවය කරන ලදී.

ඔහු මොරටුව විශ්වවිද්‍යාලයේ BSc විද්‍යාවේදී ගෞරව උපාධිධාරියෙකු, UCLA (ඇමෙරිකා) ඇන්ඩර්සන් කළමනාකරණ විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිධාරියෙකු, CIMA, අලෙවිකරණ ඩිප්ලෝමාධාරියෙකු සහ "ෆුල්බ්‍රයිට්" ශිෂ්‍යත්වලාභියෙකු ද වේ.

## ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා

මුදල් අමාත්‍යාංශය යෝජනාවට අනුව, ප්‍රකට බැංකුකරුවකු වන ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතාව ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2021 මාර්තු 27 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කෙරිණි. එමෙන්ම සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2021 මැයි 21 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි.

පෙරේරා මහතාට මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 40කට අධික පළපුරුද්දක් ඇති අතර එයින් වැඩි කොටසක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල වල සේවාවන් ය.

පෙරේරා මහතා ලන්ඩනයේ වරලත් බැංකුකරණ ආයතනයෙහි සාමාජිකයෙකු වන අතර ලන්ඩන්, නිව් යෝර්ක්, සැන් ෆ්‍රැන්සිස්කෝ, හොන්ග් කොන්ග් සහ සිංගප්පූරුවෙහි පිහිටි මූල්‍ය ආයතනයන්ගෙන් හසළ පුහුණුවක් ලබා ඇත.

දැනට පෙරේරා මහතා, මැක්ලරන්ස් සමූහ ආයතනයන් සහ ඉන්ටර් ඕෂන් එනර්ජි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙ හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස, සහ ප්‍රිමියර් ෆිසිෂන්ස් මෙඩිකල් සමූහ ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු සින්ගර් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයේ අවදානම් කළමණාකරණ කමිටු සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක ධූරයද, විගණන කමිටු සාමාජික ධූරයක්ද දරයි. ඔහු යුරෝපයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ නැව් සමාගම් සහ සංචාරක ආයතන නියෝජනය කරන සංචාරක ක්ෂේත්‍රයේ ඉහළ පිළිගැනීමක් ඇති ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස් ආයතනයේ අධ්‍යක්ෂ නිලධාරීවරයාය.

පෙරේරා මහතා සිය කීර්තිමත් වෘත්තීය ජීවිත තුල හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී (HNB) - ජාත්‍යන්තර, ව්‍යාපාර ප්‍රවර්ධන සහ ආයතනික ණය ඇතුළු භාණ්ඩාගාරික
කටයුතු අංශයෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කලේය. එමෙන්ම ඔහු HNB ඇෂුවරන්ස් පීඑල්සී නිර්මාතෘ අධ්‍යක්ෂකවරයෙකු ද වේ. ඔහු ඇකියුට් ස්ටොක්බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, HNB සහ DFCC බැංකු හවුල් හිමිකාරීත්වයෙන් යුත් ඇකියුට් සෙකියුරිටි සහ ඇකියුට් පාට්නර්ස් යන ආයතනවල කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය. මෙම ධූරයන් දැරීමෙන් ව්‍යාපාර වර්ධනය සඳහා අතිමහත් දායකත්වයක් දෙන ලදී. එතුමා ලංකා වෙන්චර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එල්. වී. එල්. එනර්ජී ආයතනවල අධ්‍යක්ෂ ධූර දැරීය. පෙරේරා මහතා HNB හි සේවා කාලය තුලදී, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයෙක් ලෙස ශ්‍රී ලංකා මහා බැංකුව සමග සම්බන්ධීකරණයෙන් ද ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන ලදී.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

## රිචඩ් නටල් මහතා

***වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන වාණිජ නිලධාරි***

රිචඩ් නට්ල් මහතා 2021 නොවැම්බර් මස ආරම්භයේ සිට ප්‍රධාන වාණිජ නිලධාරිතුමා ලෙස ගුවන් සේවයට සම්බන්ධ වූ අතර, 2022 ජනවාරි 1 වන දින සිට වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරිතුමා බවට පත් විය.

ගුවන් සේවා ක්ෂේත්‍රයේ වසර 25ක පළපුරුද්දක් ඇති ඔහු ලොව පුරා විවිධ මෙහෙයුම් අංගයන් ආවරණය වන පරිදි බොහෝ ගුවන් සේවාහි විවිධ ජ්‍යෙෂ්ඨ භූමිකාවන් දරා ඇත. මේ සඳහා ඇතුළත් වන්නේ:

- සවුදි එයාර්ලයින්ස්හි විවිධ භූමිකාවන්. ආරම්භයේදී වෙළඳ පරිවර්තනයේ උප සභාපතිතුමා ලෙස පත් කරන ලදුව, පසුව විකුණුම් අංශයෙහි උප සභාපතිතුමා ලෙස කටයුතු කළ අතර, ඔහු විසින් නිෂ්පාදන සහ අලෙවිකරණය සඳහා අමතර වගකීම් ද දරන ලදී. ඔහු වාර්ෂික ආදායමෙන් ඩොලර් බිලියන 6ක් සමග ගුවන් සමාගමක් සඳහා වන වාණිජ උපාය මාර්ගයේ හිමිකාරිත්වයෙහි කොටස්කරුවෙකු වූ අතර ගෝලීය වශයෙන් 2,700ක කාර්ය මණ්ඩලයක් මෙහෙයවීය. වසර 3ක් පුරාවට 30% ක ජාත්‍යන්තර මගී වර්ධනයක් ලබාදී, කලාපීය සාමාන්‍යයට වඩා බෙහෙවින් වැඩි, බෙදාහැරීමේ පිරිවැයෙහි 25% ක අඩුවීමක් අත්කර ගත් අතර, ක්ෂේත්‍රයේ හොඳම දෑට අනුකූලව ගුවන් සමාගමේ NPS ලකුණු ඉහළ නංවන සේවාවක් ආරම්භ කිරීමෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.
- රෝයල් ජෝර්ඩානියන්හි ප්‍රධාන වාණිජ සහ උපාය මාර්ගික නිලධාරිතුමා ලෙස ඔහු මුලපිරීම් 70ක් හඳුනාගනිමින්ද කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමට සහ මැනීමට රාමුවක් නිර්මාණය කරමින්ද උපායමාර්ගික කාර්ය පිළිබඳ දැනුම ලබා දෙනු පිණිස ව්‍යාපාරික නායකයින් සහ ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් උපදේශකයින් කණ්ඩායමකට නායකත්වය ලබා දුන්නේය. ඔහු ඩොලර් මිලියන 80ක ප්‍රගතියක් සහ 12%ක ආන්තික වර්ධනයක් සමගින් ගුවන් සමාගම ලාභදායි තත්වයට පත් කළේය.
- ස්කයිටීම් (Skyteam) අධීක්ෂණ මණ්ඩලයේ සවුදි එයාර්ලයින්ස්හි නියෝජිතයෙකු වූ අතර, පසුව ඔහු එහි නව පාලන ආකෘතියක් යටතේ විධායක මණ්ඩලයට සම්බන්ධ විය.
- අනෙකුත් තනතුරු අතර, බහරේන් එයාර්හි ප්‍රධාන විධායක නිලධාරිතුමා, කෙන්යා එයාර්වේස්හි වාණිජ අධ්‍යක්ෂකතුමා, පිලිපීන ගුවන් සේවය සමග ජ්‍යෙෂ්ඨ වාණිජ උපදේශකතුමා, ධ්‍රැවීය ගුවන් භාණ්ඩ සඳහා ඇමරිකා සමාගමෙහි විකුණුම් සහ අලෙවිකරණ අංශයන්හි උප සභාපතිතුමා සහ කැතේ පැසිෆික් එයාර්වේස්හි කළමනාකරණ භූමිකාවන් රාශියක් ඇතුළත් වේ.

නට්ල් මහතා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් ගණිත උපාධියක් සහ ලන්ඩන් ව්‍යාපාරික අධ්‍යයනායතනයෙන් ස්ලෝන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

## ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය

***සමාගම් ලේකම්/ආයතනික ලේකම් සේවා ප්‍රධානී***

ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය 2013 දී සමාග මේ සේවයට සම්බන්ධ වුවාය. ඇය සමාගම් ලේකම් සහ ආයතනික ලේකම් සේවා ප්‍රධානී වශයෙන් කටයුතු කරයි. මෙම අංශය මගින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් වෙත ආයතනික ලේකම් සේවා සපයයි. ඇය "ශ්‍රී ලංකන් Cares" භාරයේ භාරකාරිනියකි.

එතුමියට වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇත. ඇයගේ සේවා කාලය තුළදී ඇය ලංකාවේ ලැයිස්තුගත විවිධාංගීකරණය වූ සමාගම් සමූහයන්හි ඉතා උසස් හා වගකිවයුතු තනතුරු හොබවා ඇත.

එතුමිය එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන් සහ පරිපාලකයින්ගේ ආයතනයේ සාමාජිකාවක් වන අතර ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරිනියකි. තිරුකුමාර් මහත්මිය ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සාමාජිකාවක් ද වේ.

## යසන්ත දිසානායක මහතා

***මූල්‍ය කළමනාකරණ ප්‍රධානී***

යසන්ත දිසානායක මහතා 2004 දී සමාගමට සම්බන්ධ වූ අතර වර්තමානයේ ඔහු මූල්‍ය කළමනාකරණ ප්‍රධානී තනතුර දරයි. සමාගමේ මූල්‍ය හා වාණිජමය ප්‍රසම්පාදන අංශයන් ඔහු වෙත වාර්තා කරයි.

ආසියානු කලාපීය සම්මාන දෙකක් විසින් පිළිගත් ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ඉස්ලාමීය මූල්‍යකරණ පහසුකම් ඇතුළු සමාගමේ පුරෝගාමී මූල්‍ය ගනුදෙනු රාශියකට ඔහු නායකත්වය දී තිබේ.

A 330- 300 ගුවන් යානා සමූහය සඳහා පූර්ව ලබාදීමේ මූල්‍යකරණ ගනුදෙනු සැකසීමේ දී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරන ලද අතර එම ගනුදෙනුව "එයාර්ෆයිනෑන්ස්" සඟරා මගින් 2014 දී "වසරේ පූර්ව ලබාදීම් මූල්‍යකරන ගනුදෙනුව" වශයෙන් ඇගයුමට පාත්‍ර විය. සමාගම හා සම්බන්ධ වීමට පෙරාතුව දිසානායක මහතා ආයෝජන බැංකුකරණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයන්හි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබවිය. හෙතෙම, වෘත්තියෙන් ගණකාධිකාරිවරයකු, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයෙහි අධි සාමාජිකයකු සහ කාර්ඩිෆ් හි වේල්ස් සරසවියේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියෙකි.

## චාමර පෙරේරා මහතා

***තොරතුරු තාක්ෂණ ප්‍රධානී***

ගුවන් සේවා තාක්ෂණය හා ස්වයං ව්‍යාපාරික ක්‍රියාවලි පිළිබඳ හසළ දැනුමක් සහිත චාමර පෙරේරා මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ පරිණත වෘත්තිකයෙකි. හෙතෙම සමූහය වෙත තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් පරිවර්තනයන් සම්බන්ධයෙන් ක්‍රමෝපායික නායකත්වය ලබා දෙයි.

1999 වර්ෂයේදී ගුවන් සේවා ක්ෂේත්‍රයට එක්වූ චාමර පෙරේරා මහතා දශක දෙකක කාලයක් පුරා ජාතික ගුවන් සේවය සමග කටයුතු කරයි. ඔහු ගුවන් සමාගමේ කළමනාකරණ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයකම සේවය කර ඇති අතර 2012 දී තොරතුරු තාක්‍ෂණ ප්‍රධානී ලෙස පත් විය. පසුව 2021 දී ශ්‍රීලංකන් සමූහයහි තොරතුරු තාක්‍ෂණ අංශයේ වගකීම එම මහතා හට පැවරී ඇත.

එම මහතා ශ්‍රීලංකන් සමූහයේ ගුවන් සේවා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය සහ ඩිජිටල් පරිසර පද්ධති ලෝක ව්‍යාප්ත මෙහෙයුම් වල නිරත තීරණාත්මක ගුවන් සේවා පද්ධතිවල සහ ව්‍යාපාරික තොරතුරු තාක්‍ෂණ විසඳුම් දක්වා ගුවන් සමාගම් සමූහයේ ඩිජිටල් පරිවර්තන උපාය මාර්ග කටයුතු සොයා බලයි. පෙරේරා මහතා ගුවන් සේවා වල තාක්‍ෂණික භාවිතය ඉහළ නැංවීම සඳහා ගුවන් ප්‍රවාහන ක්‍රියාවලීන් හි විවිධ ස්පර්ශක ස්ථාන හරහා මගී කේන්ද්‍රීය ඊ-ව්‍යාපාරික විසඳුම් සහ සේවාවන් ස්ථාපිත කිරීම සඳහා තාක්‍ෂණික නවෝත්පාදනයන් හි බොහෝ පුරෝගාමී ක්‍රියාත්මක කිරීම් මෙහෙයවීය. කඩිනම් සංචාරක තාක්‍ෂණ අනුවර්තනයන් සඳහා වූ IATA ව්‍යාපාරය සරල කිරීමේ වැඩසටහන (StB) ව්‍යාපාර

මෙහෙයවීම සඳහා දත්ත පදනම් කරගත් ගුවන් සේවා වේදිකාවක් ක්‍රියාත්මක කිරීම, ගුවන් ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් සේවා උප පද්ධති වලට අනුකූල වීම එතුමාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපාර කාර්යයක් වේ. ශ්‍රීලංකන් ගුවන් සමූහය සඳහා තොරතුරු තාක්‍ෂණ පාලන ප්‍රමිතීන් සාක්‍ෂාත් කර ගැනීමට ද එතුමා කටයුතු කළේය. ISO/ IEC 27001:2013 තොරතුරු ආරක්‍ෂක කළමනාකරණය, ISO/9001: 2015 මෘදුකාංග තත්ව කළමනාකරණය සහ ISO/ IEC 20000:2018 තොරතුරු තාක්‍ෂණ සේවා කළමනාකරණය සඳහා ශ්‍රීලංකන් තොරතුරු තාක්‍ෂණය සහතික වී ඇත. ජාතික ගුවන් සේවයේ සමස්ත තාක්‍ෂණික පිරිවැය තාර්කික කිරීම සඳහා මිල අධික පැරණි ගුවන් සේවා පද්ධති පිරිවැය ඵලදායි හා නවෝත්පාදන කට්ටලයක් සමග වෙනස් කිරීමට හා ප්‍රතිස්ථාපනය කිරීමට පෙරේරා මහතා නායකත්වය ලබා දී ඇත. තවද, ගුවන් සේවා ප්‍රජාව සඳහා අලෙවි කළ හැකි සේවා හා විසඳුම් සකස් කරමින් එතුමාගේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ වැඩි දියුණු කිරීම සහ විසඳුම් සඳහා ජාතික හා ජාත්‍යන්තර සම්මාන දිනාගෙන ඇත.

පෙරේරා මහතා ලයිස්ටර් විශ්ව විද්‍යාලයේ (එක්සත් රාජධානියේ) තොරතුරු තාක්‍ෂණ කළමනාකරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලන (MBA) උපාධියක් ලබා ඇත. මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc උපාධියක් ලබා ඇති එතුමා වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකි. පෙරේරා මහතා තොරතුරු තාක්‍ෂණ විශේෂීකරණයන්ට අදාළ වෘත්තීය සුදුසුකම්, සහතිකපත් සහ ජාත්‍යන්තර ආයතනවල පිළිගැනීම් ලබා ඇත.

## චාමර රණසිංහ මහතා

### *ගුවන් භාණ්ඩ අංශ ප්‍රධානී*

චාමර රණසිංහ මහතා 2013 දී ගුවන් භාණ්ඩ ප්‍රධානී ලෙස සමාගමට එක්විය. එතුමාට පාරිභෝගික සේවා, භාණ්ඩ වෙන් කිරීම්, භාණ්ඩ විකුණුම් සහ අලෙවිකරණය සහ ගුවන් තොටුපළ භාණ්ඩ මෙහෙයුම් ක්ෂේත්‍රයේ වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇත.

සමාගමට සම්බන්ධ වීමට පෙර එම මහතා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කීර්තිමත් ජාත්‍යන්තර ගුවන් සමාගම් වල උසස් කළමනාකරණ තනතුරු දැරීය.

## දිමුතු තෙන්නකෝන් මහතා

### *ලෝක ව්‍යාප්ත විකුණුම් හා බෙදා හැරීමේ ප්‍රධානී*

දිමුතු තෙන්නකෝන් මහතා, ලෝක ව්‍යාප්ත මගී විකුණුම්, ජාලය පුරා විකුණුම් නාලිකා කළමනාකරණය සහ ගුවන් සමාගමේ විකුණුම් මෙහෙයුම් සඳහා නායකත්වය දෙමින් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ලෝක ව්‍යාප්ත විකුණුම් හා බෙදා හැරීමේ ප්‍රධානී ලෙස කටයුතු කරයි. වර්තමාන භූමිකාවට 2017 අප්‍රේල් මාසයේදී පත් කරන ලද තෙන්නකෝන් මහතා ගුවන් සේවා විකුණුම්, මූල්‍ය කළමනාකරණය, ආදායම් කළමනාකරණය සහ වාණිජමය සැලසුම්කරණය පිළිබඳ වසර 25 ක පළපුරුද්දක් ඇති අයෙකි.

1992 වසරේ දී ශ්‍රීලංකන් පවුලට සම්බන්ධ වූ තෙන්නකෝන් මහතා මුල් කාලයේදී ආදායම් සැලසුම් කිරීම, උපලේඛන සැලසුම් කිරීම, මාර්ග කළමනාකරණය සහ මිල ගණන් පිළිබඳ දෙපාර්තමේන්තුන් හී සේවය කර ඇත. ඔහුගේ විදේශීය කාර්යයන් තුළ ඩුබායි, කැනඩාව සහ ඉන්දියාව තුළ ජාතික කළමනාකරු ලෙස සහ ආසියා පැසිෆික් සහ මැද පෙරදිග කලාප සඳහා කලාපීය කළමනාකරුගේ භූමිකාවන් ඇතුළත් වේ. තවද, ඔහු ඕමාන් එයාර් ආයතනයේ උතුරු ඉන්දියාවේ කළමනාකරු ලෙස කටයුතු කර ඇත.

ලෝක ව්‍යාප්ත විකුණුම් කාර්යයන්ට නායකත්වය දීමට පෙර තෙන්නකෝන් මහතා වාණිජ මෙහෙයුම් සාමාන්‍යාධිකාරී ලෙස සේවය කර ඇති අතර එහිදී ඔහු ප්‍රාදේශීය විකුණුම්, විකුණුම් සංවර්ධන, නිෂ්පාදන සංවර්ධන, පාරිභෝගික කටයුතු, කර්මාන්ත කටයුතු, ශ්‍රීලංකන් නිවාඩු, ඊ-වාණිජ්‍යය, නාලිකා කළමනාකරණය සහ පාරිභෝගික පක්ෂපාතීත්ව අංශ පිළිබද පාලන කටයුතු සිදුකිරීම, ජාත්‍යන්තර ගුවන් සේවා ව්‍යාපාර සහ අලෙවිකරණ ව්‍යුහයන් පිළිබඳ ඔහුගේ දැනුම හා පළපුරුද්ද පිළිබඳ පුළුල් පරාසයන් විදහා දක්වන ලදී.

තෙන්නකෝන් මහතා මිල ගණන්, මාර්ග කළමනාකරණය, උපලේඛන සැලසුම් කිරීම සහ ආදායම් සැලසුම් විෂය ක්ෂේත්‍රයන්හි සිය ප්‍රවීණතාවය විදහා දක්වමින් දැඩි කර්මාන්ත තරඟය සාර්ථකව ජය ගැනීම සඳහා වූ අනාගත විකුණුම් උපාය මාර්ග සඳහා ඉහළ පිළිගැනීමකට ලක් විය.

ක්‍රියාකාරී හා ප්‍රතිඵල මත පදනම් වූ වාණිජ භාවිතයන් වෙනුවෙන් පෙනී සිටි තෙන්නකෝන් මහතා සිය උපායමාර්ගික සැලසුම්කරණය සහ නවෝත්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ යෝජනා සඳහා ප්‍රසිද්ධ වී ඇත. ඔහු ආයතනික වර්ධනය සහ දිගු කාලීන තිරසාර වෙළෙඳපොළ භාවිතාවන් සඳහා කැපවූ නායකයෙකි.

කොළඹ විශ්වවිද්‍යාලයේ- නීති පීඨයේ උපාධිධරයෙකු වන තෙන්නකෝන් මහතා, ශ්‍රීලංකා ගුවන් නියෝජිත මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ද, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

## බුද්ධිකා මානගේ මහත්මිය

### *මානව සම්පත් හා ගුවන් මැදිරි සේවා ප්‍රධානී*

බුද්ධිකා මානගේ මහත්මිය 2003 වසරේ දී කළමනාකරණ පුහුණුකරුවෙකු ලෙස ගුවන් සේවයට බැඳුණු අතර 2004 දී වාණිජ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරිනියක් ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. එතුමියට ගුවන් සමාගම තුළ වසර 17 ක පළපුරුද්දක් ඇති අතර, වාණිජ ප්‍රසම්පාදන විධායක ව්‍යාපෘති, ජ්‍යෙෂ්ඨ ගුවන් සේවා විධායක නිලධාරී (පරිපාලක සහ කාර්ය මණ්ඩල සේවා), ගුවන් ගමන් සේවා කළමනාකාරිනී (පරිපාලක හා කාර්ය මණ්ඩල උපලේඛනගත කිරීම), කළමනාකාරිනී මානව සම්පත් සංවර්ධන හා ව්‍යාපාර හවුල්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී මානව සම්පත් සංවර්ධන හා ව්‍යාපාර හවුල් සහ කැබින් සේවා ප්‍රධානී. ගුවන් මැදිරි සේවා ප්‍රධානී තනතුරට අමතරව, 2020 ජනවාරි සිට වැඩබලන මානව සම්පත් ප්‍රධානීතුමිය ලෙස ද එතුමිය පත් කෙරිණි. 2020 ජූලි සිට බලපැවැත්වෙන පරිදි එතුමිය මානව සම්පත් හා ගුවන් මැදිරි සේවා යන අංශ දෙකේම "මානව සම්පත් සහ ගුවන් මැදිරි සේවා ප්‍රධානීතුමිය" ලෙස ස්ථිරව පත් විය.

2020 සැප්තැම්බර් මාසයේදී ඇය ගුවන් සේවයේ රාජකාරි වලට අමතරව ශ්‍රීලංකන් කේටරින් හි මානව සම්පත් කාර්යය අධීක්ෂණය සඳහා "මානව සම්පත් හා මැදිරි සේවා සමූහ ප්‍රධානී" ලෙස පත් වන ලදී.

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සහ කේටරින් හි සමස්ත මානව සම්පත් ක්‍රියාකාරිත්වය සහ ගුවන් සේවයේ කැබින් කාර්යය මණ්ඩලය පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම ඇයගේ විෂය පථයට යටත් වේ.

එතුමිය ශ්‍රීලංකන් ගුවන් සමාගම සහ ශ්‍රීලංකන් කේටරින් යන අංශ දෙකෙහිම මණ්ඩලයේ "මානව සම්පත් හා වේතන කමිටුවේ" (HRRC) ලේකම් ලෙස ද කටයුතු කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

එතුමිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් ද, මොරටුව විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ MSc උපාධිය ලබා ඇති අතර IPM වෙතින් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකමක් ද ලබා ඇත. බුද්ධිකා මහත්මිය කම්කරු නීතිය, සැපයුම් දාම කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි ද සුදුසුකම් සපුරා ඇත.

## කැප්ටන් පැට්රික් ප්‍රනාන්දු මහතා

*ගුවන් මෙහෙයුම් ප්‍රධානී (ගුවන් නියමු කණ්ඩායම)*

එයාර් ලංකා ලෙස හැඳින් වූ 1992 වසරේ දී ශ්‍රීලංකන් සමාගම සමග එක්වූයේ ඔහු L1011 කණ්ඩායමේ කැඩෙට් නියමුවරයෙකු ලෙසය. ඔහු L1011, A320, 330 සහ A340 ගුවන් යානා පියාසර කර ඇත. වසර 20 කටත් වැඩි කාලයක් කපිතාන්වරයෙකු ලෙසත් වසර 15 කටත් වැඩි කාලයක් උපදේශකවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. 2011 වසරේ දී නියෝජ්‍ය ප්‍රධාන නියමු පුහුණුව හා ප්‍රමිති සහ පසුව ප්‍රධාන නියමු පුහුණුව හා ප්‍රමිති වශයෙන් කළමනාකාරීත්වයට සම්බන්ධ විය.

A320/330 කණ්ඩායමේ වත්මන් අණ දෙන නිලධාරීතුමන්, සිමියුලේටර් සහ රේඛා උපදේශක මෙන්ම CAASL සඳහා නියම කළ පිරික්සුම් නියමුවරයෙකු ද වේ.

## සමින්ද පෙරේරා මහතා

*අලෙවිකරණ ප්‍රධානී*

සමින්ද පෙරේරා මහතා විසින් 2015 ජූනි මස සිට ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන උපායමාර්ගය මෙහෙයවනු ලැබේ. උපායමාර්ගික අලෙවිකරණය සහ ගෝලීය විකුණුම් පිළිබඳ විශේෂඥයකු ලෙස ඔහු දශක දෙකකට වැඩි කාලයක් ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවය කරනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම එමිරේට්ස් යටතේ පැවති කාලයේ එහි වාණිජ විධායකයෙකු ලෙස සම්බන්ධ වූ පෙරේරා මහතා අර්බුද සන්නිවේදන අධ්‍යක්ෂකතුමා, ආයතනික සිදුවීම් සහ ප්‍රවර්ධන කළමනාකාරතුමා, ආයතනික සන්නිවේදන වැඩබලන ප්‍රධානී, ප්‍රංශයේ වාණිජ කළමනාකාරතුමා, ශ්‍රී ලංකාව සහ මාලදිවයින කලාපීය කළමනාකාරතුමා, ලෝක ව්‍යාප්ත විකුණුම් සාමාන්‍යාධිකාරී සහ ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ආයතනික සන්නිවේදන සාමාන්‍යාධිකාරී වැනි ගුවන් සේවයේ ප්‍රමුඛ තනතුරු රැසක් දරන්නට විය. එමෙන්ම ඔහු ඕමාන් එයාර් හි අලෙවිකරණ සන්නිවේදන කළමනාකරතුමා ලෙස මෙන්ම ප්‍රංශයේ යුනෙස්කෝ හි උපදේශක/ඇගයුම්කරු ලෙස ද කටයුතු කර ඇත.

ඔහු එයාර්ලයින්ස් හි විකුණුම් අංශයේ සේවය කරන කාලය තුළ, ගුවන් සමාගමේ හරස් මායිම් වෙළඳපොළ තත්වය අවධාරණය කරමින් ගෝලීය විකුණුම් උපායමාර්ග යක් සංවර්ධනය කිරීම සහ ව්‍යාපාරික බුද්ධිය භාවිතයෙන් විකුණුම් කණ්ඩායම් ප්‍රතිසංවිධානය කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ජාලය පුරා සිටින කලාපීය කළමනාකරුවන් සහ දේශීය කළමනාකරුවන් මෙහෙයවීමට සහ අලෙවි ප්‍රවර්ධනය සඳහා ව්‍යාපාරික බුද්ධිය සහ විශ්ලේෂණ භාවිත කළ හැකි අභ්‍යන්තර සංස්කෘතියක් ගොඩනගා ගැනීමට මූලික වී ඇත. ඔහුගේ විකුණුම් සේවා කාලය තුළ ප්‍රධාන සන්ධිස්ථානය වන්නේ, ඇමරිකානු ඩොලර් මිලියන 780 ක සමස්ත ජාල මගී ආදායම් ඉලක්කයක් වාර්තා කිරීම සහ ශ්‍රී ලංකාවේ වෙළඳපොළ කොටස 23% සිට 33% දක්වා පුළුල් කිරීමයි.

පෙරේරා මහතා හට ගුවන් සේවා ප්‍රතිරූප ප්‍රවර්ධනය, ගුවන් සේවා අලෙවිකරණයේ ශක්තිමත් මූලිකාංග මත ගොඩනැගුණු නවෝත්පාදක අලෙවිකරණය හරහා මගී ධාරිතාව වර්ධනය පිළිබඳ කැපීපෙනෙන පසුබිමක් ඇත. අලුතින් ස්ථාපිත වෙළඳපළ/ගමනාන්තය තුළ සන්නාමය ස්ථාවර කිරීම, අලෙවිකරණ නවෝත්පාදනයන් සහ පාරිභෝගික කේන්ද්‍රීය, සාකල්‍ය සන්නිවේදනය වැනි ක්ෂේත්‍ර වෙත ද ඔහු විශේෂඥතාවයක් පෙන්නුම් කරයි. ඔහු ජාත්‍යන්තර සංසදවලදී කැපී පෙනෙන ගෝලීය වශයෙන් පිළිගත් අලෙවිකරණ සන්නිවේදන ප්‍රයත්නයන් රැසක එයාර්ලයින්ස් අලෙවිකරණ කණ්ඩායමට නායකත්වය සපයා ඇත.

ඔහු වාණිජ ගුවන් සේවා ලෝකයේ නව්‍ය ක්‍රම ගවේෂණය කිරීමට සහ අභියෝග ජය ගැනීමට උනන්දුවක් දක්වන ගතික සහ ආදර්ශමත් නායකයෙකි. ඔහුගේ වගවීම, ක්‍රියාශීලී සහ ස්ථිර ප්‍රවේශය සහ සුවිශේෂී අන්තර් පුද්ගල කුසලතා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි ප්‍රතිරූපය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට හේතු වී ඇත.

ඔහු ඉංග්‍රීසි, ප්‍රංශ සහ සිංහල යන භාෂාවන්හි නිපුණත්වයක් ඇති ත්‍රෛභාෂිකයෙකි.

## සංජීව ජයතිලක මහතා

*ජ්‍යෙෂ්ඨ කළමනාකරු ගුවන් තොටුපළ සහ ගොඩබිම් සේවා*

2020 දෙසැම්බරයේ දී ගුවන් තොටුපල සහ ගොඩබිම් සේවා අංශයේ නායකත්වය සඳහා රවි සංජීව ජයතිලක මහතා පත් කරන ලද අතර පසුගිය වසර 15 පුරාවටම ඔහු ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සේවය කළේය. ශ්‍රීලංකන් හි දී ඔහු මානව සම්පත් සංවර්ධන කළමනාකාරතුමන් ලෙස ආරම්භ කළ අතර පසුව ඔහු ලෝක ව්‍යාප්ත මගී විකුණුම් අංශයට යාමට පෙර නිෂ්පාදන සංවර්ධන දෙපාර්තමේන්තුව කළමනාකරණය කිරීමට කටයුතු කළේය.

එතුමා ශ්‍රී ලංකා සහ ඕස්ට්‍රේලියා රටවල් හි ජාතික කළමනාකරු වශයෙන් සේවය කළේය. ඔහු ශ්‍රීලංකන් ආයතනයට බැඳීමට පෙර ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත හා අර්ධ රාජ්‍ය අංශයන් හි සේවය කර ඇත.

සංජීව මහතා දකුණු ක්වීන්ස්ලන්ත විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් පිළිබඳ MBA උපාධියක් ලබා ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා ඇත.

## ප්‍රීමාල් ද සිල්වා මහතා

*සාමාන්‍යාධිකාරී ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය*

1988 දී සමාගමේ ගුවන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවයට එක් වූ සිල්වා මහතා 2006 වන තුරු ජ්‍යෙෂ්ඨ ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. දැනට ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයේ සාමාන්‍යාධිකාරී තනතුර දරන අතර වගකීම් කළමනාකරු (147 කොටස), ගුවන්යානා නඩත්තු සහ පුහුණු සංවිධානය සඳහා වගකීම් දරනු ලැබේ. මෙම පත්වීමට පෙර ගුවන් මැදිරි ආරක්ෂක කළමනාකරු සහ යානාවන් තුළ මෙහෙයුම් සහ පුහුණු කටයුතු කළමනාකරු ලෙසද සිල්වා මහතා කටයුතු කරන ලදී.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ MBA උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයෙන් පුහුණු හා සංවර්ධන පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හිමිකරගෙන ඇත. ඔහු මේ වන විට කොළඹ විශ්ව විද්‍යාලයේ කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ MBA උපාධිය සඳහා අධ්‍යයන කටයුතු සිදු කරයි.

## ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා

***සාමාන්‍යාධිකාරී ගුවන්තොටුපළ හා ගොඩබිම් සේවා***

ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 23 ක සේවා කාලයකින් පසුව වර්ෂ 2012 දී වේරගම මහතා සමාගමේ සේවයට එක් විය. ත්‍රිවිධ හමුදා පරිසරය ආශ්‍රිත පුහුණුව හා පළපුරුද්දට අමතරව ඒ මහතා එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි ද සේවය කර ඇත. සමාගමේ මානව සම්පත් ගුවන් යානාස්ථ හා ආරක්ෂක අංශ වලට සේවා සැපයූ වේරගම මහතා ගුවන්තොටුපළ හා ගොඩබිම් සේවා අංශයේ ප්‍රධානියා ලෙස 2016 වසරේ පෙබරවාරි මාසයේ දී පත් කරන ලදී. බන්දුල මහතා, 2020 අප්‍රේල් මාසයේදී භාරගත් පත්වීමක් වශයෙන් කණ්ඩායම් ආරක්‍ෂක අංශයේ කටයුතු මෙහෙයවයි.

කැළණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් හිමි වේරගම මහතා පාකිස්තානයේ ක්වෙට්ටා විශ්වවිද්‍යාලයේ MSc උපාධියක් ද ලබාගෙන ඇත.

## කේ. අර්ජුන කපුගීකියන මහතා

***ජ්‍යෙෂ්ඨ කළමනාකාර- ගුවන් යානා නඩත්තු කටයුතු***

අර්ජුන කපුගීකියන මහතා, එවකට එයාර්ලන්කා ලෙස හැඳින්වූ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්හි ඉංජිනේරු අංශය සමග 1984 වසරේදී ආධුනිකයෙකු ලෙස සම්බන්ධව, 2018 මැයි මස ගුවන් යානා නඩත්තු කිරීමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරතුමා ලෙස පත් වුවේය. ඔහු දැනට සමාගමේ ගුවන් යානා ඉංජිනේරු අංශයේ සේවය කරනු ලබයි.

ඔහු, එයාර්බස් A320/330/340 ගුවන් යානා සඳහා සහතික ලත් වරප්‍රසාද සහිත බලපත්‍රලාභී ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරයෙකි. ඔහු ඉංජිනේරු සහ නඩත්තු අංශයේ බොහෝ කළමනාකාර තනතුරු දැරීය. බහු සංස්කෘතික පරිසරයක් තුළ 1988 වසර සිට 1991 වසර දක්වා ඔහු ගල්ෆ් ගුවන් යානා නඩත්තු සමාගමෙහි කෙටි කාලයක් සේවය කළේය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් ගුවන් යානා නඩත්තු බලපත්‍රයක් හිමි කපුගීකියන මහතා, කේම්බ්‍රිජ් (එංගලන්තය) විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

## ක්‍ෂානක සපරමාදු මහතා

***කළමනාකාර - ආදායම් කළමනාකරණය***

2000 වසරේ පුහුණු කළමානකාර ලෙස ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්හි සේවයට බැඳෙමින්, 2001 වසරේදී ඔහු වාණිජ අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ක්ෂේත්‍රයේ වසර 20කට වැඩි අත්දැකීමෙන් පරිපූර්ණ ඔහු, කළමනාකරණ මට්ටමෙහි වසර 15කට වැඩි කාලයක් සේවය කර ඇත. වර්තමානයේ එයාර්ලයින්ස්හි ආදායම් කළමනාකරණය, ජාල සැලසුම්කරණය සහ ජාත්‍යන්තර සම්බන්ධතා ක්‍රියාකාරීත්වය ඔහු විසින් මෙහෙයවනු ලබයි.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ විශේෂඥ උපාධියක් සහ ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ IATA ඩිප්ලෝමාවක් (මොන්ට්‍රියල්) මෙන්ම, වරලත් කළමනාකරණ සහ ගණකාධිකාරණ ආයතනයේ (එංගලන්තය) අවසන් අදියර සමත් වූවෙකි.

## තුෂාරි පෙරේරා මහත්මිය

***කළමනාකාර - සමූහයේ නීති කටයුතු***

තුෂාරි පෙරේරා මහත්මිය ශ්‍රීලංකන් සමූහයේ නීති කටයුතු කළමනාකාරතුමිය ලෙස කටයුතු කරයි. සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි මානව සම්පත් අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, මානව සම්පත් කළමනාකරණයේ විවිධ අංශවල සේවයේ නිරත වූවාය. ඇය කාර්මික සහ කම්කරු සබඳතා සහ සේවකයින් සම්බන්ධ කාරණාහි නඩු පැවරීම් ආදී පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇත. 2013 වසරේදී සමූහ නීති කටයුතු දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ දින සිට, ආයතනික සහ නියාමන කටයුතු, මතභේද විසඳීම, විදේශයන්හි බහු අධිකරණ සහ දේශීය නඩු, බුද්ධිමය දේපළ, කාර්මික සහ කම්කරු සබඳතා සහ නොතාරිස් කටයුතු ඇතුළු සමූහයේ වාණිජ සහ ගුවන් සේවා කොන්ත්‍රාත්තු සෑම අංශයක්ම ඇය විසින් කළමනාකරණය කරනු ලබයි.

පෙරේරා මහත්මිය වෘත්තියෙන් නීතිඥවරියෙකු වන අතර, ඉංග්‍රීසි සහ සිංහල භාෂා සඳහා නොතාරිස් බලපත්‍ර හිමි අයෙකි. ඇය සිය නීති අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ (IPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ද සාර්ථකව සම්පූර්ණ කර ඇත.

## සුදත් මඩපාත මහතා

***ජ්‍යෙෂ්ඨ කළමනාකාර - සමූහයේ ආරක්ෂක කටයුතු***

1995 වසරේදී ගොඩබිම් සේවා පාලන අංශය සඳහා පැටවුම් පාලකවරයෙකු ලෙස භාණ්ඩ අධිකාරී ලෙස සමාගමට ප්‍රථම වරට සම්බන්ධ වූ කපිතාන් සුදත් මඩපාත මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ වසර 27 ක් පමණ සිට සේවය කරනු ලබයි.

1998 වසරේදී ඔහු බලපත්‍රලාභී පියාසර හසුරුවන්නෙකු ලෙස ගුවන් ගමන් මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි සේවයට බැඳුණු අතර, A330/A340 බලඇණියේ පළමු නිලධාරියකු ලෙස උසස් වීමක් ලද්දේය. 2006 වසරේදී ඔහු එතිහාඩ් එයාර්වේයිස් සමග සම්බන්ධ වී, 2010 වසරේදී ඔහු උසස් වීමක් ලද්දේය.

2019 දී ඔහු නැවතත් ශ්‍රීලංකන් කපිතාන්වරයෙකු ලෙස සම්බන්ධ වූ අතර, 2020 වසරේ IOSA සහතික කිරීමේ විගණන සැකසීම සඳහා IOSA විගණන උපදේශකවරයෙකු ලෙස ගිවිස ගන්නා ලදී.

කපිතාන් මඩපාත මහතා එයාර්ලයින්ස්හි අභ්‍යන්තර පුහුණුව ඇතුළු EASA, IATA එයාර්බස් සහ බොයිං වෙතින් ආරක්ෂිත කළමනාකරණ පද්ධතිය සහ තත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා ඇත. ඔහු දැනට MBA උපාධිය ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටී.

# ව්‍යාපාර අවදානම් කළමනාකරණය

### අවදානම් පාලනය

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම විසින් ව්‍යාපාර අවශ්‍යතාවන් සහ අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් පදනම් කරගනිමින් ව්‍යාපාර අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සඳහා කළමනාකරණ ආකෘතික රාමුවක් ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සඳහා ආකෘතික රාමුව අනුමත කර ඇති අතර එය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සියලු අංශයන් වල ක්‍රියාත්මක කරනු ලබයි.

විගණක කමිටුව, මණ්ඩලයේ පිහිටුවා ඇති ක්‍රියාපටිපාටීන් සොයා බලමින් අධීක්ෂණ වගකීම් පිළිබඳ මණ්ඩලය සඳහා සහය ලබා දෙන අතර ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණයට මාණ්ඩලික සහ කළමනාකරණ මට්ටම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් පිහිටුවාලීම සහ පවත්වාගැනීම පිළිබඳ කළමනාකරණ කාර්යසාධන විශ්ලේෂණයට සහය ලබාදෙයි.

ජ්‍යේෂ්ඨ කළමනාකරණ කමිටුව මගින් අපේක්ෂිත අවදානම් විශ්ලේෂණය සහ උපායමාර්ගික මට්ටමේ අවදානම් ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා උපාය මාර්ග සකස් කරනු ලබයි. දෙපාර්තමේන්තු/ අංශ කළමනාකරුවන් මගින් ඔවුන් වගකියනු ලබන ක්ෂේත්‍රයේ අවදානම් හඳුනා ගැනීමට සහ එය කළමනාකරණයට ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ වගකියනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ව්‍යාපාරික අවදානම් කළමනාකරණය ක්‍රියාවට නැංවීම සඳහා සමූහ තහවුරුකරණය සහ උපදේශන සේවා පහසුකම් සපයයි.







### අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සම්මත ක්‍රියා පටිපාටීන් මගින් සියලු අංශවල අවදානම් හඳුනාගැනීම, ඇගැයීම, කළමනාකරණය, වාර්තාකරණය සහ අධීක්ෂණය කිරීම සහතික කරලීමට අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ව්‍යුහගත රාමුවක් ක්‍රියාවට නංවයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි අවදානම් හඳුනාගැනීම, අවදානම් විශ්ලේෂණය, අවදානම් නිරාකරණය සිදු කිරීම, අවදානම් වාර්තාකරණය සහ අධීක්ෂණය අන්තර්ගත වේ.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ, අභ්‍යන්තර සහ බාහිර සාධක අපේක්ෂා කරනු ලබන අතර ක්‍රියාකාරී සහ ව්‍යාපාරික පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට බාධාවක් විය හැකි අවදානම් හඳුනාගනු ලබයි. අවදානම සැලකිය යුතු ඉහළ, මධ්‍යම හෝ පහළ, ලෙස අවදානමේ බලපෑම මත පදනම්ව සහ අවදානම් ලකුණු මත පදනම්ව ශ්‍රේණිගත කරයි. අවදානම් අගය ගණනය කරනු ලබන්නේ සම්භාවිතා ශ්‍රේණිගත කිරීමේ බලපෑම් ශ්‍රේණිගත කිරීම සමග ගුණ කිරීමෙනි.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව සහ දෙපාර්තමේන්තු/ අංශ කළමනාකරුවන් අවදානම් ශ්‍රේණිගත කිරීම් සහ අවදානම් ලකුණු මත පදනම් කරගත් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට වගකීම් දරනු ලබයි. සැලකිය යුතු අවදානම් නිරාකරණය, ප්‍රධාන විධායක නිළධාරී/අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් සමාලෝචනය කරනු ලබයි.

සියලු අවදානම් දත්ත ගබඩා කිරීමේ පද්ධතියක් තුල පවත්වා ගෙන යන අතර අවදානම් හි යාවත්කාලීන බව තහවුරු කිරීමට සහ වත්මන් මෙහෙයුම් පරිසරය පිළිබිඹු කිරීමට අවදානම් පිළිබඳ කටයුතු කරන්නන් හට සෘජුවම ව්‍යාපාරික අවදානම් කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කළ හැකිය.

# ආයතනික පාලන වාර්තාව

සමාගමේ කාර්ය සාධනයේ තිරසාරත්වය සඳහා මනා ආයතනික පාලනයක් අත්‍යවශ්‍ය වන බවත්, කළමනාකාරිත්වයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වන හෙයින් රජය සතු ව්‍යාපාරයන්හි යහපාලන භාවිතයන්ට ද එය ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බවත්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විශ්වාස කරනු ලබයි.

යුතුකම්, වගකීම, විනිවිදභාවය සහ වගවීම යන අංශයන්හි හිතකර සමතුලිතතාව වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ආයතනික පාලන මූලධර්ම සහ භාවිතයන්හි ප්‍රමිතීන් අඛණ්ඩව ඉහළ නැංවීමට සමාගම කැපවී සිටී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය ආයතනික පාලනයේ කොටසක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද පහත සඳහන් නීති සම්පාදන, කේත සහ ස්වේච්ඡා ප්‍රතිපත්ති රාමුවලට අනුකූල වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනත
- සමාගමේ සාංගමික ලේඛන
- 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ යටතේ නිකුත් කරන ලද, රජය සතු ව්‍යාපාරයන් සඳහා ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ.
- අභ්‍යන්තර සමාගම් නීති සහ ක්‍රියාවලි සහ කර්මාන්ත විශේෂිත නීති සහ රෙගුලාසි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

*මණ්ඩලයේ සංයුතිය*

සමාගමේ සාංගමික ලේඛනයන්ට ප්‍රකාරව, භාණ්ඩාගාර ලේකම්තුමා හරහා ක්‍රියා කරනු ලබන ශ්‍රී ලංකා රජය විසින්, සමාගමේ කොටස්වලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් රජය සතු වන තාක් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. රජය සතු ව්‍යාපාර සාර්ථක ව්‍යාපාර බවට පත් කිරීමට හැකියාව ඇති සුදුසුකම් ලත්, දක්ෂ පුද්ගලයින්ගෙන් මණ්ඩලය සමන්විත බව තහවුරු කිරීම සඳහා තේරීම් කමිටුවක් හරහා රජය විසින් අධ්‍යක්ෂවරුන් මණ්ඩලයට පත් කරයි. ව්‍යාපාරයන්හි පොදු අයිතිය රජයට පැවරී ඇති බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකියනු ලබයි.

*අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය*

සමාගමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම උදෙසා සහය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික මගපෙන්වීමක් සපයන අතර, උපායමාර්ගික සැලැස්ම මගින් ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා වලට අනුකූල වන බව තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමතුලිතතාවය සහ බලය සහ අධිකාරිය සඳහා පහසුකම් සලසනු ලබන කළමනාකරණය අතර පැහැදිලි වගකීම් බෙදීමක් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම් වනුයේ;

- විශේෂයෙන්ම උපායමාර්ගික නියෝග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසෙන මෙහෙයුම් තීරණ ගැනීමේදී, කළමනාකරණයට ප්‍රමාණවත් බලයක් පැවරීම තහවුරු කිරීම.
- තීරණ ගැනීම සහ වගවීම සඳහා පහසුකම් සපයන ස්ථිර සහ විශ්වාසනීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් සමාගම සතු බව තහවුරු කිරීම.
- ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතිවල සම්පූර්ණත්වය සහතික කිරීම, අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් පාලනය වැනි පාලන පද්ධති, නීති, රෙගුලාසි සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම.
- මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාවලි ඇතුළු ප්‍රධාන ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර ඇති බවට සහ කාලානුරූපීව යාවත්කාලීන කරන බවට තහවුරු කිරීම.
- සමාගමේ වෙබ් අඩවිය හරහා කිසිදු ව්‍යවස්ථාපිත හෝ මෙහෙයුම් අවශ්‍යතාවලට හානියක් නොවන පරිදි, මූල්‍ය සහ මූල්‍ය නොවන ආකාරයේ උපරිම තොරතුරු එහි පාර්ශවකරුවන්ට හෙළිදරව් කිරීම තහවුරු කිරීම.

අධක්ෂවරුන්ට සිය වගකීම් ඉටු කිරීමට, කාලීන සහ නිවරද්‍ය තොරතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක ලබයි.

- සියලුම අධ්‍යක්ෂවරුන් සඳහා නිවරද්‍ය, අදාළ, කාලෝචිත, පැහැදිලි සහ සමබර තොරතුරු ලැබේ.
- කමිටු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් ප්‍රධාන කළමනාකාරිත්වය අතර තොරතුරු ලබා දීම සඳහා සමාගම් ලේකම්තුමිය සම්බන්ධක ලෙස කටයුතු කරනු ලබයි.
- ප්‍රධාන විධායක නිලධාරීතුමා ඇතුළු අදාළ අංශ ප්‍රධානීන් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දෙනු ලබයි.
- ඊට අමතරව, සමාගමේ තිරසාර මූලපිරීම් වලට අනුකූලව, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන, විද්‍යුත් ලේඛන ලෙස ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාකාරකම් සඳහා සවිමත් තොරතුරු තාක්ෂණයෙන් සහය ලබා ගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ආරක්ෂිත සම්බන්ධතාවයක් හරහා ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන වෙත ප්‍රවේශ වීමට සහ දුරස්ථ රැස්වීම් සඳහා සහභාගී වීමට හැකියාව ලබා දෙනු ලබයි.

*අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත බලය පැවරීම*

මනා පාලනයක් සහ හොඳම භාවිතයන් සපුරාලීම සඳහා එයාර්ලයින්ස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත. පවරන ලද කමිටු වෙත තම විශේෂඥතාවය සහ පළපුරුද්ද දායාද කිරීමට හැකි අධ්‍යක්ෂවරුන්ගෙන් මෙම කමිටු සමන්විත වේ. වගකීම්, යොමු කිරීමේ අනුදේශයන්හි විධිමත්ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ලේකම්තුමා, සමාගම් ලේකම්තුමිය වේ.

සලකා බැලියයුතු ක්‍රියා පටිපාටියන්හි නිශ්චිතව දක්වා ඇති, ඔවුන්ගේ අධිකාරිය සහ වගවීම සම්බන්ධ කරුණු සලකා බැලීමට සහ සාකච්ඡා කිරීමට කමිටු නිතිපතා රැස්වේ. ඔවුන්ගේ නිරීක්ෂණ සහ නිර්දේශ නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

# ආයතනික පාලන වාර්තාව

*අධ්‍යක්ෂවරුන්ට වන්දි පූරණය*

සමාගමේ සාංගමික ලේඛනයන්ට අනුකූලව, අධ්‍යක්ෂවරුන්ට, සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ඔවුන්ගේ තනතුරු අනුව වගකීම් ඉටුකිරීම සඳහා, දරනු ලබන වගකීම් සම්බන්ධයෙන් නීතියෙන් අවසර දී ඇති ප්‍රමාණයට සමාගමෙන් වන්දි පූර්ණයක් ලබා දෙනු ලැබේ. අධ්‍යක්ෂකතුමා විසින් වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියා කර ඇති බව ඔප්පු වුවහොත්, වන්දිය මගින් කිසිදු ආවරණයක් සපයන්නේ නැත. සමාගම වසර පුරාවට අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ වගකීම් රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යනු ලැබ ඇත.

*සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ කාර්යභාරය*

උපායමාර්ගික සහ මෙහෙයුම් කරුණු අතර වෙනස, සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වගකීම් බෙදීම අනුව පැහැදිලිව දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමා, විධායක නොවන පත්වීමක් වන අතර, උපායමාර්ගික ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම, ව්‍යාපාර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම අධීක්ෂණය සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් රැස්වීම් සඳහා ඵලදායී ලෙස සහභාගී වීම ඔහු විසින් තහවුරු කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරිතුමා, එදිනෙදා ව්‍යාපාර කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ නායකත්වය සහ සමූහයේ උපායමාර්ගික සහ මෙහෙයුම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය. සමාගමේ කාර්ය සාධනය, මෙහෙයුම් කටයුතු සහ මානව සම්පත් සම්බන්ධ ඕනෑම ගැටලුවක් සාකච්ඡා කිරීමට සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරිතුමා නිරන්තරයෙන් රැස් වනු ලබයි.

*අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය*

දැනට පවතින අභ්‍යන්තර පාලන රාමුව සකසා ඇත්තේ, අවදානම් කළමනාකරණ රාමුව, මූල්‍ය පාලනය, අභ්‍යන්තර විගණනය සහ ආධාරක ප්‍රතිපත්ති මගිනි. සමාග මේ අභ්‍යන්තර පාලන රාමුවේ පරමාර්ථය වනුයේ, මෙහෙයුම්හි ඵලදායීත්වය සහ උපායමාර්ගික ඉලක්ක සමග මනාව ගැලපීම සහතික කිරීමයි. අභ්‍යන්තර පාලන රාමුව මගින් නිවැරදි, විශ්වාසනීය සම්පූර්ණත්වය සහ කාලෝචිත මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකරණ තොරතුරු සහතික කිරීමට අදහස් කරනු ලබයි. මෙම රාමුව මගින් සදාචාරාත්මක වටිනාකම්, යහපත් ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන් අනුමත කරනු ලබයි.

*ව්‍යවස්ථාපිත අනුකූලතාවය*

අධ්‍යක්ෂකවරුන්, ඔවුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, ශ්‍රී ලංකා රජය, අනෙකුත් නියාමන ආයතනවලට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ එයාර්ලයින්ස් සේවකයන්ට අදාළ ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.



# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

## මූල්‍යමය විමර්ශනය

පැතිරෙමින් පවතින කෝවිඩ් 19 වසංගතයෙන් ගුවන් ගමන් කර්මාන්තයේ ව්‍යසනකාරී බලපෑම් ඇති කළද එය පාලනයට කටයුතු කළ හෙයින් ශ්‍රීලංකන් එයාර්ලයින් තුළ පැතිරීම අවම විය. ලෝකයේ බොහෝ ප්‍රදේශවල දේශීය ගුවන් ගමන් නැවත ඇති වීමත් සමග මගී ගමනාගමන යථා තත්වයට පත්වීම ආරම්භ වුවද, ශ්‍රීලංකාව නොසැලකිය හැකි තරම් දේශීය වෙළෙඳපලක් සහිත කුඩා දිවයිනක් වන හෙයින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට කිසිදු වාසිදායක තත්වයක් නොමැත. මේ හේතුවෙන් 2020/21 මූල්‍ය වර්ෂය ගුවන් සේවා ඉතිහාසයේ මෙතෙක් පැවති අභියෝගාත්මකම වසරක් විය.

පළමුව ඇති වූ ජාත්‍යන්තර දේශසීමා වසා දැමීම සහ දෙවනුව තවමත් ඉහළ යන කෝවිඩ් 19 වසංගතයේ තුන්වන රැල්ලත් ඇති වීම හේතුවෙන් ගුවන් ගමනාගමනවල ඉල්ලුම අනපේක්ෂිත පහත බැස්ම, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අපේක්ෂිත ප්‍රමාණයට වඩා මන්දගාමී විය. කෙසේවෙතත්, පිරිවැය අවම කරන ක්‍රම, මුදල් නාස්තිය අඩු කිරීම, තෝරාගත් පියාසැරීන් වලදී ආදායම් අවස්ථාවන් පවතින ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමුකිරීම සහ ශ්‍රී ලංකා රජයෙන් (GOSL) ලබන සහය කරණකොට ගෙන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ආදායම පහත බැස තිබූ කාලයක පැවැත්ම තහවුරු කරගන්නා ලදී.

මගීන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන්, විශාල ලෙස අඩු වූ මගී ගුවන් ගමන් කාල සටහන උපයෝගී කර ගනිමින් භාණ්ඩ ප්‍රවාහන ආදායම මගින් සමාගමට නව ජීවනාවලියක් ලබා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචනය කරන ලද වසර තුළදී භාවිතයට නොගැනෙන මගී ගුවන් ගමන් යානා  සැලකිය යුතු ප්‍රමාණයක් ගුවන් භාණ්ඩ ප්‍රවාහනය කරන ලද අතර එමගින් භාණ්ඩ ප්‍රවාහනය ආදායම ප්‍රථම වරට මගී ආදායම ඉක්මවා යන ලදී.

සමාලෝචිත වර්ෂය ආරම්භ වූයේ දැඩි ලෙස ජෙට් ඉන්ධන පිරිවැය පහත බසින ලද සහ වාසිදායක මූල්‍ය සංචලනය වැනි සාපේක්ෂ සාර්ව ආර්ථික තත්වයක වුවද, ගුවන් ගමනාගමන පහත වැටීම තුළ එවැනි ලාභයක් දැරීමෙන් ලැබෙන ප්‍රතිලාභ නොසලකා හැරිය හැකිය.

එහි ප්‍රතිඵලයක් ලෙස 2020/21 මූල්‍ය වර්ෂය සඳහා සමූහය මිලියන 49,705 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර එය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 12.6% කින් වැඩිවිය.

ඉහත සඳහන් සමූහයේ අලාභයන් සඳහා ප්‍රධාන මෙහෙයුම් නොවන අයිතමයන් පහත පරිදි ය.

| | රුපියල් මිලියන |
|---|---:|
| මූල්‍ය පිරිවැය | -35,864 |
| විනිමය අලාභ- (මෙහෙයුම්) | -6,339 |
| නැවත ලියූ රඳවාගැනීමේ බද්ධ (WHT) | +16,433 |

2021 අංක 10 දරන දේශීය ආදායම් පනත (සංශෝධිත) ක්‍රියාත්මක කිරීමත් සමග, 2018 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31 දක්වා කාලානුරූපීව විදේශ සැපයුම්කරුවන්ගේ ගෙවීම් සඳහා බදු වගකීම් සඳහා වූ වෙන් කිරීම් සමාලෝචනය කරන ලද මූල්‍ය වර්ෂය තුළදී නැවත ලියන ලදී.

**ජෙට් ඉන්ධන පිරිවැය සංචලනයේ බලපෑම**




සංචලනය: මූල්‍ය වර්ෂය ආරම්භයේදී ජෙට් ඉන්ධන මිල පහත වැටී ඇති අතර එය ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම අඩු මට්ටමක පැවති විට එක ගැලුමකට ඇමරිකානු ඩොලර් ශත 61 ක් විය. කෙසේ වෙතත්, සැපයුමේ බාධා හේතුවෙන් ජෙට් ඉන්ධන මිල ඉහළ දැමූ අතර, 172% ක දළ වර්ධනයක් සමග වසර තුළ ඉහළ යාමක් පෙන්නුම් කෙරුණි. 2020/21 වසර අවසානයේ කෝවිඩ් මට්ටම පෙර තිබූ තත්වයට ජෙට් ඉන්ධන මිල බොහෝ දුරට ළඟා වූ අතර ගැලුමකට එකකට ඇමරිකානු ඩොලර් ශත 166 ක් විය.  (මූලාශය: IndexMundi)

බලපෑම: වසංගතයේ මුල් කාලයේදී අඩු ජෙට් ඉන්ධන මිලෙහි වාසිය සමූහයට ලබා ගත නොහැකි වූ අතර, පසුගිය වසරේ ඉන්ධන මෙහෙයුම් පිරිවැයෙන් 29.3% සිට සමාලෝචනය කළ වර්ෂය තුළදී 12.8% දක්වා අඩු කිරීම හේතුවෙන් සැලකිය යුතු ලෙස අඩු ඉන්ධන පරිභෝජනය වසරින් වසර 72% කින් අඩුවීමක් දක්වන ලදී. වසර අවසානයේදී  ජෙට් ඉන්ධන මිල ඉහළ යාම ගුවන් සමාගමට තවදුරටත් බාධාවක් විය.

### විනිමය අනුපාතික සංචලනයේ බලපෑම




සංචලනය: 2020/21 වසර මූල්‍ය වර්ෂයේ මුල් භාගයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ඉහළ ගිය ශ්‍රී ලංකා රුපියල, කෝවිඩ් මගින් බලපෑමට ලක් වූ අපනයන සහ සංචාරක අංශ වලින් විදේශ විනිමය ඉපැයීම පහත බැසීම හේතුවෙන් දෙවන භාගයේදී සීඝ්‍රයෙන් පහත වැටීමක් වාර්තා කරන ලදී. පසුගිය වසර තුළ 8% ක අවප්‍රමාණයකට සාපේක්ෂව වසර සඳහා වූ අවපාතය 6% කි.

බලපෑම: අවසාන භාගයේ අහිතකර මුදල් සංචලනය මිලියන 19,673 ක විනිමය අලාභයක් ඇති කළ අතර, ප්‍රධාන වශයෙන් ඇති වූ ණය සහ ලීසිං ඇතුළු විදේශ විනිමය වගකීම් වලින් පැන නැඟුණ අතර, වසර සඳහා ශුද්ධ අලාභය 40%ක් ලෙස එය සමූහයේ අදායම සඳහා බලපෑම් කරන ලදී.

### සමූහයේ ඉපැයුම්

සමූහයේ ඉපැයුම් වසරකට පසු එහි පටු බඳ සහිත ගුවන් යානා බොහෝමයක ගුවන් ගමන් බොහෝමයක් අඩාල වූ අතර, විශාල බඳ සහිත ගුවන් යානා අඩු මගී ප්‍රවාහන සාධකය මත ක්‍රියාත්මක වූ අතර, සමූහය වාර්ෂිකව 72.3% ක තියුණු අඩු වීමක් පෙන්වමින් රුපියල් මිලියන 50,929 ක ආදායමක් වාර්තා කරන ලදී. සමූහ ආදායමෙන් 53.9% ක් වූ ගුවන් භාණ්ඩ ප්‍රවාහන ආදායම, සමූහ ඉපැයීම් සඳහා ප්‍රධාන දායකයා වීමෙන් ඉතිහාස ගත විය.

### ආදායම් ප්‍රවණතාව රු. මිලියන වලින්




### සංයුතිය




### ආදායමේ වෙනස් වීම රුපියල් මිලියන




මගී ගුවන් ප්‍රවාහන සේවා සඳහා ඇති ඉල්ලුම අනපේක්ෂිත ලෙස පහත බැසීම වලක්වාලීමට හඳුන්වා දුන් උපාය මාර්ග ගණනාවක් තිබුණද 2020 මට්ටමෙන් ගෙන යන ලද සමස්ත මගීන් සංඛ්‍යාව 96.8% කින් පහත වැටුණි.

ප්‍රධාන ලෙස අඩු කළ ගුවන් ගමන් ප්‍රමාණය නිසා ධාරිතාව අඩු වීම හේතුවෙන් වසරින් වසර 50.5% අඩු වීමක් ගෙන යන ලද භාණ්ඩ ටොන් වලින් පිළිබිඹු වූවද, පසුගිය වසර 22% ක ප්‍රතිශතයට සාපේක්ෂව 78% ක් ලෙස රැගෙන යන ලද මුළු ගෙවීම් සඳහා භාණ්ඩ දායකත්වය ලබා දුන්නද, ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ වැඩි වීමක් ඇති කරමින් 2019/20 වසරේ 7.2% ප්‍රතිශතයට සාපේක්ෂව සාමාන්‍ය ගුවන් යානයක් මගින් රැගෙන යන ලද භාණ්ඩ ටොන් ප්‍රමාණය සැලකිය යුතු ලෙස 23.3%කින් වර්ධනය වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ ආදායම පසුගිය මූල්‍ය වසරට සාපේක්ෂව රුපියල් මිලියන 15,905 සිට රුපියල් මිලියන 27,454 ලෙස වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

**ප්‍රවාහනය කරන ලද මගී සංඛ්‍යාව '000**




**රැගෙන යන ලද භාණ්ඩ ප්‍රමාණය ටොන් වලින්**




**වියදම**

2021 වසරේ සමූහයේ වියදම රුපියල් මිලියන 118,314 ක් වූ අතර, එය 2020 වසරේ සමූහයේ වියදම වූ රුපියල් මිලියන 229,368 න් 48.4%ක සැලකිය යුතු පහත බැස්මක් පෙන්නුම් කළ අතර කෝවිඩ් 19 බලපෑම නිසා ගුවන් ගමන් සීමා කිරීම හේතුවෙන් මෙහෙයුම්වල 68% ක පහළ බැස්මක් දැක්විණ. සමූහයේ වියදම පහත පරිදි ය.

| | 2021 | | 2020 | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලි.) | දායකත්වය % | වටිනාකම (රු. මිලි.) | දායකත්වය % | වටිනාකම (රු. මිලි.) | දායකත්වය % |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | 10,569 | 12.8 | 55,328 | 29.3 | 44,759 | 80.9 |
| සේවක පිරිවැය | 17,112 | 20.8 | 22,903 | 12.1 | 5,791 | 25.3 |
| ගුවන් තොටුපළ අතරමැදි සහ මගී වියදම් | 7,308 | 8.9 | 25,277 | 13.4 | 17,969 | 71.1 |
| ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය | 13,695 | 16.6 | 22,820 | 12.1 | 9,125 | 40.0 |
| ක්ෂය/ක්‍රමක්ෂය | 16,745 | 20.3 | 19,392 | 10.3 | 2,647 | 13.6 |
| කෙටි කාලීන ලීසිං කුලී (ගුවන්යානා සහ අමතර එන්ජින්) | 2,265 | 2.7 | 1,394 | 0.7 | (871) | (62.5) |
| විකිණුම්, අලෙවි හා ප්‍රචාරණ වියදම් | 2,065 | 2.5 | 14,550 | 7.7 | 12,485 | 85.8 |
| ගුවන් සේවක වියදම් | 1,680 | 2.0 | 6,557 | 3.5 | 4,877 | 74.4 |
| විනිමය අලාභය (මෙහෙයුම්) | 6,339 | 7.7 | 5,270 | 2.8 | (1,069) | (20.3) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 4,671 | 5.7 | 15,209 | 8.1 | 10,538 | 69.3 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **82,450** | **100.0** | **188,700** | **100.0** | **106,251** | **56.3** |
| මූල්‍ය පිරිවැය (වෙනත්) | 35,864 | | 40,667 | | 4,803 | 11.8 |
| **මුළු වියදම්** | **118,314** | | **229,368** | | **111,054** | **48.4** |

අඩු කරන ලද මෙහෙයුම් හේතුවෙන් ඉන්ධන පරිමාව 72%කින් පහත වැටීම නිසා මිලියන 39,859 ක ඉන්ධන පිරිවැය අඩු වූ අතර, 2019/20 දී ඇමරිකානු ඩොලර් ශත 203 සිට 2020/21 ඇමරිකානු ඩොලර් ශත 131 දක්වා ඉන්ධන මිල පහත වැටීමේ සාමාන්‍ය, ශ්‍රී ලංකා රුපියල් 5,814 ක් ලෙස ඉන්ධන පිරිවැය තවදුරටත් අඩු කරනු ලැබිණ. කෙසේවෙතත් ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ඉන්ධන මත අහිතකර බලපෑම රුපියල් මිලියන 914 ක් විය.

අඩු වූ ගුවන් යානා සහ මගී සංඛ්‍යාවට සමගාමීව, ගුවන් තොටුපළ සහ මගී වියදම සහ විකුණුම්, අලෙවිකරණය සහ ප්‍රචාරණ වියදම් පිළිවෙලින් 71.1% ක් සහ 85.8% ලෙස පහළ බසින ලදී.

මෙහෙයුම් අඩු වීම හේතුවෙන් කාර්ය මණ්ඩල පිරිවැය 74,4% කින් අඩු විය. තවද, ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීමේ පිරිවැය, මූලිකව භාවිතය අවම වීම හේතුවෙන් 2020 වසරේ රුපියල් මිලියන 22,820 ට සාපේක්ෂව 2021 වසරේදී රුපියල් මිලියන 13,695 දක්වා අඩු විය.

ගුවන් ගමනාගමන ආදායම අඩු වීමෙන් ඇතිවන අලාභය අවම කිරීමට, ලීසිං සමාගම් සමග පුළුල් සාකච්ඡා මගින් කල්බදු ගිවිසුම් ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ගුවන් බදු කුලී අඩු කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පියවර ගෙන ඇති අතර, එමගින් 2020/21 මූල්‍ය වර්ෂය සඳහා ඉතිරි වූ මුදල රුපියල් මිලියන 3,454 (ඇමරිකානු ඩොලර් මිලියන 18 කි) ක් වන අතර, අපේක්ෂිත වාර්ෂික ඉතිරි කිරීම් ඩොලර් මිලියන 27.5 ක් වනු ඇත.

2019/20 දී සැපයූ රුපියල් බිලියන 8 (54%) ක රඳවාගැනීමේ බද්ධ නොමැති වූ හෙයින් අනෙකුත් වියදම් 69.3% කින් පෙර වසරට සාපේක්ෂව අඩු වූ විය. ඊට අමතරව තොරතුරු තාක්ෂණය, නිෂ්පාදන සංවර්ධනය, දේපල සහ සැපයුම්, ගුවන් මෙහෙයුම් සහ ආදායම් කළමනාකරණ ක්ෂේත්‍රයන්ට අදාළ තෙවන පාර්ශවීය ගිවිසුම් නැවත සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2020/21 මූල්‍ය වර්ෂය තුළදී රුපියල් මිලියන 1,510 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 8) ක් ඉතිරි කරගැනීමට හැකි විය.

සමාලෝචිත වසර තුළ වැටුප්/දීමනා අඩු කිරීමත් සමග කොන්ත්‍රාත් සේවකයන්ගේ වැටුප් රහිත නිවාඩු මත සහ විදේශගත සේවකයින්ගේ සේවාව නැවැත්වීම වැනි හේතු නිසා සේවක පිරිවැය 25.3% අඩු විය. මෙමගින් ඉතිරි වූ මුළු මුදල රුපියල් මිලියන 5,791 කි (ඇමරිකානු ඩොලර් මිලියන 30). තවද ස්වෙච්ඡා විශ්‍රාම යෝජිත ක්‍රමයක් (VRS) හඳුන්වා දුන් අතර, එමගින් දළ වශයෙන් වාර්ෂිකව රුපියල් මිලියන 432 ක (ඇමරිකානු ඩොලර් මිලියන 2.3) ඉතිරියක් ලැබෙනු ඇත.

## මුදල් තත්වය

කලබලකාරී වාතාවරණය සහ මූල්‍ය ගලනය ප්‍රමාද වීම හේතුවෙන්, මූල්‍ය වර්ෂය පුරා සමූහය සෘණාත්මක මූල්‍ය තත්වයක් දැරූ අතර, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබුණු ශුද්ධ මූල්‍ය ගලනය ධනාත්මක රුපියල් මිලියන 26,130 සිට සෘණාත්මක රුපියල් මිලියන 30,685 ක් ලෙස 217.4 % කින් පහත වැටුණි.

ගුවන් යානා කල්බදු සමාගම් සමග සාකච්ඡා කිරීමෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මාස 18-14 දක්වා වූ නැවත ගෙවීම් කාලය සමග ඩොලර් මිලියන 80.24 ක් වටිනා කල්බදු සහ නඩත්තු සංචිත ගෙවීම් කල් දැමීමට හැකි විය. මෙය කල් දැමූ ගෙවීම් සැලසුම් සහ අනෙකුත් ප්‍රධාන සැපයුම්කරුවන් සමග මූල්‍ය වර්ෂය තුළ ඇමරිකානු ඩොලර් 35 ක් වූ අතර, මූල්‍ය සැලසුම් පිළිබඳ නිශ්චිතභාවයක් ලබා දෙන ලදී.

තවද, වසර තුළ යොදාගත් මූල්‍ය ගලනය කළමනාකරණ උපායමාර්ගයක් වන්නේ ක්‍රෙඩිට් සුයිසේ බෑන්ක් ඒජී (Credit Suisse Bank AG) මගින් ලබා ගත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමයි. ඇමරිකානු ඩොලර් මිලියන 16.67 ක ප්‍රාග්ධනය 2020 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා මාස 06 ක් තුළදී කල් දමන ලදී.

සමාලෝචනය කරන ලද මූල්‍ය වර්ෂය තුළදී, ශ්‍රී ලංකා රජය විසින් ඩොලර් මිලියන 75 ක ණය පහසුකම් සහ ඩොලර් බිලියන 27.73 ක හිමිකම් ආයෝජන වශයෙන් (ඇමරිකානු ඩොලර් මිලියන 150 කට සමාන) ලබාදුන් අතිමහත් සහයෝගය, ගුවන් සමාගමේ මූල්‍ය බර ක්ෂණිකව ලිහිල් කරන ලදී. තවද, ඇමරිකානු ඩොලර් මිලියන 500 ක ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මුළුමනින්ම අනුමත කරන ලද නැවත ප්‍රාග්ධනීකරණයේ දෙවන වාරිකය වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 18 ක (ඩොලර් මිලියන 90.5 කට සමාන) හිමිකම් ආයෝජනය 2021 අප්‍රේල් මාසයේදී ලැබුණි.

## මූල්‍ය තත්වය

සමූහයේ මුළු වත්කම 2021 මාර්තු 31 දින වන විට රුපියල් මිලියන 157,883 ක් වූ අතර, එයට ප්‍රධාන වශයෙන් රුපියල් 11, 554 ක් වටිනා කල්බදු ප්‍රතිව්‍යුහගත කිරීම සහ රුපියල් මිලියන 16,745 ක ක්ෂය සහ ක්‍රමක්ෂය අදාළ වේ.

**වත්කම - රුපියල් මිලියන**




## මෙහෙයුම් විමර්ශනය

## ආදායම් කළමනාකරණය

අනපේක්ෂිත ලෙස වසංගත තත්වය පැතිරීම සහ ගුවන් ගමනාගමන සඳහා ඉල්ලුම විශාල ලෙස පහත වැටීම, 2020/21 මූල්‍ය වර්ෂය ගුවන් සමාගම සඳහා වඩාත් අභියෝගාත්මක කාලයක් බවට පත් කරන ලදී. 2019/20 මූල්‍ය වර්ෂය අවසානයේදී රටේ දේශ සීමා වසා දැමීමෙන් ඇති වූ දැඩි බලපෑම හේතුවෙන් 2019/20 මූල්‍ය වර්ෂයේ මිලියන 5.5 කට අධික වූ මගීන් සංඛ්‍යාව සමග සංසන්දනය කළ විට ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි මුළු මගීන් සංඛ්‍යාව 167,000 ක් පමණක් වූ අතර, ඒ අනුව මගී ධාරිතාවය 79% පමණ අඩු කරන ලදී.

2020/21 වසර තුළදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මගී ප්‍රවාහනය සේවා ඉල්ලුම බොහෝ විට නොපවතින බැවින් විශාල බඳ සහිත ගුවන්යානා ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වර්ධනය වන වෙළඳපොළ අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට උත්සහ කරන ලදී. සමාන වෙළඳපොළ අරමුණු ඇති ගුවන් සමාගම් සමග ඇති වූ දැඩි තරඟකාරීත්වය හේතුවෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනයට කඩිනමින් කටයුතු කරමින් සහ භාණ්ඩ ඉල්ලුම පවතින වෙළඳපොළ සමග කටයුතු කිරීමට සිදු විය. මෙම වෙළඳපොළට දැනට පවතින සහ නව ගමනාන්ත ඇතුළත් විය. 2020//21 කාලය භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇති ව්‍යාපාර අවස්ථාවන් පදනම් කරගෙන සිඩ්නි, සයිගොන්, ෆ්‍රෑන්ක්ෆර්ට්, හොංකොං, මිලාන් සහ පැරිස් වෙත නව මෙහෙයුම් හඳුන්වා දෙන ලදී. අත්‍යවශ්‍ය මගී ප්‍රවාහන කටයුතු සඳහා භාණ්ඩ ප්‍රවාහනය ක්‍රියාත්මක කළ බොහෝ ගුවන්යානා සීමිත මගී මෙහෙයුම් සඳහා ලබා දෙන ලදී. ඊට අමතරව ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිතිපතා නැවත ගෙන්වා ගැනීම සඳහා සියොල් ද හඳුන්වා දෙන ලදී.

වසර තුළදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් අතරමං වූ ලාංකිකයන් නැවත මවු රටට ගෙන්වා ගැනීමට වෙන් කළ ගුවන්යානා පියාසැරි කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, ජාත්‍යන්තර සේවාදායකයින් වෙනුවෙන් කැපවූ ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව එක්සත් රාජධානිය (චීන ජාතිකයින්), සහ ඕස්ට්‍රේලියාව (ඉන්දියානු ජාතිකයින්) වැනි විදේශ ජාතිකයින් තම මව් රටට ගෙන්වීමට විශේෂ ගුවන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වාතාවරණය යටතේ, 2020/21 මූල්‍ය වර්ෂය සඳහා ගුවන් සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 96.6 ක (රුපියල් බිලියන 18.4) මගී ආදායමක් වාර්තා කළ අතර, සමස්ත ගුවන් ප්‍රවාහන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 243.4 ක් (රුපියල් බිලියන 45.88) ලෙස වාර්තා වූ අතර, 2019/20 වසරෙන් එය 74% ක සමස්ත පහත වැටීමකි.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

පශ්චාත් කෝවිඩ් මගී ඉල්ලුම යථා තත්වයට පත් කිරීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් අඛණ්ඩව පවතින අතර, විශ්වාසදායක වෙළඳපොළ පුරෝකථනයන් නොමැති අවස්ථාවක, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, 2021/22 සහ ඉන් ඉදිරියට ඉදිරි දැක්ම පිළිබඳ සාධාරණ තක්සේරුවක් කිරීමට ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) සහ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) වැනි වෙළඳ ආයතන විසින් කරන ලද ස්වාධීන අවබෝධය තුළින් මඟ පෙන්වීම ලබා ගැනීමට සහ කරුණු අධ්‍යයනයට අදහස් කරනු ලබයි.

## "වන්වර්ල්ඩ්" (oneworld)

2014 මැයි මස 1 වැනි දින වන්වර්ල්ඩ් එකමුතුව සමග ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එක්වන ලදී. මෙම එකමුතුවෙහි සාමාජිකයකු වශයෙන් ගුවන් සේවාව මගින් ලොව පුරා විසිරුණු වන්වර්ල්ඩ් ගමනාන්තයන් 1,100 වෙත පියාසර කිරීමේ අවස්ථාව මගීන් වෙත පිරිනමනු ලැබේ. මේ ඔස්සේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලෝක ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි විශාලතම සහ කීර්තිමත් සන්නාම වන ඇලස්කා එයාර්ලයින්ස්, ඇමරිකන් එයාර්ලයින්ස්, බ්‍රිටිෂ් එයාර්වේස්, කැතේ පැසිෆික්, ෆින්නෙයාර්, අයිබීරියා එයාර්ලයින්ස්, ජපෑන් එයාර්ලයින්ස්, මැලේෂියා එයාර්ලයින්ස්, ක්වන්ටාස්, කටාර් එයාර්වේස්, රෝයල් එයාර් මැරොක්, රෝයල් ජෝර්දානියන් සහ S7 එයාර්ලයින්ස් ආදිය සමග සිය සාමාජිකත්වය බෙදාහදා ගනු ලබන ඉන්දියානු උප මහද්වීපයේ ප්‍රථම ගුවන් සමාගම ලෙස ගෞරවය හිමිවන ප්‍රථම ගුවන් සේවය වන්නේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමයි. එකමුතුව සඳහා 2021 වසරේ එක් වූ නවතම සාමාජිකයා ඇලස්කා එයාර්ලයින්ස් වේ.

මෙම එකමුතුවෙහි සාමාජිකයකු වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය සේවා ජාලය වර්ධනය කරගනිමින් දේශීය මට්ටමේ සිට ගෝලීය මට්ටමට වෙළඳ නාම වටිනාකම නංවමින්, සිය හිතෛෂීත්ව වැඩසටහන ගොඩනැගීමට සහ දැනුම හුවමාරු කරගැනීමේ ක්‍රියාවලියෙහි කොටසක් බවට පත් වීමට සමත් විය. ''වන්වර්ල්ඩ්'' වෙත එහි පිවිසුමක් සමග, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වන්වර්ල්ඩ් සාමාජික ගුවන් සේවා හතරක් ඇතුළුව, ගුවන්සේවා හයක් සමග 'කෝඩ්ෂෙයාර්' සහයෝගීතාවයන්ට එළැඹෙන ලදී.

වන්වර්ල්ඩ් නිතර ගමන් කරනු ලබන (frequent flyer) සාමාජිකයින්හට ව්‍යාපාරික ගුවන් ආසන පංතියේ ඇතුල්වීම (business class check-in), පොරොත්තු ලේඛණයේ ප්‍රමුඛත්වය, අමතර ගමන් මළු දීමනාව සහ ලොව පුරා විවේකාගාර 550 කට අධික සංඛ්‍යාවක් වෙත පිවිසීමේ අවස්ථාවද හිමිවේ. මෙම එකමුතුව මගින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගීන් වෙත පිරිනමනු ලබන කැපී පෙනෙන ප්‍රතිලාභයක් වනුයේ, එහි සියළුම සාමාජික ගුවන්සේවා සමගින් "frequent flyer" සැතපුම් දීමනා උපයා ගැනීමේ සහ වැය කිරීමේ අවස්ථාව සැලසීමයි.

## ලොව පුරා විකිණුම් සහ බෙදාහැරීම්

පසුගිය මූල්‍ය වර්ෂය ශ්‍රීලංකන් සඳහා නිසැකයෙන්ම අභියෝගාත්මක වූවකි. කෝවිඩ් 19 පැතිරීම පාලනය කිරීමේ අරමුණින් නියාමකයන් සහ සියලු කලාපවල රටවල් විසින් පනවා තිබූ සංචාරක සීමා සහ සෞඛ්‍ය පියවර අඛණ්ඩව පැවතීම හේතුවෙන් ගෝලීය වසංගත තත්වය පැතිරීමත් සමග, වසරේ විකුණුම් මෙහෙයුම් පිළිබඳ අපේක්ෂිත සැලසුම් මුළුමනින්ම අඩාල විය. පැමිණෙන සංචාරක වෙළඳපොළ තියුණු ලෙස පහත් තත්වයක පැවතුණ අතර, සංචාරක කර්මාන්තයේ සියළු අනුබද්ධිත සේවා සපයන්නන් ඇතුළු කොටස්හිමියන්ට සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

කෙසේවෙතත්, සංචාරක ක්ෂේත්‍රයේ නව යුගයක ආරම්භය ලෙස පෙනෙන නව මාවත් ඔස්සේ සිය උපාය මාර්ග සකස් කරගත් බැවින්, අනුගතවීමේ හැකියාව ගුවන් සමාගම විසින් පෙන්නුම් කරනු ලැබිණ. පසුගිය වසරට සාපේක්ෂව 89% ක් කාර්යසටහන් සහිත මගී මෙහෙයුම් අඩු වීමක් පෙන්නුම් කළද, ආපසු ගෙන්වා ගැනීමේ උත්සහයන් සහ පෞද්ගලික ව්‍යාපාර සඳහා කාර්ය සටහන් රහිත මගී මෙහෙයුම් සඳහා ඉඩ ලබාදීමට අවධානය යොමු වූ අතර, එය ගුවන් සමාගමෙහි අදායම් කළඹ සඳහා ව්‍යාපාර අවස්ථාවන් උත්පාදනය කරන්නක් විය.

අඛණ්ඩව පැවති ගෝලීය වසංගතය සමග, නියමිත භාණ්ඩ ප්‍රවාහන ගුවන්යානාවල මගී ප්‍රවාහනයන් මූලික කරගනිමින් මුළු මගී ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 96.6 ක් ලෙස මූල්‍ය වර්ෂය අවසන් විය. ඉහළම මට්ටමක ආරක්ෂාව තහවුරු කරමින්, මගීන්ගෙන් ගමනාගමනයට අවම නැවතුම් සහ අවම බාධා සහිතව නැගෙනහිර සිට බටහිරට පහසු සම්බන්ධතා සපයමින් ලබා දුන් දිගු දුර ගුවන් ගමන්, ජාල ආදයමට වටිනා දායකත්වයක් ලබා දෙන ලදී.

වසංගත තත්වය නිසා සංචාරක කර්මාන්තයේ ඇති වූ බලපෑම් තවමත් මැඩපවත්වා ගැනීමට නොහැකි වූ අතර, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් තිරසාර ආදයම් උත්පාදනය සඳහා නව්‍යකරණයන් සහ අනාගත දැක්මක් ඇති මාවතක් දැනටමත් ආරම්භ කර ඇත. අපගේ ප්‍රධාන කොටස්හිමියන් සහ හවුල්කරුවන් සමග ව්‍යාපාර අවස්ථා ඇති කරමින් මගී ආරක්ෂාව සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අවධානය යොමුකරමින් සමාගම විසින් බලාපොරොත්තු සහිත දකුණු කොරියාව, කෙන්යාව, සහ ජර්මනිය වැනි නව වෙළඳපොළ ගවේෂණය කිරීමෙන් ශ්‍රී ලංකාවට සෘජු සම්බන්ධතා සැපයීමේදී සිය තත්වය තහවුරු කිරීමට ඇති කැපවීම පෙන්නුම් කරනු ලබයි. තවද ක්‍රියාශීලී සහ වෙනස්වන මගී අවශ්‍යතා සමග සම්බන්ධවීමට සියලු ප්‍රධාන ශාඛා විකුණුම් තත්වයන් පවත්වා ගෙන යාමට විකුණුම් සහය ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදුකරනු ලබයි.

## විද්‍යුත් වාණිජ්‍යය

විද්‍යුත් වාණිජ්‍යය කර්මාන්තයේ ප්‍රමුඛතම ගුවන් සමාගම් සමග සමව සිය මාර්ගගත අලෙවිකරණ මට්ටම් ගෙන ඒමේ අරමුණු ඇතිව, ශ්‍රීලංකන් විසින් එහි ගුවන් මගී අත්දැකීම් ඉහළ නැංවීම සඳහා නවීන දැක්මකින් සහ වැඩිදියුණු කළ ක්‍රියාකාරකම් වලින් යුතු සිය වෙබ් අඩවිය වන www.srilankan.com, නැවත ආරම්භ කරන ලදී. මෙම වෙබ් අඩවිය ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රමිතීන් සහ පිළිගත් භාවිතයන් සහතික කරමින්, සියළුම උපාංග හරහා වඩා හොඳ කාර්යක්ෂමතාවයෙන් යුතු සේවයක් ලබා දෙයි.



සෘජු නාලිකා සිය කාර්ය සාධන මැනීමේ මෙවලම්, ගූගල් විශ්ලේෂණයන් සම්මත තත්වයේ සිට වැඩි දියුණු කළ සොයා ගැනීම් දක්වා උසස් කළ අතර, එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබා දෙමින් ගුවන් සමාගමට එහි සෘජු නාලිකාවේ ඕනෑම වැඩිදියුණු කිරීමක් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට අවස්ථාව ලබා දෙන ලදී.

සියලුම මගීන් සඳහා මාර්ගගත ක්‍රමයට ගුවන් සේවා ලබා ගැනීමේ ක්‍රියාවලියේ පහසුව සහ නම්‍යශීලීතාව සහතික කිරීම සඳහා, ගුවන් සමාගම WeChat Pay, Alipay (චීනය) සහ POLi (ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය) වැනි නව ගෙවීම් විකල්ප හඳුන්වා දුන්නේය.

ඊට අමතරව, දේශීය බැංකු සඳහා අවස්ථාව ලබා දෙන මාර්ගගත ක්‍රමය සඳහා නව අන්තර්ජාලය හරහා ගෙවීම් දොරටුවක් 2021 නොවැම්බර් මස ආරම්භ කිරීමට නියමිතය.

මාර්ගගත ක්‍රමයෙ පහසුව තවදුරටත් වැඩිදියුණු කරමින්, වීසා බලපත්‍ර ලබා ගැනීම සඳහා මගීන්ට සංචාරක ගමන් විස්තරයක් ලබා ගැනීමට හැකි වන පරිදි, සංචාරක ගමන් විස්තර පහසුකමද ශ්‍රීලංකන් විසින් ක්‍රියාත්මක කර ඇත.

මෙහි තවදුරටත් වැඩිදියුණු කිරීම සමගින්, මාර්ගගත ජාලය පිළිබඳ පාරිභෝගික අත්දැකීම්, එක් පියවරකින් ලෝකය ඔවුන්ගේ ඇඟිලි තුඩුවක දුරින් සමීප කරවීම තුළින් පාරිභෝගික අත්දැකීම් ශක්තිමත් කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අරමුණු කරයි.

### සහායක සේවා

වසංගත තත්වය මධ්‍යයේ මුහුණ දෙන අභියෝග සමග, අසල්වැසියන්ගෙන් තොර ආසන පහසුකම් (Neighbour Free Seats facility) වැනි සහායක නව සේවාවන් එක් කරමින් ශ්‍රීලංකන් වසර පුරා අඛණ්ඩ සිය සේවා පිරිනැමීම ශක්තිමත් කර තිබේ. මෙමගින් සාමාන්‍ය පංතියේ (Economy Class) මගීන්ට වඩාත් සුවපහසු, විවේකී සහ සමාජීය දුරස්ථභාවය තබා ගනිමින් සංචාරය කිරීම සඳහා යාබද අසුනක් හෝ මුළු පේළියක්ම වෙන් කරවා ගැනීමටද හැකි විය.




ඊට අමතරව සාමාන්‍ය පන්තියේ මගීන්ට බොත්තමක් ස්පර්ශ කිරීමෙන් ව්‍යාපාරික පන්තියට වෙනස් කිරීමට ඉඩ සලසන "Instant Upgrade" නමින් හැඳින්වෙන පහසුකම දියත් කිරීමට ගුවන් සමාගම සිය හවුල්කරුවන් සමග කටයුතු කරමින් සිටී. මෙම නව විශේෂාංග, කලාපයේ වඩාත්ම පාරිභෝගික කේන්ද්‍රීය ගුවන් සේවය වීමේ ආයතනික දැක්මට අනුකූල වේ.

ගුවන් සේවා කර්මාන්තයේ සහායක සේවා ආදායමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉදිරි වසරවලදී සහාය සේවා වැඩි දියුණු කිරීම අඛණ්ඩව කරගෙන යාමට අධිෂ්ඨානය දමා ඇත.

### නියෝජිත ජාල කළමනාකරණය

සාමාන්‍ය ගුවන් කාලසටහන් නැවත ආරම්භ වූ පසු සංචාරක නියෝජිතයන් සඳහා සෘජු වෙන් කිරීමේ ක්‍රමයක් වන ඒජන්සි වෙන් කිරීමේ උපකරණය ආරම්භ කිරීමට සූදානම්ය. සෘජු සම්බන්ධතාවය මගින් සංචාරක නියෝජිතයන්ට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමග සෘජුවම ගුවන් සේවා වෙන් කරවා ගැනීමට හැකිවන අතර ගෝලීය බෙදා හැරීමේ පද්ධති සඳහා දරන වත්මන් පිරිවැය අවම කිරීමට හැකි වේ. IATA හි නව බෙදා හැරීමේ හැකියාව සඳහා 4 වෙනි මට්ටමේ සහතිකය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නියෝජිත වෙන්කිරීමේ පදනම සඳහා ලබාගෙන ඇති අතර, එය NDC හි ඉහළම මට්ටමයි. NDC ගුවන් සේවය සහ සංචාරක නියෝජිතයින් අතර සන්නිවේදනය වැඩි දියුණු කරන අතර, එමගින් වඩාත් කාර්යක්ෂම වෙළඳ භාණ්ඩ, තරඟකාරී යෝජනා සහ නිෂ්පාදන පුද්ගලීකරණය සඳහා ඉඩ සැලසේ. පවතින වෙළඳපොළ සහ නිෂ්පාදන වෙනස වැනි වර්තමාන බෙදා හැරීමේ සීමාවන්ද එමගින් විසඳෙනු ඇත.

### පාරිභෝගික පක්ෂපාතිත්වය

වඩාත්ම විශ්වාසවන්තම පාරිභෝගිකයින්, වෙත FlySmiLes ගුවන් යානයේ නිතර පියාසර කිරීමේ වැඩසටහන මගින් වටිනා ත්‍යාග සහ පිළිගැනීම් ලබා දෙමින් මෙතෙක් අභියෝගාත්මක සහ අවිනිශ්චිත වසරක් ගත කරන ලදී.

FlySmiLes සාමාජිකයින්ට ආහාරපාන, ජීවන රටාව, බැංකුකරණය සහ විදුලි සංදේශනය සඳහා වන්වර්ල්ඩ් ගුවන් සේවා හවුල්කරුවන් සහ තවත් දේශීය සහ ජාත්‍යන්තර ගුවන් නොවන හවුල්කරුවන් කිහිප දෙනෙකු සමග සැතපුම් එකතු කරගැනීම සහ වැය කිරීමට හැකිය. වන්වර්ල්ඩ් එකමුතුවේ සාමාජිකයෙකු වශයෙන්, මෙම වැඩසටහනේ ගෝල්ඩ් සහ ප්ලැටිනම් සාමාජිකයින් විසින් ලොව පුරා ගමනාන්ත 1,000කට වැඩි ප්‍රමාණයක් සම්බන්ධ කරමින් ස්ථාන 600 කට අධික සංඛ්‍යාවක් විවේකාගාර පහසුකම් භුක්ති විඳිනු ලැබෙති.

පවතින වසංගත තත්වය හේතුවෙන් සාමාජික ක්‍රියාකාරකම් සීමා වූ හෙයින්, සාමාජිකයින්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම සහ වරප්‍රසාද සඳහා බාධා නොවීමට පියවර කිහිපයක් ගෙන ඇත. සාමජිකයින් තම සුදුසුකම් ලැබීම් බාධාවකින් තොරව භුක්ති විඳීමට හැකි බව සහතික කිරීම සඳහා සැතපුමක් කල් ඉකුත් වීම් දීර්ඝ කිරීම්, දීර්ඝ කිරීම් මට්ටම් සහ හවුල්කාරීත්ව වවුචර වලංගුභාවය දීර්ඝ කිරීම් ලබා දෙන ලදී.

සාමාජිකයින් අතර සංචාරය කිරීමට ඇති උනන්දුව සහ ඔවුන්ගේ වසංගත තත්වයෙන් පසු සංචාරක ඉල්ලීම් සහ අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ අරමුණින් සාමාජිකයින් අතර සංචාරක අභිප්‍රාය පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. සාමාජික වරප්‍රසාද සම්බන්ධ සමීක්ෂණයක් 2021 මුල් භාගයේ දී සිදු කරන ලදී.

සාමාන්‍ය ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමේ අනපේක්ෂිතභාවය මධ්‍යයේ, වැඩසටහන තවදුරටත් වැඩිදියුණු කිරීමේ

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

මාර්ග සොයමින් සිටී. ඉදිරි වසර සඳහා නව සාමාජික ප්‍රතිලාභ සහ වරප්‍රසාද මෙන්ම හවුල්කාර කළඹ පුළුල් කිරීම සැලසුම් කර ඇත. මෙම වැඩසටහන අඛණ්ඩව, ගුවන් සමාගම සහ එහි හිතවත් මගීන් අතර සම්බන්ධතාවය ශක්තිමත් කර ගැනීමට අපේක්ෂා කරන අතර ඉදිරි වසර තුළ දී ගුවන් ගමන් අත්දැකීම් තවදුරටත් වැඩිදියුණු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

### ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය (GCC)

ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය විසින් අපගේ ගෝලීය පාරිභෝගික ජාලය වෙත ඉංග්‍රීසි, සිංහල, දෙමළ සහ මැන්ඩරින් ආදී විවිධ භාෂා ඔස්සේ අඛණ්ඩව සේවා ලබා දෙයි. ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය හරහා, ලෝක ව්‍යාප්ත ගනුදෙනුකරුවන්ට සහ FlySmiLes සාමාජිකයින්ට ආසන වෙන් කිරීම්, ප්‍රවේශපත්‍ර මිල දී ගැනීම්, දින වෙනස් කිරීම්, සංචාරක ආශ්‍රිත විමසීම්, සහායක සහ වෙනත් සේවාවන් ඇතුළු සේවාවන් රාශියක් එක් ස්ථානයකින් ලබා ගැනීම සිදු කළ හැකි වේ.

වසංගත තත්වයේ තීරණාත්මක කාල පරිච්ඡේදයක වුවද ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය පැය 24 පුරා සේවා ලබා දුන් අතර, සංචාරක සැලසුම් නැවත සකස් කිරීමේ දැඩි අවශ්‍යතාවයෙන් සිටි මගීන්ට සහය ලබා දෙනු ලැබිණි. කෝවිඩ් 19 පැතිර යමින් තිබූ ආරම්භක අවදියේ සහ ඉදිරි මාස කිහිපය තුළදී පැමිණෙන ඇමතුම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, විකල්ප සංචාරක විධිවිධාන සලස්වමින් අපගේ ගනුදෙනුකරුවන් හසුරුවා ගැනීමට ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය සමත් විය.

අඛණ්ඩව පනවා තිබූ සංචරණ සීමා සමග, 24x7 ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම නිසැකයෙන්ම අභියෝගාත්මක විය. කෙසේවෙතත් අපගේ ගෝලීය පාරිභෝගිකයින්ට සහයවීම සඳහා වසර පුරා අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කැපවී සිටියේය. මෙවැනි තත්වයක, කොළඹ වෙත සහ කොළඹ සිට ආපසු ගෙන්වා ගැනීමට ගුවන් යානා ටිකට්පත් නිකුත් කිරීම තුළින්, පවතින වසංගතය හේතුවෙන් බොහෝ විදේශීය කාර්යාල සහ සංචාරක නියෝජිතයන් අක්‍රිය වූ අවස්ථාවේදී ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී.

මේ වනවිට, රටවල් 12ක වෙසෙන පාරිභෝගිකයින්ට වෙන්වූ දේශීය අංක ඔස්සේ ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය වෙත ළඟා වීමේ හැකියාව ඇති අතර, මෙම සේවාව මාර්ගගත ක්‍රමයට අනෙකුත් ගමනාන්ත වෙතද ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

ගුවන් සමාගම විසින් ගනු ලැබූ ඩිජිටල් මුලාරම්භයන්ට අනුකූල වීමට, ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය දැන් ෆේස්බුක්, ට්විටර් සහ ලයිව්චැට් (Facebook, Twitter and LiveChat) වැනි ගුවන් සමාගමේ සමාජ මාධ්‍ය හැසිරවමින් සන්නද්ධව සිටී. මෙම සමාජ මාධ්‍ය විමසීම්, පැමිණිලි සහ ප්‍රතිචාර කළමනාකරණය සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට කැපවූ කණ්ඩායමක් යොදවා ඇත. අනාගතයේදී අන්තර්ජාලය පදනම් කරගත් අනෙකුත් නාලිකා වෙතද එහි සේවා ව්‍යාප්ත කිරීමට යෝජිත සැලසුම් ඇතුළත් කර ඇත.

GCC පාරිභෝගික තෘප්තිය සහතික කරන අතරතුර, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව අත්දැකීම් ලබා දීමේදී ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය තොරතුරු කේන්ද්‍රය ලෙස කටයුතු කරයි.

### ශ්‍රීලංකන් හොලිඩේස්

ශ්‍රීලංකන් හොලිඩේස් වසංගත තත්වයෙන් පසු ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය යථා තත්වයට පත් කිරීම සහ මෙම අරමුණු යටතේ ආයතනික ගිවිසුම් ඇති කර ගැනීමට සංචාරක කර්මාන්තයේ ප්‍රවීණයන් සමග ශ්‍රීලංකන් හොලිඩේස් හවුල් වී ඇත. සංචාරක ව්‍යාපාරයේ අනාගතය අඛණ්ඩව විකාශනය වෙමින් පවතින හෙයින්, ශ්‍රීලංකන් හොලිඩේස් විසින් එහි පාර්ශවකරුවන් සහ රට කෙරෙහි වගකීමේ කොටසක් ලෙස ආරක්ෂිත සංචාරක ව්‍යාපාරය දිරිමත් කරනු ඇත.

මෙම අරමුණු ඇතිව, පශ්චාත් කෝවිඩ් තත්වයෙන් යථා තත්වයට පත් වීමේ සැලසුමේ වඩාත් වැදගත් වූ, අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරයේ දියුණුවට දායක වන, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් “Travel Bubble” සංකල්පය පදනම් කර ගනිමින් ගුවන් සමාගමේ සංචාර අංශය මගින් බොහෝ පැකේජ ලංකාවට හඳුන්වා දෙන ලදී. වසංගත තත්වය පහව ගිය විගස ව්‍යාපාර නැවත ආරම්භ කළ හැකි බව සහතික කිරීමට ජාත්‍යන්තර සහ දේශීය සංචාරක ක්‍රියාකරුවන්, ගොඩබිම සහ නියෝජිත ක්‍රියාකරුවන් සමග ශ්‍රීලංකන් හොලිඩේස් කටයුතුවල යෙදී සිටී.

රජය විසින් ක්‍රියාත්මක කළ නැවත ගෙන්වීමේ පැකේජ සඳහා ශ්‍රීලංකන් හොලිඩේස් විසින් සහය ලබා දෙන ලදී. ඊට අමතරව ශ්‍රීලංකන් හොලිඩේස් විසින් තෝරාගත් අතිශය ආරක්ෂිත නිවාඩු නිකේතන සහිත සංචාරක නිවාඩු පැකේජයක්ද මාලදිවයිනට හඳුන්වා දෙනු ලැබිණ. මෙම පැකේජය ප්‍රවර්ධනය කරන ලද්දේ ලංකාව ඇතුළු ගෝලීය ජාලය හරහාය. එක්සත් අරාබි එමීර් රාජ්‍යට කුවේට් විදේශගත නැවැතුම් (Kuwait expat stopover) පැකේජය හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවෙන් පැමිණෙන මගීන් සඳහා කුවේට් ප්‍රාන්තය තුළ පනවා ඇති සංචාරක සීමා හරහා ව්‍යාපාරික අවස්ථා උපරිම කර ගැනීමට ශ්‍රීලංකන් හොලිඩේස් උත්සහ කරන ලදී.

ශ්‍රීලංකන් හොලිඩේස් විසින් විකල්ප ව්‍යාපාර අවස්ථා සඳහා යොමු වූ අතර ආයතනික සේවකයින්, පවුල්, යුගල සහ තනි සංචාරකයින් සඳහා දේශීය පැකේජය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

ශ්‍රීලංකන් හොලිඩේස් MICE ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා ප්‍රමුඛතම රැස්වීම්, උත්සව සහ උත්සව සත්කාර ස්ථානයවන BMICH සමග හවුල්කාරීත්වය ලබා ඇත. මෙම ගිවිසුම මගින් ව්‍යාපාරික සංචාරක ශක්තිමත් වන අතර, අනාගතයේදී ප්‍රධාන ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව ස්ථාන ගත වීමට එය රැකුලක් වී ඇත.

පරිශීලක අත්දැකීම් ඉහළ නංවමින් නවීකරණය කරන ලද සැලසුමක් සහ වැඩි දියුණු කළ ක්‍රියාකාරකම් වලින් සිය වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට ශ්‍රීලංකන් හොලිඩේස් සැලසුම් කරයි. මෙම වෙබ් අඩවිය කාර්මික ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන්ට අනුකූල වීමට වඩා හොඳ කාර්යය සාධනයක් සහතික කරන සහජ සැලසුමක් දක්වයි. ගුවන් ගමන් නිකේතන කර්මාන්තයේ නව ප්‍රවණතාවක් සැලකිල්ලට ගනිමින්, නව තෝරා ගැනීමේ ක්‍රම, ඔවුන්ගේ නිවාඩු සිය මූල්‍ය සැලැස්ම අනුව තෝරා ගැනීමට ඇති විවිධත්වය, නම්‍යශීලී ගෙවීම් විකල්ප, කැමති මුදල් වර්ගයක් තෝරා ගැනීම, විවිධ හෝටල් තෝරා ගැනීම සහ තවත් බොහෝ අංශයන්ගෙන් යුත් මෙම වෙබ් අඩවිය පුළුල් ප්‍රේක්ෂක සංඛ්‍යාවක් වෙත ළඟා වන අතර, නිකේතන අවශ්‍යතා සියල්ල සපුරාලන හෙයින් මෙය ‘වඩාත් සුදුසු සංචාරක යෝජනාවක්’ වනු ඇත.

### අලෙවිකරණය

වසංගතය අතරතුර, ගනුදෙනුකරුවන්ගේ සම්බන්ධතාවය සහ වෙළඳ නාමය සමග චිත්තවේගී සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් උපායමාර්ගික අලෙවිකරණ උත්සාහයන් කිහිපයක් මෙහෙයවනු ලැබිණ. රටවල් පුරා සංචාරක සීමා සහ දේශසීමා වසා දැමීම හේතුවෙන් වෙළඳනාමය මුලින්ම අත්විඳීමේ අවස්ථා සීමා විය. එමනිසා සංචාරකයින්ගේ අපේක්ෂාවන්, ආරක්ෂාව පිළිබඳ අඛණ්ඩ සහතික වීම, ගමනාන්ත අනුප්‍රාණය සහ ගුවන් සේවකයින්ගේ මෙන්ම සුවතා සහ ශුභවාදී තානාපතිවරුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාමාලා තුළින් සංචාරක පරීක්ෂකවරුන්ගේ කාර්යභාර්ය කෙරෙහි අවධානය යොමු කිරීමට ගුවන් සමාග මේ සන්නිවේදන ජාලයන්ට බල කෙරුණි. #srilankanpromises වසංගත තත්වය පැතිර යන සමයේ සමාජ මාධ්‍ය ප්‍රජාවගෙන් හෘදයාංගම ප්‍රතිචාරයක් ලැබුණු එක් අවස්ථාවකි.

අඳුරු මෙහෙයුම් තත්වයන් නොතකා, 2020 ලෝක සංචාරක සම්මාන උළෙලේදී “ආසියානු ඉන්දීය සාගර කලාපයේ ප්‍රමුඛතම ගුවන් සේවය” සහ “ඉන්දීය සාගර කලාපයේ ලොව ප්‍රමුඛතම ගුවන් සේවය” යන ගෞරව නාමයන් රඳවා ගනිමින් සිය සම්මානලාභී ජයග්‍රහණය අඛණ්ඩව පස්වන වරටත් පවත්වා ගැනීමට ශ්‍රීලංකන් සමාගම සමත් විය.

මෙවර පැසිෆික් ආසියා සංචාරක සංගමයේ (PATA) රන් සම්මාන උළලේදී, ගුවන් සමාගම අඛණ්ඩව දෙවන වරටත් ගෞරවනීය “අලෙවිකරණ සමාගම” යන ගෞරව නාමය දිනා ගත් අතර, මෙවර පෑන් ඉන්දියා වෙළඳපොළ “Serendipity Next-door” පාදක කරගනිමින් බොලිවුඩයේ සුපිරි තාරකාවක් වන ජැකලින් ෆර්නැන්ඩර්ස් සහ ක්‍රිකට් පුරාවෘත්තයක් වන කුමාර් සංගක්කාර සමගින් වාර්තා බිඳ දැමූ සන්නාමය පිළිබඳ වීඩියෝවක් ඉදිරිපත් කළ අතර, “Next-door neighbour” යන අලෙවිකරණ වැඩසටහනට සියළු දේ ඇතුළත් කරන ලදී.

අඛණ්ඩව සිව්වන වරටත් පැවතුණ ඉතිහාසගත මෙල්බර්න් මැරතන් උළලේදී අර්ධ මැරතන් ඉසව්ව සඳහා ගුවන් සමාගමේ අනුග්‍රහය අප විසින් ලබා දෙන ලදී. 2018 සහ 2019 කාලය තුළ නිරන්තරයෙන් අලෙවි කිරීමේ සිද්ධීන් වාර්තා කරමින්, ගුවන් සේවය දෘශ්‍යතාව වැඩි දියුණු කිරීමට අරමුණු කළ අතර තරඟයට වැඩි ප්‍රේක්ෂකයන් ආකර්ෂණයට උත්සහය දරමින් සිටින්නට විය. කෙසේ වෙතත් පවතින වාතාවරණය යටතේ මැරතන් තරඟය අතථ්‍ය ක්‍රමයට පැවතුණි.

### ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ ප්‍රවාහනය

රජයන් විසින් ගෝලීය වශයෙන් ගනු ලැබූ කෝවිඩ් 19 වසංගත තත්වය වැළැක්වීමේ පියවර සමග 2022/21 වර්ෂයේදී ගුවන් සේවා මෙහෙයුම් සඳහා පෙර නොවූ ආකාරයෙන් වතාවරණයක් නිර්මාණය කළ අතර, එමගින් IATA විසින් වාර්තා කළ පරිදි 2019/20 වර්ෂයට සාපේක්ෂව ගෝලීය මගී ඉල්ලුම 58.6%කින් අඩු විය. IATA විසින් වාර්තා කළ පරිදි, 2019/20 මූල්‍ය වර්ෂයෙන් ගෝලීය වශයෙන් 70.3%ක පහත වැටීමක් වාර්තා කළ අතර, එමගින් මගී ධාරිතාව ඉවත්කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඇතුළුව ගුවන් සේවාවලට බල කෙරුණි. වෙළඳපොළේ ඇති මුළු ගුවන් ප්‍රවාහන ධාරිතාවෙන් 50% කට වැඩි ප්‍රමාණයක් මගී ප්‍රවාහන ධාරිතාවෙන් සමන්විත හෙයින්, ගුවන් භාණ්ඩ ප්‍රවාහන සඳහා වූ සැලකිය යුතු ඉල්ලුමක් හේතුවෙන් ගුවන් භාණ්ඩ ප්‍රවාහනවල මිල අනුපාතය ඉලක්කම් දෙකෙන් යුතු විය. මෙම වාතාවරණය මගින් භාණ්ඩ විවිධාංගීකරණය වූ ආදායම් මාර්ග ඇති ගුවන් සමාගම් වලට බාධා ඇති වූ ක්‍රියාකාරකම් නිසා මූල්‍යමය බලපෑම් අවම කර ගැනීමට අවස්ථාව ලබා දුන් අතර, බොහෝ ගුවන් සමාගම් භාණ්ඩ ඉල්ලුම ප්‍රයෝජනයට ගනිමින් මගී ගුවන් යානා වලින් භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් සිදු කරන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 2020 මාර්තු මාසයේදී ෂැංහයි වෙත සිය පළමු භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් ක්‍රියාත්මක කළ අතර, 2020 මැයි මාසයේදී ගමනාන්ත 18 ක ජාලයක් දක්වා මෙහෙයුම් පුළුල් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වර්ෂයේදී පවතින අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් සහ ශ්‍රීලංකන් භාණ්ඩ ප්‍රවාහන තරඟකාරී වාසිය ඉහළ නංවමින් ෆ්‍රෑන්ක්ෆර්ට් (ජර්මනිය), පැරිස් (ප්‍රංශය), සිඩ්නි (ඕස්ට්‍රේලියාව), හෝචිමිං නගරය (වියට්නාමය) සහ ඉනචියෝන් (දකුණු කොරියාව) යන නව ගමනාන්තය වෙත කාලෝචිත ලෙස මෙහෙයුම් ආරම්භ විය. නොසලකිය හැකි මගී ගමන්වල අඩු වීම හේතුවෙන්, වසංගතයට පෙර තිබූ භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව මෙන් 3-4 ගුණයක්, එනම් ටොන් 25-35 පමණ ගුවන් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව ඉහළ ගියේය.

විශාල ලෙස චීනය, හොංකොං, වියට්නාමය සහ ශ්‍රී ලංකාව, දකුණු අප්‍රිකාව, බටහිර අප්‍රිකාව, උගන්ඩාව, නේපාලය, ඉන්දියාව සහ යුරෝපය වෙත අවසර ඇති පූර්ණ සහ අර්ධ ගුවන් භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් 80 ක් හරහා පුද්ගලික ආරක්ෂා උපකරණ (PPE), අමුද්‍රව්‍ය අපනයන සහ ආනයන ඖෂධ සහ භාණ්ඩ නිෂ්පාදන සඳහා ගුවන් ගමන් ප්‍රවාහන ධාරිතාව සඳහා ඇති ඉල්ලුම, ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ වෙත අවස්ථාවන් ලබා දෙයි. මූල්‍ය වර්ෂය තුළ උත්පාදනය කරන ලද භාණ්ඩ ආදායමෙන් 8% ක් වූ භාණ්ඩ ප්‍රවාහනය ඇමරිකානු ඩොලර් මිලියන 11 ක ආදායමක් උපයා දුන්නේය. 2020/21 මූල්‍ය වර්ෂය තුළදී අන්තර් ආදයම් මගින් ජාලය පුරාවට වෙන් කළ ධාරිතාව උපරිම කිරීමෙන් සහ මාලදිවයින සහ මැදපෙරදිග හරහා යුරෝපාය වෙත සම්බන්ධතා විකල්පයන් වැඩිදියුණු කරමින් භාණ්ඩ ආදායම සඳහා තවදුරටත් ප්‍රධාන ආදායමක් පෙන්නුම් කළ අතර, හවුල්කාර ගුවන් සේවාවල මුළු අන්තර් ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 8 කි.

සිංගප්පූරුවේ චැංගි ගුවන් තොටුපල භාණ්ඩ මධ්‍යස්ථානය හරහා උසස් සේවාවක් සහ නවෝත්පාදන විසඳුම් ලබා දීම සඳහා ගුවන් භාණ්ඩ කර්මාන්ත හවුල්කරුවන් විසින් නම් කරන ලද ගුවන් සේවා තුනෙන් එකක් ලෙස, සිංගප්පූරුව භාණ්ඩ වෙළඳපොළේ කණ්ඩායමක් විසින් ‘විශිෂ්ටතා සම්මානය’ ලබා ගැනීමේදී ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ එහි සුවිශේෂී උත්සහය සඳහා මෙන්ම, චැංගි ගුවන් තොටුපල විසින් පවත්වනු ලබන “Let’s Talk Cargo 2021” සමුළුවේදී ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ වර්ධනයෙහි ඉහළම ගුවන් සමාගම් 5 අතර (Top 5 Airlines by Absolute Cargo Growth) ඇගයීමට ලක් විය.

ඉහළ භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ප්‍රයෝජනයට ගනිමින්, ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ, තවදුරටත් A330-200 ගුවන් යානයේ ආසන ඉවත් කිරීම තුළින් ප්‍රධාන තට්ටුවේ තොග පැටවීමට හැකිවීම තුළින් භාණ්ඩ සඳහා වූ මෙහෙයුම් සඳහා අවස්ථාව සලස්වා දෙනු ලැබිණි.

ඉහත සඳහන් මුලපිරීම් මගින් 2020/21 මූල්‍ය වර්ෂයේදී ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ ඩොලර් මිලියන 146 (රුපියල් බිලියන 27.33) ක ආදායම ලැබූ අතර, එය පසුගිය මූල්‍ය වර්ෂයෙන් 74% ක් වර්ධනය වූ අතර, මූල්‍ය

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

වර්ෂය සඳහා උත්පාදනය කළ මුළු ගුවන් ප්‍රවාහන ආදායමෙන් 60% ක් විය. 2019/20 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ගුවන් භාණ්ඩ 167% කින් ඉහළ ගොස් තිබේ.

යුරෝපය, මාලදිවයින සහ මැදපෙරදිග සම්බන්ධ කිරීම තුළින්, 2019/20 මූල්‍ය වර්ෂයේ සිට 132% ක වර්ධනයකින්, ඇමරිකානු ඩොලර් මිලියන 54 ක් වූ මුළු උපයන ආදායමෙන් 37% ක් ශ්‍රී ලංකා භාණ්ඩ අලෙවියෙන් වාර්තා විය. ආදායමෙන් 40% ක් ලෙස, ඈත පෙරදිග නැවතුම වලින් ඇමරිකානු ඩොලර් මිලියන 59 ක ආදායමක් උපයා ගත් අතර, පසුගිය මූල්‍ය වර්ෂයට වඩා 100% ක් වර්ධනයක් වූ අතර සිංගප්පූරුව, හොංකොං සහ ෂැංහයි හි මෙහෙයුම් වැඩි වශයෙන් දායක විය. ලන්ඩන් සහ ෆ්‍රැන්ක්ෆර්ට් වෙත භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව වැඩි කිරීම මෙන්ම ජාලය හරහා ඕස්ට්‍රේලියාවට ඉහළ ආදායමක් ලබා දෙන සංචලන පහසු කිරීමට, යුරෝපීය කලාපය ඇමරිකානු ඩොලර් මිලියන 10 ක ආදායම උපයා දුන් අතර එය 62% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මූල්‍ය වර්ෂයේදී මැදපෙරදිග කලාපය ඇමරිකානු ඩොලර් මිලියන 6ක් වූ අතර, ඩුබායි නැවතුම ඒ සඳහා වැඩි ලෙස දායකත්වය දුන් අතර, වසරින් වසර 21% කින් ඉහළ ගොස් තිබේ. එසේම ඉන්දියානු උප මහද්වීපය (ශ්‍රී ලංකාව හැර) සමස්ත භාණ්ඩ ආදායමෙන් 11% ක්, ඇමරිකානු ඩොලර් මිලියන 15ක් ලෙස දායක විය.

2022 මුල් භාගය වන විට, UL ගුවන් යානා සමූහයට ප්‍රවාහන ගුවන් යානයක් ඇතුළත් කිරීම තුළින් පවතින භාණ්ඩ ප්‍රවාහන ආකෘතිය නැවත උපායමාර්ගගත ක්‍රමයට කිරීමට ශ්‍රීලංකන් විසින් තවදුරටත් අදහස් කරන අතර, එමගින් ශ්‍රී ලංකාවේ වර්ධනය ජාත්‍යන්තර වෙළඳාමේ මෙන්ම, නැවත භාණ්ඩ මාරු කිරීම සහ පෙරදිග, යුරෝපය, ඉන්දියානු උප මහද්වීපය සහ මැද පෙරදිග ගෝලීය ගුවන් භාණ්ඩ අවස්ථා සඳහා ගුවන් සමාගමට සහභාගී වීමට ඉඩ සලසයි.

වසංගත තත්වය හේතුවෙන් 2019/20 මූල්‍ය වර්ෂයේ පිළිවෙලින් 84% කින් සහ 80% කින් පහත වැටීමක් සිදු වූ අතර, මෙට්‍රික් ටොන් 135,549 ක භාණ්ඩ ප්‍රවාහනක් හසුරුවමින්, භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කටයුතු ඇමරිකානු ඩොලර් මිලියන 15.1 ආදායමක් ලබා ඇත. ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ විසින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ විශ්වාසනීයත්ව අනුපාතය 99.95% ක මට්ටමෙන් පවත්වා ගෙන යන ලදී.

2023 වන විට, ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල සහ ගුවන් සේවා අධිකාරිය (AASL) හරහා නව ආනයන භාණ්ඩ ප්‍රවාහන පර්යන්තයක් සංස්ථාපිත කිරීමෙන් වර්තමාන ගුවන් භාණ්ඩ තවත් පුළුල් කිරීම ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ ගොඩබිම් මෙහෙයුම් විසින් කරනු ලබයි. මෙම පර්යන්ත සැලසුම් කර ඇත්තේ ස්වයංක්‍රීය ගබඩා කිරීම සහ නැවත ලබා ගැනීමේ පද්ධතියක් (ASRS) වැනි අති නවීන තාක්ෂණය ඇතුළත් කරමිනි. වැඩිදියුණු කළ හැසිරවීමේ ධාරිතාව මගින් ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ තවදුරටත් උෂ්ණත්වය පාලනය කළ හැකි හැසිරවීමේ ප්‍රදේශයක්, භාණ්ඩ බෙදා හරින මධ්‍යස්ථානයක් සහ පොදු භාණ්ඩ සඳහා වෙන්වූ පර්යන්තයක් සහිත වෙනස්වන මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීමට හැකිවන අතර, බැංගලෝර්, දිල්ලිය, ඩුබායි සහ සිංගප්පූරුව වැනි කලාපීය භාණ්ඩ මධ්‍යස්ථාන සමග සම මට්ටමක පවතින පරිදි ලංකාවේ ගොඩබිම් භාණ්ඩ හැසිරවීමේ කටයුතු දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

## පියාසැරි මෙහෙයුම්

### ආරක්ෂාව

සියලුම මෙහෙයුම් සිදු කරනු ලබන ශ්‍රීලංකන්හි මෙහෙයුම් ඉහත සියල්ලට වඩා ආරක්ෂිත ප්‍රමිතීන්ගෙන් යුත් පරිසරයක් සහතික කිරීමට ගනු ලබන පියවර මූලික තැනක් ගනී. ආරක්ෂාව පිළිබඳ හොඳම භාවිතයන් සාක්ෂාත් කර ගැනීමට සහ එමගින් සියලු දෙනාට ආරක්ෂිත පරිසරයක් සහතික කිරීමට වරින් වර අනිවාර්ය පුහුණුවක් සමීප අධීක්ෂණ යටතේ පැවැත්වේ. සවිස්තරාත්මක ආරක්ෂිත පියවරයන් සහිත ආරක්ෂිත කළමනාකරණ පද්ධතියේ (SMS) පුළුල් විෂය පථය යටතේ, සියළුම අවදානම් තක්සේරු කිරීම් දැඩි පරීක්ෂණයකින් සිදු කෙරේ. සියලුම නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව, මෙම වසංගත කාල සීමාව තුළ එය බෙහෙවින් සිදු කරනු ලබන්නකි. බාධාවකින් තොරව ගමනාගමනය සහ අඛණ්ඩ ව්‍යාපාර සඳහා අපගේ හවුල්කරුවන් සමග ව්‍යාපාර කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් වන, IATA සාමාජිකත්වය රඳවා ගනිමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මාර්ගගත IOSA විගණනයක් සාර්ථකව නිම කරනු ලැබිණ.

### නියමිත කලට කාර්යයන් ඉටු කිරීම (OTP)

වසංගත තත්වය ගෝලීය වශයෙන් ගුවන් සේවා කර්මාන්තයට අහිතකර ලෙස බලපෑ අතර, පෙර කෝවිඩ් මෙහෙයුම් පරිමාණයට සාපේක්ෂව මෙම කාලය තුළ සාමාන්‍යයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගුවන්ගමන් සංඛ්‍යාව 85%කින් අඩු විය. දේශීය සහ ගෝලීය වශයෙන් නිරන්තර වෙනස්වීම් සහ යාත්වකාලීන කිරීම්වලට භාජනය වූ දැඩි සංචාරක සීමා මධ්‍යයේ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉතා සතුටුදායක OTP මට්ටමක පවත්වාගෙන යනු ලැබුණි. කර්මාන්ත සම්මතයෙන් මිනිත්තු 15 ක් ඇතුළත්, සියලු පැමිණීම්වලින් සමාලෝචනයට භාජනය වූ කාලය තුළ පැමිණීම්වලින් 81%ක සහ සියලුම පිටත්වන ගුවන් යානාවල 78%ක කාර්යක්ෂම අනුපාතිකයක් දක්වයි.

### ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය (AOCC)

සියළුම පාර්ශවකරුවන් සමග ඉතා සියුම් සම්බන්ධීකරණ ක්‍රියාවලියක් මගින් ප්‍රකාශිත කාලසටහන්වල විශ්වාසනීයත්වය කළමනාකරණය කරමින්, වර්තමාන වසංගත පසුබිම තුළ සීමාසහිත වාණිජමය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී AOCC තීරණාත්මක වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. දේශීය සහ ගෝලීය වශයෙන් විවිධාකාරයෙන් පනවා ඇති සීමා කිරීම් මධ්‍යයේ වුවද, ගනුදෙනුකරුවන් අවම අපහසුතාවයකින් සහ වඩාත්ම ලාභදායී ලෙස මෙහෙයුම් කළමනාකරණය කිරීමේ අරමුණින්, සියළුම රෙගුලාසි වලට අනුකූලව කඩිනම් වෙනස්කම් සහිතව බොහෝ උපායමාර්ග අනුගමනය කරන ලදී.

සමාලෝචනය කරන ලද කාල සීමාව තුළදී, සෞඛ්‍ය මාර්ගෝපදේශ සමග නිරෝධායන නීතිරීතිවලට අනුකූලව කාර්ය මණ්ඩල වැඩ වාර සටහන් අනුගමනය, සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව විෂබීජ නාශක යොදා ගුවන් යානා සූදානම් කිරීම සහ අනෙකුත් සියලුම අභ්‍යන්තර සහ බාහිර මෙහෙයුම් පාර්ශවකරුවන් සමග වැඩකිරීම, පූර්ව සැලසුම් සහිතව 24×7 නිරීක්ෂණය යටතේ සිදු කරන ලද කාර්යයන් අභියෝගාත්මක විය. ගුවන් මෙහෙයුම්, AOCC යටතේ සාමූහික වශයෙන් නව ගමනාන්ත වෙත ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර, මෙහෙයුම් අභියෝගයන් මධ්‍යයේ අතරමංව සිටි ලාංකිකයන් ගෙන්වා ගැනීම් සඳහා රජය ගත් පියවර සමග කටයුතු කරන ලදී. වාණිජ සැලැස්මෙහි කඩිනම් වෙනස්කම්වලට අනුගතවීමෙන්, සීමා සහිත සම්පත් සහ ගුවන්යානා උපායමාර්ගිකව සැලසුම් කිරීමේ ක්‍රියාවලියක් තුළින් ආදායම උපරිම කිරීමට අතිරේක ප්‍රවාහන ගුවන් යානා ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් සූදානම සහතික කරනු ලැබිණ.

### පුහුණුව

දැඩි නිරෝධායන ක්‍රියා පටිපාටි හේතුවෙන් ගුවන්යානා කාර්ය මණ්ඩලයේ ගුවන්ගමන් ක්‍රියාත්මක කිරීමට ඇති ඵලදායී මිනිස් දින ගණන 30% කින් දක්වා අඩු කරනු ලැබිණ. දුෂ්කරතාවන්ට මුහුණ දීමේ පියවරක් ලෙස නැවත පියාසර කිරීම (Back to Flying) යන IATA සංකල්පයට අනුකූලව, සියළුම ගුවන් නියමුවන් කාල සටහන කළමනාකරණය කිරීමට වලංගු සහ සුදුසුකම් ලැබූවන් ලෙස පවත්වා ගැනීමට සීමිත වාර ගණනක් තිබියදීත්, සියළුම ගුවන් නියමුවන් පියාසැරි නැවත ක්‍රියාත්මක කරන ලදී. ඇතැම් අත්‍යවශ්‍ය පුනරාවර්තන පුහුණුවීම් මාර්ගගත ක්‍රමයට පවත්වන ලද අතර, වාර ගණන අඩු වීම හේතුවෙන් අනිවාර්ය පුහුණු අවලංගු කර, සියළු නියමුවන් සූදානම් කිරීම සහ ක්‍රියාකාරීත්වය ඵලදායීතාවයෙන් තබා ගන්නා ලදී.

### පියාසර යැවුම් මධ්‍යස්ථානය (FDC)

ජාතීන් අතර කරදරකාරී දේශපාලන වාතාවරණයන් සහ වසංගත හේතුවෙන් ඇති වූ දුෂ්කරතා හේතුවෙන්, ගුවන් ගමන් සීමා වැඩිවීමත් සමගින්, සමාලෝචනයට භාජනය වූ කාලය තුළ වාසිදායක මාර්ගවල ගුවන් ගමන් සැලසුම් කිරීම අභියෝගයක් විය. කෙසේවෙතත් උපරිම ගෙවුම් ධාරිතාව ඉහළ නැංවීම සහතික කිරීමට, හොඳම විකල්ප භාවිතයන් ප්‍රශස්ත කිරීමට පියාසර යැවුම් මධ්‍යස්ථානයට හැකි විය.

සමාලෝචනයට භාජනය වූ කාලය තුළදී, ගුවන් සැලසුම් සේවා සැපයුම්කරු වශයෙන් විදේශ ගුවන් සමාගම් කිහිපයක් හසුරවමින් FDC විසින් අමතර ආදායමක් උපයා ඇත.

තවද, ගුවන් යානා නංවන ඉන්ධන පරිභෝජනය අධීක්ෂණය කිරීම යනු, ඉන්ධන භාවිතය යහපත් කිරීමට සිදු කරන ලද දැඩි ප්‍රයත්නයකි. ශ්‍රීලංකන් හි නියමුවන්ගේ දක්ෂ පියාසර හැකියාව මෙම සමීකරණයේ ප්‍රධාන කරුණකි. එපමණක් නොව ඉන්ධන පිරිවැය ප්‍රශස්ත කිරීම සඳහා FDC විසින් 'අධිධාරිතාකරණ' වැඩපිළිවෙල අඛණ්ඩව සමාලෝචිත වසර තුළද සිදු කරන ලදී.

### යානාස්ථ සේවා

යානාස්ථ සේවා, ගෝලීය වසංගත තත්වයට අදාළ අභියෝග හසුරුවාලමින්, එයාර්ලයින්ස් හි දැක්ම වන ආසියාවේ පාරිභෝගිකයන් වඩාත් පදනම් කරගත් ගුවන් සේවය වීම සඳහා සහයෝගය ලබා දෙනු ලබයි. මගීන්ගේ සහ මැදිරි කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කරන අතර, බාධා නොමැති මෙහෙයුම් සහතික කිරීමට වසංගත තත්වය සමග ඇති අවදානම් අවම කිරීමට බොහෝ මූලික මුලපිරීම් ගෙන ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය, සෞඛ්‍ය අමාත්‍යංශය සහ CAASL විසින් ලබා දුන් මාර්ගෝපදේශයන්ට අනුකූලව, වර්තමාන සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOPs) වෙනස් කරමින්, යානාස්ථ සේවා මෙහෙයුම් ක්‍රියාවලි නැවත සකස් කරන ලදී. පාරිභෝගිකයින් කේන්ද්‍ර කරගත් යානාස්ථ සේවා සඳහා නව උපකරණ හඳුන්වා දෙන ලදී. වැඩි වූ අවදානම් කළමනාකරණ කිරීම සඳහා සියලුම මගී ගුවන් යානාවල කාර්ය මණ්ඩල සඳහා සම්පූර්ණ PPE ලබා දෙන ලදී. ඉලෙක්ට්‍රොනික් ගුවන් ගමන් මල්ල සහ ස්වයංක්‍රීය ගමන් වාර්තාවල ඇතුළත් කිරීමට විද්‍යුත් ගොනුවක් ලෙස කැබින් කාර්ය මණ්ඩලය පරිපාලන අත්පොත ලබා දීම වැනි මුලපිරීම් මගින් කඩදාසි භාවිත නොවන පරිසරයක ක්‍රියාත්මක වීමට හඳුන්වා දෙන ලදී.

ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් සැලසුම් කර තිබූ අතර නොබැඳි ස්ථාන කිහිපයක ක්‍රියාත්මක කරන ලදී. අඛණ්ඩව රට වසා දැමීම සහ ව්‍යාපාරික ඒකක වසා දැමීම හේතුවෙන්, දිගු දුර ගුවන්යානා මෙහෙයුම්වල ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් යානා හි නැවත පැමිණමේ අංශය සඳහා කොළඹ සිට සනීපාරක්ෂක තත්වයෙන් වැඩිදියුණු කරන ලද ආහාර සපයන ලදී.

නිතර වෙනස් වන නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා යානාස්ථ පුහුණුව මගින් සිය පහසුකම් සහ සේවාවන් කැප කළ අතර ජාත්‍යන්තර සහ දේශීය කෝවිඩ්-19 මාර්ගෝපදේශයන්ට අනුකූලව ගුවන් සේවා නැවත ප්‍රති නිර්මාණය කරන ලදී. කැබින් කාර්ය මණ්ඩල නියෝජිතයින් සමග ඒකාබද්ධ ආරක්ෂිත අවදානම් තක්සේරු කිරීම සිදු කළ අතර, පවතින ආහාර සේවා වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ගේ එකඟතාවය ලබා ගන්නා ලදී.

අඩු කරන ලද මෙහෙයුම් හඳුන්වාදීමෙන්, යානස්ථ පුහුණුව මගින් යානස්ථ ආරක්ෂක කාර්යසාධන දර්ශකය සහ ආරක්ෂක කාර්ය සාධන ඉලක්ක නැවත ඇගයීමට ලක් කරන ලදී. ගුවන්ගමන් හි ප්‍රවණතා සහ ඉල්ලීම් සපුරාලීම සඳහා, පාරිභෝගික කේන්ද්‍රගත කිරීම- සතුටුදායක මොඩියුලය සහ කාර්යක්ෂමතාව යන නව විෂයන් දෙකක් යානස්ථ පුහුණු න්‍යායට ඇතුළත් කරන ලදී. කැබින් කාර්ය මණ්ඩල සඳහා මාර්ගගත පුහුණු සැසි ලබාදීම තුළින් යානස්ථ පුහුණුව නියාමන අවශ්‍යතා අඛණ්ඩ පවත්වා ගැනීම සහතික කරන ලදී.

### යානාස්ථ තීරුබදු රහිත මිලදී ගැනීම්

යානාස්ථ තීරුබදු රහිත මිලදී ගැනීම් සීමා කරන ලද වර්තමාන ගෝලීය වසංගත තත්වය සමග වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සේවා ආදායම වැඩි කිරීමට, කාලීන ප්‍රවර්ධනයන් සමගින් සීමිත යානාස්ථ අලෙවිකරණයන් සිදු කරමින්, තීරුබදු රහිත මෙහෙයුම් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරයි. තීරුබදු රහිත භාණ්ඩ විශාල ප්‍රමාණයක් විකිණීම සහ නිවසට ගෙන්වා ගැනීම හෝ ගුවන් තොටුපලෙන් ලබා ගැනීම් සමග සමස්ථ විකුණුම් විසඳුමක් හඳුන්වාදීමට සැලසුම් කරනු ලබයි.

## ව්‍යාපාර ඒකක සමාලෝචනය

### ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා

2020/21 වසර කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා සඳහා අභියෝගාත්මක වසරක් වූ අතර, එය ගොඩබිම් සේවා සඳහා ප්‍රායෝගිකව බලපෑම් ඇති කරමින් සම්පූර්ණ කර්මාන්තයටම අනපේක්ෂිත පහත වැටීමකට හේතු විය. වසරේ පාරිභෝගික ගුවන් සේවා භාවිතය අඩු කිරීම, මූල්‍ය වර්ෂය තුළ ගොඩබිම් සේවා මෙහෙයුම් වලට දැඩි ලෙස බලපෑම් කළ අතර එමගින් අවම ගුවන් ගමන් වාර ප්‍රමාණයක් හසුරුවනු ලැබීය.

2021/21 මූල්‍ය වර්ෂයේ මුල් කාර්තුවේදී, කෝවිඩ් 19 වසංගත තත්වයට පෙර මෙහෙයුම් වලින් හසුරවනු ලැබුවේ ගුවන් ගමන් වලින් 10%ක් පමණක් වන අතර, මූල්‍ය වර්ෂයේ දෙවන භාගයේදී මන්දග ාමී සහ අස්ථාවර ප්‍රතිසාධනයක් ඇති විය. පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා විසින් ගුවන් ගමන් වලදී 84% ක් සහ මගී සංඛ්‍යාවෙන් 97% ක තියුණු පහත වැටීමකට මුහුණපාන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2021/21 මූල්‍ය වර්ෂයේ ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා විසින් අඩුම ආදායමක් වාර්තා කරන ලදී. මෙහෙයුම් බාධාවන් නොතකා, සමාලෝචනය කරන ලද

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

වර්ෂය තුළ නියමිත වේලාවට කාර්ය සාධන දර්ශකය 99.66% ක් සහ වැරදි ලෙස යොමු වීමේ ගමන් මලු අනුපාතය මගීන් 1000 කට 0.39 ක් ලෙස දැක්වීමට සමත් විය. තවදුරටත් මෙහෙයුම් පුළුල් කරමින් නව ගුවන් සේවා 04 ක් සමග ශ්‍රීලංකන් ගුවන් සේවය ගිවිසුමකට එළඹෙන ලදී.

**හසුරුවන ලද ගුවන් යානා සංඛ්‍යාව**




**හසුරුවන ලද මගීන් සංඛ්‍යාව**




වසංගත තත්වයත් සමග, මගීන් සහ සේවකයින්ගේ ආරක්ෂාව ප්‍රමුඛතාවය වන ලදී. අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද ආරක්ෂක විධිවිධාන වලට අමතරව, සේවා කවුළුවල පුද්ගලයින් ගැවසීම අවම කිරීමට මාර්ගගත ක්‍රමයට හෝ kiosk යන්ත්‍රය හරහා අවශ්‍යතා සපුරා ගැනීමට මගීන් දිරිගැන්වූ අතර, සියලුම කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුද්ගල ආරක්ෂක උපකරණ පහසුකම් ලබා දුන් අතර, අඛණ්ඩ ලෙස ස්ථාන පරීක්ෂාවට ලක් කරමින් පොදු ස්ථානවල දිනපතා විෂබීජහරණය සිදුකරන ලදී.

එමෙන්ම ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා විසින් නිසි සෞඛ්‍ය සහ ආරක්ෂිත ප්‍රමිතීන් පවත්වා ගනිමින් මාර්ගගත ක්‍රමයට සහ පන්ති කාමර සැසි තුළින් කාර්ය මණ්ඩල පුහුණුවක් ලබාදීමට මෙම කාලය කාර්යක්ෂමව භාවිත කරන ලදී.
පාරිභෝගිකයින් කේන්ද්‍ර කර ගත් පුහුණු වැඩසටහනක් පාරිභෝගිකයින්ට සේවා සැපයීමේ සේවා මට්ටම ඉහළ නැංවීමට හඳුන්වා දෙන ලදී. ආරක්ෂාව සහතික කිරීම සඳහා සම්මත සනීපාරක්ෂක ක්‍රියාපිළිවෙල සමග කාර්ය මණ්ඩලය පුහුණු කරන ලදී.

කෝවිඩ් 19 ගෝලීය වසංගතය අතරතුර බාධාවකින් තොරව මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා හදිසි අවස්ථා සැලසුම් ක්‍රියාත්මක කරන ලදී.

එයාර්ලයින්ස් පාරිභෝගිකයින්ට ලබා දෙන වට්ටම් සහිත ගොඩබිම් සේවා ගාස්තු මගින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලැබූ පියවරයන්ගෙන්, ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා විසින් පාරිභෝගික ගුවන්සේවා 15 සේවා සැපයීම, ආපසු ගෙන්වා ගැනීමට ගුවන් ගමන් 60 ක් සහ මගීන් 32,855 ක් ඇතුළුව ගුවන් ගමන් 285 සිදු කිරීමට සමත් විය.

නවතම සෞඛ්‍ය සහ ආරක්ෂක ක්‍රියාමාර්ග සමගින් අපගේ මගීන්ට උසස් සේවා මට්ටම් ලබා දීමෙන් අපගේ වටිනා පාරිභෝගිකයන් සමග එලදායි හවුල්කාරිත්වය ගොඩනැගීමට, අනාගතයේ අර්බුධකාරී අවස්ථාවන්හිදී කාර්යක්ෂමව මෙහෙයුම් කටයුතු කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මෙහෙයුම් ක්‍රියාදාම අඛණ්ඩව සමාලෝචනය කරනු ඇත.

ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා විසින්, ගොඩබිම් සේවා සඳහා IATA ආරක්ෂක විගණනය (ISAGO) සහ IATA මෙහෙයුම් ආරක්ෂක විගණනය (IOSA) වලදී අනුකූලතා ලබා ගත් අතර, එමගින් ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා සඳහා සියලුම ගුවන් සේවා වලට දැඩි උනන්දුවෙන් සේවය කිරීමට හැකි විය.

## ශ්‍රීලංකන් ඉන්ජිනේරු අංශය

ගුවන් සේවා වලට සහයෝගය දැක්වීමට ශ්‍රීලංකන් ඉන්ජිනේරු අංශය දැඩි උනන්දුවෙන් කටයුතු කළ අතර, සේවා පිරිනැමීම වර්ධනය කරමින් පීඩාකාරී වසරක් තුළ සැලකිය යුතු ඉතිරියක් ලබා ගැනීමට හැකි විය.

අවම කරන ලද පියාසර ක්‍රියාකාරකම් සඳහා, ගුවන් යානා කිහිපයක ගොඩබෑම සහ ආරක්ෂා කිරීම අවශ්‍ය වූ අතර, පසුව බොහෝ ගුවන් යානා නැවත සක්‍රීය කිරීමට අවශ්‍ය වූ අතර එය ඉංජිනේරු කණ්ඩායමේ විසින් නිෂ්පාදක මාර්ගෝපදේශයන්ට අනුකූලව සාර්ථකව සිදු කරන ලදී.

ගුවන් සේවා ඉංජිනේරු අංශය මුහුණ දෙන මෙහෙයුම් පහත වැටීමට සහ මුදල් ගලා ඒමේ අභියෝගයන්ට ප්‍රතිචාර වශයෙන්, ලීසිං කොන්ත්‍රාත් භාරකරු වශයෙන්, සියලු බදුකරුවන් සමග සම්බන්ධ වී එහි සියලු ගුවන් යානා සහ එන්ජින් කල්බදු ගිවිසුම නැවත සාකච්ඡා කිරීමට පහසුකම් සැලසීමට කටයුතු කළේය. ගුවන් යානා කිහිපයක් ඇණහිටීම සමග විශාල ආදායම් පහත වැටීමක් සහ ඉල්ලුම යථා තත්වයට පත් වීම සීමා වීමක් ඇති කළ හෙයින් ගුවන් සමාගමට එහි ගුවන් කල්බදු වියදම අවම කිරීමට අවශ්‍ය විය. දීර්ඝ කාලයක් පැවති සාකච්ඡාවලින් අනතුරුව, ගුවන් සේවා ඉංජිනේරු අංශයේ උත්සාහයන් නිසා අනාගතය සඳහා වසර ගණනාවක් දක්වා කල්බදු පිරිවැය යටතේ ඩොලර් මිලියන

100ක වටිනාකමක් ඉතිරි කර ගැනීමට සමාගමට හැකි විය.

අඩු මෙහෙයුම් මට්ටම හඳුනාගෙන, නඩත්තු කිරීමේ මෙහෙයුම් සෑම අංශයකම කාර්යක්ෂතාව තවදුරටත් ඉහළ නැංවීමට උත්සහ කරන ලදී. ද්‍රව්‍ය මිලදී ගැනීමේදී මුදල් පිටතට ගලා යාම අවම කිරීම සහ මෙහෙයුම් මට්ටමට ගැළපෙන පරිදි නඩත්තු වැඩසටහන ප්‍රශස්ත කිරීම සඳහා නව ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කරන ලදී. කැබින් සහ පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළත්ව, ගුවන් යානා අමතර නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා ගොඩබිම පවතින කාලය භාවිතා කරන ලදී. එමෙන්ම ගුවන් සේවා ඉංජිනේරු අංශය කෝවිඩ්-19 ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර රෙගුලාසි පිළිපදිමින් විෂබීජහරණ ක්‍රියාකාරකම් ඇතුළත්ව නව සෞඛ්‍ය සහ ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක කිරීමට සමත් විය.

සේවා සපයන්නන් සහ ස්වකීය මිනිස් බලය තුළින් අලුතින් සැලසුම් කළ සහ තාවකාලික ගමනාන්තයන්හි නඩත්තු කිරීම සහ ගුවන් යානා සහතික කිරීම සඳහා ගුවන් සේවා ඉංජිනේරු අංශය පහසුකම් සැලසීය.

කොළඹ සහ මාලදිවයින වෙත පැමිණෙන ගමනාගමනය පහත වැටීම හේතුවෙන්, තුන්වන පාර්ශවීය ගුවන් යානා වලට සේවා සැපයීමෙන් උපයන ඉංජිනේරු රේඛීය නඩත්තු ආදායම පහත වැටුණි. මෙම තත්වයට ප්‍රතිචාර වශයෙන් සහ කෙටි කාලීනව පාරිභෝගික ගුවන් සේවා මෙහෙයුම් අවිනිශ්චිත පරිමාණය හඳුනාගෙන, ගුවන් සේවා ඉංජිනේරු අංශය විසින් සිය මෙහෙයුම් වල අනෙකුත් අංශයන් අතිරික්තක සම්පත් නැවත යෙදවීමට කඩිනමින් කටයුතු කළ අතර අනෙකුත් ආදායම් මාර්ග පුළුල් කිරීමට උපාය මාර්ගයක් අනුගමනය කරන ලදී. මෙම උපාය මාර්ගයේ කොටසක් ලෙස, ගුවන් සේවා ඉංජිනේරු අංශය විසින් සිය පදනම් නඩත්තු සේවා සැපයීමේ කටයුතු පුළුල් කිරීමට සහ සංචරක නඩත්තු කිරීම මෙන්ම තාවකාලික භාණ්ඩ හුවමාරු කිරීම ඇතුළත් කිරීම සඳහා සිය සේවා කළඹ පුළුල් කිරීමට උත්සහ කරන ලදී. මුද්‍රිත මෙන්ම ඩිජිටල් මාධ්‍ය ඔස්සේ අලුත් වැඩියා කිරීමේ සහ මෙහෙයුම් අවකාශයන් (MRO) හි වෙළඳ නාම නිරාවරණය වැඩි කිරීම සඳහා අලෙවිකරණ උත්සහයන් තීව්‍ර කෙරිණි.

වසර තුළදී, ගුවන් සේවා ඉංජිනේරු අංශය මගින්, එක් මගී ප්‍රවාහන ශ්‍රීලංකන් එයාර් බස් ඒ 330-200 ගුවන්යානයක් තාවකාලික භාණ්ඩ ප්‍රවාහන ගුවන්යානයක් බවට සාර්ථක පරිවර්තනයක් කරන ලදී. සමාලෝචනයට භාජනය වූ වසරට පසු, එයාර් බස් ඒ 320 ගුවන්යානයක් තුන්වන පාර්ශවීය පාරිභෝගිකයෙකු සඳහා ගුවන් සේවා ඉංජිනේරු අංශය විසින් පෙර ආකාරයටම සමාන පරිවර්තන ව්‍යාපෘතිය සිදු කරන ලදී.

හැකි සෑම අවස්ථාවකදීම මාර්ගගත ක්‍රමය යටතේ සියලුම අනිවාර්ය පුහුණු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. වසංගත තත්වය අතරතුර නව දුරස්ථ සේවා ක්‍රමයක් ක්‍රියාත්මක වීම ඩිජිටල්කරණ ව්‍යාපෘතිවල වටිනාකම පෙන්නුම් කළ අතර, එය හැකි සෑම අවස්ථාවකදීම සියලු ලේඛන කටයුතු ඩිජිටල්කරණය ආධාරයෙන් ඉටු කිරීමට සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට පියවර ගෙන ඇත.

## ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය (SLAC)

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය (SLAC), ජාතික ගුවන් සේවයේ පුහුණු අංශය සමාලෝචනයට බඳුන් කළ වර්ෂය තුළ, ඉතා වැදගත් කාර්ය සාධනයක් පෙන්නුම් කිරීමට සමත්විය. මෙම විද්‍යායතනය, ජාත්‍යන්තර ගුවන් ගමනාගමන සංගමය (IATA), යුරෝපීය ගුවන් සේවා ආරක්ෂණ නියෝජිතායතනය (EASA), ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO), රාජකීය ගුවන් සමාජය (RAES), යුරෝපීය ගුවන් සේවා නඩත්තු පුහුණු කමිටුව (EAMTC),  ශ්‍රී ලංකා, පාකිස්තානු සහ මාලදිවයින යන සිවිල් ගුවන් සේවා අධිකාරිය වැනි ආයතන මගින් පිළිගැනීමට ලක් වූ අතර, කීර්ති නාමයක් දරණ අධ්‍යයන ආයතනය සහ පුහුණු ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරමින් සිසුන්ට මෙන්ම වැඩ කරන වෘත්තිකයින්ට ද පුළුල් ගුවන් අධ්‍යයන විකල්ප දීර්ඝ කරන ලදී.

වර්ග පුහුණු ප්‍රතීතනය සහ ඒකාබද්ධ පුහුණු හවුල්කාරීත්වය සඳහා එයාර් බස් පුහුණුව සහ Boeing සමග හවුල්කාරීත්වය වර්ධනය කර ගැනීමට සමත් විය. මෙම ජයග්‍රහණය ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සහ ගුවන් පුහුණු අවස්ථාවල ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය පුරෝගාමියා ලෙස කටයුතු කරයි.

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් ICAO පුහුණු පාඨමාලා සංවර්ධන ක්‍රමවේදය උපයෝගී කරගනිමින් පෞරුෂය දියුණු කිරීමේ සහ රූපලාවන්‍ය, ආයතනික චිත්තවේග පුහුණු වැඩසටහන, ඩ්‍රෝන් නියමු පුහුණුව වැඩසටහන සහ සහතිකපත් වැඩසටහන වැනි නව පුහුණු වැඩසටහන් කිහිපයක්ද සාර්ථකව සංවර්ධනය කර ඇත.

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය  විසින් ‘IATA Virtual Training Partner’ යන නාමය පිරිනමනු ලැබූ අතර, IATA ගාස්තු සහ ප්‍රවේශපත්‍ර, ගුවන් සේවා සඳහා තත්ව කළමනාකරණය, ආදායම් කළමනාකරණය සහ සංචාරක කර්මාන්ත සඳහා සමාජ සේවා මාධ්‍ය (දුරස්ථ අධ්‍යාපනය) වැනි විශේෂිත පාඨමාලා  පැවැත්වීමට බලපත්‍ර ලබාගෙන ඇත.

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයේ කැපී පෙනෙන දක්ෂතා තවදුරටත් තහවුරු කරමින්, විද්‍යායතනය ‘IATA ප්‍රාදේශීය හොඳම කාර්යසාධකයා’ සම්මානයෙන් අඛණ්ඩව 2020 වසරේදීත් පිදුම් ලැබීය.

මෙම පිළිගැනීම ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය, සිසුන්ගේ ජයග්‍රහණය සඳහා කැපවීම පෙන්නුම් කරමින් පුහුණුව සඳහා වූ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් ලෙස සහ IATA පුහුණු වැඩසටහන් ලබා දීමේ වෘත්තීයභාවය පෙන්නුම් කරනු ලබයි.

## *රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක තත්වය ලබා ගැනීම*

රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය කටයුතු කරමින් සිටී. සමාරම්භක උපාධි පාඨමාලාවන් වන සත්කාරක සේවා සහ සංචාර කළමනාකරණය පිළිබඳව (ගුවන් සේවා) විද්‍යා උපාධිය සහ ගුවන් සේවා සඳහා කළමනාකරණය පිළිබඳව විද්‍යා උපාධිය සඳහා විෂය නිර්දේශ සකස් කිරීම බොහෝ දුරට අවසන් කර තිබේ. ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය නෛතික ආකෘතියක් සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය සමගින් සාකච්ඡා මගින් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන සංවිධාන සැලැස්ම මේ වන විට නිම කරමින් සිටියි.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

***අධ්‍යාපන සංවිධාන කළමනාකරණ පද්ධති (EOMS)***

2016 නොවැම්බර් මාසයේදී තත්ව කළමනාකරණ පද්ධති සඳහා ISO 9001:2015 සහතිකය සහ විධිමත් නොවන අධ්‍යාපන සහ පුහුණුව සඳහා වූ ඉගෙනීමෙ සේවා සඳහා 29990:2010 සහතිකය ලබා ගැනීම සහ, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් සිය අධ්‍යාපන සංවිධාන කළමනාකරණ පද්ධති සහතිකය ලබා ගැනීමට උත්සාහ කරන අතර, එමගින් ඉගැන්වීම, ඉගෙනීම හෝ පර්යේෂණ තුළින් නිපුණතා අත්පත් කර ගැනීමට සහ වැඩි දියුණු කිරීමට සහය දීමට ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයට හැකිවනු ඇත. පද්ධතිය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියන් සහ ඉගෙනුම්කරුවන්ගේ සහ අනෙකුත් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහතික කිරීම ඇතුළත් වන එහි ඊඕඑම්එස් ඵලදායී ලෙස යෙදීම තුළින් ඉගෙන ගන්නන්, සෙසු ප්‍රතිලාභීන් සහ කාර්ය මණ්ඩලය තෘප්තිමත් කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

ISO 21001:2018 යනු වෘත්තිය පුහුණු දෙපාර්තමේන්තු වැනි අධ්‍යාපන නොවන ප්‍රධාන ව්‍යාපාර වූ, විශාල සංවිධානවලට අදාළ අධ්‍යාපන සංවිධාන සහතිකයකි. ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයට විශ්ව විද්‍යාලයක් වීමට කටයුතු කරන හෙයින්, ISO 21001:2018 ප්‍රමිතිය ලබා ගැනීම ඉහළ පෙළ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතන ක්‍රියාවලීන් සහ භාවිතයන් සකසනු ලබන අතර, එමගින් මහජනතාවට සහ පොදුවේ අනෙකුත් පාර්ශවකරුවන්ට එහි ආකර්ෂණය ඉහළ නංවනු ලැබේ.

***මාර්ගගත ක්‍රමයට පුහුණුව පවත්වාගෙන යාම***

වසංගතය තත්වය තුළ SLA සඳහා සඳහා කිසිදු අතිරේක පිරිවැයක් නොමැතිව ඔවුන්ගේ අනුමැතිය ලබා දීම සඳහා මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා අනතුරුදායක භාණ්ඩ නියාමන පුහුණුව, එනම් මාර්ගගත විභාග ආරම්භ කිරීමට ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය සහාය විය. වසංගත තත්වය හේතුවෙන් සීමාවන් පැනවූවද ගුවන් යානා නඩත්තු කිරීමේ පුහුණු පාඨමාලාව ශ්‍රීලංකන් කාර්මික පුහුණුව (STT) මාර්ගගත ක්‍රමයට අඛණ්ඩව පවත් ගෙන යන ලදී.

***එයාර්බස් පුහුණු හවුල්කාරීත්වය***

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය, ලොව විශාලතම ගුවන් යානා නිෂ්පාදකයෙකු සමග පුද්ගලයින්ට ඔවුන්ගේ නිපුණතා තවදුරටත් වර්ධනය කර ගැනීමේ අවස්ථාව ලබා දීමේ අරමුණින්, සිය විශිෂ්ඨතම පුහුණු සේවා තවදුරටත් ඉහළ නංවා ගැනීම සඳහා එයාර් බස් පුහුණුව පිළිබඳ හවුල්කාරීත්වය සාකච්ජා කරයි. නවතම තාක්ෂණය සහ ඉගෙනුම් සංකල්පය නීතිගත හඳුන්වා දෙන නවෝත්පාදක ප්‍රවේශයකින්, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය බලාපොරොත්තු වන්නේ එයාර් බස් පුහුණු පාඨමාලාව ඉගෙනීමට පහසුව සලසා දෙමින් කලාපයේ සිසුන්ට වැඩි පහසුවක් සලසා දීමයි.

***Boeing හවුල්කාරීත්වය***

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය, Boeing සමග පුහුණු හවුල්කාරීත්වයක් ඇති කරගත් අතර, එමගින් ශ්‍රීලංකන් එයාර්ලයින් සහ Boeing අතර අවබෝධතා ගිවිසුම මත, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය ඒකාබද්ධ පුහුණු හවුල්කාරීත්වයක් පිළිබඳ ඉහළ මට්ටමේ සාකච්ඡා පවත්වා ගෙන යනු ලබයි. මෙම හවුල්කාරීත්වය යටතේ පළමු වරට දියත් කිරීමට ඇති වැඩසටහන, ගුවන් යානා පිටත්කර වීම/ICAO 201 වැඩසටහන වේ. Boeing සහ එයාර් බස් වේදිකා පිළිබඳ සිසුන්ට පුහුණු පාඨමාලව සඳහා යොමු වීමට අවස්ථා සලසමින්, ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ ප්‍රමුඛ පුහුණු ආයතනය ලෙස එහි පිළිගැනීම ලබා ගැනීමට සහ ඊට පදනම සැපයීමට, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් පුහුණු පාඨමාලා පුළුල් කිරීමට කටයුතු කරයි.

***පුහුණුව සඳහා වෙනත් හවුල් සම්බන්ධතා***

පුහුණු විෂය පථය පුළුල් කරමින් දේශීය සමාගමක් සමග හවුල්කාරීත්වයක් ඇති කරගමින් පාකිස්ථානයේ EASA අනුමත ඉංජිනේරු පුහුණුව ලබා දීමට STT මගින් සැලසුම් කරයි.

දේශීය කර්මාන්තය නඟා සිටුවීමේ අදහසින් දේශීය ක්‍රියාකරුවන්ගේ පුහුණුවට අදාළ වූ එහි නව සංවර්ධනයක් කරන ලද ගුවන් යානා නඩත්තු මගින් ප්‍රාදේශීය ගුවන් සේවා කර්මාන්ත සඳහා සහය ලබා දීම විද්‍යායතනය විසින් කරගෙන යනු ලබයි.

***ගුවන්යානා නඩත්තු අංශයේ රැකියාව අතරතුර පුහුණුව***

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් ව්‍යුහගත රැකියාව අතරතුර පුහුණුව (SOJT), අදාළ රැකියා පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළ පසු එහි පළමු සහතිකය ලබා ගැනීම සඳහා පිරිනමනු ලැබෙයි.

එමෙන්ම ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් අදාළ ගුවන් යානා නඩත්තු කිරීමේ කණ්ඩායේ මූලික බලපත්‍ර ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට පුද්ගලයින් සඳහා රැකියාව අතරතුර පුහුණුව ලබාදීමට සැලසුම් කරනු ලබයි. ඉහත යෝජිත වැඩසටහන් 'EASA part 145 organisation' විසින් පවත්වනු ලැබේ (ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය) .

***භූගෝලීය විවිධාංගිකරණය***

උතුරු සහ නැගෙනහිර පළාත්වල බලය ලත් ආයතන පුහුණු ආකෘතියක් ස්ථාපිත කිරීමට ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් සැලසුම් කරනු ලැබේ. නැගෙනහිර විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශීය ඒකකය සමග ගෞරවනීය උපදේශකවරුන් විසින් මාර්ගගත වැඩසටහනක් වන ගුවන් නියමු පුහුණු වැඩසටහන පවත්වනු ලබයි.

***පාඨමාලා සංවර්ධන ඒකකය (CDU)***

වෙළඳපොළ විශ්ලේෂණ සමාලෝචනය කිරීමෙන් සහ වැඩිදුර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු පාඨමාලා ඵලදායිතාවය තක්සේරු කිරීමෙන් වැදගත් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සහ ඉදිරියේදී ගුවන් සේවා විශ්ව විද්‍යාලයක් වීමේ පරමාර්ථය ඉටු කරගැනීමේ අරමුණින් ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් පාඨමාලා සංවර්ධන ඒකකයක් පිහිටුවන ලදී. ව්‍යුහගත නිපුණතා පදනම් කරගත් පුහුණු වැඩසටහන්වල ප්‍රතිඵලයක් වන පුහුණු විෂයමාලා සංවර්ධනය සහ ක්‍රියාත්මක කරන උසස් පියවර සහ අදියර පදනම්වූ, පුහුණු කිරීමේ වැඩසටහන් අන්තර්ගතය/ වැඩසටහන් සංවර්ධනයේ ICAO පුහුණු පාඨමාලාව සංවර්ධන ක්‍රම, CDU විසින් යොදා ගන්නා ලදී. Finishing School/ Corporate Plus, චිත්තවේගී බුද්ධි පුහුණු වැඩසටහන, ඩ්‍රෝන් නියමු පුහුණුව සහ සහතික කිරීමේ වැඩසටහන ඉහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින් CDU විසින් සකස් කරන ලද පුහුණු වැඩසටහන් කිහිපයකි.

## ශ්‍රීලංකන් කේටරින් සමාගම

### *කාර්යසාධනය*

ශ්‍රීලංකන් කේටරින් සමාගම යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි පූර්ණ හිමිකාරීත්වය දරන පරිපාලිත ආයතනයක් වන අතර, එය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළේ යානාස්ථ ආහාර සපයන එකම සැපයුම්කරු වේ. බණ්ඩාරනායක සහ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (MRIA) සංක්‍රමණික මගීන් සඳහා අවන්හල් සහ විවේකාගාර ක්‍රියාත්මක කරනු ලබයි. එහි අතිරේක ව්‍යාපාරික කටයුතුවල කොටසක් ලෙස, ශ්‍රීලංකන් කේටරින් මගින් සෙරින්ඩිවා ට්‍රාන්සිට් හෝටලය (Serendiva Transit Hotel) සහ රෙදි සේදීමේ සේවාව ක්‍රියාත්මක කරනු ලබයි.

කෝවිඩ් 19 වසංගතය ශ්‍රීලංකන් කේටරින්හි සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019/20 වසරේ රු. මිලියන 9,036 ක් වූ ආදායම සමග සසඳන කළ රු. මිලියන 694 ක් ලෙස වාර්තා කරමින් සැලකිය යුතු ලෙස ආදායම පහත බැස්මක් පෙන්වන ලදී. තවදුරටත් වාර්තා කළ බදුවලට පසු ශුද්ධ අලාභය රු. මිලියන 960 ක් වූ (2018/19 දී- ලාභය රු. මිලියන 4,800 ) අතර, මගීන් සංඛ්‍යාව පහත බැසීම හේතුවෙන් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සැලකිය යුතු ලෙස අඩුවිය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, ශ්‍රීලංකන් කේටරින් නව ආදායම් මාර්ගය සක්‍රීය පවත්වා ගෙන ගියේය. අදාළ වෙළඳපොළ පර්යේෂණයට පසුව, එය ශීත කළ ආහාරපාන කිහිපයක්, Cuisine Gastronome' නම් සන්නම් සංකල්පය, දේශීය සහ අපනයන වෙළඳපොළ වෙත විශාල නිෂ්පාදන සහ මෙහෙයුම් හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් හඳුන්වාදෙන ලදී. ශ්‍රීලංකන් කේටරින් මෙම ආහාරපාන දැනටමත් ඕස්ට්‍රේලියාව, සහ ඇමරිකා එක්සත් ජනපදයට අපනයනය කරන අතර, කැනඩාව එක්සත් රාජධානිය සහ යුරෝපා සංගමයට අපනයනය කිරීම සඳහා සාකච්ඡා අවසන් කරමින් සිටී. එපමණක් නොව මෙම නිෂ්පාදන දේශීයව බෙදා හැරීම වැඩි දියුණු කිරීම සහ ජපානය සහ මැද පෙරදිග දක්වා ව්‍යාප්ත වීමෙන් අපනයන වෙළඳ පොළ තවදුරටත් සංවර්ධනය කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද පරිපාලිතයේ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් උත්සාහ දරන අතර, පිරිවැය කාර්යක්ෂමතාව ඇති කිරීමට සම්පත් ප්‍රශස්ත කිරීම සඳහා අවධාරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මාණ්ඩලික සේවා සංඛ්‍යාව දැක්වීමට සහ නිසි ප්‍රමාණයට පවත්වා ගැනීමට හැකි විය. මීට අමතරව, මෙහෙයුම් මට්ටමේ අඩු වීමත් සමග අනෙක් සෘජු මෙහෙයුම් වියදම් මාර්ගයන් අවම කිරීමට ඉහළ අවධානයක් දෙන ලදී. වසංගත තත්වය හමුවේ පිරිවැය කළමනාකරණය කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් නැවත සාකච්ඡා කිරීමට පියවර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ ප්‍රධාන සේවා සපයන්නන්, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම (ශ්‍රීලංකන්) ඇතුළත්ව ද්‍රවශීලීතාව වැඩි දියුණු කිරීමට දායක වූ කුලිය මත සහන සැපයීම ලබා දෙන ලදී. ශ්‍රීලංකන් කේටරින් ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති කල් දැමූ අතර, තීරණාත්මක සහ හදිසි ප්‍රාග්ධන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම් උත්පාදන කටයුතු සහ පරිපාලිතයේ පිරිවැය කළමනාකරණය මූලාරම්භයක් වැඩි දියුණු කරන ලදී.

### *ආදායම*

වසංගත තත්වය හේතුවෙන්, පෙර මූල්‍ය වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචනයට භාජනයට වූ වර්ෂය තුළ පරිපාලිතයේ ආදායම් සංයුතියේ විශාල වෙනසක් සිදුවිය.

**ආදායමට එදිරිව ආදායම් වර්ධනය**




පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ යානස්ථ ආහාරපාන 93% (රුපියල් මිලියන 6,736) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ අවන්හල්වල ආහාරපාන ආදායම 93% කින් (රුපියල් මිලියන 1,134) අඩු වීමයි.

පසුගිය මූල්‍ය වර්ෂයේ මිලියන 6.5 ක වටිනා ආහාර සැපයුමට සාපේක්ෂව වර්ෂය තුළ නිෂ්පාදනය කරන ගුවන් යානා ආහාර ප්‍රමාණය 96% කින් එනම් වාර්ෂිකව ආහාර රු. මිලියන 0.25 දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යානස්ථ කේටරින්හි ප්‍රධාන පාරිභෝගිකයා 68% ක් මුළු යානස්ථ පිරිවැටුමෙන් පෙන්නුම් කරන අතර, මුළු නිෂ්පාදිත ආහාර ප්‍රමාණයෙන් 76% ක් නියෝජනය කරයි.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ අවන්හලේ (පොදු සහ අතරමැදි) දායකත්වය පරිපාලිතයේ මුළු ආදායමයෙන් 12%කි. කෙසේ වෙතත් ගුවන් තොටුපළ අවන්හලේ ආදායම පසුගිය මූල්‍ය වසරට සාපේක්ෂව රුපියල් මිලියන 86 දක්වා 93% කින් අඩු වී ඇත (2019/20 රුපියල් මිලියන 1,220). තවද අනෙකුත් අනුබද්ධ ව්‍යාපාරික කටයුතු වලින් පිරිවැටුම 78% කින් අඩු විය.

### *වියදම*

වර්ෂය තුළදී, ව්‍යාපාර අඩු වීම හේතුවෙන් මෙහෙයුම් අලාභයන් අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ආදායම 93% කින් පහත වැටීමට සමගාමීව සෘජු පිරිවැය 81% කින් අඩු විය. ආයතනය පුරා මෙහෙයුම් පිරිවැය අඩුකිරීම සඳහා කළමනාකරණය විසින් දරන ලද උත්සාහයන් පිළිබිඹු කරමින් සමස්ථ පොදු කාර්ය පිරිවැය 47% කින් එනම් රුපියල් මිලියන 3,170 සිට රුපියල් මිලියන 1,731 දක්වා අඩු කළ අතර සම්පත් ප්‍රශස්තිකරණය කෙරෙහි අවධානය යොමු කෙරුණි. කාර්ය මණ්ඩලය සඳහා වන පිරිවැය 47% කින් අඩු වීම ප්‍රධාන වශයෙන්ම කළමනාකරණය විසින් අතිකාල දීමනාව අඩු කිරීමට සහ සේවක සංඛ්‍යාව නිවැරදිව පවත්වා ගෙනයාමට ගත් ක්‍රියාමාර්ගයක් සඳහා උදාහරණයකි. තවද ක්‍රියාකාරකම් මට්ටම් සමග සෘජුවවම සම්බන්ධිත අනෙකුත් මෙහෙයුම් වියදම් වර්ෂය තුළ 44% පහත වැටීමක් වාර්තා කරන ලදී.

### *ලාභදායීත්වය*

වසංගතයේ විනාශකාරීත්වයේ බලපෑම නොතකා, විවිධාංගිකරණය සහ පිරිවැය සීමා කිරීමේ වැඩපිළිවෙළේ ප්‍රතිඵලයක් වශයෙන් එම වර්ෂයේ පාඩු අවම කර ගැනීමට සහ රුපියල් මිලියන 903 ක ශුද්ධ අලාභයක් පවත්වා ගැනීමට ශ්‍රීලංකන් කේටරින් සමත් විය.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

**ශුද්ධ ලාභ ප්‍රවණතාව**




## උපකාරක සේවා

### ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය විසින් ගුවන් සේවා කර්මාන්තයේ අති නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් ඩිජිටල් ව්‍යාපාර සහ තාක්ෂණික මෙහෙයුම් සමග මගීන්ගේ අත්දැකීම් ඉහළ නංවමින් ශ්‍රීලංකන් හි ව්‍යාපාර සහ අරමුණු අනුව ශ්‍රීලංකන් හි තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය පාලනය කරනු ලබයි.

2020/21 මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ සේවා අංශය අන්තර්ජාලය හරහා ඩිජිටල් ව්‍යාපාර සේවා නිෂ්පාදන කිහිපයක් හඳුන්වා දෙමින් සහ නවීකරණය කරමින්, පුද්ගල සබඳතාවක් නොමැති සංචාරයක් සඳහා පහසුව ලබා දෙමින්, ජාතික ගුවන් සේවය NextGen තාක්ෂණ සහ සැලසුම් කළ නවෝත්පාදනයන් සමග නව පෙරළියකට තාක්ෂණය හඳුන්වා දෙන ලදී.

කෝවිඩ් 19 වසංගත තත්වයත් සමග මෙහෙයුම් අවම වීමෙන්, ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය සමස්ත තොරතුරු තාක්ෂණ පිරිවැය තාක්ෂණ ගිවිසුම් නැවත ගිවිස ගැනීමෙන් අඩු කරගත් අතර, අවම කර ගත් මෙහෙයුම් සමග තොරතුරු තාක්ෂණ සේවාවන් සිදු කරන ලදී. මෙමගින් තොරතුරු තාක්ෂණ පහසුකම් පිරිවැය 16% කින් අඩු කිරීමත්, තොරතුරු තාක්ෂණ ව්‍යාපාර පද්ධති පිරිවැය 23% කින් පසුගිය වසරට සාපේක්ෂව අඩු වීමත් සිදු විය. ඊට අමතරව ගුවන් සමාගමෙහි මූල්‍ය ගලනය කළමනාකරණය පහසු කිරීමට ගෙවීම් විලම්භ කාලයක් ලබා ගැනීමට සාකච්ඡා කෙරුණි.

### මගී අත්දැකීම් පිරි පුද්ගල සම්බන්ධතා රහිත සංචාරක මාවතක්

නව සමාජ තත්වය සමග, ලොව පුරා සිටින ගුවන් මගීන් ගමනාගමනයේ දී බාධා අඩු, අවම පුද්ගල මැදිහත් වීමකින් සිදු කිරීමට කැමැත්තක් දක්වන ලදී. මෙම අවශ්‍යතාව සපුරාලීමට ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙ හි සහ ලොව පුරා පිහිටි ශ්‍රීලංකන් ජාල ස්ථාන හරහා කරදර රහිත වේගවත් මගී ප්‍රවේශයක් හඳුන්වා දීමට සහ මගීන් පිරික්සුම සහ බෑග් ටැග් කිරීම සඳහා ස්පර්ශ රහිත KIOSK ලබාදීමට ආයෝජනය කරන ලදී. ඊට අමතරව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී ආගමන අධිකාරීන්ගේ තොරතුරු පද්ධති සමග මගී තොරතුරු පිරික්සුම සඳහා සෘජුවම ජංගම නේවාසික බලපත්‍රය සක්‍රීය කිරීම සඳහා නව මාවතක් ඇති කළේය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි මගීන් ස්පර්ශක ස්ථාන හොඳින් තක්සේරු කිරීමෙන් සහ කර්මාන්තයේ නවීන තාක්ෂණයන් ගෙන වීමෙන් මගීන් සඳහා සම්බන්ධතා රහිත ස්වයං සේවා සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබා දෙමින් සවිස්තර සැලැස්මක් සිදු කරන ලදී.

### ආයතනික වෙබ් අඩවියට නව මුහුණුවරක්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි ආයතනික වෙබ් අඩවිය නව මුහුණුවරක් සමග නවීකරණය කර වැඩි දියුණු කළ අතර එමගින් නැවුම් අත්දැක්මක් ලබා දෙන ලදී. තරඟකාර ජාත්‍යන්තර ගුවන් සමාගම්වල වෙබ් අඩවි අනුව ප්‍රතිසංස්කරණය කරන ලදී. නව වෙබ් අඩවිය භාෂා 10කට පරිවර්තනය කර ඇති අතර, එමගින් ලොව පුරා ව්‍යාප්ත වීමට ඉඩ සලස්වයි. මෙය UI පරිශීලක අතුරු මුහුණත සහ UX පරිශීලක පළපුරුද්ද යන අංශයන්හි සැලකිය යුතු දියුණුවක් ඇති කළේය. නව වෙබ් අඩවිය නවතම පරිශීලක හිතකාමී ජංගම ප්‍රතිචාරාත්මක විශේෂාංග එකතු කර ඇති අතර, එමගින් ගනුදෙනුකරුවන්ට නව සහ සරල වෙබ් පිටුවක අත්දැකීමක් ලබා දෙයි.




තවද, මෙම වැඩිදියුණු කිරීම මගින් SEO නවතම ප්‍රවණතා සමග අනුකලනය කිරීමට හැකි වූ අතර, ගුවන් සේවාවේ ආදායම් උත්පාදන රාශියක් ඇතුළත් කොට ප්‍රමුඛතාවයක් ඇති කරන ලදී. වැඩිදියුණු කළ වෙනස්වන ‘Booking Widget’ හරහා යොමු වීමෙන් ආසන වෙන් කරවා ගැනීමට පාර්ශ්වකරුවන්ට ඉඩ සලස්වන අතර, නව ‘Ancillary Ribbon’ මගින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමග සංචාරය කරන මගීන්ට ලබා ගත හැකි සියලුම සහායක සේවා ප්‍රදර්ශනය කරනු ලබයි. නිශ්චිත මූලාරම්භයකින් වැඩි ඉල්ලුමක් ඇති මාර්ග සහ ඒවායේ ගතික ගාස්තු ප්‍රදර්ශනය කිරීමට නව කාර්ය සාධන අලෙවිකරණ විශේෂාංගය ඉඩ සලසයි. එසේම නව සෙවුම් විකල්පය ක්ෂණිකව ඇති නව දීමනා සහ අනුග්‍රහයන් ඇතුළත්ව ‘නවතම දීමනා’ අංශය මගින් තත්පර කිහිපයකින් මගීන්ට තමාට අවශ්‍ය දේ වෙබ් අඩවියෙන් නිසැකව සොයා ගැනීමට අවස්ථාව සලසයි.

ප්‍රතිසංස්කරණය කරන ලද වෙබ් අඩවිය, සියලුම SLA වෙබ් අඩවිවල අනුකූලතාව පවත්වා ගෙන යන අතර දත්ත ආරක්ෂාව සහ ගුවන් සේවා රෙගුලාසිවල අවශ්‍ය අනුකූලතා සහ ප්‍රමිතීන් සපුරාලන අතර පරිශීලකයන් පාදක කරගත් සරල විශේෂාංග පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ තෘප්තියක් පෙන්නුම් කරයි.

### ශ්‍රී ලංකාවේ පළමු ගෘහස්ථ සිතියම් ක්‍රියාත්මක කිරීම

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණය අංශය ශ්‍රී ලංකාවේ මෙම විශේෂාංගය සක්‍රිය කළ පළමු ගෘහස්ථ පහසුකම බවට පත්වෙමින් බණ්ඩාරනායක ගුවන් තොටුපලෙහි ගෘහස්ථ ගූගල් සිතියම හඳුන්වා දීමට සමත් විය. AASL හි තොරතුරු තාක්ෂණ කණ්ඩායම සමග ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස මෙය දියත් කරන ලදී. මෙයින් පරිශීලකයින්ට තමන් අවට ස්ථාන බැලීමටත්, ගුවන් තොටුපලෙහි තම මාර්ගය සොයා ගැනීමට ගෘහස්ථ ගූගල් සිතියමහි තොරතුරු පිරික්සීමටත් හැකිය. බණ්ඩාරනායක ගුවන් තොටුපලෙහි ගෘහස්ථ සිතියමහි පර්යන්තය හරහා මගීන්ට ගමන් කිරීමට පහසු කිරීමට ඇතුළුවීමේ කවුන්ටරය, පහසුකම් සහ වෙළඳසැල් වලින් සමන්විතය. මෙම පහසුකම මගින් ගුවන් තොටුපලෙහි පිහිටි B2B ආයතනවල දුරස්ථ දෘශ්‍යතාවයට ඉඩ සලස්වයි.

***මගී අන්තර්ක්‍රියා සඳහා 'යානා' (YAANA) චැට්බොට්***




ශ්‍රීලංකන් හි පළමු CHAT BOT (ඩිජිටල් මගී ආධාර) එනම් 'යානා' දියත් කළේ සමාලෝචනය කරන ලද වසරේදී වන අතර එතැන් සිට ඇය බොහෝ වෙබ් අඩවි පරිශීලකයින්ට සේවා සපයනු ලබයි. 'යානා' සංවර්ධනය කරන ලද්දේ කෝවිඩ් 19 ආශ්‍රිත ගැටලු සඳහා වන අතර සංචරණ සීමා සම්බන්ධව මගීන්ගේ විමසීම්වලට කාලෝචිත පියවරක් ලෙසයි. රටට පැමිණීමෙන් පසු කළ යුතු විශේෂ ක්‍රියාමාර්ග පිළිබඳ, ගමනාන්ත ගුවන් තොටුපලවල් සහ බලපෑමට ලක් වූ ගමනාන්ත, සංචාරක වෙනස්වීමේ ප්‍රතිපත්ති, සංචාරක සීමා සහ නවතම ප්‍රවෘත්ති පිළිබඳව ඇය තොරතුරු සපයයි.

තවද 'යානා' ඇයට පිළිතුරු දිය නොහැකි ගැටළු සඳහා මගීන්ව නියෝජිතයන්ට යොමුකිරීමට තරම් බුද්ධිමත්ය.

'යානා' සැලසුම් කර ඇත්තේ සංවාද හැකියාවන් ඇති මෙනුවකට අනුව CHAT BOT එකක් ලෙස වන අතර මෙය නව ප්‍රතිසංස්කරණය කරන ලද www.srilankan.com වෙබ් අඩවියේ පළ කරන ලදී. වෙබ් අඩවිය පරිශීලකයන් විසින් 'යානා'වෙත ඉක්මනින් අනුවර්තනය වූ අතර, ඉන් පාරිභෝගික ආකර්ෂණයද වැඩිවිය. වසංගත තත්වය අතරතුර නැවත නැවතත් විමසීම්වලට ප්‍රතිචාර දක්වමින් ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානයේ අධික ඇමතුම් හසුරුවා ගැනීමට මෙය උපකාරී විය.

මගීන්ට ටිකට්පත් වෙන් කරවා ගැනීමට, මුදල් ආපසු ගෙවීම සහ පැමිණිලි සටහන් කර ගැනීමට උපකාර කිරීමට මෙම Chatbot සේවය තවත් වැඩිදියුණු කිරීමට ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය සැලසුම් කර ඇත.

***අන්තර්ජාලය හරහා පැමිණෙන මගී අත්දැකීම් දියුණු කිරීම***

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් EveryMundo සමග හවුල්කාරිත්වය ඇති කරගනිමින්, අන්තර්ජාලය හරහා ගුවන් සේවා ලබා ගැනීමේ එන්ජිමක් සඳහා කාර්යසාධනය පදනම් කරගත් අලෙවිකරණ විසඳුම් ක්‍රියාත්මක කළ අතර, එමගින් අවම ගුවන් ගාස්තු පිළිබඳ දක්වා ඇති ජාල රේඛා හෝ අනුග්‍රහනය දක්වන සටහන් පදනම් කරගෙන තම සංචාරක දින මගීන්ට තීරණය කිරීමට අවස්ථාව සලස්වයි. තවද, විසඳුම්වල සාර්ථකභාවය තීරණය කිරීමට, නිවැරදි ව්‍යාපාර තීරණවලට සහය වීමට, දියුණු ගූගල් විශ්ලේෂණයන් සමගින් වැඩිදියුණු කළ විද්‍යුත් වාණිජය තහවුරු කරන ලදී.

***කෝවිඩ් 19 හේතුවෙන් නව මංපෙත්***

කෝවිඩ් අවදානම් මට්ටම, ගුවන් ගමන් තහනම්, ජාතික පාලන ක්‍රියාමාර්ග, සංචරණ සීමා සහ ඇතුළු වන ස්ථානයන්හි පරීක්ෂාවන් සහ නිරෝධායන අවශ්‍යතාවන්ට අදාළව ශ්‍රී ලංකා තොරතුරු තාක්‍ෂණ ආයතනය ඇමේඩියස් (Amadeus) සමග එක්ව අපේක්ෂිත ගමනාත්තයන් කරා යාමට මගීන්ට සේවා සැපයීමට අයදුම්පත් වෙන්කර ගැනීම සඳහා 'COVID-19 button' පහසුකම සහ ලෝක සිතියමක් හඳුන්වා දෙනු ලැබීය.

***ගුවන් උපයෝගී ආදායම වැඩි කිරීම***

අතිරික්ත ගමන්මලු සහ විශේෂ අවස්ථා සැමරුම් කේක් ඇනවුම් සේවාවන් වැනි අතිරේක සේවාවන් ලබා ගැනීමට අදාළ වෙන් කරවා ගැනීමේ පිටු පූරණය වන කාලයන්හිදී උපයෝගී සේවාවන් ප්‍රවර්ධනය කිරීම.

මගී පහසුව සලසමින් අනෙකුත් ගුවන් සමාගම්වල ටිකට්පත් ලබා ගන්නා මගීන්ට ද අපගේ ඕනෑම ප්‍රවේශපත්‍ර කාර්යාලයක් මගින් හෝ වෙබ් අඩවියෙහි Manage My Booking හරහා ශ්‍රීලංකන් තොරතුරු තාක්‍ෂණ ආයතනය පහසුකම් ලබා දී ඇත. තවද, නම් කර ඇති මුදල් ගෙවීමේ කවුළු වෙත යාමට ඇති අපහසුතා මගහැර මගීන්ගේ අත්දැකීම් සහ පහසුව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් තොරතුරු තාක්‍ෂණ ආයතනය විසින් ඇතුළුවීමේ කවුන්ටර සහ ගමන් සඳහා ඇති දොරටුහිදී ගෙවීම් ක්‍රමවේදයන් හඳුන්වා දී ඇත.

***නිවසේ සිට වැඩ කිරීමේ (WFH) මෙහෙයුම***

නව සාමාන්‍යකරණයත් සමග අත්‍යන්ථ පරිගණක, MS O365 tools, MS Teams අත්‍යන්ථ සම්මන්ත්‍රණ, CISCO Jabber හරහා සචලතා ව්‍යාප්තිය, තාක්ෂණික විසඳුම් සහ අමතර දෘඩාංග සැපයීම පිළිබඳ 24x7 දුරස්ථ සේවා සැපයීම ඔස්සේ ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය නිවසේ සිට වැඩ කිරීම අවස්ථාව ලබා දෙන ලදී. මෙම පහසුකම් කාර්යමණ්ඩල සාමාජිකයින් හට මෙහෙයුම් වලට කිසිදු බලපෑමක් නොවන ලෙස සිය රාජකාරි ඉටු කිරීමට සපයා දෙන ලදී.

***තොරතුරු මත පාදක වූ ගුවන් සේවයක්***

"එයාර්ලයින් ඉන්සයිට්" ("Airline Insight") ශ්‍රීලංකන්හි කළමනාකරණ තොරතුරු තාක්ෂණ අංශය (MIS), එහි සේවාව වාණිජ, ඉංජිනේරු, ශ්‍රීලංකන් කේටරින්, ගුවන් තොටුපල සහ ගොඩබිම් සේවා සඳහා සිය සේවාවන් සපයන අතර ව්‍යාපාර ඒකකය හරහා සිදු කෙරෙන තීරණාත්මක දත්තවල විනිවිදභාවය සහ නිවරද්‍යතාව වැඩි කිරීමට උපකාරී වේ. වාණිජ ඒකකයේ උපායමාර්ග සහ උපායශීලී තීරණ ගන්නන්, තත්‍ය තොරතුරු මත ඉක්මන් තීරණ ගැනීමට තම වාර්තා සහ උපකරණ පුවරු නිර්මාණය කරගැනීමට සහ විශ්ලේෂණයට ස්වයං සේවා ව්‍යාපාර බුද්ධියෙන් සමන්විය.

"Airline Insight" සඳහා අවධානය යොමු වී ඇත්තේ ශ්‍රීලංකන්හි සම්පූර්ණයෙන් මගී කේන්ද්‍ර තොරතුරු පදනම් කර ගත් ගුවන් තොටුපලක් බවට පත් කිරීමට හැකියාව ඇති අභ්‍යන්තර පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරමින් මගී කේන්ද්‍රතාව ඉහළ නැංවීමයි.

***කණ්ඩායම් දත්ත ආරක්ෂාව, අනුකූලවීම සහ පාලනය***

2020/21 මූල්‍ය වසර තුළ ISO/IEC 27001:2013 ශ්‍රීලංකන් සමූහය සඳහා තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, ISO/IEC 20000:2018 තොරතුරු තාක්ෂණය අංශය සඳහා තොරතුරු තාක්ෂණය සේවා කළමණාකරණය, සහ ISO 9001:2015 මෘදුකාංග සංවර්ධනය සඳහා තත්ව කළමනාකරණ පද්ධති සමග ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණය ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ සහතික වලට අනුකූලවීමට අඛණ්ඩව කටයුතු කරයි. ඊට අමතරව මගීන්ගේ සංචාරය පුරා දත්ත ආරක්ෂාව

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

සහ පෞද්ගලිකත්වය අවධාරණය කරමින් යුරෝපා සංගම් සාමාන්‍ය දත්ත රෙගුලාසි හි නිර්දේශ සහ මාර්ගෝපදේශ සපුරාලීම සඳහා මෙහෙයුම් අඛණ්ඩව වැඩි දියුණු කරන ලදී. සමාලෝචිත වසර තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය තාක්ෂණික පාලනයන් නව්‍යතා කළමනාකරණය කිරීමේ නවතම තාක්ෂණය සමග පුළුල් කර අතර, සයිබර් ආරක්ෂාව සඳහා එහි ක්‍රියාකාරී ප්‍රවේශය වැඩි දියුණු කළේය.

**මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචනය කරන ලද වසර තුළ, ශ්‍රීලංකන් හි මානව සම්පත් අංශය සඳහා මෙහෙයුම් ස්ථාවරත්වය සඳහා ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙන යාම සහ මානව සම්පත් ප්‍රශස්තව පවත්වා ගනිමින් සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීම අභියෝගාත්මක විය. ව්‍යාපාර ප්‍රමුඛතා සපුරාලන අතර සෞඛ්‍යාරක්ෂිත සේවක කණ්ඩායමක් සමග ව්‍යාපාර හවුල්කාරිත්වයක් ඇති කරගැනීමේ අප උපායමාර්ගික අරමුණ සැකසීම සහ සාක්ෂාත් කරගැනීමට බලපෑමක් සහ මඟ පෙන්වීමට ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි සැකසීම සඳහා ප්‍රධාන කරගෙන මෙය ක්‍රියාවට නංවන ලදී.

මෙම අංශය විසින් මූලෝපායික වශයෙන් කැපී පෙනෙන ප්‍රධාන අංශ හතරක් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි;

***අප සේවකයින්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුභසාධනය***

සේවකයින්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුභසාධනය යන කරුණුවලදී, විශේෂයෙන් මේ වසරේ පෙර නොවූ විරූ වසංගත තත්වයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රීලංකන් මානව සම්පත් වෛද්‍ය සේවා (HRMS) වැදගත් වේ. සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ආයතනයට සම්පතක් යැයි දැඩි විශ්වාසයක් පවත්වා ගනිමින්, කෝවිඩ් 19 වෙනස් වෙමින් ව්‍යාප්තිය තුළ ඒකමතික කණ්ඩායමක් ලෙස ශ්‍රීලංකන් මානව සම්පත් වෛද්‍ය සේවා කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරන ලදී.

දේශීය සහ ජාත්‍යන්තර සෞඛ්‍ය සහ ආරක්ෂක රෙගුලාසි වලට අනුකූලව සේවකයින්, පාරිභෝගිකයින් සහ කොටස්හිමියන්ගේ ආරක්ෂාව සඳහා සෑම පියවරක්ම මෙම කණ්ඩාම විසින් ගෙන ඇති අතර, එමගින් සේවකයින්ගේ අලුත් කිරීමේ මාර්ගෝපදේශ සමග නිරන්තරයෙන් යාත්වකාලීන කෙරේ. රජයේ බලධාරීන් සහ අනෙකුත් වෛද්‍ය ආයතන සමග සියලුම දෙපාර්තමේන්තු සහ මාණ්ඩලික ධුරාවලිය තුළ වැඩ කරමින් සිටියදීත් ආයතනයේ ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා ශ්‍රීලංකන් මානව සම්පත් වෛද්‍ය සේවා කැපී පෙනෙන සේවයක් ඉටු කරන ලදී.

ප්‍රධාන පෙරටුගාමී හා මෙහෙයුම් කාර්ය මණ්ඩලය සහ අනෙකුත් දෙවන මට්ටමේ මෙහෙයුම් කාර්ය මණ්ඩලය 4127 ක් ආවරණය වන පරිදි කෝවිඩ් 19 වැළැක්වීමේ එන්නත වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රීලංකන් මානව සම්පත් වෛද්‍ය සේවා කණ්ඩායම සුවිශේෂී ලෙස කැපවන ලදී. මානව සම්පත් කළමනාකරණය විසින් මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා සතියකට වතාවක් සහ සේවක කණ්ඩායම සඳහා දිනපතා සමාගම පුරා අහඹු PCR සහ RAT පරීක්ෂණ සිදු කරන ලද අතර ඉන් සේවකයින්ගේ සහ ආශ්‍රිතයන්ගේ උපරිම ආරක්ෂාව සහතික කෙරුණි. කෝවිඩ් වැළඳුණ සේවකයින් සඳහා අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් කණ්ඩායම විසින් පවත්වා ගෙන යමින් පීඩාවට පත් වූවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් පිළිබඳ නිතිපතා සොයා බලන ලදී.

තවද කෝවිඩ් 19 වැළැක්වීමේ කාර්ය සාධක බලකාය ද ස්ථාපිත කරන ලද අතර, මුළු ආයතනය පුරාම කාර්ය මණ්ඩලය නියෝජනය කරමින් සුපරීක්ෂාකාරී වීම, වැළැක්වීමේ පියවර ගැනීම සහ අදාළ ගැටලු වලට කඩිනම් සහ කාර්යක්ෂමතාවයෙන් කටයුතු කිරීම සඳහා ස්ථාපිත කරන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් "ආසියානු නායකත්ව ප්‍රදානය" සඳහා සහභාගී වූ අතර, "රැකියාවේදී හොඳම සෞඛ්‍ය කළමනාකරණය" යන කාණ්ඩයේ සම්මානයෙන් පිදුම් ලබන ලදී.

***මහජන සම්පත් සහ ප්‍රශස්තකරණය***

පරිමාණ පහත දැමීමේ ක්‍රියාවලියට සහය දැක්වීම සඳහා සේවක සංඛ්‍යාව ප්‍රශස්තිකරණය කිරීම සඳහා 'නිවැරදි ප්‍රමාණය' සහ ව්‍යාපාර තිරසාරත්වයට සහය දීමට සේවක සංඛ්‍යාව ප්‍රශස්තකරණය කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් වන ලදී. තවද මේ යටතේ ගනු ලබන මුලපිරීම් කිහිපයක් පහත දැක්වේ.

- පටු ව්‍යුහයක් තිබීම සහ අකාර්යක්ෂමතා තුරන් කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ අදියර කිහිපයක් සිදු කරන ලදී. පරමාදර්ශී සංවිධාන ව්‍යුහය කරා ළඟාවීම සඳහා රැකියා ඒකාබද්ධ කිරීම, ප්‍රධාන නායකත්ව භූමිකාවන් නැවත ස්ථානගත කිරීම සහ සමහර අංශවල කළමනාකරණ තනතුරු සහ සංවිධානය පුරා ඇති අනවශ්‍ය තනතුරු හඳුනා ගැනීම.
- බාහිර බඳවා ගැනීම් අවම කිරීම තුළින් ආයතනය තුළ තනතුරු සඳහා වූ ප්‍රතිස්ථාපන විශාල වශයෙන් කළමනාකරණය කර ඇත. මූල්‍ය වසර තුළදී මුළු සෘජු සේවක සංඛ්‍යාව 10% කින් අඩු කර ඇති අතර, අභ්‍යන්තර වශයෙන් සේවක මණ්ඩල නැවත පත් කිරීම සහ වත්මන් මානව ප්‍රාග්ධන උපරිම කිරීම සඳහා අඛණ්ඩ යාන්ත්‍රණයන් සකසා ඇත.
- පශ්චාත් කෝවිඩ් 19 යුගයේ මෙහෙයුම් යථාර්ථයන්ට අනුකූල වීම සඳහා අතිරික්ත ශ්‍රම බලකාය සම්බන්ධ නොකර ගැනීමෙන් සමාගම "නිවැරදි ප්‍රමාණයේ" අවශ්‍යතාවන් මත පදනම්ව ස්වෙච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය හඳුන්වා දීම.
- සේවා සපයන (SP) නිලධාරීන් යෙදවීම අවම කිරීම.
- භාණ්ඩ ප්‍රවාහනය වැනි ඉහළ මෙහෙයුම් පරිමාවක් ඇති ප්‍රදේශ ශක්තිමත් කිරීම සඳහා මෙහෙයුම් පසුබෑම හේතුවෙන්, අතිරික්තව සිටි කාර්ය මණ්ඩලය යෙදවීම තුළින් එම කාලය තුළ බොහෝ අංශ හරහා කාර්ය මණ්ඩලය ප්‍රයෝජනයට ගැණුනි.

මූලික ව්‍යාපාර අඩු වීමත් සමග ගුවන් සමාගමේ පැවැත්ම තහවුරු කිරීම සහ එහි සේවක බලකායේ බහුතරයකගේ ජීවනෝපාය සහතික කිරීම සඳහා වැටුප් පිරිවැය අඩු කිරීමේ පියවර ගණනාවක් හඳුන්වාදීමට සමාගමට සිදු වුණි. මේ සඳහා වැටුප් අඩු කිරීම, ඇතැම් දීමනා සහ දිරි දීමනා ගෙවීමේ පදනම නැවැත්වීම සහ සංශෝධනය කිරීම, වාර්ෂික වැටුප් වර්ධක නොගෙවීම, මෙහෙයුම් අවශ්‍යතාවන්ට වඩා වැඩි ස්ථාවර කාලීන කොන්ත්‍රාත්වල නියුතු ඇතැම් සේවකයින්ගේ සක්‍රීය සේවකයින් ඉවත් කළ අතර, විශේෂ ස්වේච්ඡා වැටුප් රහිත වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම ඇතුළත් වේ.

### ව්‍යාපාර අඛණ්ඩතා සඳහා හැකියාවන් ගොඩනැගීම සහ කුසලතා වර්ධනය

වසංගත කාලයේ පවා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කෝවිඩ් 19 මාර්ගෝපදේශයන්ට අනුකූලව අන්තර්ජාලය ඔස්සේ බොහෝ වැඩසටහන් සිදු කරමින් පුහුණු සහ සංවර්ධන (T&D) මුලපිරීම අඛණ්ඩව පවත්වා ගෙන ලදී. අභ්‍යන්තර මෘදු කුසලතා පුහුණු කණ්ඩායම සංවර්ධනය සහ ගුවන් සේවා සහාය කාර්ය මණ්ඩලය සඳහා පාරිභෝගික සේවා පුහුණුව, නව උසස් වීම් ලැබූ කළමනාකරණය සඳහා යෝග්‍යතා පුහුණුව, නායකත්වය සහ අභිප්‍රේරණ වැඩසටහන් වැනි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ නායකත්වය උදෙසා සාර්ථක සැලසුම් මෙම පුහුණු  කිරීම්වල මුල පිරීම් කිහිපයකි.

### සේවක සන්නිවේදනය සහ සබඳතා

වසර පුරාම ශ්‍රීලංකන් කාර්ය මණ්ඩලයේ සුභසාධනය සහ යහපැවැත්ම සඳහා සේවය කිරීමට ශ්‍රීලංකන් මානව සම්පත්හි සේවක සන්නිවේදන සහ සබඳතා ඒකකය (ECEU) කැපවී සිටින ලදී.

නිතිපතා යාත්වකාලීන කරන ලද සෞඛ්‍ය සහ ආරක්ෂක රෙගුලාසීන්ට අදාළ තොරතුරු පිළිබඳ සියලුම කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කරන ලදී. ඉලෙක්ට්‍රොනික සහ සමාජ මාධ්‍ය වැනි සම්ප්‍රදායික සහ විකල්ප සන්නිවේදන අංශ භාවිත කරමින්, සේවක චිත්ත ධෛර්යය සහ විශ්වාස යථා තත්වයට පත් කර ගැනීමට සේවක සුදානම වැඩි දියුණු කිරීම සහ එවැනි අවස්ථා අවම කර ගැනීමට තීරණාත්මක වසංගත ආශ්‍රිත තොරතුරු බෙදා හැරීමට කාලෝචිත ද්වි මාර්ග සන්නිවේදනය ECEU විසින් සක්‍රීය කර ඇත.

සතුට- ආසියාවේ වඩාත්ම පාරිභෝගික කේන්ද්‍රීය ගුවන් සේවය බවට සමාගමේ දැක්මෙහි සාරය ඉස්මතු කරන නැවුම් දැක්මක් ඉදිරිපත් කරමින් සමාගමේ ව්‍යාපාරික උපායමාර්ගිය සමග පෙළ ගැසුණු නවතම සන්නිවේදන තේමාව දියත් කරන ලදී. ආගන්තුක සත්කාරයන්ට කැපවූ ප්‍රජාවක් වශයෙන් ශ්‍රී ලාංකික අපට ආවේණික වූ පරාර්ථකාමී සේවයේ සහ ගෞරවයේ වැදගත්කම “සතුට” යන්නෙන් දැක්වේ.

## ප්‍රජා සහභාගීත්වය

### පරිසරය කෙරෙහි අවධානය යොමු කිරීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සැමවිටම කලාපයේ පරිසර හිතකාමී ගුවන් සේවාවක් වූ අතර සහ එහි ‘Planet Friendly SriLankan’ වැඩසටහන අනුව ගුවන් සේවා කටයුතුවල නිරත වන අතර එමගින් ගුවන් සමාග මේ කාබන් පිය සටහන අඩු කිරීම සහ දේශගුණික විපර්යාසවලට එරෙහිව කටයුතු කිරීමට අපි උත්සහ කරමු. ගෝලීය උවදුරෙන් ගුවන් සමාගම දැඩි ලෙස පීඩාවට පත් වූවද, අපගේ GHG විමෝචනය පාලනය කිරීමට, Oneworld’s NetZreo2050 අභියෝගකරුවන්ට සහය දීමට; එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කවලට සහයෝගය දීමට, පාරිසරික ගැටලු පිළිබඳ දැනුවත් කිරීම හරහා නීති විරෝධී වන ජීවී වෙළඳාම තුරන් කිරීමට කටයුතු කිරීමට; එමගින් ලෝකයේ අප දැකීමට බලාපොරොත්තු වන වෙනස අපි තුළින් ඇති වීමට ඉඩ සලසමින් අපි තවමත් කැප වී සිටින්නෙමු.

දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් පාරිසරික සංරක්ෂණය කෙරෙහි පමණක් අවධානය යොමු කළ SLA සිය පාරිසරික ප්‍රතිපත්ති තහවුරු කරමින් බොහෝ මුලපිරීම් වල නිරත විය. දේශීය හා ගෝලීය වශයෙන් අදාළ වන සියලුම අදාළ පරිසර නීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරමින් SLA හෘද සාක්ෂියට එකඟව කටයුතු කරයි.

හානියට පත් සමස්ත පරිසර පද්ධතිය හා වනජීවී වාසස්ථාන පැවති විල්පත්තු ජාතික වනෝද්‍යානයට යාබදව පිහිටි වනාන්තර සංකීර්ණයේ හෙක්ටයාර 2,000 ක් නැවත වගා කිරීම සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් පිහිටුවන ලද ‘තුරුලිය වෙනුවෙන් අපි‘ නැවත වගා කිරීමේ වැඩසටහනට සහයෝගය දැක්වීම සඳහා ශ්‍රීලංකන් විසින් ‘විල්පත්තුවට පැලෑටියක්‘ ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා සේවකයින් සහ වෘත්තීය සමිති නොමසුරුව දායක වූ අතර ගුවන් සමාගමේ ‘හරිත අරමුදල’ ආධාරයෙන් අක්කර භාගයක් පමණ වන වගා බිම් නැවත වගා කිරීමට සහ වසර 3 ක් නඩත්තු කිරීමට සෑහෙන මුදලක් එකතු කළහ.



*විල්පත්තු පැළ ව්‍යාපෘතිය*

2020 සැප්තැම්බර් මාසයේදී oneworld සන්ධානයේ කොටසක් ලෙස මුලපිරීමට කැප වූ අතර 2050 වන විට කාබන් විමෝචනය ශූන්‍ය කිරීමට සියලුම සමාජික ගුවන් සමාගම් කැප වූ අතර කාබන් උදාසීනභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා පොදු ඉලක්කයක් පිටුපස එක් වූ පළමු ගෝලීය ගුවන් සේවා සන්ධානය බවට පත්විය.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

ICAO ඇතුලු රජයන් විසින් කලින් එකඟ වූ දැනට පවතින පාරිසරික රාමුව තුළ මෙම ඉලක්කය සපුරා ගැනීමට සාමාජික ගුවන් සමාගම් සැලසුම් කරති. මෙහෙයුම් සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ඉන්ධන කාර්යක්ෂම ගුවන් යානා සඳහා ආයෝජන කිරීම සහ තිරසාර ගුවන් යානා ඉන්ධන වැඩි දියුණු කිරීම ඇතුලු පියවර කිහිපයක් මෙම සන්ධිස්ථානය සාක්ෂාත් කර ගැනීම සඳහා සන්ධාන සාමාජිකයින් විසින් සැලසුම් කර ඇත.

**ශ්‍රීලංකන් කෙයා(ර්)ස්**

පළමු වරට ශ්‍රීලංකන් අලෙවිකරණය යටතේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ආයතනික සමාජ වගකීම් අංශය වන ශ්‍රීලංකන් කෙයා(ර්)ස් මගින් ලෝක ළමා දිනය සමරන ලද්දේ ආඬිඅම්බලම මහා විද්‍යාලයේ ආබාධ සහිත හැකියාවන් ඇති ශිෂ්‍යයෙකුට බ්‍රේල් රචකයනක් පරිත්‍යාග කරමිනි.

නත්තල් උත්සවයේ සැබෑ අරුත බෙදා ගැනීම සඳහා ගුවන් සමාගමේ විවිධ දෙපාර්තමේන්තු සහ අංශය වලට අයත් කාර්ය මණ්ඩලය මහරගම පිළිකා ආයතනයේ CCC හුවමාරු නිවාසයේ පදිංචිකරුවන් සහ අපේක්ෂා රෝහලේ නේවාසික රෝගීන් සමග ශ්‍රීලංකන් කෙයා(ර්)ස් අත්වැල් බැඳ ගත් අතර එහිදී අත්‍යවශ්‍ය දේ අඩංගු පාර්සල් 340 කට අධික ප්‍රමාණයක් පරිත්‍යාග කළේය.

Lady Ridgeway රෝහලේ හෘද සහ සත්කාර සංකීර්ණයේ ඉදිකිරීම සඳහා ජාතික මට්ටමේ අරමුදල් සම්පාදකයක් වන Little Hearts ව්‍යාපෘතිය සමග දෙවන සහයෝගීතාවය, කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දායකත්වයෙන් මිලියන 1.2 කට වඩා වැඩි මුදලක් ලබා ගැනීමට හැකි වූ අතර, එමගින් අවශ්‍යතා ඇති දරුවන්ගේ ජීවිත 120 ක් බේරා ගත හැකි විය. Little Hearts ව්‍යාපෘතියේ සමග පළමු සහයෝගීතාවය තුළදී එකතු කරන ලද මුදල මෙවර ඉක්මවා ගිය අතර මෙය සමාගමේ උග්‍ර මූල්‍ය තත්වයන් හේතුවෙන් සේවකයින් වැටුප් කප්පාදු දරා සිටින අවස්ථාවක දායකත්වය ලබාදීම වඩාත් අර්ථාන්විත කරුණික පරිත්‍යාගයක් වනු ඇත.

# මූල්‍ය ප්‍රකාශ


අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 42
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 2020/21 46
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 47
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 48
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 52
ලාභ අලාභ ප්‍රකාශය 53
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 54
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 55
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 56
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 57

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ශ්‍රීලංකන් එයාර් ලයින්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වසර සදහා වන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනුයේ සතුටිනි.

## ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

සමාගමේ ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකරකම් ලෙස ශ්‍රී ලංකාවේ නිල ගුවන් සේවය වශයෙන්, මගී ප්‍රවාහනය, භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සදහා  කාර්යසටහන් සහිතව සහ රහිතව ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම් සම්පාදනයයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (“MRIA”) හරහා ගුවන් පර්යන්ත සේවාවන් සැපයීම, ගුවන් මගීන් වෙත තීරු බදු රහිත භාණ්ඩ අලෙවි කිරීම, අභ්‍යන්තර සහ බාහිර නිවාඩු ගත කිරීමේ සැලසුම් අලෙවි කිරීම සමාගමෙහි අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තෙවන පාර්ශව ගුවන්යානා නඩත්තු සේවා, ගුවන්යානා මෙහෙයුම් සේවා ප්‍රතිපාදනය කරමින් සමාගමේ ගුවන් ආශ්‍රිත පුහුණු සමන්විත අතිරේක ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. මූල්‍ය වර්ෂය තුළ සමාගමේ ක්‍රියාකාරකම්වල ස්වාභාවයේ සැලකිය යුතු වෙනසක් දැකගත නොහැකි විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (“MRIA”) හරහා මෙහෙයුම් කටයුතුවල යෙදෙන ගුවන්යානා සඳහා ආහාරපාන සේවා සැපයීම මූලික කාර්යය ලෙස සිදුකරනු ලබන, සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම වන පරිපාලිතයෙන් සහ සමාගමෙන්, සමූහය සමන්විත වේ. අනෙකුත් අතිරේක සේවාවන් සඳහා පොදු සහ සංක්‍රමණික අවන්හල්, ලොන්ඩරි සේවාවන් සහ සංක්‍රමණික හෝටල් කළමනාකරණය අන්තර්ගත වේ.

## මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව

මූල්‍ය කළමනාකරණ ප්‍රධානී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් තබන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ සහ ඒ පිළිබඳ 2021 මාර්තු 31 දිනට අවසන් වන වසර සඳහා වන විගණන වාර්තාව මෙම වාර්තාව සමග අමුණා ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශය සැකසීමේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් 57 සිට 70 පිටුවල ඉදිරිපත් කර ඇත.

## සමූහයේ පිරිවැටුම

සමූහයේ සමූහයේ පිරිවැටුම රුපියල් මිලියන 50,929 :2019/20: රුපියල් මිලියන. 183,532) ලෙස දැක්වේ. මූල්‍ය ප්‍රකාශය සඳහා සමූහයේ පිරිවැටුමෙ හි සවිස්තර ඇගයීම සටහන් 21 හි දක්වා ඇත. සමාගම සහ එහි පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර ගනුදෙනු සාධාරණ වෙළඳපොළ මිළ ගණන් අනුව සිදුකරනු ලබයි.

## ප්‍රතිඵල

සමූහයෙහි වසර සදහා බදු වලට පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 49,705  කි. (2019/20 : රුපියල් මිලියන 44,139) සමූහය විසින් රුපියල් මිලියන 57 ක (2019/20 : රුපියල් මිලියන 35) බදුකරණ වියදමක් දරන ලදී. වසර සදහා වන ලාභ අලාභ ප්‍රකාශය 53 පිටුවෙහි දක්වා ඇත.

## සමූහයේ ආයෝජන

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ මත සමූහයේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 362 ක් වශයෙන් දැක්විණි (2019/20 : රුපියල් මිලියන 655).

## දේපළ පිරියත සහ උපකරණ

වාර්තා කරනු ලබන දින වන විට සමූහයේ දේපළ පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 7,229  ක් වශයෙන් දැක්විණි (2019/20: රුපියල් මිලියන 8,450). දේපළ පිරියත සහ උපකරණ සහ ඒවායේ සංචලනය සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශයන් සදහා වන සටහන් 4 හි දක්වා ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 79,352.43 ක් වශයෙන් දැක්විණි (2019/20: රුපියල් මිලියන 51,617.44).

2021 ජූලි 16 දින පැවැත්වූ අතිවිශේෂ මහසභා රැස්වීමේදී ශ්‍රී ලංකා රජය වෙත කරන ලද කොටසක් රුපියල් 100 බැගින් වූ සාමාන්‍ය කොටස් 447,432,300 ක වෙන්කිරීම මගින් සමාගමේ සංචිත ප්‍රාග්ධනය රුපියල් 51,617,435,500 සිට රුපියල් 96,360,665,500 දක්වා ඉහළ ගොස් ඇත.

## සංචිත

2021 මාර්තු 31 දින වන විට සමස්ත සමූහ සංචිත රුපියල් මිලියන 360,838 ක ඍණාත්මක අගයක් වශයෙන් දැක්විණි (2019/20 : රුපියල් මිලියන 312,791 ක ඍණාත්මක අගයකි). මෙය රුපියල් මිලියන 366,285 ක සමුච්චිත අලාභයකින් (2019/20: රුපියල් මිලියන 316,478), රුපියල් මිලියන 5,441 ක ප්‍රාග්ධන සංචිත (2019/18 : රුපියල් මිලියන 3,687) සමන්විත වේ. මෙකී සංචිතයන්හි සංචලනය මූල්‍ය ප්‍රකාශයන්හි ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයෙහි දැක්වේ.

## ආයතනික ප්‍රදානයන්

සමූහය මගින් වසර තුළදී කිසිදු පරිත්‍යාගයක් නොකරන ලදී. (2019/20: රුපියල් මිලියන 0.42).

## අයබදු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග වූ ගිවිසුම අනුව සමාගම වෙත 2013 මාර්තු 31 දින දක්වා බදු විරාමයක් හිමි විය. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරනු ලැබීමෙන් අනතුරුව (සංශෝධිත) 2011 අංක 22 දරන පනතෙහි විධිවිධාන අනුව සමාගම 2021 මාර්තු 31 වැනි දින තෙක් සිදුකරනු ලබන සියළුම ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියළුම බදු වලින් නිදහස් කෙරිණි.

කෙසේවුවද, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමත් සමග සමාගම 2018 අප්‍රේල් 1 වැනි දින සිට සියළුම ස්වකීය ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියළුම ආදායම් බදු ගෙවීමේ වගකීමෙන් බැඳී සිටී. මේ වන විට ද්විත්ව බදුකරණ ගිවිසුම් නොපවතින රටවල සිදුකරනු ලබන විදේශ මෙහෙයුම් සම්බන්ධයෙන් බදු මුදල් ගෙවීමට සමාගම බැඳී සිටී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග වූ ගිවිසුම අනුව පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම වෙත 2021 මැයි 30 දින දක්වා බදු විරාමයක් හිමි විය. වර්තමානය වන විට යානාස්ථ මුලුතැන් ගෙවල් වලින් (Flight Kitchen), සංක්‍රමණික අවන්හල්වලින්, සංක්‍රමණික හෝටල, යානාස්ථ ලොන්ඩරි කටයුතු සහ EK පරිශ්‍රය ආශ්‍රිත මෙහෙයුම් මගින් උපයනු ලබන ශුද්ධ ලාභය 2021 මැයි 30 වැනි දින තෙක් සම්පූර්ණයෙන් ආදායම් බදු වලින් නිදහස් කොට ඇත. ඉන් අනතුරුව ශුද්ධ ලාභය 2029 මැයි 30 වැනි දින දක්වා තවදුරටත් වසර 8 සදහා 15% ක සහන බදු අනුපාතයක් යටතේ වගකීමෙන් බැඳේ. පොදු අවන්හල, “වැනිලා පොඩ්” ආහාර වෙළඳසැල් “සෙමොන්ඩු” අවන්හල සහ දේශීය ලොන්ඩරි සේවා හා වෙනත් ආදායම් දැනට පවතින බදු අනුපාතය වන 24% ක ආදායම් බද්දකට යටත් වේ.

## කොටස් පිළිබඳ විස්තර

2021 මාර්තු 31 දින වන විට කොටස් පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ:

| කොටස් හිමිකාරිත්වය | කොටස් සංඛ්‍යාව | හිමිකාරිත්ව % |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 511,574,169 | 99.11% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0. 36% |
| වෙනත් | 2,736,509 | 0.53% |
| මහජන බැංකුව | 1 | |

## නීතිරීති සහ රෙගුලාසීන්ට අනුකූලත්වය

සමාගම සෑමවිටකම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කොට ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරණ නිලධාරීන් විසින් විගණන කමිටුවේ කාර්තුමය රැස්වීම්වලදී අනුකූලතාවය සම්බන්ධ වාර්තාවක් සභාගත කරනු ලබයි.

## සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශයෙහි සටහන 30 හි දක්වා ඇත.

## අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

2021 මාර්තු 31 වැනි දිනට අසම්භාව්‍ය වගකීම් සහ එම දිනට ප්‍රාග්ධන වියදම් මත දරන ලද බැඳීම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 27 හි ඉදිරිපත් කොට ඇත.

## වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 29 හි දක්වා ඇති කරුණු හැරුණු විට වෙනස්කිරීමක් හෝ අනාවරණය කිරීමක් අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්වයක් වාර්තාකරණ දින සිට උද්ගතව නැත.

## මානව සම්පත්/සේවා නියුක්ති ප්‍රතිපත්ති

මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජන සිදුකරමින් ද නව ව්‍යාපාරික ප්‍රමුඛතාවන්ට සර්ලන පරිදි ඵලදායී ශ්‍රම බලකායක් සේවයේ යොදවමින්, අනාගත සාර්ථකත්වය සඳහා සිය සේවකයින්ගේ නිපුණතා සහ දැනුම වර්ධනය කරවමින් කටයුතු කරන බවට තහවුරු කරයි. සමූහයේ සේවක ප්‍රතිපත්ති, ඒක පුද්ගල ගරුත්වය ලබා දෙමින් ස්ත්‍රී පුරුෂ භේදය, ජාතිය හෝ ආගම නොසලකා හරිමින්, සමාන වෘත්තීය අවස්ථාවන් ලබා දෙනු ලබයි. වෘත්තීයමය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රමිතීන්ට සැලකිය යුතු අවධානයක් යොමු කරනු ලබයි. සමාගම මගින් සේවයේ යොදවනු ලැබ ඇති පුද්ගලයින් සංඛ්‍යාව වසර අවසානයේදී 5,965 (2019/20: 6,693) වූ අතර පර්පාලිතයෙහි සේවක සංඛ්‍යාව 853 (2019/20 - 1,008) ක් විය.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂකවරුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, සේවකයින් සහ ශ්‍රී ලංකා රජය සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.

## පරිසර සංරක්ෂණය

සමූහයේ ව්‍යාපාරික කටයුතු මගින් පරිසරය වෙත සෘජු සහ වක්‍ර බලපෑම් ඇති කළ හැකි වේ. පරිසරය කෙරෙහි ඇති වන අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගනිමින්, අනුකූලතාවය ඉහළ නැංවීම සහ අදාළ අධිකාරීන් සහ රෙගුලාසි වෙත සහයෝගය දැක්වීම සමූහයේ ප්‍රතිපත්තිය වේ.

## අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශ කර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවේ 79 වගන්තිය ප්‍රකාරව සියළුම අධ්‍යක්ෂවරුන් ශ්‍රී ලංකා රජය විසින් පත් කරනු ලැබේ. වර්තමාන අධ්‍යක්‍ෂ මණ්ඩලයේ හඳුන්වාදීමක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 11 සිට 13 දක්වා ඉදිරිපත් කරනු ලබයි.

මූල්‍ය වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් එකොළහක් කැඳවූ අතර අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත පරිදිය;

| 2020/2021 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධූරය දැරූ කාලසීමාව තුළ සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| අශෝක පතිරගේ මහතා (සභාපති) | 11/11 |
| මලික් ප්‍රනාන්දු මහතා | 10/11 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා | 11/11 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා | 11/11 |
| සංජය මොහොට්ටාල මහතා | 11/11 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 11/11 |
| අෂ්රොෆ් ඕමාර් මහතා (2021 මාර්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී ) | 10/11 |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා (2021 මාර්තු 27 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී) | නැත |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

**විගණන කමිටු සාමාජිකයින්**
සංජය මොහොට්ටාල මහතා මූල්‍ය වර්ෂය තුළ, මෙම කාලයට අදාළ විගණන කමිටුවේ සභාපතිවරයා විය. විගණන කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සැදුම්ලත් වේ.

| සාමාජිකයින් | සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| සංජය මොහොට්ටාල මහතා/තාවකාලික සභාපතිවරයා | 5/5 |
| මලික් ප්‍රනාන්දු මහතා | 5/5 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා | 5/5 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 5/5 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා - 2021 අප්‍රේල් 23 දින කමිටුවෙන් ඉල්ලා අස්වන ලදී. | 5/5 |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා - 2021 අප්‍රේල් 23 දින කමිටුව පත්වන ලදී. | නැත |

විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 46 හි දක්වා ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව**
මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුවෙහි ප්‍රධාන අරමුණු වනුයේ, පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් දියුණු කිරීම උදෙසා විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීම සඳහා මඟ පෙන්වීමත්, පාරිශ්‍රමික ව්‍යුහයක් ස්ථාපනය කිරීමත්ය.

වෙළඳපොල, ක්ෂේත්‍ර සාධක සහ සමූහයේ සියලු සමාගම්වල පුද්ගල කාර්යසාධනය මත පදනම්ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර ඇත. මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව අවශ්‍යතාව පරිදි රැස්වේ.

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව, පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| සාමාජිකයින් | සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා - සභාපති (2021 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි) | 1/1 |
| මලික් ප්‍රනාන්දු මහතා | 3/3 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා | 3/3 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා | 3/3 |
| මොහමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා (සභාපති 2021 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී) | 2/2 |

**අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව (BRC)**
ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, එවැනි අවදානම් මූල්‍ය හා මූල්‍ය නොවන දෙඅංශය කෙරෙහි බලපෑම ගණනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදු කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවෙහි සාකච්ඡා මගින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපානු ලබන අවදානම් වල බලපෑම වාර්තා කිරීමට සහ කිසියම් අහිතකර බලපෑමක් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සැලසිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වනුයේ,

| |
|---|
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා - සභාපති |
| මලික් ප්‍රනාන්දු මහතා |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා |
| සංජය මොහොට්ටාල මහතා |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා |

**සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය**
සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ;

| |
|---|
| අසෝක පතිරගේ මහතා (සභාපති) |
| මලික් ප්‍රනාන්දු මහතා |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා |
| සංජය මොහොට්ටාල මහතා |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා |

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික**
2007 අංක 7 දරන සමාගම් පනතෙහි 168 (1) (ඊ) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වෙත ගෙවන ලද සමුච්චිත වේතන මෙම වාර්තාවේ 99 පිටුවෙහි සටහන 30 යටතේ දැක්වේ.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය**
ශ්‍රී ලංකා රජය (GOSL) හි බලතල අනුව, නාමයෝජක අධ්‍යක්ෂ ඒ. කේ. පතිරගේ මහතා/සභාපති, සමාගමෙහි සාමාන්‍ය කොටස් 3 ක හිමිකාරිත්වය දරයි.

**සබඳතා ලේඛනය**
2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය අනුව සමාගම මගින් සබඳතා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. සියලුම අධ්‍යක්ෂවරුන් තමන් වෙනත් සමාගම් වල පවත්වාගෙන යන සබඳතා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කොට ඇති අතර 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අංක 192 (1) සහ 192 (2) යන වගන්ති ප්‍රකාරව අදාළ සබඳතා පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ සබඳතා ලේඛනයෙහි වාර්තා කොට ඇත.

### අධ්‍යක්ෂකවරුන්ගේ ගිවිසුම් සබඳතා

සමාගමෙහි ව්‍යාපාරික කටයුතු වලට අදාළ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 30 හි අනාවරණය කොට ඇති දෑට අමතරව අධ්‍යක්ෂකවරුන් කිසිදු සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක්, නොතිබුණි.

### වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමෙහි හතළිස් තුන්වන වාර්ෂික මහා සභා රැස්වීම, 2022, මැයි 27 වන සිකුරාදා ප.ව. 3.00 ට කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'මිහිලක මැදුර' පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතය.

මහා සභා රැස්වීම පිළිබඳ දැනුම්දීම වාර්ෂික වර්තාවේ පිටු අංක 117 හි දැක්වේ.

### විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විගණකවරුන්, විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. විගණක ගාස්තු පිළිබඳව මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 23 හි දක්වා ඇත. සමාගම හෝ එහි පරිපාලිත ආයතනය සමග (විගණකවරයකු වශයෙන් පවතින සම්බන්ධය හැරුණු විට) විගණකවරුන්ගේ කිසිදු සබඳතාවයක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී,

**අසෝක පතිරගේ**
*සභාපති*

**සංජය මොහොට්ටාල**
*අධ්‍යක්ෂ*

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2022 මාර්තු 2
කටුනායක

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 2020/21

### කාර්යභාරය සහ වගකීම්

ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) විෂය පථය සහ වගකීම්, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කර සම්මත කරන ලද අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව පාලනය කරනු ලැබේ. ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහයවීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අරමුණයි. ප්‍රධාන අරමුණ වන්නේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාපටිපාටි, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි, පාලන ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාපටිපාටි, සහ නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය නිරීක්‍ෂණය කරමින් එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීම කරනු ලබයි.

### කමිටුවෙහි සංයුතිය

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සේවය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වූයේ, සංජය මොහොට්ටාල මහතා (තාවකාලික සභාපති), මලික් ප්‍රනාන්දු මහතා (සාමාජික), ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා (සාමාජික), ජයන්ත් පෙරේරා මහතා (සාමාජික) සහ ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා (සාමාජික) ය. (ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා 2021 අප්‍රේල් 23 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වෙන ලදී).

ඩී.ඩී. දිල්රුක්ෂි මහත්මිය, ජාතික විගණන කාර්යාලය නියෝජනය කරමින්, විගණන කමිටු රැස්වීමට සහභාගී විය.

### රැස්වීම්

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් පහක් (5) පැවැත්විණි. නිශ්චිත ගැටලු පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවට පැහැදිලි කිරීම සඳහා ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ කළමනාකරණ සාමාජිකයින්, ආරාධනා මත රැස්වීම්වලට සහභාගී විය.

### සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය

ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය (GAAS) විසින් අභ්‍යන්තර විගණනයන් පවත්වන ලබන අතර අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කරයි.

### මූල්‍ය වර්ෂය තුල අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- තොරතුරු තාක්ෂණ පාලනයන් ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධති මත අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය සහ නියමිත වේලාවට දෙපාර්තුමේන්තු ප්‍රධානීන් විසින් ක්‍රියාමාර්ග ගැනීම අධීක්ෂණය කිරීම.
- වසර අවසාන මූල්‍ය වාර්තා සමාලෝචනය සහ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශිත දෑ ඉදිරිපත් කෙරේ. මීට අමතරව, බාහිර විගණක විසින් නිකුත් කළ කළමනාකරණ ලිපිය සහ ඉස්මතු වූ ගැටළුවලට කළමනාකාරීත්වයේ ප්‍රතිචාර අධීක්ෂණය.
- සමාගමේ සියලුම අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර ඇති බවට සහතික කරලීමට කාර්තුමය අනුකූලතා පාලන රාමුව සමාලෝචනය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ සමාලෝචනය සඳහා GSA පරිපාලන අත්පොත, සම්බන්ධක සේවා ස්ථාන අත්පොත, ආයතනික කළමනාකරණ පද්ධති අත්පොත, පාරිභෝගික ප්‍රතිචාර හසුරුවාලීමේ අත්පොත, ආයතනික තොරතුරු ආරක්ෂණ අත්පොතෙහි සංශෝධනය, නියෝජිතයන්ගේ දිරිදීමනා පටිපාටිය සහ බඩු තොග බැහැරකිරීමේ පටිපාටිය පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය (SOP) (ඉංජිනේරු අංශයට අමතරව).
- කාර්තු පදනම යටතේ නිකුත් කළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු විස්තර සමාලෝචනය.
- කාර්තු පදනම යටතේ වඩාත් ප්‍රමුඛ ණයගැතියන් පිළිබඳ සමාලෝචනය.
- වාර්තා කිරීමේ වගකීම් වල ස්වාධීනත්වය සහ අධිකාරිය මෙන්ම GAAS වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළුව GAAS අංශය විසින් සිදු කරන ලද අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කරන ලදි.

**සංජය මොහොට්ටාල**
*තාවකාලික සභාපති*

අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව
2022 මාර්තු 2

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, 48 වන පිටුවේ ඇති වාර්තාවේ අන්තර්ගත විගණකවරුන්ගේ වගකීම් වලින් වෙනස් වේ.

2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතා ප්‍රකාරව අධ්‍යක්ෂකවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශය, මූල්‍ය වර්ෂය අවසානය සඳහා සමාගම සහ සමූහයේ ක්‍රියාකාරකම් පිළිබඳ නිවැරදිවූත්, සාධාරණවූත් විනිශ්චයක් ලබා දෙමින්, මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ ලාභ හෝ අලාභ දක්වමින් සැකසිය යුතුය. මූල්‍ය ප්‍රකාශය සැකසීමේදී උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගත් අතර අවශ්‍ය පරිදි යොදාගැනීම, සාධාරණ සහ විචක්ෂණශීලි විනිශ්චයන් සහ තක්සේරුවන් සිදුකර ඇති අතර අදාළ වන්නා වූ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන පනතේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවට සහතික කිරීමට, සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්වයන්වල නිවැරදි බව සමග අනාවරණය කිරීමට ප්‍රමාණවත් ගිණුම්කරණ වාර්තා සමාගම සහ සමූහය පවත්වා ගෙන යන බවට සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි. එමෙන්ම ඔවුන්, සමූහයේ වත්කම් සුරක්ෂිතභාවයට මනා ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ සම්බන්ධව වංචා සහ අක්‍රමිකතා සිදුවීම හඳුනාගැනීමට සහ වැලැක්වීම සඳහා ගැලපෙන අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම වෙනුවෙන් නිසි සැලකිල්ලක් දැක්වීමට වගකියනු ලබයි.

බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සහනශීලී ලිපි/රජයේ සහතිකවීම මාර්ගයෙන් ශ්‍රී ලංකා රජය (GOSL) විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය සහ ශ්‍රී ලංකා රජය විසින් සමාගම නැවත සකස්කිරීමට ගත් ප්‍රයත්නයන් සහ සමාගමේ මෙහෙයුම් සහ මූල්‍ය තත්වයන් නඟා සිටුවීම පිළිබඳ සැලකීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරුන් විසින් 'අඛණ්ඩ පැවැත්ම' යන සංකල්පය මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී තවදුරටත් පවත්වා ගෙන යන ලදී.

තවද, මූල්‍ය සටහන් වල 3 වන සටහන යටතේ විස්තර කර ඇති පරිදි, යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2020 ජුනි 17 වන දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත (2020 ජුනි 29 දින භාණ්ඩාගාරික ලේකම් විසින් ලිපිය නිකුත් කර ඇත).

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ මතය ගොඩනැගීම සඳහා සුදුසු යැයි සලකනු ලබන කවර හෝ පරීක්ෂාවක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා ඇති බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි පරිපාලිත සමාගමට අදාළ සියලු බදු, අයකිරීම් සහ මූල්‍ය බැඳීම් ගෙවා හෝ ඊට අදාළ ප්‍රමාණවත් ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය දැනුම අනුව තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/*
*සමාගම් ලේකම්*

2022 මාර්තු 2

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } AAV/A/SLAL/01/20/30 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 29 March 2022

සභාපතිතුමා

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශ

### *1.1 මතය*

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියෙහි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශන වලින් 2021 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### *1.2 මතය සඳහා පදනම*

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණනය ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

### *1.3 කාරණා අවධාරණය කිරීම*

(අ) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව

මූල්‍ය වාර්තාවේ සටහන 3 වෙත මම අවධානය යොමු කරමි, එයින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගමට රුපියල් මිලියන 45,231.46 ක ශුද්ධ අලාභයක් සිදුවී ඇති බවත්, ඒ වන විට රුපියල් මිලියන 371,733.52 ක සමුච්චිත අලාභයක් ඇති බවත්, ඒ වන විට සමාගමේ ජංගම බැරකම් ජංගම වත්කම් ඉක්මවා ඇති බවත්, මුළු බැරකම් මුළු වත්කම් ඉක්මවා ඇති බවත් එම ඉක්මවීම් පිළිවෙලින් රුපියල් මිලියන 221,308.99 හා රුපියල් මිලියන 289,265.27 ක් බවත් පෙන්නුම් කෙරිණි. තවද 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමූහයට රුපියල් මිලියන 49,704.51 ක අලාභයක් සිදුවී ඇති බවත්, ඒ අනුව රුපියල් මිලියන 366,284.57 ක සමුච්චිත අලාභයක් ඇති බවත්, ඒ වන විට සමාගමේ ජංගම බැරකම් ජංගම වත්කම් ඉක්මවා ඇති බවත්, මුළු බැරකම් මුළු වත්කම් ඉක්මවා ඇති බවත් එම ඉක්මවීම් පිළිවෙලින් රුපියල් මිලියන 214,635.95 හා රුපියල් මිලියන 281,490.87 ක් බවත් පෙන්නුම් කෙරිණි.

මූල්‍ය වාර්තාවේ සටහන 3 හි සඳහන් කර ඇති පරිදි, මෙම සිදුවීම් සහ කොන්දේසි, සටහන 3 හි දක්වා ඇති අනෙකුත් කාරණා සමග, ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙන්නුම් කරන අතර, එමගින් සමාගමේ සහ සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු අවිනිශ්චිත බවක් මතු විය හැකිය.

මූල්‍ය ප්‍රකාශනෙහි සටහන 2.1, සමාගමේ සහ සමූහයේ අනාගත අපේක්ෂාවන්, කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් කෙරෙහි

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

කෝවිඩ් 19 පැතිරීමේ බලපෑම විස්තර කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අවසන් කරන අවස්ථාවේදී විසංගත තත්වය පවතින බැවින් කළමනාකරණය විසින් මෙම සිදුවීම් සහ තත්වයන් සමග කටයුතු කිරීමට සැලසුම් කරන ආකාරය විස්තර කර ඇත.

සටහන අංක 3 හි දක්වා ඇති අවම කිරීමේ සාධක සහ 2022 පෙබරවාරි 7 දින කැබිනට් අනුමැතිය සහ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත විගණනය සඳහා ලබාගත්, භාණ්ඩාගාර ලේකම් විසින් 2022 පෙබරවාරි 24 දින නිකුත් කරන ලද ලිපිය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා රජය (GOSL) සමාගම වෙත "අඛණ්ඩ පැවැත්ම" සහිත සමාගමක් වශයෙන් සිය මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා සහයෝගය තහවුරු කරන ලද අතර, මෙම මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් පිළියෙල කොට ඇත.

### ආ) A350-900 පූර්ව ලබාගැනීමේ ගෙවීම්

මූල්‍ය ප්‍රකාශනෙහි සටහන 6 වෙත මාගේ අවධානය යොමු වන අතර, එමගින් 2021 මාර්තු 31 දිනට රුපියල් මිලියන 2,528.12 (ඇ.ඩො. මිලියන 19.21) ක් වූ පූර්ව ලබාගැනීමේ ගෙවීම්, සමාලෝචිත වසර අවසානයට අනුව, සටහන 11-වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ නැවත වර්ගීකරණය කර ඇති බව පෙන්නුම් කරයි.

සටහන 6 හි සඳහන් පරිදි, සමාගම එයාර්බස් S.A.S. වෙත ඉල්ලීම් ලිපියක් යවා ඇති අතර, එයාර්බස් SE විසින් පොළී සමග පූර්ව ලබාගැනීමේ ගෙවීම් ආපසු ලබා දෙන ලෙස ඉල්ලා සිටියි. මෙම අවස්ථාවේදී සමාගමේ කළමනාකාරිත්වයට පූර්ව ලබාගැනීමේ ගෙවීම් ආපසු අයකර ගැනීමේ ප්‍රතිඵලය සමාගමට අහිතකර විය හැකි බවට විශ්වාස කිරීමට කිසිදු තොරතුරක් නොමැත.

කෙසේ වෙතත්, නිරාකරණයක් නොමැති අවස්ථාවක සිදුවිය හැකි නීතිමය ක්‍රියාමාර්ග යක ප්‍රතිඵලය මත ප්‍රතිසාධනය රඳා පවතින අතර, මෙම වාර්තාවේ දිනය දක්වා වූ පූර්ව ලබාගැනීමේ ගෙවීම්වල ප්‍රතිසාධනය පිළිබඳ සමාගමේ උපකල්පනයට විරුද්ධ කිසිදු අමතර තොරතුරක් පිළිබඳව මා දැනුවත් කර නොමැත.

මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිදු කරුණක් නොමැත.

### *1.4 සමාගමේ 2020/21 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු*

වෙනත් තොරතුරු වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු වලින් සමන්විත වන අතර, එයට මූල්‍ය ප්‍රකාශ සහ ඒ සම්බන්ධ මෙම විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබාගත් මාගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරණය නොවන අතර ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක තහවුරුවක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වනුයේ, ඉහත සඳහන් කරන ලද වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර එහිදී, වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශ අතර ප්‍රමාණාත්මක
නොගැලපීමක් පවතීද, විගණනයේදී මා ලද දැනුම අනුව හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇතිද යන්න සොයා බලනු ලබයි. එසේ නම්, අප විසින් සිදුකරන ලද කාර්යය මත පදනම්ව, මෙම විගණන වාර්තාවේ දිනයට පෙර ලබාගත් වෙනත් තොරතුරු මත මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතැයි මා විසින් නිගමනය කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිදු කරුණක් නොමැත.

### *1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකාරිත්වයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරිත්වයෙහි වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාරිත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 2020/21

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සමාගම හෝ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, සමාගමේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරිත්වයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගම සහ සමූහය විසින් සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### *1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්*

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මවිසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනානොග ැනීමට වඩා වැඩි ය, මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇතිකිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.
- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි, නමුත් එසේ සිදුකරන්නේ සමාගමේ ඵලදායීතාවය සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.
- කළමනාකාරිත්වය ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් ඇතිවීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණයන් පිළිබඳ මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් මගින් සමූහය අඛණ්ඩව පැවැත්ම නැවැත්වීමට හේතු විය හැක.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මගින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. කණ්ඩායම් විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මම වගකිව යුතුය. මගේ විගණන මතයට මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව විගණනයේ සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමග මම සන්නිවේදනය කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

***2.1*** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධව නිශ්චිත විධිවිධාන ඇතුළත් කර ඇත.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනී යන පරිදි සමාගම සහ සමූහය විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියට අනුව නිසි පරිදි විගණන වාර්තා තබා ඇත.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වසරට අනුකූල වේ.

2.1.4 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසරේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

***2.2*** සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, ද්‍රව්‍යමය කරුණු වලට සීමා වූ කිසිවක් මගේ අවධානයට ලක්ව නැත;

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තිය අනුව සමාගමේ සාමාන්‍ය සමාගම් කටයුතු බැහැර කටයුතු සම්බන්ධයෙන් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාගමේ පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීමට,

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීති, සාමාන්‍ය සහ විශේෂ විධානවලට සමාගම අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීමට,

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගම එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට,

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාළ නීතිවලට අනුකූලව සහ අදාළ නීතිවලට අනුකූලව නිසි කාල රාමු තුළ සමාගමේ සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලබාගෙන ඒවා භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීම.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
*විගණකාධිපති*

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| මාර්තු 31 දිනට | සටහන | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2021 රු. මිලියන | 2020 රු. මිලියන | 2021 රු. මිලියන | 2020 රු. මිලියන |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 4 | 7,228.51 | 8,449.51 | 4,903.20 | 5,767.28 |
| භාවිත හිමිකම් වත්කම් (ROU) | 5 | 92,455.88 | 119,083.74 | 92,171.07 | 118,751.75 |
| ගුවන් යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් | 6 | - | 2,528.12 | - | 2,528.12 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 7 | 21,246.37 | 18,603.60 | 21,246.37 | 18,603.60 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | | 4,038.79 | 4,241.81 | 4,038.79 | 4,241.81 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 92.14 | 103.92 | 69.55 | 78.50 |
| ආයෝජන | 9.1 | 0.40 | 0.40 | 42.44 | 42.44 |
| | | 125,062.09 | 153,011.10 | 122,471.42 | 150,013.50 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 10 | 4,655.75 | 5,128.63 | 4,483.02 | 4,813.41 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 11 | 11,111.45 | 8,820.33 | 10,810.64 | 7,683.59 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 7 | 13,635.10 | 16,290.06 | 13,635.10 | 16,290.06 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | | 602.76 | 542.22 | 602.76 | 542.22 |
| ආයෝජන | 9.2 | 1,367.82 | 1,039.24 | 1,114.66 | 613.64 |
| මුදල් සහ බැංකු ශේෂයන් | 12 | 1,447.82 | 1,596.98 | 1,263.81 | 1,233.18 |
| | | 32,820.70 | 33,417.46 | 31,909.99 | 31,176.10 |
| **මුළු වත්කම්** | | 157,882.79 | 186,428.56 | 154,381.41 | 181,189.60 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| හිමිකම් | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13 | 79,352.43 | 51,617.44 | 79,352.43 | 51,617.44 |
| සංචිත | 14 | 5,441.27 | 3,686.67 | 3,115.82 | 1,354.96 |
| සමුච්චිත අලාභ | | (366,284.57) | (316,477.65) | (371,733.52) | (326,341.48) |
| | | (281,490.87) | (261,173.54) | (289,265.27) | (273,369.08) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පොලී දරන වගකීම් | 16 | 168,070.52 | 191,315.43 | 167,297.59 | 190,480.17 |
| වෙනත් දිගු කාලීන වගකීම් | 17 | 23,846.49 | 22,033.35 | 23,130.11 | 21,257.28 |
| | | 191,917.01 | 213,348.78 | 190,427.70 | 211,737.45 |
| **ජංගම වගකීම්** | | | | | |
| වරණීය කොටස් | 15 | - | 1,000.00 | - | - |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 18 | 11,196.76 | 17,835.18 | 11,196.76 | 17,835.18 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 19 | 100,350.89 | 108,343.99 | 106,176.53 | 118,086.77 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 175.45 | 212.57 | 175.45 | 175.45 |
| පොලී දරන වගකීම් | 16 | 135,733.55 | 106,861.58 | 135,670.24 | 106,723.83 |
| | | 247,456.65 | 234,253.32 | 253,218.98 | 242,821.23 |
| **මුළු වගකීම්** | | 439,373.66 | 447,602.10 | 443,646.68 | 454,558.68 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 157,882.79 | 186,428.56 | 154,381.41 | 181,189.60 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

**යසන්ත දිසානායක**
*මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද්දේ,

**අසෝක පතිරගේ**
*අධ්‍යක්ෂ*

**ජයන්ත් පෙරේරා**
*අධ්‍යක්ෂ*

පිටු අංක 57 සිට 107 දක්වා ඉදිරිපත්කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

2022 මාර්තු 2
කොළඹ

# ලාභ අලාභ ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2021 රු. මිලියන | සමූහය 2020 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන | සමාගම 2020 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **ආදායම** | 21 | 50,928.92 | 183,531.82 | 50,693.85 | 180,151.02 |
| **වියදම** | | | | | |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | | (10,569.38) | (55,327.75) | (10,569.38) | (55,327.75) |
| සේවක පිරිවැය | | (17,111.81) | (22,903.06) | (16,206.23) | (21,205.44) |
| ගුවන් තොටුපළ ගමන් සහ මගී වියදම් | | (7,308.38) | (25,276.94) | (7,440.31) | (29,217.18) |
| ගුවන් යානා නඩත්තු හා අලුත්වැඩියා පිරිවැය | | (13,695.34) | (22,820.26) | (13,695.34) | (22,820.26) |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය | | (16,745.32) | (19,391.55) | (16,295.62) | (19,013.83) |
| කෙටි කාලීන බදු ගුවන්යානා සහ එන්ජින් කොටස් සඳහා බදු කුලිය | | (2,265.02) | (1,393.67) | (2,265.02) | (1,393.67) |
| විකිණුම් අලෙවි හා ප්‍රචාරණ වියදම් | | (2,064.99) | (14,549.74) | (2,033.93) | (14,540.51) |
| ගුවන් කාර්ය මණ්ඩල වියදම් | | (1,680.18) | (6,557.11) | (1,680.18) | (6,557.11) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (4,670.86) | (15,208.69) | (4,325.38) | (14,127.44) |
| විනිමය අලාභය | | (6,339.22) | (5,270.29) | (6,894.60) | (6,118.51) |
| **මෙහෙයුම් අලාභය** | 23 | (31,521.58) | (5,167.24) | (30,712.14) | (10,170.68) |
| වෙනත් ආදායම් සහ ලාභ | 22 | 17,062.15 | 1,351.51 | 20,628.65 | 3,046.13 |
| මූල්‍ය ආදායම | 24.1 | 561.51 | 377.88 | 524.86 | 317.28 |
| මූල්‍ය වියදම | 24.2 | (35,863.65) | (40,666.87) | (35,672.83) | (40,390.59) |
| **බදු පෙර අලාභ** | | (49,761.57) | (44,104.72) | (45,231.46) | (47,197.86) |
| ආදායම් බදු වියදම | 26 | 57.06 | (34.68) | - | - |
| **වසර සඳහා අලාභය** | | (49,704.51) | (44,139.40) | (45,231.46) | (47,197.86) |

පිටු අංක 57 සිට 107 දක්වා ඉදිරිපත්කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | **සටහන** | **2021** | **2020** | **2021** | **2020** |
| | | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| **වසර සඳහා අලාභය** | | **(49,704.51)** | (44,139.40) | **(45,231.46)** | (47,197.86) |
| **වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය)** | | | | | |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභ):** | | | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම මත ආයුගණන ලැබීම්/(අලාභය) | 17.2 | **(92.13)** | (20.86) | **(160.58)** | (8.87) |
| නිවාඩු මුදල් කිරීම මත ආයුගණන ලැබීම්/(අලාභය) | | **(7.38)** | - | **-** | - |
| OCI වල හඳුනාගත් අයිතමයන්ට විලම්බිත බදු බලපෑම | 26.2 | **(9.16)** | - | **-** | - |
| | | **(108.67)** | (20.86) | **(160.58)** | (8.87) |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභ) (බදුවලට පසු)** | | | | | |
| හෙජ් මුදල් ප්‍රවාහ මත ශුද්ධ සංචලනය | 14.1 | **1,760.86** | (61.44) | **1,760.86** | (61.44) |
| | | **1,760.86** | (61.44) | **1,760.86** | (61.44) |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය) - ශුද්ධ බදු** | | **1,652.19** | (82.30) | **1,600.28** | (70.31) |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය) - ශුද්ධ බදු** | | **(48,052.32)** | (44,221.70) | **(43,631.18)** | (47,268.17) |

පිටු අංක 57 සිට 107 දක්වා ඉදිරිපත්කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| **සමූහය**<br>**මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය**<br>**රු. මිලියන** | **ප්‍රත්‍යාගණන සංචිතය**<br>**රු. මිලියන** | **මුදල් ප්‍රවාහ සීමා සංචිතය**<br>**රු. මිලියන** | **සමුච්චිත අලාභ**<br>**රු. මිලියන** | **එකතුව**<br>**රු. මිලියන** |
|---|---|---|---|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | 51,617.44 | 5,459.01 | (1,699.42) | (223,488.73) | (168,111.70) |
| SLFRS 16 හි පරිවර්තනීය බලපෑම | - | - | - | (48,840.14) | (48,840.14) |
| **2019 අප්‍රේල් 01 දිනට ගළපන ලද ශේෂය** | 51,617.44 | 5,459.01 | (1,699.42) | (272,328.87) | (216,951.84) |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය ආපසු හැරවීම | - | (11.48) | - | 11.48 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (44,139.40) | (44,139.40) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (61.44) | (20.86) | (82.30) |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | (61.44) | (44,160.26) | (44,221.70) |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 5,447.53 | (1,760.86) | (316,477.65) | (261,173.54) |
| ප්‍රකාශිත ආදායම් වලට අත්තිකාරම් | 27,734.99 | - | - | - | 27,734.99 |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය ආපසු හැරවීම | - | (6.26) | - | 6.26 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (49,704.51) | (49,704.51) |
| වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | 1,760.86 | (108.67) | 1,652.19 |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | 1,760.86 | (49,813.18) | (48,052.32) |
| **2021 මාර්තු 31 දිනට ශේෂය** | 79,352.43 | 5,441.27 | - | (366,284.57) | (281,490.87) |

| **සමාගම** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය**<br>**රු. මිලියන** | **ප්‍රත්‍යාගණන සංචිතය**<br>**රු. මිලියන** | **මුදල් ප්‍රවාහ සීමා සංචිතය**<br>**රු. මිලියන** | **සමුච්චිත අලාභ**<br>**රු. මිලියන** | **එකතුව**<br>**රු. මිලියන** |
|---|---|---|---|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | 51,617.44 | 3,115.82 | (1,699.42) | (230,590.07) | (177,556.23) |
| SLFRS 16 හි පරිවර්තනීය බලපෑම | - | - | - | (48,544.68) | (48,544.68) |
| **2019 අප්‍රේල් 01 දිනට ගළපන ලද ශේෂය** | 51,617.44 | 3,115.82 | (1,699.42) | (279,134.75) | (226,100.91) |
| වසර සඳහා අලාභය | - | - | - | (47,197.86) | (47,197.86) |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | (61.44) | (8.87) | (70.31) |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | (61.44) | (47,206.73) | (47,268.17) |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 3,115.82 | (1,760.86) | (326,341.48) | (273,369.08) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් | 27,734.99 | - | - | - | 27,734.99 |
| වසර සඳහා අලාභය | - | - | - | (45,231.46) | (45,231.46) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | 1,760.86 | (160.58) | 1,600.28 |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | 1,760.86 | (45,392.04) | (43,631.18) |
| **2021 මාර්තු 31 දිනට ශේෂය** | 79,352.43 | 3,115.82 | - | (371,733.52) | (289,265.27) |

පිටු අංක 57 සිට 107 දක්වා ඉදිරිපත්කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2021 රු. මිලියන | සමූහය 2020 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන | සමාගම 2020 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් /(භාවිත කළ) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදමට පෙර අලාභය | | (49,761.57) | (44,104.72) | (45,231.46) | (47,197.86) |
| ගැලපුම්: | | | | | |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය/හානිකරණය | | 16,745.32 | 19,391.55 | 16,295.62 | 19,013.83 |
| මූල්‍ය පිරිවැය | 24.2 | 35,592.49 | 40,666.87 | 35,401.67 | 40,390.59 |
| දේපළ පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද අලාභය/(ලැබීම්), | | (7.57) | 8.71 | (4.94) | (3.49) |
| මූල්‍ය ආදායම | 24.1 | (561.51) | (377.88) | (524.86) | (317.28) |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 11.2 | 129.22 | 37.35 | 111.15 | 32.94 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදනය | 9.1 | 385.28 | 113.58 | 282.74 | 91.75 |
| නඩත්තු සංචිතය හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 6.2 | 1,181.44 | 4,349.64 | 1,181.44 | 4,349.64 |
| WHT වල ප්‍රතිපාදන (වෙනස් කිරීම) | 22 | (16,433.45) | 8,062.11 | (16,433.45) | 8,062.11 |
| බදු සහන | 16.3 | (444.93) | - | (278.63) | - |
| භාණ්ඩාගාර බැඳුම්කරවල බැහැර කිරීම්වල අලාභ | | 271.16 | - | 271.16 | - |
| උපලබ්ධි නොවන ලද විනිමය අලාභයෙහි බලපෑම | | 3,969.64 | 4,330.87 | 4,551.06 | 5,045.97 |
| අත්තිකාරම් වල විකිණුම් ආපසු ලිවීම | | (1,931.97) | (1,818.01) | (1,931.97) | (1,818.01) |
| ගෙවන ලද පාර්තෝෂිකය | 16.2 | 997.45 | 1,126.34 | 903.81 | 1,031.33 |
| **කාර්ය ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අලාභ** | | (9,869.00) | 31,786.41 | (5,406.66) | 28,681.52 |
| තොග වල පහළයාම/(ඉහළයාම) | | 87.60 | (50.66) | 47.66 | (55.29) |
| පූර්ව ප්‍රවාහන විකුණුම් වල (පහළයාම)/ඉහළයාම | | (4,706.44) | (5,663.49) | (4,706.44) | (5,663.49) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (ඉහළයාම)/පහළයාම | | 212.10 | 10,584.47 | (605.76) | 10,718.09 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල ඉහළයාම/(පහළයාම) | | 4,132.61 | 18,994.38 | (367.71) | 21,299.36 |
| නඩත්තු සංචිත වල (ඉහළයාම)/පහළයාම | | 246.53 | (6,367.39) | 246.53 | (6,367.39) |
| ගුවන්යානා සුරැකුම් තැන්පතු වල පහළයාම/(ඉහළයාම) | | 633.22 | 132.68 | 633.22 | 132.68 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | (9,263.38) | 49,416.40 | (10,159.16) | 48,745.48 |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | | (20,395.65) | (22,699.41) | (20,204.83) | (22,432.00) |
| ගෙවන ලද පාර්තෝෂිකය | 16.2 | (988.41) | (587.07) | (941.21) | (543.52) |
| ගෙවන ලද ආදායම් බදු | | (37.51) | - | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ/(භාවිත කරන ලද)** | | (30,684.95) | 26,129.92 | (31,305.20) | 25,769.96 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලද පොලිය | | 300.90 | 132.57 | 267.40 | 88.57 |
| දේපළ පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | | (319.95) | (735.56) | (282.82) | (399.28) |
| (ආයෝජන)/ කෙටි කාලීන ආයෝජන/තැන්පතු උපලබ්ධි වීම | | (271.21) | (72.08) | (446.81) | 4.92 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | | (38.60) | (23.44) | (30.00) | (20.26) |
| දේපළ පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම බැහැර කිරීමෙන් ලද මුදල් | | 10.52 | 5.10 | 4.94 | 3.84 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (318.34) | (693.41) | (487.29) | (322.21) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවල බැහැර කිරීම්වල උත්පාදන | | 27,463.82 | - | 27,463.82 | - |
| පොලී දරන වගකීම් ආපසු ගෙවීම | | (3,189.70) | (39,704.62) | (3,078.78) | (39,579.34) |
| කල්බදු වගකීම ආපසු ගෙවීම | | (6,677.11) | (19,452.56) | (6,799.04) | (19,421.89) |
| වරණීය කොටස් නිදහස් කිරීම | | (1,000.00) | - | - | - |
| පොලී දරන ණය හා ණය ලබාගැනීම් වෙතින් මුදල් | | 2,821.40 | 30,556.46 | 2,801.40 | 30,556.46 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් (භාවිත කෙරුණු) ශුද්ධ මුදල්** | | 19,418.41 | (28,600.72) | 20,387.40 | (28,444.77) |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ ඉහළයාම/(පහළයාම)** | | (11,584.88) | (3,164.21) | (11,405.09) | (2,997.02) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 12 | (10,084.43) | (6,920.22) | (10,448.23) | (7,451.21) |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 12 | (21,669.31) | (10,084.43) | (21,853.32) | (10,448.23) |

පිටු අංක 57 සිට 107 දක්වා ඉදිරිපත්කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සාංගමික තොරතුරු

### 1.1 සාමාන්‍ය තොරතුරු

**සමාගම**

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (සමාගම) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමාසහිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි, ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

**සමාගම**

සමාගමේ මූලික ක්‍රියාකාරකම් සමන්විත වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහකයා වශයෙන් මගීන් ප්‍රවාහනය කිරීම සඳහා නිශ්චිත සහ නිශ්චිත නොවන කාලසටහනකට අනුව ගුවන් සේවා පවත්වාගෙන යාම සහ, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය කිරීමය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළේ (“MRIA”) ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීම, අභ්‍යන්තර සහ බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීම අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. තෙවන පාර්ශවවලට නඩත්තු සේවා සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සහ ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීම යනාදිය සමාගමේ උපකාරී සේවා කටයුතු වේ.

**පරිපාලිතය සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපල හරහා ක්‍රියාත්මක වනු ලබන ගුවන් සේවා සඳහා ආහාරපාන සේවාවන් සැපයීම සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි (පරිපාලිතය) මූලික ක්‍රියාකාරකමකි. අනෙකුත් සහායක කටයුතු අතරට මහජන සහ අතරමැදි මගී සංක්‍රමණ අවන්හල් පවත්වාගෙන යාම, ලොන්ඩරි සේවා ලබාදීම සහ අතරමැදි මගී සංක්‍රමණ හෝටලය කළමනාකරණය කිරීම ඇතුළත් වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශයන් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මාර්තු 02 දින අනුමැතිය ලබාදෙන ලදී.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර ඇති ඉඩම් සහ ගොඩනැගිලි සහ ගුවන්යානයේ මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය මත ගණනය කර ඇත.

වෙනත් අයුරකින් සඳහන් කර ඇති විටක හැර, සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කොට ආසන්නතම රුපියල් මිලියනයට වටයා ඇත.

ලොව පුරා ආසාදිතයන් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්තා කරමින්, 2020 වසරේ කෝවිඩ්-19 වසංගතය සීඝ්‍රයෙන් පැතිරුණි. වෛරසය පැතිරීම සීමා කිරීමට සහ අවම කිරීමට ගත් ක්‍රියාමාර්ග පුද්ගලයින්ගේ ගමනාගමන සහ ගුවන්සේවා සීමා කිරීම ඇතුළුව සැලකිය යුතු ලෙස ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා බලපෑමක් ඇති කරන ලදී. ලෝක ගුවන්සේවා වෙළඳපොළ, සැලකිය යුතු ලෙස කෙටිකාලීන අර්බුදයකට ලක්විය. මෙම බිඳවැටීම සංචරණ සීමා ලිහිල් කිරීමෙන් පසු ක්‍රමයෙන් යථා තත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගුවන් සේවාවක් ලෙස, සාමාන්‍ය ලෙස සම්පූර්ණ මගී සේවාව මෙහෙයවීමට සමාගම අපොහොසත් වූ අතර සමාගමේ ආදායම වසංගත තත්වය හේතුවෙන් සෘණාත්මක බලපෑමකට ලක් වූ අතර එය ඉදිරියටත් පවතිනු ඇත. එමෙන්ම එහි පූර්ණ බලපෑම සහ කාල සීමාව නිශ්චිතව පුරෝකථනය කළ නොහැක. උක්ත හේතු මත, පරිපාලිත ආයතනයට උපරිම ධාරිතාවයෙන් කටයුතු කළ නොහැකි විය.

නව ආදායම් උත්පාදන අවස්ථාවන් ඇතිකරලීම (කාර්යසටහන් සහිතව භාණ්ඩ ප්‍රවාහනය සහ මගී ප්‍රවාහන ගුවන්යානා විශේෂිත භාණ්ඩ ප්‍රවාහන ගුවන්යානා ලෙස භාවිතය), පිරිවැය අවම කිරීමට ක්‍රියාමාර්ග ගැනීම, අභිමත ප්‍රාග්ධන වියදම් අවම කිරීම සහ අමතර කාරක ප්‍රාග්ධන පහසුකම් සාකච්ජා කිරීම ඇතුළුව වසංගතය හමුවේ ව්‍යාපාර කළමනාකරණයට සමූහය මගින් විවිධාකාර ක්‍රියාකාරකම් ගෙන ඇත.

මෙම ක්‍රියාමාර්ග අතරට නව හිමිකම් ප්‍රාග්ධනය එක් කිරීම සහ ශ්‍රී ලංකා රජයේ කැපවූ සහය ලබා ගැනීමද ඇතුළත් වන අතර, ඒ පිළිබඳ අඛණ්ඩභාවය 3 වන සටහනෙහි දක්වා ඇත.

උක්ත කරුණු පදනම්ව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩභාවය පදනම මත පවත්වා ගෙන යනු ලැබේ.

තවද, කෝවිඩ්-19 බලපෑම හේතුවෙන් සමූහයට ඇති විය හැකි හානිය ගණනය කරන පරීක්ෂාවක් සිදු කළද, හානිකරණ පාඩුවක් හඳුනා නොගැනුණි. ඉදිරියටත් කරගෙන යනු ලබන බලපෑම් තක්සේරුවේ කොටසක් ලෙස කෝවිඩ්-19 තත්වය වැඩි අවධානයකින් නිරීක්ෂණය කිරීමට කළමනාකරණය යොමු වී ඇත.

#### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම, 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සිදු කරනු ලබයි.

#### 2.1.2 සංසන්දනාත්මක තොරතුරු

නිසි ඉදිරිපත් කිරීම සහ වර්තමාන වසර සමග සසන්දනයට අදාළ වූ විටක, පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

#### 2.1.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

සමූහයේ මූල්‍ය ප්‍රකාශන වල ක්‍රියාකාරී සහ ඉදිරිපත්කරනු ලබන විනිමය ශ්‍රී ලංකා රුපියල් (LKR) මගින් දක්වනු ලබයි. මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත්කිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් LKAS 01 මගින් අවසරදී ඇති පරිදි සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කොට ඇති අතර සියලුම මූල්‍ය තොරතුරු සඳහන් කොට ඇතිවිටෙක හැර ආසන්නතම රුපියල් මිලියනයට වටයා ඇත.

### 2.2 ඒකාබද්ධකරණයෙහි පදනම

මූල්‍ය ප්‍රකාශවල සමාගමේ සහ එහි අනුබද්ධිත සමාගම්වල 2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසරට මූල්‍ය ප්‍රකාශන අඩංගු වේ. සමාගමේ පරිපාලිතයන් වල මූල්‍ය ප්‍රකාශයන් ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිත කරමින් එම වාර්තාකරණ වසර සඳහා සකස් කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 2.2.1 ව්‍යාපාර සංයෝජනය

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයක් ව්‍යාපාරයක හා ව්‍යාපාර පාලනයේ අර්ථ දැක්වීම සපුරාලන විට අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් සමූහය, ව්‍යාපාර සංයෝජනයන් ගිණුම්ගත කරයි. අත්පත් කරගත් කිසියම් ක්‍රියාකාරකමක් හෝ වත්කමක් ව්‍යාපාරයක් ද නැද්ද යන්න හඳුනා ගැනීමේදී අවම ලෙස එය ආදානයක් සහ ස්වාධීන ක්‍රියාවලියක් මෙන්ම එයට නිපැයුමක් කිරීමේ හැකියාවක් තිබේද යන්න සමූහය තක්සේරු කරනු ලබයි.

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් ව්‍යාපාරයක් නොවන්නේද යන්න සරල ලෙස තක්සේරු කිරීමට ඉඩ දෙන 'ඒකාග්‍රතා පරීක්ෂණයක්' කිරීමට සමූහයට විකල්පයක් ඇත. අත්පත් කරගත් දළ වත්කම්වල සාධාරණ අගය සැළකිය යුතු ලෙස හඳුනාගත හැකි වත්කම් හෝ සමානව හඳුනාගත හැකි වත්කම් සමූහයක් තුළ සංකේන්ද්‍රණය වී ඇත්නම් විකල්ප ඒකාග්‍රතා පරීක්ෂණය සපුරාලනු ඇත.

අත්කරගැනීම්වල හරවන ලද වටිනාකම් මෙන්ම හඳුනාගත් ශුද්ධ දළ වත්කම්ද සාමාන්‍යයෙන් සාධාරණ අගය මත මනිනු ලබයි. ඇතිවන්නාවූ ඕනෑම කීර්තිනාමක්, හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි. ඕනෑම ලාභයක් හෝ කේවල කිරීමක් ලාභ සහ අලාභවල කඩිනමින් හඳුනා ගනු ලබයි. ණය හෝ අවශිෂ්ට සුරුකුම්පතකට සම්බන්ධ වීමකදී හැර ගනුදෙනු පිරිවැය දැරූ වියදම් ලෙස සලකනු ලබයි.

පූර්ව පවත්නා සම්බන්ධතා පියවීමේ වටිනාකම් පැවරීම්වල අන්තර්ගත නොවේ. එවැනි අගයන් සාමාන්‍යයෙන් ලාභ සහ අලාභවල හඳුනාගත හැකිය.

ඕනෑම අවිනිශ්චිත වටිනාකමක් අත්පත් කර ගැනීමේ දිනට එහි සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

අවිනිශ්චිත ගෙවීමට ඇති බැඳීම මූල්‍ය උපකරණයක නිර්වචන සමග සැසඳේ නම් සහ එය හිමිකම් වර්ගීකරණය යටතට වැටේ නම්, එවිට නැවත ගණනය නොකරන අතර ගාස්තු ගෙවීම හිමිකම් සමග ගිණුම්ගත කරනු ලබයි. ඒ හැරුණු කොට අනෙකුත් ප්‍රතිලාභ හඳුනාගැනීම සෑම වාර්තාකරණ දිනකම සාධාරණ අගය මත නැවත ගණනය කරනු ලබන අතර, අවිනිශ්චිත ප්‍රතිලාභ හඳුනාගැනීමේ සාධාරණ අගයන්වල සමාගම් වෙනස්කම් ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

### 2.2.2 පරිපාලිතයන්

පරිපාලිතයන් යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය ආයතනයන් 'පාලනය' කරනු ලබන්නේ, එයට නිරාවරණය වූ විටක හෝ, එහි සම්බන්ධවීම තුළින් පරිපාලිතයේ විචල්‍ය ප්‍රතිලාභ සඳහා අයිතියක් ඇති විටක සහ, සිය බලය යොදවමින්, එවැනි ප්‍රතිලාභ පරිපාලිතයකට බලපෑමක් ඇති කිරීමට හැකි අවස්ථාවකය. පාලනය ආරම්භ කරන දිනයේ සිට අවසන් දිනය තෙක් පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය වාර්තාවේ අන්තර්ගත වේ.

### 2.2.3 පාලනයට නතු නොවන අයිතීන්

සෑම ව්‍යාපාර සංයෝජනයකදීම සමූහය විසින් අත්කර ගැනීමට අදාළ පාලනය නතු නොවන අයිතීන් ගණනය කරනු ලබන අතර, එය සාධාරණ අගය මත හෝ සමානුපාතික කොටස්වල හඳුනාගත් ශුද්ධ වත්කම්වල අගය මත ගණනය වේ. කෙසේවෙතත් මෙය සාමාන්‍යයෙන් සාධාරණ අගය මත ගණනය වේ.

පාලනයට නතු නොවන අයිතීන් අත්පත් කර ගැනීම, හිමිකරුවන් සමග හිමිකරුගේ ධාරිතාවය මත සිදුවූ ගණුදෙනුවක් ලෙස සලකා ගණනය කරනු ලබයි. එවැනි ගනුදෙනු නිසාවෙන් කීර්තිනාමයක් හඳුනා ගත නොහැකිය. පාලනයට නතු නොවන අයිතීන්වල වෙනස්කම්, පරිපාලිතයේ ශුද්ධ වත්කම්වල සමානුපාතික අගයමත පදනම්ව ගණනය කරනු ලබයි.

සමූහයට පරිපාලිතයේ තිබෙන අයිතියේ අහිමිවීමක් ගෙන නොදෙන වෙනස්කම්, හිමිකම් ගනුදෙනුවක් ලෙස ගණනය කරනු ලබයි.

### 2.2.4 පාලනය අහිමි වීම

පරිපාලිතයේ පාලනය සමූහයෙන් ගිලිහී යන විටක, එය පරිපාලිතයේ වත්කම් සහ වගකීම් සහ එයට අදාල NCI හා අනෙකුත් හිමිකම්වල අංග ලෙස හදුනා නොගනී. ප්‍රතිඵලයක් ලෙස ලාභ හෝ අලාභයක් වෙතොත් එය ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලබයි. පෙර පරිපාලිතයේ ඕනෑම රඳවා ගන්නා ලද අයිතියක්, සාධාරණ අගය මත ගණනය කරනු ලබයි.

### 2.2.5 ඒකාබද්ධ කිරීම මත ඉවත් කළ ගනුදෙනු

අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු වලින් ඇතිවන උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඉවත් කෙරේ. හිමිකම් ගිණුම්ගත ආයෝජිතයන් සමග ගනුදෙනු වලදී උපලබ්ධි නොවූ ලාභ එම ආයෝජන වලට එරෙහිව එම හිමිකම් මත ඉවත්කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ, උපලබ්ධි නොවූ ප්‍රතිලාභ ආකාරයටම ඉවත් කළද, එය හානිය පිළිබඳ සාක්ෂියක් නොමැති තෙක්ය.

## 2.3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන්

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන් මෙම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සියලුම කාල පරිච්ඡේදයන්ට අදාළව අඛණ්ඩව යොදා ගෙන ඇත.

### 2.3.1 ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්

2020 අප්‍රේල් 1 දිනට බලපැවැත්වෙන නව ප්‍රමිතීන්/ අර්ථකථන සමූහයේ මූල්‍ය ප්‍රකාශනයන්ට සැලකියයුතු බලපෑමක් ඇති නොකරයි. 2020 මැයි 28 දින නිකුත් කරන ලද කෝවිඩ්-19 ට අදාළ බදු සහන IFRS 16 හි සංශෝධනයන් මුල සිට සමූහය විසින් යොදා ගන්නා ලදී. කල්බදු සඳහා විකල්ප ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් සංශෝධනයන් මගින් හඳුන්වාදෙනු ලබන අතර සමූහය බදු ගැනුම්කරුවෙකු වේ. එනම් සමූහය විසින් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් යොදා ගනිමින් අය කර ගන්නා කල්බදු සදහා සුදුසුකම්ලත් ණය සහනයන් කෝවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයක් නිසා ඇතිවූ වෙනස්කිරීමක්ද යන්න තක්සේරුකිරීමට සමූහයට අවශ්‍ය නොවේ. සමූහය සංශෝධන අතීතානුබද්ධව යොදා ගෙන ඇත. 2020 අප්‍රේල් 01 දිනට රඳවා ගත් ඉපැයුම්වලට සංශෝධනවල බලපෑමක් නැත. පෙර යොදාගන්නා ලද, නිකුත් කළ නමුදු බලාත්මක නොවන කිසියම් ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් සමාගම සතුව නැත.

### 2.3.2 සැලකියයුතු ගිණුම්කරන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන්

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිලිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ වාර්තා කරන දිනයට සිදුකරන හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑම් කල හැකි විනිශ්චයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන විනිශ්චයන්, ඇස්තමේන්තු

හා ඒ හා බැඳුණු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක් කෙරෙන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුකූලව සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

විෂයානුබද්ධ මෙන්ම මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනෙන අගයන් මත වැදගත් බලපෑමක් ඇති කරන්නාවූ අනෙකුත් දෑ අතර පහත දැක්වෙන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගනු ලැබේ.

(අ) විනිශ්චයන්

**(i) අඛණ්ඩ පැවැත්ම**
3 වන සටහනෙහි අනාවරණය කර ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර සහ ඉදිරිපත් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනම මතය.

**(ii) අසම්භාව්‍ය වගකීම් - නඩු කටයුතු**
වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානය වන විට විවිධ පාර්ශවකරුවන් සමග සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ නීතිඥයන්ගේ උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කටයුතු වල තත්වය ඇගයුමට ලක් කරන අතර අනාගතයේදී සම්පත් ගලායෑමක් පවතී යයි නිශ්චය කළහොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරනු ලබයි.

ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවකයින් විසින් සමූහයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම් ඉල්ලීමක් සහ විභව හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන්, සමාගමේ ව්‍යාපාර කටයුතුවලට සැලකිය යුතු බලපෑමක් අධ්‍යක්ෂවරුන් අපේක්ෂා නොකරන කාරණා සඳහා, අදාළ මුදල් ප්‍රමාණයන් සටහන 26 හි හෙළිදරව් කර ඇත.

**(iii) කල්බදු**
කොන්ත්‍රාත්තුවක් තක්සේරු කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු ක්‍රමයක් ද යන්න බැලීම සඳහාය. හඳුනාගත් වත්කම් කිසියම් කාල සීමාවකට යම් වටිනාකමක් වෙනුවෙන් භාවිතය සහ පාලනය කිරීමට අයිතියක් ප්‍රකාශ කරන්නේ නම් එය කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු වේ. කොන්ත්‍රාත්තුවක් හඳුනාගත් වත්කමක් පාලනයට අයිතිය ප්‍රකාශ කරන්නේද යන්න තීරණය කිරීමට සැලකිය යුතු සාධකයන් වන්නේ ද කොන්ත්‍රාත් පදනම අනුව හඳුනාගත් වත්කම් භාවිතයට ගැනීමට, භාවිත කාලය පුරාම තක්සේරුව භාවිත කරමින් සියළු ආර්ථික වාසි ලබා ගැනීමට මෙන්ම තක්සේරුවන් සෘජුව භාවිත කිරීමට සමූහයට අයිතියක් ඇත.

(ආ) ඇස්තමේන්තු

**(i) දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය වීම/ක්‍රමක්ෂය**
දේපළ, පිරියත හා උපකරණ යන වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් ඒවාට යම් ඵලදායී ජීවකාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ඵලදායී ජීවකාලයද එක් එක් වාර්තා කරන දිනට ඒවායේ ක්ෂයවීම්/ක්‍රමක්ෂය ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම් සඳහා පෙර සිදුකළ ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමග එය අනුගතවන බවටද සහතික කරනු ලබයි. මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා අවශේෂ වටිනාකම් වල වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සංශෝධන වලට හේතුවිය හැකිය. (2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්ති විමසා බලන්න)

**(ii) නිරන්තර පියාසර වැඩසටහන "Frequent Flyer Programme"**
ලකුණු ප්‍රදානයන් (Award Credits) ආදායමෙහි වෙනම හඳුනාගැනෙන සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ. ලකුණු ප්‍රදාන සඳහා වෙන්කළ අදාළ ප්‍රතිෂ්ඨාව ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීමක් (විලම්භිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් ලකුණු ප්‍රදාන (Mile Credits) වල සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණ ශිල්ප ක්‍රම භාවිතා කරන අතර අංශයක් (Sector) සඳහා ගාස්තුව, ඉහළ පංතියක ආසනයක් ලබාගැනීම හා හවුල්කාර ප්‍රදාන වැනි සාධක ගණනාවක් සඳහා බර තැබූ සාමාන්‍යයක් පෙන්නුම් කෙරේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවණතාවන් යොදා ගැනේ. සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂා නොකරන සැතපුම් සඳහා සහ කල් ඉකුත් සැතපුම් සඳහා, සැතපුම්වල සාධාරණ අගය වෙනුවෙන් ගැළපුම් සිදුකෙරේ.

සැතපුම් වල සාධාරණ අගය නිශ්චය කිරීමෙහිලා යොදාගැනෙන යෙදවුම්වල විවිධත්වය නිසා කළමනාකරණ විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

**(iii) නඩත්තු සංචිතය**
නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් කල්බදු යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම විසින් මාසික ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය සහ චක්‍ර ගණන අනුවය. ආපසු අයකර හැකි වටිනාකම් වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් වල ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳව කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. කිසියම් වත්කමක ධාරණ අගය එහි ආපසු අයකර ගතහැකි මුදල ඉක්මවන විට එම වත්කම හානිකරණය වූ වත්කමක් සේ සලකා එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා පහත දමයි (සටහන 6 විමසා බලන්න).

**(iv) ගුවන් යානා නඩත්තු සහ අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන්කිරීම**
නඩත්තු කටයුතු සඳහා එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා බඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබෑසුම් උපකරණ සම්බන්ධ විශාල නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. පිරික්සුමේ ස්වාභාවය මත කාලය යෙදවීම හා භාවිතය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන තුළ විශාල නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදන සිදුකරයි. මෙම ප්‍රතිපාදන තීරණය කිරීමෙහිදී, අදාළ පරික්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේදී පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත තත්වය මත, යෙදවිය යුතු අමුද්‍රව්‍ය හා දැරිය යුතු පොදුකාර්ය පිරිවැය මත සහ අදාළ පරික්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මත සුදුසු උපකල්පනවලට එළඹේ. මෙම උපකල්පනවලට එළඹෙනුයේ අතීත අත්දැකීම් මත වන අතර ඒවා සත්‍ය මට්ටමට ආසන්න බව තහවුරු කරගැනීම සඳහා නිරන්තර සමාලෝචනයට ලක්කරනු ලැබේ. ප්‍රතිපාදන

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිකරන උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් සංශෝධන වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් සිදුකරනු ලැබේ.

**(v) ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත සෘජු මෙහෙයුම් වියදම් සඳහා වෙන්කිරීම**

ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කාර්ය වලදී ඉන්ධන ගාස්තු, ගොඩබිම් මෙහෙයුම් සේවා සඳහා ගාස්තු, ගොඩබෑම් හා නවතා තැබීමේ ගාස්තු, ගුවන්යානා තුළ ආහාර පාන, ප්‍රවේශපත් වෙන්කරවා ගැනීමේ පද්ධති ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි සෘජු වියදම් සම්බන්ධයෙන්වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීමට අනිවාර්යයෙන්ම සිදුවේ. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අතීත අත්දැකීම් මතද, අවස්ථානුකූල පරිදි සාධාරණ වේයැයි විශ්වාස කෙරෙන බොහෝ අනිකුත් සාධක මතද පදනම් වන අතර ඉන් උද්ගත වන ප්‍රතිඵල වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වගකීම්වල ධාරණ අගය මත ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවේ.

**(vi) තොග**

සමාගම විසින් අඛණ්ඩ තොග ගණනය සිදුකිරීම මගින් තොග වල පැවැත්ම හා ප්‍රයෝජනවත්භාවය, සමාලෝචනය කරයි. කල් ඉකුත් වූ තොග සහ/හෝ තොගවල ආපසු අයකරගත හැකි වටිනාකමෙහි අඩුවීමක් සම්බන්ධයෙන් කළමනාකරණය තීරණය කල විට ඒ සඳහා ප්‍රතිපාදන සිදුකරයි.

**(vii) මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

යම් වත්කමක් හානිකරණයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි සොයා බැලීමට එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නොගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට සිය විනිසුම කළමනාකරණය විසින් භාවිතා කරනු ලබයි.

**(viii) මූල්‍ය වත්කම් හානිකරණය**

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නොගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට කළමනාකරණය විසින් සිය විනිසුම භාවිතා කරනු ලබයි.

(ඇ) උපකල්පන

**(i) නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්ම**

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය තීරණය කෙරෙනුයේ ආයුගණන  තක්සේරුවක් ආශ්‍රයෙනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොළී අනුපාතය, වැටුප් වර්ධන අනුපාතය, විශේෂ වාරික, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතා වලට යටත් වේ. (2.4.16 සටහන විමසා බලන්න.)

**(ii) දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය**

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ඉඩම් සහ ගොඩනැගිලිවල සහ ගුවන් යානා මුළුතැන්ගෙයි උපකරණ ප්‍රත්‍යාගණන අගය මත මනිනු ලැබේ. සාධාරණ අගය තීරණය කිරීම පිණිස එකී තක්සේරුකරු විසින් උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතා කරනු ලැබේ. අදාළ තක්සේරු කිරීමේ පදනම සටහන 4 හි හෙළිදරව් කර ඇත.

***2.4 සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත සාරාංශය***

2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු ඒවා සිදුවන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදලින් ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැයට ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

2.4.2 බදුකරණය

ආදායම් බදුවල ප්‍රවර්තන සහ විලම්භිත බදු අඩංගු වේ. එය ව්‍යාපාර සංයෝජනයකට සම්බන්ධවන ප්‍රමාණයට හෝ හිමිකම් හෝ OCI හි සෘජුවම හඳුනාගත් අයිතමයක් නොවන අවස්ථාවක ලාභ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ. අදායම් බදුවලට සම්බන්ධ පොළී සහ දඩ මුදල් (අවිනිශ්චිත බදු පිරියම් ඇතුළුව) ආදායම් බදුවල අර්ථකථනයට නොගැළපෙන හෙයින් එය IAS 37 ප්‍රතිපාදනයෙහි අවිනිශ්චිත වගකීම් සහ වත්කම් යටතේ ගිණුම්ගත කරනු ඇත.

**(i) ප්‍රවර්තන ආදායම් බදු**

ප්‍රවර්තන බදුවල අපේක්ෂිත බදු ගෙවීම් හෝ ආදායම් බදුවල ලැබියයුතු හෝ වසර සඳහා අලාභ හෝ පෙර වසරට අනුව ගෙවියයුතු බදු හෝ ලැබියයුතු බදු සඳහා ඕනෑම වෙනස් කිරීමක් අඩංගු වේ. ප්‍රවර්තන බදු ගෙවියයුතු හෝ ලැබියයුතු ප්‍රමාණයන් යනු අදායම් බදුවලට අදාළ දක්වනු ලබන ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත බදු ප්‍රමාණයන්වල සුදුසුතම තක්සේරුවයි, එසේ වේ නම්, වාර්තාකළ දිනයට පැනවූ බදු අනුපාතික හෝ නිත්‍ය ලෙස පැනවීම් පාදක කරගනිමින් එය මනිනු ලැබේ. එමෙන්ම ලාභාංශයෙන් ඇතිවන ඕනෑම බදු, ප්‍රවර්තන බදුවල අන්තර්ගතය.

කිසියම් නිර්ණායකයක් තිබේ නම් පමණක්, ප්‍රවර්තන බදු වත්කම් හෝ වගකීම් වලට හිලව් කරගනු ලැබේ.

**සමාගම**

(අ) දේශීය බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත බලාත්මක වීම සමඟ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම ව්‍යාපාර කටයුතු සඳහා ආදායම් බදු ගෙවීමේ වගකීමක් සමාගම සතු වේ.

(ආ) විදේශීය බදුකරණය

ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුල තම මෙහෙයුම් කටයුතු මත බදු ගෙවීමේ වගකීමට සමාගම යටත් වේ. කෙසේ වුවද, සමාගමට ඇති ඉදිරියට ගෙන ගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය

තුළ බදු සම්බන්ධ කිසිදු වගකීමක් සමාගමට නොමැත.

**පරිපාලිත සමාගම - ශ්‍රීලංකන් කේටරින් සමාගම**
ආදායම් බදු වියදම් තුළ ප්‍රවර්තන සහ විලම්භිත බදු අඩංගුවේ. හිමිකම් තුළ සෘජුවම හඳුනා ගැනෙන අයිතමයන් ලෙස සැලකෙන තෙක් හැර, ආදායම් බදු වියදම ලාභය හෝ අලාභය තුල හඳුනා ගැනේ.

ආයෝජන මණ්ඩලය (BOI) සමග ඇතිකරගත් ගිවිසුම අනුව, ගුවන් යානාස්ථ ආහාර සැපයුම සහ ගුවන් මගී මාර්ගස්ථ අවන්හලෙන් උපයන ආදායම 2021 මැයි මස 31 දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. වෙනත් මූලයන් වෙතින් උපයන ආදායම සාමාන්‍ය බදු අනුපාත යටතේ බදු වගකීමට බැඳේ.

**(ii) විලම්භිත ආදායම් බදු**
වත්කම් සහ වගකීම්වල බදු පදනමේ සහ ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා වූ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ වගකීම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත ආදායම් බදු වෙන්කිරීම් කෙරේ.

විලම්භිත බදු, වාර්තාකරණ දිනයට පනවන ලද හෝ නිත්‍ය ලෙස පනවන ලද නීති මත පදනම්ව, ප්‍රතිවර්තනය කරන අවස්ථාවක තාවකාලිකව වෙනස් කිරීම සඳහා යොදාගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික අනුව ගණනය කරනු ලබයි.

භාවිතා නොකළ බදු අලාභයන් සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන අතර, ඒවා ප්‍රයෝජනට ගත හැකි අනාගත බදු ආදායම් වලට එදිරිව භාවිතා කළ හැකිය. විලම්භිත බදු වත්කම් වාර්තා කරන දිනයට විමර්ශනය කරන අතර අදාළ බදු ප්‍රතිලාභයන් තැබිය හැකි, තවදුරටත් සම්භාවි විය නොහැකි වන තෙක් අඩුකරනු ලබයි.

### 2.4.3 දේපළ, පිරියත සහ උපකරණ

**(අ) පිරිවැය සහ තක්සේරු කිරීම**
දේපළ, පිරියත සහ උපකරණවල සියලුම අයිතම මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරනු ලබයි. අත්පත්කර ගැනීම් හෝ ඉදිකිරීම සඳහා සෘජුව ආරෝපණය කල හැකි වියදම් පිරිවැයට ඇතුලත් වේ. ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ යනාදිය පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර එම ප්‍රත්‍යාගණිත දේපළ, පිරියත සහ උපකරණ යම් ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකළ ප්‍රත්‍යාගත අගයට ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම් සහ/හෝ සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත වාර්තා කරයි.

සමාන වත්කමකට අයත් මීට පෙර ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වන තෙක් හැරුණුවිට, ඉඩම්, ගොඩනැගිලි සහ ගුවන් යානාස්ථ මුළුතැන්ගෙහි උපකරණ ප්‍රත්‍යාගණන අගයට ගණනය කරන අතර ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම් තුල හඳුනාගන්නා අතර හිමිකම තුළ වූ ප්‍රත්‍යාගණන සංචිතය තුළ සමුච්චිත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුල හඳුනාගෙන ඇති එම වත්කමට අදාළ දැනටමත් පවත්නා අතිරික්තයක් හිලව් කළපසු ඉතිරියටය.

ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයට විශාල වෙනසක් සිදුනොකරනු ලබන බවට සහතිකවනු පිණිස වත්කම් තක්සේරු කටයුතු ප්‍රමාණවත් වාර ගණනක් සිදු කෙරේ. අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒ නම් හෝ අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් ගණනය කල හැකි නම් පසුව ඇතිවන පිරිවැය අදාළ වත්කමෙහි ධාරණ අගය තුළ අන්තර්ගත කිරීම හෝ වෙනම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදුකෙරේ.

අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදය තුළ ලාභ අලාභ ප්‍රකාශයට අය කෙරේ.

දේපළ, පිරියත සහ උපකරණ තුළ පහත සඳහන් වෙනත් දෑ ඇතුලත් වේ.

**(i) ගුවන්යානා භ්‍රමණාමය අමතර කොටස්**
ස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණාමය අමතර කොටස් මූලික වශයෙන් පිරිවැය මත වාර්තා කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය "ගුවන්යානා ආශ්‍රිත උපකරණ" යටතේ වර්ග කර ඇත.

**(ii) නොනිමි ප්‍රාග්ධනය**
නොනිමි ප්‍රාග්ධනය ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපිත දිනය දක්වා දරන ලද සියලු වියදම් ඇතුළත් පිරිවැයට වාර්තා කරනු ලබයි. වැඩ ස්ථාපනය කළ විට නොනිමි ප්‍රාග්ධනය දේපළ, පිරියත සහ උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි.

(ආ) ක්ෂයවීම
සින්නක්කර ඉඩම් හැරුණු විට, සියලුම දේපළ, පිරියත සහ උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමවේදය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සමාන වාරිකවලින් කපා හරිමින් ක්ෂයවීම් සඳහා වූ වෙන්කිරීම් ගණනය කෙරේ.

| | | |
|---|---|---|
| ගුවන් යානා ආශ්‍රිත උපකරණ | - | වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා |
| පිරියත සහ උපකරණ | - | උපකරණයේ වර්ගීකරණය/ස්වභාවය මත පදනම්ව වසර 3-10 දක්වා කාලපරිච්ඡේදය පුරා |
| ගොඩනැගිලි | - | වසර 15 සිට 50 දක්වා වූ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීවකාලය පුරා |
| මෙහෙයුම් කල්බදු මත වූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් | - | වසර 10 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා ක්ෂය කරනු ලබයි. |

අවශේෂ වටිනාකම/සුන්බුන් අගය, ඵලදායී ජීවකාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තාකරණ දිනට සමාලෝචනය කෙරෙන අතර සුදුසු පරිදි අදාළ ගැලපීම් සිදුකෙරේ.

ඉහත සඳහන් ක්ෂයවීමේ අනුපාත ඉදිරිපත් කළ සියළුම කාලපරිච්ඡේදවලට අදාළ වේ.

(ඇ) හඳුනාගැනීමෙන් බැහැර කිරීම
කිසියම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් එහි භාවිතයෙන් ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇති නොවන විට හෝ එය මූල්‍ය ප්‍රකාශන වලදී හඳුනාග ැනීමෙන් බැහැර කරනු ලැබේ. යම් වත්කමක් එසේ බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (බැහැර කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

අතර වෙනස ලෙස ගණනය කළ) අදාළ වත්කම බැහැර කරනු ලබන වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා ඇතිවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාවීම සහ එවැනි වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කල හැකි නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගනු ලැබේ. ඒ අනුව සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැය මත මෙම වත්කම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන් කරගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්පත්කර ගැනීමේ හෝ සැකසීමේ පිරිවැය වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, එය සරල රේඛීය පදනම මත වසර 05 කට නොවැඩි කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තා කරන දිනට විමර්ශනයට ලක් කරනු ලබයි. මෙම වත්කමේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බව යම් අවස්ථානුකූල සිදුවීම් සහ වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් හානිකරණය සඳහා එම වත්කමේ ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ.

### 2.4.5 කල්බදු

කොන්ත්‍රාත්තුවක් ආරම්භ කිරීමේදී, එය කල්බදු වේද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් ඇගයුමට ලක් කෙරේ. කොන්ත්‍රාත්තුව මගින් හිලව් කිරීමකට හුවමාරු වශයෙන් කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේ නම්, එම කොන්ත්‍රාත්තුව කල්බදු හෝ එහි කල්බදු ඇතුළත් වේ. කිසියම් කොන්ත්‍රාත්තුවක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේද යන්න ඇගයුමට ලක් කිරීමේදී සමූහය මගින් පහත දැක්වෙන කරුණු සලකා බලනු ලබයි.

- කොන්ත්‍රාත්තුව තුළ හඳුනාගත් වත්කමක් පවතීද යන්න - මෙය පැහැදිලිව හෝ වක්‍රව විශේෂ කොට දැක්විය යුතු වන අතර, එහිදී අදාළ වත්කම භෞතිකව අනන්‍ය ස්වභාවයෙන් යුතු වීම හෝ එහි සම්පූර්ණ ධාරිතාව ප්‍රමාණවත් අයුරින් නියෝජනය විය යුතු වීම අවශ්‍ය වේ. සැපයුම්කරුට සැලකිය යුතු ආදේශක අයිතියක් තිබේ නම්, වත්කම හඳුනා ගනු නොලැබේ.
- භාවිතා කරනු ලබන කාල පරිච්ඡේදය පුරා අදාළ වත්කම භාවිතයෙන් සියළුම ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණවත් ආකාරයෙන් ලබාගැනීමේ හිමිකම, සමූහය සතු වේද යන්න සහ;
- වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේද යන්න. අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳ වෙනස් කිරීමට වඩාත්ම අදාළව තීරණ ගැනීමේ අයිතිය පවතින විටකදී මෙම හිමිකම සමූහය සතු වේ. වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳව තීරණය පූර්ව නිශ්චිත වූ දුර්ලභ අවස්ථාවන්හිදී, පහත සඳහන් තත්ව යටතේ වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේ:
  - » වත්කම මෙහෙයවීමේ හිමිකම සමූහය සතු වේ නම්; හෝ
  - » සමූහය මගින් අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පූර්ව නිශ්චය කළ හැකි ආකාරයෙන් සකසා ඇති නම්.

ආරම්භයේදී හෝ කල්බදු සංරචකයක් සහිත කොන්ත්‍රාත්තුවක නැවත තක්සේරුවකදී, සමූහය විසින් එක් එක් කල්බදු සංරචකය සඳහා එහි අදාළ සාපේක්ෂ - තනි අගයන්වල පදනම මත කොන්ත්‍රාත්තුවල ප්‍රතිෂ්ඨාව වෙන් කරනු ලැබේ.

කෙසේවුවද, එය බදුකරු වන ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ කල්බදු වලදී, සමූහය මගින් කල්බදු නොවන සංරචකයන් වෙන් කිරීමට අදහස් නොකරන අතර කල්බදු සහ කල්බදු නොවන සංරචකයන් තනි කල්බදු සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ.

#### *2.4.5.1 භාවිත හිමිකම් වත්කම් (ROU)*

සමූහය මගින් කල්බදු ඇරඹෙන දිනයේදී භාවිත හිමිකම් වත්කමක් සහ කල්බදු වගකීම හඳුනාගනී. භාවිත හිමිකම් වත්කම මූලිකව පිරිවැයට ගණනය කෙරෙන අතර, එය ලද කවර හෝ කල්බදු දීමනා අඩු කොට, ආරම්භක දිනයේදී හෝ එයට පෙර සිදුකරන ලද කවර හෝ කල්බදු ගෙවීම් වෙත ගලපන ලද වගකීමෙහි මූලික වටිනාකම සහ දරන ලද කවර හෝ මූලික සෘජු පිරිවැයක් සහ පාදක වන වත්කම ඉවත් කිරීමට හෝ ගලවා දැමීමට හෝ පාදක වන වත්කම හෝ අදාළ වත්කම පිහිටා ඇති පරිශ්‍රය ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධ පිරිවැය ආශ්‍රිත ඇස්තමේන්තුවකින් සමන්විත වේ.

#### (අ) ගුවන්යානා සහ අමතර එන්ජින් කල්බදු ගැනීම

සමාගම මගින් සිය යානා සමූහය සඳහා ගුවන්යානා සහ එන්ජින් කල්බදු ගැනීම සිදුකරයි. ගුවන්යානා සහ එන්ජින් කල්බදු වල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 4 සිට 12 දක්වා වේ.

ගුවන්යානා කල්බදුවල ගුවන්යානාවේ ආපසු ලබාදෙන තත්වය සඳහා වෙන්කිරීමක් ඇතුළත් වේ; එය වගකීම නිර්මාණය කරනු ලබන අවස්ථාවේදී, භාවිත කරන වත්කම ROU වෙත කල්බදු ආශ්‍රිත නීතිරීති හා කොන්දේසි මගින් ඉල්ලා සිටින පරිදි පාදක වන වත්කම යථා තත්වයට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා බදුකරු විසින් දරනු ලබන පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුවකි. සෙසු ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානා බරපතල නඩත්තු, එන්ජින් අළුත්වැඩියා සහ ගියර් අළුත්වැඩියා හැර) දරන ලද පදනමක් මත සිදුකෙරෙන අතර, අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන අංක 2.4.15. හි දක්වා ඇත.

කල්බදු ඇරඹුමේදී තැන්පතු ගෙවීම සහ සෙසු කල්බදු ගෙවීම් සියල්ල එකම ගනුදෙනුවකින් ආරම්භ වේ. එමනිසා, ප්‍රවර්තන වටිනාකම සහ ආරම්භයේදී ගෙවනු ලබන මූලික මුදල අතර වෙනස බදුකරු විසින් ගෙවිය යුතු අමතර මුදලක් වශයෙන් සැළකේ.

තැන්පතුව SLFRS 9 හි විෂය පථය තුළ පවතින අතර මූලික සාධාරණ අගයට ගිණුම්ගත කළයුතු වන අතර මූලික මුදල හා තැන්පතුව අතර අතිරික්තය එහි සාධාරණ අගය මත SLFRS 16 - කල්බදු හි විෂය පථයට ඇතුළත් වේ. තැන්පතු සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන 2.4.9. හි දැක්වේ.

මාස 12 ක් ඇතුළත අවසන් වන කල්බදු කාලසීමාවන් සහිත ගුවන්යානාවන්හි කල්බදු සැළකිල්ලට නොගැනුණු අතර, ඒවා කෙටි කාලීන කල්බදු ආකාරයෙන්ම ගිණුම්ගත කොට ලාභ අලාභ ප්‍රකාශයෙහි කල්බදු ගුවන්යානා මත කුලිය යටතේ ඇතුළත් කොට අනාවරණය කර ඇත.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි ආශ්‍රිත කල්බදු
සමූහය මගින් ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි ඉඩම් සහ ගොඩනැගිලි කල්බදු පදනමට ගනු ලැබේ. ඉඩම් සහ ගොඩනැගිලි කල්බදු වල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 2 සිට 8 දක්වා වේ. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ඇතැම් කල්බදුවල, අවලංගු කළ නොහැකි ගිවිසුම් කාලසීමාව අවසන් වීමට පෙරාතුව සමූහයට සිදුකල හැකි කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් වේ. අදාළ අවස්ථාවන්හිදී, සමූහය මගින් මෙහෙයුම් නම්‍යශීලීත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව නව කල්බදු ගිවිසුම් තුළ කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. පවතින කාලසීමා දිගු කිරීම් වරණයන් භාවිත කළ හැකි වන්නේ සමූහයට පමණක් වන අතර බදු හිමියන්ට නොවේ.

සමූහය මගින් කල්බදු ආරම්භයේදී කාලසීමා දිගු කිරීමේ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ ඇගයීමක් සිදු කෙරේ. සැලකියයුතු සිදුවීමක් හෝ තත්ව වල සැලකිය යුතු වෙනසක් සිය පාලනය තුළ පවතී නම්, අදාළ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳව සමූහය මගින් ප්‍රතිඇගයුමක් සිදු කරනු ලැබේ.

(ඇ) රථවාහන ආශ්‍රිත කල්බදු
සමූහය මගින් වසර 2 සිට 5 දක්වා කාලසීමා යටතේ රථවාහන කල්බදු පදනමට ලබා ගැනේ.

(ඈ) තොරතුරු තාක්ෂණ සහ වෙනත් උපකරණ ආශ්‍රිත කල්බදු
සමූහය මගින් වසර එකේ සිට තුන දක්වා කොන්ත්‍රාත් කොන්දේසි සහිතව තොරතුරු තාක්ෂණ උපකරණ සහ සෙසු යන්ත්‍ර කල්බදු පදනමට ලබාගැනේ. මෙම කල්බදු කෙටි කාලීන වන සහ/හෝ අඩු වටිනාකමකින් යුතු කල්බදු අයිතම වේ. සමාගම මගින් මෙම කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් සහ කල්බදු වගකීම් හඳුනානොගැනීමට තීරණය කෙරිණි. අදාළ කල්බදු ගෙවීම් ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කර ඇත.

**භාවිත හිමිකම් වත්කම් ක්ෂයවීම**
භාවිතා කරන වත්කම් සරල රේඛීය ක්‍රමවේදයට අනුව පසුව ක්ෂය කෙරෙනුයේ ආරම්භක දිනයේ සිට භාවිත හිමිකම් වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය අවසන් වීම හෝ කල්බදු කාලසීමාව අවසන් වීම යන දෙකෙන් වඩාත් කලින් එළඹෙන දිනය දක්වාය. භාවිත හිමිකම් වත්කම්වල ඵලදායී ජීව කාලය නිර්ණය කිරීමේදී දේපල හා උපකරණ සම්බන්ධයෙන් යොදාගත් පදනම භාවිත කෙරේ. ඊට අමතරව, භාවිත හිමිකම් වත්කම් සම්බන්ධ හානිකරණ අලාභයන් වෙතොත් ඒ සඳහා අඩු කෙරෙන අතර, කල්බදු වගකීමෙහි ඇතැම් ප්‍රතිමිනුම්ගත කිරීම් සඳහා ගලපනු ලැබේ.

*2.4.5.2 කල්බදු වගකීම*
කල්බදු වගකීම මූලිකව ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම් වල ප්‍රවර්තන වටිනාකමට ගණනය කෙරෙන අතර, කල්බදුවල පැහැදිලි පොලී අනුපාතය භාවිත කරමින් හෝ එම අගය නිසි පරිදි නිර්ණය කළ නොහැකි වේ නම්, සමූහයේ වර්ධනීය ණය ලබාගැනීමේ අනුපාතය යොදා ගනිමින් වට්ටම් කෙරේ. සාමාන්‍යයෙන් සමූහය එහි වර්ධක ණය ගැනීම් අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිත කරනු ලබයි.

කල්බදු වගකීම් ගණනය කිරීමේදී ඇතුළත් කරන ලද කල්බදු ගෙවීම් පහත දැක්වේ.

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම්ද ඇතුළු ස්ථාවර ගෙවීම්;
- ආරම්භක දිනයේදී අදාළ දර්ශකය හෝ අනුපාතය යොදාගනිමින් ගණනය කරන ලද, දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්; සහ
- ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොටගත් මිළ, කාලසීමා දිගු කිරීමේ වරණයක් ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට ගත්තේ නම් වෛකල්පිත නැවත අලුත්කිරීමේ කාලසීමාවක කල්බදු ගෙවීම්, සහ කලින් අවසන් කිරීමට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට නොගත්තේ නැතිනම් කල්බදු ගිවිසුමක් කලින් අවසන් කිරීම සඳහා වන දඩ මුදල්

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කෙරේ. කිසියම් දර්ශකයක හෝ අනුපාතයක වෙනස්වීමක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් උද්ගත වන විටකදී, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවියයුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය සම්බන්ධ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් පවතින විටකදී, හෝ සමූහය මගින් මිලදී ගැනීමක්, කාලසීමා දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ වරණයක් තෝරාගන්නේද යන්න පිළිබඳ ස්වකීය ඇගයුම වෙනස් කරන ලද විටකදී එය ප්‍රතිගණනය කෙරේ.

මේ අයුරින් කල්බදු වගකීම ගණනය කල විටකදී, භාවිත හිමිකම් වත්කමෙහි ධාරණ අගය වෙත අනුරූපී ගැලපුමක් සිදු කරනු ලබන අතර, භාවිත හිමිකම් වත්කමෙහි ධාරණ අගය ශූන්‍ය දක්වා පහත වැටී ඇත්නම් එය ලාභ අලාභ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ.

*2.4.5.3 කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු*
තොරතුරු තාක්ෂණ උපකරණ ඇතුළු මාස 12ට අඩු කල්බදු කාලසීමාවන් සහිත කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හෝ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට සමූහය තීරණය කරන ලදී. සමූහය මගින් මෙකී කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

*2.4.5.4 කෝවිඩ්-19 ට අදාළ බදු කුලී සහන*
කෝවිඩ්-19 අදාළ බදු කුලී සහන - IFRS 16 සඳහා සංශෝධන සමූහය විසින් යොදා ගන්නා ලදී. කෝවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයන් නොවන කල්බදු වෙනස් කිරීම්වල සුදුසුකම්ලත් බදු සහන පිළිබඳ තක්සේරු නොකිරීමට ඉඩ සලසන ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන්, සමූහය යොදා ගනු ලබයි. සමාන අවස්ථාවන්හි සමාන ලක්ෂණ ඇති ගිවිසුම් සඳහා සමූහය ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් අඛණ්ඩව යොදාගෙන ඇත. සමූහය විසින් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් නොයෙදීමට තෝරා ගනු ලබන හෝ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් සඳහා සුදුසුකම් නොලබන කල්බදුවල සහනයන්ට කල්බදු නව්‍යකරණයකට යොමු විය හැකි දැයි තක්සේරු කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 2.4.6 තොග

ගුවන් යානා හා ගුවන් පර්යන්ත සේවා ආශ්‍රිත තොග, අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ.

තොග වාර්තා කරනුයේ පිරිවැය අගය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යන දෙකෙන් අඩු අගය මතය. තොගවල පිරිවැය යනු සියලු ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ එම තොග වර්තමාන තත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්ය.

තොග වල පිරිවැය ගණනය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනේ. සියලුම ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකුණුමක් සිදුකිරීම සඳහා අවශ්‍යවන්නා වූ පිරිවැය අඩුකරන ලද ඇස්තමේන්තුගත විකුණුම් මිල ශුද්ධ උපලබ්ධි අගය නියෝජනය කරයි.

### 2.4.7 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

කිසියම් වත්කමක් හානිකරණය වූ බවට පෙන්නුම් කිරීමක් ඇත්දැයි පරීක්‍ෂා කිරීමට සමූහය විසින් එක් එක් වාර්තා කරන දිනට තක්සේරුවක් සිදුකරයි. එබඳු යම් පෙන්නුම් කිරීමක් වුවහොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්‍ෂණයක් අවශ්‍ය වන විට හෝ වත්කමෙහි ආපසු අයකරගත මුදල පිළිබඳව සමූහය විසින් තක්සේරුවක් සිදුකෙරේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගයෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණයට පත්ව ඇතැයි සලකන අතර එය ආපසු අයකරගත හැකි අගය දක්වා කපා හැරේ.

කෝවිඩ් 19 වසංගතය පැතිරීමෙන් අනතුරුව, සමූහය මගින් වාර්තාකරණ දිනය වන විට මූල්‍යමය නොවන වත්කම් වල (භාවිත හිමිකම් වත්කම්ද ඇතුළුව) කවර හෝ ප්‍රමාණාත්මක හානිකරණයක් පවතීද යන්න සළකා බැලීම සඳහා විශ්ලේෂණයක් සිදු කරන ලදී. අදාළ විශ්ලේෂණය මත පදනම්ව, 2021 මාර්තු 31 දිනට කිසිදු හානිකරණයක් හඳුනා නොගැනුණි.

### 2.4.8 සාධාරණ අගයට ගණනය කිරීම

සමූහය විසින් ඉඩම් හා ගොඩනැගිලි, සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය මත ගණනය කරයි. සාධාරණ අගය ආශ්‍රිත අනාවරණය කිරීම සටහන 04 හි සිදුකර ඇත.

සාධාරණ අගය යනු එය ගණනය කරනු ලබන දිනකදී වෙළෙඳපොළේ සහභාගීවන්නන් අතර විධිමත් ගණුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීමේ පදනම වනුයේ යම් වත්කමක් විකිණීම හෝ යම් වගකීමක් පැවරීම:

- වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළෙඳපොළේදී හෝ
- මූලික වෙළෙඳපොළක් නොමැති විට, වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසි සහගතම වෙළෙඳපොළේදී

සමූහයට මූලික වෙළෙඳපොළ හෝ වඩාත් වාසි සහගතම වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සළසා ගත හැකි විය යුතු බවයි.

එබඳු වත්කම්වල සාධාරණ අගය ගණනය කරනුයේ, වෙළෙඳපොළ සහභාගිවන්නන් අදාළ වත්කම හෝ වගකීම මිල කිරීමේදී සිය ප්‍රශස්ත ආර්ථික අපේක්ෂාවන් ඔස්සේ ක්‍රියා කරනු ඇතැයි උපකල්පනය කරමිනි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීම, වත්කම එහි ඉහළම සහ හොඳම භාවිතය හෝ වත්කම එහි ඉහළම හෝ හොඳම භාවිතය සඳහා යොදා ගන්නා වෙනත් වෙළඳපොළ සහභාගීවන්නෙකුට විකිණීමෙන්, ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමෙන් වෙළඳපොළ සහභාගීවන්නන්ගේ හැකියාව සැලකිල්ලට ගනී.

අදාළ තත්වයට ගැලපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය භාවිත කරයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිනුම්කරණයේදී වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව සාධාරණ අගය මනිනු ලබන සියලු වත්කම් සාධාරණ අගය ආශ්‍රිත ධුරාවලිය තුළ පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කෙරේ.

- 01 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපොලේ ලැයිස්තුගත මිල ගණන් (නොගළපන ලද).
- 02 වන මට්ටම - සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම
- 03 වන මට්ටම - නිරීක්‍ෂණය කළ නොහැකි සාධාරණ අගයට මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනෙන වත්කම් සහ වගකීම් සඳහා එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේද අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරුවක් (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) මගින් ධුරාවලියෙහි මට්ටම අතර මාරුවීම් සිදුවී ඇත්ද යන්න සමූහය තීරණය කරනු ලබයි.

දේපළ, පිරියත සහ උපකරණ වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ. බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේ නිර්ණායකවල වෙළෙඳපොළ දැනුම, කීර්තිනාමය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව කටයුතු ඉටු කරන්නේද යන දෑ ඇතුලත් වේ. බාහිර තක්සේරුකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගන්නේද යන්න පිළිඳව සමූහය මගින් තීරණය කරනු ලැබේ.

සාධාරණ අගය අනාවරණය කිරීමේ අරමුණ සඳහා, වත්කමට හෝ වගකීමට අදාළ ස්වභාවය, ගති ලක්‍ෂණ සහ අවදානම් මෙන්ම ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය පිළිබඳ ධුරාවලියේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් සහ වගකීම්වල කාණ්ඩය තීරණය කරනු ලැබේ.

### 2.4.9 මූල්‍ය උපකරණ

#### *2.4.9.1 මූල්‍ය වත්කම්*

**මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම**

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) වශයෙන් වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද වත්කම් ඇතුළුව) මුලින් හඳුනාගනු ලබන්නේ සමූහය උපකරණයේ ගිවිසුම්ගත

විධිවිධානවල පාර්ශවකරුවෙකු සමග වෙළඳාම සිදුවන දිනයේදීය.

මූල්‍ය වත්කමක් මුලින් ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් නොමැති අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
මූල්‍ය වත්කම් වර්ගීකරණය සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය වත්කමක් කළමනාකරණය කරනු ලබන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මතය.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම FVTPL වශයෙන් නම් කර නොමැති නම් එය ක්‍රමක්ෂය පිරිවැයකින් ගණනය කරනු ලැබේ:

- වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති අතර, එහි අරමුණ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය මුල් ගෙවීම සහ හිඟ මුදලෙහි පොලී මත පමණක් සිදු වේ.

වෙළඳාම සඳහා නොපවතින කොටස් ආයෝජනයක් මුලින් පිළිගැනීමෙන් පසු, ධනෂ සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමූහය ආපසු හැරවිය නොහැකි ලෙස තෝරා ගත හැකිය. උපකරණයක් - උපකරණයක් පාසා මෙම තෝරාගැනීම සිදු කරනු ලබයි.

වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ ගුවන් යානා නඩත්තු සංචිතය, ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා තැන්පතු, ආයෝජන, මුදල් සහ බැංකු මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය මත ගණනය කරනු ලැබේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට සමූහය මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි, නැතහොත් ගනුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරන අතර එමගින් සැලකිය යුතු ලෙස මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර එය මූල්‍ය වත්කම්වල පාලනයේ රඳවා නොගනී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය සහ අගයේ වෙනස (හෝ හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වත්කම් කොටසට අදාළ ධාරණ අගය) සහ:

(i) ලද ප්‍රතිශ්ඨාව (අත් කරගත් නව වත්කම් වලින් අඩු කළ ඕනෑම උපකල්පිත නව වගකීම් ඇතුළත්ව) සහ
(ii) වෙනත් විස්තීර්ණ ආදායම් වලින් හඳුනාගෙන ඇති කවර හෝ සමුච්චිත ලාභ හෝ අලාභ යන ඒවායේ එකතුව ලාභ සහ අලාභ වල හඳුනාගෙන ඇත.

**මූල්‍ය වත්කම් හානිකරණය**
ක්‍රමක්ෂය පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් ගණනය කරනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් සමූහය විසින් හඳුනාගනු ලැබේ.

සියළුම වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ සඳහා ජීවිත කාලය පුරාම අපේක්ෂිත අලාභ දීමනාවක් භාවිතා කරන අපේක්ෂිත ණය පාඩු ගණනය සඳහා සමූහය මගින් සරල ප්‍රවේශයක් භාවිතා කරනු ලැබේ.

සමූහය විසින් මූල්‍ය උපකරණයක අපේක්ෂිත ණය අලාභ මැන බලන්නේ පහත සඳහන් කරුණු නිරූපනය වන අයුරිනි.

ඇ) සම්භාවිතාවක් සහිත ප්‍රතිඵල පරාසයක් ඇගයීමෙන් තීරණය කරනු ලබන අපක්ෂපාතී සහ සම්භාවිතාව මත බර තැබූ අගයක්
ආ) මුදල්වල කාල වටිනාකම; සහ
ඇ) අතීත සිදුවීම්, වර්තමාන තත්වයන් සහ අනාගත ආර්ථික තත්වයන්ගේ පුරෝකථනයන් පිළිබඳ වාර්තා කිරීමේ දිනයේදී අයුතු පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව ලබා ගත හැකි සාධාරණ සහ සහාය විය හැකි තොරතුරු

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනා රැගෙන යන දළ වත්කම් ප්‍රමාණයේ ධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

ගෝලීය ආර්ථිකය වෙත කෝවිඩ් 19 හි බලපෑම හමුවේ රජයන්, ව්‍යාපාරයන් සහ පාර්භෝගිකයින් ඒ සඳහා ප්‍රතිචාර දක්වන ආකාරය අවිනිශ්චිත වේ. කළමනාකරණ තීන්දු සහ ඇස්තමේන්තු ගණනාවකට යටත්ව සිය ණය කළඹ තුළින් අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීමේදී මෙම අවිනිශ්චිතතාව පිළිබිඹු වේ.

මෙම විනිශ්චයන් සහ ආශ්‍රිත උපකල්පනයන් කෝවිඩ් 19 හි බලපෑම් සන්දර්භය තුළ සිදුකරන ලද අතර, ඒවා මගින් පවතින තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි අනාගත සිදුවීම් සම්බන්ධ අපේක්ෂාවන්ද ඇතුළුව අදාළ යැයි සැළකෙන ඓතිහාසික අත්දැකීම් සහ සෙසු සාධක පිළිබිඹු වේ.

*2.4.9.2 මූල්‍ය වගකීම්*

**මූලික හඳුනාගැනීම සහ ගණනය**
සියලුම මූල්‍ය වගකීම් (ලාභයෙන් හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමින් නියම කර ඇති වගකීම් ඇතුළුව) මුලින් හඳුනාගනු ලබන්නේ වෙළඳ දිනයේදී සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානයන්හි පාර්ශවකරුවෙකු වන විටය.

වගකීම අත්පත් කර ගත් අරමුණ මත පදනම්ව සමාගම සිය මූල්‍ය වගකීම් පහත කාණ්ඩ දෙකෙන් එකකට වර්ග කරයි; ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) හෝ වෙනත් මූල්‍ය වගකීම් එම කාණ්ඩ දෙක වේ.

මූල්‍ය වගකීමක් පළමුව ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති භාණ්ඩයක් සඳහා, එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
සමූහයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද පොලී දරන ණය සහ ණය ගැනීම්, ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීමේ පිරිවැය, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පවතී.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මූලික පිළිගැනීමෙන් අනතුරුව, මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මනිනු ලැබේ.

මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වගකීම ගණනය කරනු ලබන ප්‍රමාණයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර හඳුනාගත් ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ඇති කිසියම් වෙනසක් සඳහා සඵල පොලී අනුපාතික ක්‍රමයක් භාවිතා කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩු කර ඉන් හානිකරණය අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
වගකීම් යටතේ ඇති බැඳීම මුදා හැරීමේදී හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

එකම ණය දෙන්නාගෙන් පවත්නා මූල්‍ය වගකීමක් වෙනත් වගකීමක් විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා ගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

*2.4.9.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම*
මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව්කර, ශුද්ධ අගය මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගනුයේ:

- හඳුනාගත් මුදල් පියවා ගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නීතිමය හිමිකමක් පවතී නම් සහ
- ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කර වගකීම් එකවර පියවා ගැනීමට අභිලාෂයක් පවතී නම් පමණි.

*2.4.9.4 මුදල් ප්‍රවාහ සුරැකුම් (Hedge) සංචිතය*
විදේශ විනිමය අනුපාත තුළ සිදුවන උච්චාවචන හේතුවෙන්, සමාගම හඳුනාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය අගයන් වෙනස්වීමෙහි අවදානම හරහා සුරැකුම් සිදු කළද, හඳුනාගන්නා ලද ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණයන්, ඉහළ සම්භාවිතාවක් සහිතව විශේෂයෙන් හඳුනාගත් ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ආශ්‍රිතව ඉපැයුම් අනාගත ආදායම් වලට එරෙහිව සුරැකුම් උපකරණයක් ලෙස සමාගම විසින් නම් කරනු ලබයි.

සුරැකුම් උපකරණය මත සිදුවන ලාභය හෝ අලාභයේ ඵලදායී කොටස් අයත් වෙනත් විස්තීර්ණ ආදායමෙහි මුදල් ප්‍රවාහ සුරක්ෂාකරණ සංචිතයෙහි සෘජුවම හඳුනා ගැනෙන අතර, යම් ඵලදායී නොවන කොටසක් වෙතොත් එය වෙනත් මෙහෙයුම් ලෙස ලාභ අලාභ ප්‍රකාශය තුල හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනාගත් අගයන් මුදල් ප්‍රවාහ සුරැකුම් ගනුදෙනුව සිදුවන විට (පුරෝකථනය කරන ලද ආදායම උපලබ්ධි වන විට) ලාභ අලාභ ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

පුරෝකථනය කරන ලද ගනුදෙනුව සිදුවනු ඇතැයි තවදුරටත් අපේක්ෂා නොකරන්නේ නම්, වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් සමුච්චිත ලාභය හෝ අලාභය/ ලාභ අලාභ ප්‍රකාශය වෙත මාරු කරයි. සුරැකුම් උපකරණ කල්ඉකුත් වුවහොත් හෝ විකුණනු ලැබුවහොත් හෝ අවසන් කළහොත් හෝ ප්‍රතිසම්පාදනයකින් හෝ නැවත දීර්ඝ කිරීමකින් තොරව ක්‍රියාත්මක කරනු ලැබුවහොත් හෝ අවලංගු කල සුරැකුමක් වශයෙන් නම්කරයි නම්, වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් යම් සමුච්චිත ලාභ හෝ අලාභ අදාළ සුරැකුම් ගිවිසුමට අනුව පුරෝකථනය කරන ලද ගනුදෙනුව සිදුවන තෙක් හිමිකම තුළ රඳවා ගනී.

කෝවිඩ්-19 හි බලපෑම මත අඩාල වූ මෙහෙයුම් හේතුවෙන් විදේශ මුදල්වලින් ලැබෙන අනාගත ආදායම සහ ප්‍රතිසැකසුම් සිදුකරන ලද විදේශ විනිමය ණය යන කරුණු දෙක කෙරෙහි බලපෑ අතර ඒ අනුව සුරැකුමෙහි බලාත්මක නොවන කොටස ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබ ඇත.

### 2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය
මෙහෙයුම් කල්බදු ගිවිසුම් අනුව ගුවන් යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි අළුත්වැඩියාවන් සඳහා මාසික පදනමක් මත කල්බදුහිමිකරුවන් වෙත කරනු ලබන ගෙවීම් වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග අළුත්වැඩියා සඳහා දරන ලද වියදම (මෙතෙක් සංචිතයට ගෙවූ ප්‍රමාණයන් දක්වා) අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අය කර ගනී.

එහි ස්වභාවය මත පදනම්ව ගුවන්යානා නඩත්තු සංචිතය ණය සහ ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, මෙම මූල්‍යමය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1. හි දැක්වේ.

### 2.4.11 වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ
තැන්පතු සහ වෙනත් ණය ගැතියන් ඇතුලත් වෙළෙඳ ණයගැතියන් (පිරිවැයට ගණනය කොට ඇති තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් හැර) වර්ගීකරණය කර ගිණුම්ගත කෙරෙනුයේ ණය සහ ලැබිය යුතු දෑ වශයෙනි. එහි ස්වභාවය මත පදනම්ව මෙම මූල්‍යමය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1 (අ) හි දැක්වේ.

### 2.4.12 ආයෝජන

**පරිපාලිත සමාගමෙහි ආයෝජන**
සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ පරිපාලිත සමාගම ආශ්‍රිතව සිදුකෙරෙන ආයෝජන තාවකාලිකව අගය අවප්‍රමාණ වීම් නොවන හානිකරණයන් ගැලපීමෙන් අනතුරුව ශුද්ධ පිරිවැයට ගිණුම්ගත කරනු ලැබ ඇත.

### 2.4.13 කෙටි කාලීන ආයෝජන
මාස තුනට වැඩි කල්පිරීමක් සහිත බැංකුවල පවතින ස්ථාවර වත්කම් කෙටි කාලීන ආයෝජන වේ. ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය මත කෙටි කාලීන ආයෝජන ගණනය කරනු ලැබේ.

### 2.4.14 මුදල් සහ මුදල්වලට සමාන දෑ
මුදල් සහ මුදල්වලට සමාන දෑ, බැංකුවේ සහ අතේ ඇති මුදල් ලෙස අර්ථ දැක්වෙන අතර, කැඳවීම් තැන්පතු සහ කෙටි කාලීන අධි ද්‍රවශීල ආයෝජන පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණයට පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ සුළු වෙනස් වීමේ අවදානමකට යටත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් සහ මුදල් සමාන දෑ වලට බැංකුවේ සහ අතැති මුදල් ද, ශුද්ධ ගෙවීමට ඇති බැංකු අයිරා, කැඳවීම් තැන්පතු ද ඇතුළත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත අයෝජනද (එනම් අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක

කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කරනු ලබන්නේ මූල්‍ය තත්වය ප්‍රකාශනය තුල පොලී දරන වගකීම් යටතේය.

### 2.4.15 වෙන්කිරීම්

**(i) සාමාන්‍ය තොරතුරු**

වෙන්කිරීම් හඳුනාගැනෙනුයේ කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය සතුව කිසියම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදී, එය බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභවල අන්තර්ගත යම් සම්පත් ගලායෑමක් අවශ්‍ය වන සහ එකී බැඳීමේ වටිනාකම මත විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදුකල හැකි විටය. සමහර වෙන්කිරීම් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කල යුතු යැයි සමූහය අපේක්ෂා කරන්නේ නම්, වෙනම වත්කමක් ලෙස එකී ප්‍රතිපූර්ණය හඳුනා ගැනෙනමුත්, එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත වූ විට පමණි. ප්‍රතිපූර්ණයන්ට ශුද්ධව මොනයම් හෝ වෙන්කිරීමක් ඇතොත්, අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ ඉදිරිපත් කරනු ලැබේ.

**(ii) ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම්**

ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානා වල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් 2.3. (ආ) (iv) හි සඳහන් කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත. "පැය ගණනට අනුව කාර්යක්ෂමතාව" තෙවන පාර්ශව නඩත්තු ගිවිසුම් මඟින් ආවරණය කල එන්ජින් අළුත්වැඩියා පිරිවැයන් සඳහා අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයට පත් ස්ථිර මිළ ප්‍රමාණයන් අනුව පිරිවැය, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ලියා හරියි.

### 2.4.16 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම**

පාරිතෝෂිකය යනු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මකි; අදාළ පනත අනුව සමාගම සහ එහි පරිපාලිත ආයතනය ගෙවීමට බැඳී සිටී. අදාළ නීතී මත පදනම්ව ඇස්තමේන්තු කර ඇති විදේශීය මධ්‍යස්ථාන හැරුණු විට සෑම වසරකම ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් පනතේ උපදෙස් අනුව, සමූහය විසින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන වටිනාකම ගණනය කරනු ලබයි.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම මගින් ඇතිවන ආයුගණක ලාභ/අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගන්නා අතර නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වලට අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ සමූහය විසින් හඳුනාගනු ලබයි.

පාරිතෝෂික වගකීම්, බාහිර වත්කම්වල ආයෝජනය කරනු නොලබයි. මෙම අයිතමය මූල්‍ය තත්ව ප්‍රකාශයේ "වෙනත් දිගු කාලීන වගකීම්" යටතේ දක්වයි. එතෙර රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි සත්කාරක රටවලට අදාළ සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම යටතේය.

**(ආ) නිර්වචනය කර ඇති දායකත්ව සැලැසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිභාර අරමුදල**

ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු සේවා නියුක්තිකයන් අදාළ අණපනත් සහ රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක සහ සේවා නියුක්තිභාර අරමුදලේ දායකත්වයන්ට සුදුසුකම් ලබා සිටී. සමාගම විසින් සේවක දළ සංවේතන ප්‍රමාණයෙන් 15% ක් සහ 3% ක ප්‍රමාණයක්ද, පරිපාලිත සමාගම විසින් 12% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලටද දායක කරනු ලැබේ.

### 2.4.17 'Frequent Flyer' වැඩසටහන

වැඩසටහනේ සාමාජිකයින්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදානය කරනු ලබන 'FlySmiLes' යන frequent flyer වැඩසටහන සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම 'frequent flyer' වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මගී ආදායමෙන් කොටසක් උපයෝජනයට ගනු ලබන තෙක් විලම්භනය කර තබයි. ආදායම කල් දැමීම තක්සේරු කරනු ලබන්නේ නිදහස් කරගැනීමේ ඓතිහාසික ප්‍රවණතාවයන් මත පදනම්ව වන අතර, පසුව එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකතනය කිරීම පිණිස යොදා ගෙන ඇත. ප්‍රදානය කරනු ලබන බැරවල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කරගත හැකි සේවාවල බර තැබූ සාමාන්‍ය අගය සලකමිනි. මෙම ඇස්තමේන්තු එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ වගකීම් ඒ අනුව ගලපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා භාවිතය හරහා උපචිතවන්නා වූ සහ සහභාගී හවුල්කරුවන් විසින් ගෙවනු ලබන්නා වූ සැතපුම් ප්‍රමාණයන්ද, ඒවා භාවිතා කරන තෙක් විලම්භිත ආදායම ලෙස ගණනය කරයි. කල් ඉකුත්වීම අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා වූ වගකීම හඳුනා නොගැනේ.

### 2.4.18 ආදායම් හඳුනාගැනීම

ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම, සමූහය විසින් පියවර පහක ආකෘතියක් පදනම් කරගනිමින් හඳුනාගනී.

ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩ හෝ සේවාවක් පාරිභෝගිකයෙක් වෙත මාරු කිරීම සඳහා යම් ආයතනයක් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිශ්ඨාව පිළිබිඹු වන වටිනාකම අනුවය.

**(අ) ගුවන් සේවාවේ ආදායම**

ආදායම ප්‍රධාන වශයෙන් උත්පාදනය වනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන්මළු සහ තැපැල් ප්‍රවාහන, ගුවන්තොටුපල පර්යන්ත සේවා, ඉංජිනේරු සේවා, ගුවන්යානා කුලී පදනම මත සැපයීම සහ ආශ්‍රිත සේවා යනාදියෙනි.

(i) මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන් මළු සහ අනෙක් අදාළ ගාස්තු, ප්‍රවාහනය/පහසුකම් සපයාදෙන අවස්ථාවේදී ජනිත වන මෙහෙයුම් ආදායම මගින් හදුනාගනු ලබයි.

(ii) භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ ගුවන් මාර්ග බිල්පත්වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම වගකීම්වල ඇතුලත් කෙරේ. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ මාර්ග බිල්පත් එක් වසරකට පසුව කල්ඉකුත් වී සහ භාවිතයට නොගෙන පවතින්නේ නම් ආදායම වශයෙන් හඳුනාගනේ.

(iii) ගුවන්තොටුපළ පර්යන්ත සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ අදාල සේවා සැපයීමෙන් පසුවය.

(iv) තෙවන පාර්ශව නඩත්තු සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.

(v) ගුවන් ගමන් මෙහෙයුම් සේවා මත උපයන ආදායම හඳුනාගැනෙනුයේ අදාල සේවා සැපයීමෙන් පසුවය.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(ආ) ගුවන් සේවා ආහාරපාන සේවා වලින් ආදායම

**භාණ්ඩ විකිණීම**
හිමිකාරීත්වයට අදාළ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැණුම්කරු වෙත පැවරෙන විට ආදායම හඳුනාගැනේ. අගය එකතු කල විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර ආදායම වෙළඳ වට්ටම් අඩු කිරීමෙන් පසු අගයට තීරණය වේ. හිඟ මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් සහ භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇත්නම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

(ඇ) ලාභාංශ ආදායම
කොටස් හිමියන්ට අදාළ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

(ඈ) කුලී ආදායම
කුලී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

(ඉ) පොලී ආදායම
ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කළ සියළුම මූල්‍ය උපකරණ සඳහා, පොලී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොලී අනුපාතිනය යටතේය.

(ඊ) වෙනත් ආදායම්
වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මතය.

2.4.19 වියදම් හඳුනාගැනීම
වියදම්, නිශ්චිත ආදායම් ආයිතමය ඉපැයුම සහ දරන ලද පිරිවැය අතර සෘජු සම්බන්ධයේ මූලිකාංග මත පදනම්ව ලාභ අලාභ ප්‍රකාශය යටතේ හඳුනා ගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ පිරියත උපකරණ කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා දරණ ලද සියළු වියදම් ලාභ අලාභ ප්‍රකාශයේ දක්වා ඇත. ලාභ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට, “වියදම්වල ස්වාභාවය” නැමැති ක්‍රමය අනුගමනය කර ඇති අතර එය අනුගමනය කර ඇත්තේ සමූහයේ කාර්ය සාධනය සම්බන්ධව අංග සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ පදනම මතය.

2.4.20 ණය ගැනුම් පිරිවැය
අපේක්ෂිත භාවිතයට සහ විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් වැයවන කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් සඳහා සෘජුවම වෙන්කළ හැකි ණය ලබාගැනීමේ පිරිවැය සහ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන ඒවා හැර, අනෙක් ණය ගැනුම් පිරිවැය ඒවා දරන ලබන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනාගැනේ.

2.4.21 ආංශික වාර්තාකරණය
කාණ්ඩයක් යනු සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයක් වන අතර අනෙකුත් අංශවලට වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් සහ ප්‍රතිලාභවලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ නිරත වේ.

සමූහයේ අවදානම සහ ප්‍රතිලාභ අනුපාතය කෙරෙහි සමූහය විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකිරීම යන සාධකය බලපෑම් ඇතිකරන බැවින් එකී මෙහෙයුම් කටයුතුවල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික අංශයන් තීරණය කරනු ලැබේ. විකුණුම් මඟින් සැකසෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම් සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීම මඟිනි. නිශ්චිත කාණ්ඩයකට සෘජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන් කොට හෙළිදරව් නොකෙරේ.

භූගෝලීය අංශ වෙත වත්කම් සහ අදාළ වගකීම් වෙන්කිරීම සඳහා කිසිදු සුදුසු පදනමක් නොපවතින බවට කළමනාකරණය අදහස් කරයි. ඒ අනුව කාණ්ඩමය වත්කම්, කාණ්ඩමය වගකීම් සහ ගෝලීය කාණ්ඩ ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් අනාවරණය කරනු නොලබයි.

ව්‍යාපාර අංශ අනුව දෙවන වාර්තාකරණය, සමූහය විසින් සපයන ලද සේවාව මත රදා පවතී. ගුවන් ප්‍රවාහන කටයුතුවල සහ සිය පරිපාලිත සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු ලෙස සමූහයේ ප්‍රධාන ව්‍යාපාර කාණ්ඩ දෙකක් යටතේ සිදුවෙයි.

***2.5 නව ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කළ නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිති***
2021 අප්‍රේල් 1 දිනෙන් ඇරඹෙන වාර්ෂික කාලවකවානුව සිට බලපැවැත්වෙන නව ප්‍රමිතීන් සහ පෙර අයදුම්පත් සඳහා අවසර ලැබී ඇත. කෙසේවෙතත් සමූහය විසින් නව හෝ සංශෝධිත ප්‍රමිතීන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා නොමැත.

**බැරෑරුම් කොන්ත්‍රාත්- කොන්ත්‍රාත් සඳහා පිරිවැය (LKAS 37 සඳහා සංශෝධන)**
කොන්ත්රාත්තුව බැරෑරුම් දැයි තක්සේරු කිරීමේ අරමුණින් කොන්ත්රාත්තුවක් ඉටු කිරීමේ පිරිවැය තීරණය කිරීම සඳහා ආයතනයකට වැයවන මුදල සංශෝධනවල සඳහන් වේ. මෙම සංශෝධනයන් 2022 අප්‍රේල් 1 දින හෝ ඊට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා අදාළ වේ. මූලික අයදුම්පත් ඉදිරිපත් කළ දිනයේදී, සංශෝධන යෙදීමේ සමුච්චිත බලපෑම රඳවා තබා ගත් ඉපැයීම් හෝ සාධාරණ කොටස්වල අනෙකුත් කොටස් සඳහා ආරම්භක ශේෂ ගැලපීමක් ලෙස පිළිගැනේ. මෙම සංශෝධනය සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි සමූහය අපේක්ෂා නොකරයි.

**පොලී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණ - දෙවන කාණ්ඩය ( SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 iy SLFRS 16 වලට සංශෝධන)**
සංශෝධන මගින් පොලී අනුපාත මිනුම් සලකුණු ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය වාර්තාකරණයට බලපාන ගැටලු, ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි වෙනස්කම් වල බලපෑම් හෝ පොලී අනුපාත මිනුම් සලකුණක්, විකල්ප මිනුම් සලකුණු අනුපාතයක් සමග ආදේශ කිරීමෙන් පැන නගින සම්බන්ධතා වැනි කරුණු ඇතුළත් වේ. පහත දෑට අදාළව සංශෝධනයන් මගින් ප්‍රායෝගික සහනයක් SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 සහ SLFRS 16 හි නිශ්චිත අවශ්‍යතාවන් මගින් ගෙන එනු ලබයි.

- මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් සහ කල්බදු වගකීම්වල ගිවිසි මූල්‍ය ගලනය හඳුනාගැනීමට ව්‍යුහයේ වෙනස්කම්
- සුරැකුම් ගිණුම්කරණය

පොලී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණවලින් පැන නගින අවදානම්වලට ස්ථිතිය පත්වීම සහ අදාළ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ සමූහය විසින් වැඩි තොරතුරු අනාවරණය කිරීම සංශෝධනයන් මගින් අපේක්ෂා කරනු ලබයි. සැලකිය යුතු බලපෑමක් ඇති වීමට සමූහය සංශෝධන සිදු කරනු නොලබයි. 2021 අප්‍රේල් 1 දින හෝ ඊට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාවන්ට මෙම සංශෝධන බලපැවැත්වෙනු ලබයි.

**වෙනත් ප්‍රමිතීන්**
පහත දැක්වෙන නව සහ සංශෝධිත ප්‍රමිතීන්, සමූහයේ මූල්‍ය ප්‍රකාශවල සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ලබයි.

- දේපළ, පිරියත සහ උපකරණ: අපේක්ෂිත භාවිතයට පෙර ආදායම (LKAS 16 හි සංශෝධන)

මෙම සංශෝධනය මගින් කළමනාකරණය කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය අඩු කර ගැනීම තහනම් වන අතර එමගින් එම දේපළ කළමනාකරණය කර අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක වීමට අවශ්‍ය වන පරිදි එම වත්කම එම ස්ථානයට ගෙන ඒමේදී නිෂ්පාදනය කරන ලද අයිතමයන් විකිණීමෙන් ලැබෙන ආදායම අඩු වේ. ඒ වෙනුවට එවැනි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම සහ එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පිරිවැය ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

2022 අප්‍රේල් 1 දින හෝ ඊට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලයට සංශෝධනයන් යොදවනු ලබයි.

- සංකල්පීය ආකෘතිය වෙත විමර්ශනය සඳහා (SLFRS 3 සංශෝධන)

ප්‍රධාන සංශෝධනයන් පහත පරිදි වේ.

- LKAS 37 හෝ IFRIC 21 හි විෂය පථය තුළ ගනුදෙනු සහ වෙනත් සිදුවීම් සඳහා අත්පත් කර ගන්නෙකු විසින් ව්‍යාපාර සංයෝජනයක් තුළ තමා විසින් ගනු ලැබූ වගකීම් හඳුනා ගැනීම සඳහා LKAS 37 හෝ IFRIC 21 (සංකල්ප රාමුව වෙනුවට) යෙදිය යුතු බවට වන අවශ්‍යතාවක් SLFRS 3 ට එකතු කරන්න.
- ප්‍රකාශිත ප්‍රකාශයන් SLFRS 3 හි ඇතුළත් කිරීම අත්කරගනු ලබන්නා ව්‍යාපාර සංකලනයක අත්කරගනු ලබන අසම්භාවයන් හඳුනානොගනී.

2022 වසරේ අප්‍රේල් 1 දිනට හෝ පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ දිනට සංශෝධනයන් යොදාගනු ලැබේ.

- වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය (LKAS 1 සංශෝධනය)

වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ සංශෝධන (LKAS 1 හි සංශෝධන) බලපාන්නේ යම් වත්කමක, වගකීමක, ආදායමක හෝ වියදමක පිළිගත් ප්‍රමාණය හෝ කාලය හෝ ආයතනය විසින් එම අයිතම පිළිබඳ අනාවරණය කරනලද කරුණු නොව මූල්‍ය ප්‍රකාශයේ වගකීම් ලෙස ඉදිරිපත් කිරීමට පමණි.

ප්‍රධාන සංශෝධනයන් පහත පරිදි වේ.

- වාර්තාකරණ අවසන් දිනයට ඇති වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණ අයිතීන් මත පදනම් විය යුතුය. වගකීම් ප්‍රකාශයක් වෙනස් කිරීමට ඇති අයිතිය ස්ථිතියකින් ක්‍රියාවට නංවනු ලබයිද, නැද්ද යන්න වර්ගීකරණය අපේක්ෂාවන්ගේ බලපෑමට ලක් නොවේ. සමථකරණයෙන් අදහස් කරන්නේ මුදල්, කොටස් උපාංග, වෙනත් වත්කම් සේවාවන්හි ප්‍රති පාර්ශවයට මාරු කිරීම බව සම්මතයෙන් ද පැහැදිලි කෙරේ.

2023 අප්‍රේල් 1 දින හෝ ඊට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලයට සංශෝධනයන් යොදවනු ලබයි.

- 2018-2020 SLFRS ප්‍රමිතීන්වල වාර්ෂික වැඩිදියුණු කිරීම්

ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා ඉක්මන් නොවන නමුත් අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම ක්‍රියාවලියේ අංගයක් වන බැවින්, IASB ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (මණ්ඩලය) විසින් 2018-2020 IFRS ප්‍රමිතීන්ට වාර්ෂික වර්ධනයන් නිකුත් කර ඇත. 2022 අප්‍රේල් 1 දින හෝ ඊට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලයට සංශෝධනයන් බල පැවැත්වෙනු ලබයි. ආවරණය කරන ලද ප්‍රධාන අංග පහත පරිදි වේ:

I. SLFRS 1 ප්‍රථම වරට ජාත්‍යන්තර ගිණුම්කරණ වාර්තාකරණ ප්‍රමිතීන් සම්මත කිරීම

එහි මවු සමාගමට වඩා ප්‍රමාදව SLFRS 1 ප්‍රමිතීන් ප්‍රථම වරට සම්මත කරනු ලබන පරිපාලිත භාවිතයන් මෙම සංශෝධන මගින් සරල කිරීම

II. SLFRS 9 මූල්‍ය උපකරණ

සංශෝධනයන් විස්තර කරනු ලබන්නේ- '10% පරීක්ෂාව' පැවැත්වීමේ අරමුණට මූල්‍ය වගකීම් නැවත හඳුනාගැනීම- ගෙවන ලද ගාස්තු ලැබූ ශුද්ධ ගාස්තු හඳුනාගැනීම, අනෙක් අය වෙනුවෙන් ණයකරු හෝ ණය දෙන්නා විසින් ගෙවන ලද හෝ ලැබූ ගාස්තු ඇතුළත්ව ණයකරු අන්තර්ගත කරන්නේ ගෙවන ලද ගාස්තු හෝ ණයකරු සහ ණයදෙන්නා අතර ලැබීම් පමණි.

## 3. අඛණ්ඩ පැවැත්ම

සමාලෝචන වර්ෂය තුළ, සමාගම රු. මිලියන 45,231.46 ක (2020 - රු. මිලියන 47,197.86) අලාභයක් වාර්තාකළ අතර 2021 මාර්තු 31 වන විට රු. මිලියන 371,733.52 (2020 - රු. මිලියන 326,341.48) ක සමුච්චිත අලාභයක් වාර්තා කළේය.

එමෙන්ම, සමාගමේ වර්තමාන වගකීම් රු. මිලියන 221,308.99 (2020 - රු. මිලියන 211,645.13) කින් එහි වර්තමාන වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කරන දිනය වන විට සමාගමේ මුළු හිමිකම් සෘණාත්මක රු. මිලියන 289,265.27 (2020 - සෘණාත්මක රු. මිලියන 273,369.08 ) දක්වා පහත වැටී ඇත.

2021 මාර්තු 31 වන විට සමූහය රු. මිලියන 49,704.51 (2020 - රු. මිලියන 44,139.40) ක අලාභයක් සමග රු. මිලියන 366,284.57 ක (2020 - රු. මිලියන 316,477.65) සමුච්චිත අලාභයක් වාර්තා කළේය. තවද, සමූහයේ වර්තමාන වගකීම් රු. මිලියන 214,635.95 (2020 - රු. මිලියන 200,835.86) කින් එහි වර්තමාන වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කරන දිනය වන විට සමාගමේ මුළු හිමිකම් සෘණාත්මක රු. මිලියන 281,490.87 ක් (2020 - සෘණාත්මක රු. මිලියන 261,173.54) දක්වා පහත වැටී ඇත.

සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු වන අතර සමාගම බරපතල ප්‍රාග්ධන ඌනතාවයකට මුහුණපා ඇත. එමනිසා, සමාගම විසින් 2020 සැප්තැම්බර් 25 වන දින අතිවිශේෂ මහා සභා රැස්වීමක් (EGM) පවත්වන ලද අතර (මීට පෙර මෙම අරමුණ වෙනුවෙන් පවත්වන ලද අතිවිශේෂ මහා සභා රැස්වීම් තුනට අමතරව) 2007 අංක 07 දරන සමාගම්

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

පනතේ 220 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

2020 වසරේ කෝවිඩ් 19 වසංගතය හමුවේ ගුවන් සමාගම්වල මෙහෙයුම් පරිසරය සම්පූර්ණයෙන් වෙනස්වන ලදී. වසංගතයේ උග්‍රතාව වර්තමානයේ තවත් වැඩි වීමෙන් ශ්‍රී ලංකාව තුළ සංචාරයට මගීන්ගේ පැමිණීම ඍණාත්මකව බලපාන ලදී. එමෙන්ම බොහෝ රටවල් වලින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් වසංගත තත්වය ගුවන් සමාගම්වල ප්‍රධාන වෙළඳ පොළවල් වන ඉන්දියාව, මැදපෙරදිග සහ ඈත නැගෙනහිර බොහෝ රටවලට බලපාන ලදී.

එම නිසා, පසුගිය වසරේ ලොව පුරා සිදු වූ දේශ සීමා බාධක හේතුවෙන් මගී ප්‍රවාහනය කිරීමේ සම්ප්‍රදායික ව්‍යාපාරික කටයුතු දැන් 2021 දක්වා අඛණ්ඩව සිදු කෙරෙන අතර, භාණ්ඩ ප්‍රවාහනය ප්‍රධාන මෙහෙයුම් මාර්ගය බවට පත්ව ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී, වෙන්වූ භාණ්ඩ කාලසටහනක් හඳුන්වා දෙන ලද අතර, භාණ්ඩ ධාරිතාව වැඩි කිරීම සඳහා පුළුල් බඳ සහිත ගුවන් යානයක් භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානයක් බවට පත් කරන ලදී. මූලික වශයෙන් භාණ්ඩ ඉල්ලුම මත ධාවනයවන නව මාර්ග හයක් හඳුන්වා දී ඇත. තවත් නව මාර්ග සහ ගුවන් යානා හඳුන්වා දීම තුළින් භාණ්ඩ ව්‍යාපාරය තවදුරටත් ඉහළ නැංවීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කෙරේ. නූතන යුගයේ දී ගුවන් සේවා කර්මාන්තය ගෝලීය වශයෙන් එහි බරපතලම අර්බුදයට මුහුණ දී ඇති අතර එම ඍණාත්මක බලපෑම අවම කිරීම සඳහා, එහි පිරිවැය ව්‍යුහය උපරිම කිරීම, කල් දැමූ ගෙවීම් සැලසුම් සහ එයාර්ලයින්හි ප්‍රධාන සැපයුම්කරුවන් සමග සහන ලබා දීම තුළින් ද්‍රවශීලතාවය රැක ගැනීමට ශ්‍රීලංකන් ගුවන් සමාගම පියවර ගෙන තිබේ. එසේ ක්‍රියාකරන අතර, දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා පිරිවැය ඉතිරි කිරීමේ පියවර කෙරෙහි අවධානය යොමු කරමින්, නව ව්‍යාපාර අවස්ථා නිර්මාණය කිරීමට ගුවන් සමාගම අඛණ්ඩව බලා සිටී.

සමාගමේ ද්‍රවශීලීතා තත්වයන්ට උපකාරීවන විමර්ශනය කළ වසරට විලම්බනය ගෙවීම් වසරකට කල්බදු කුලිය ඇමරිකානු ඩොලර් මිලියන 27ග5 කින් පෙන්නුම් කළ ගුවන්යානා කල්බදු ගිවිසුම් නැවත සකස් කිරීම මගින් පිරිවැය ප්‍රශස්ත කිරීමට ප්‍රධාන පියවර ගෙන ඇත. ස්වෙච්ඡා ඉල්ලා අස්වීමේ පටිපාටිය (VRS) දීමනා නැවත සකස්කිරීම, 2.5% සිට 25% දක්වා පරාසයක අනිවාර්ය වැටුප් කපාහැරීම්, සියලු වැටුප් වැඩිකිරීම/ බඳවා ගැනීම අත්හිටුවීම ඇතුළත්ව සේවක පිරිවැය විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ ප්‍රශස්තකරණය කිරීම වර්තමාන තත්වය යටතේ පවත්වාගෙන යනු ලබයි. වසර තුළ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් ප්‍රතික්ෂේප කරන ලදී.

නව හිමිකරු ප්‍රාග්ධන මගින් සමාගමට ශ්‍රී ලංකා රජය සහය ලබාදෙනු ලබයි. මෙය 2014 වසරෙන් පසු SLA සඳහා පළමු ප්‍රාග්ධන එක් කිරීම වූ අතර, 2020 නොවැම්බර් මස රුපියල් බිලියන 27.7 ක් ද, 2021 අප්‍රේල් රුපියල් බිලියන 18 ක් ද, නියමිත දිනයට ලැබුණි (විස්තර සඳහා සටහන 13 සහ සටහන 29 බලන්න). මෙම එක් කිරීම, 2020 ඔක්තෝම්බර් 26 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත ඇමරිකානු ඩොලර් මිලියන 500ක නැවත ප්‍රාග්ධනීකරණ වැඩසටහනේ කොටසක් විය. කෙටිකාලීන ණය පහසුකම් ප්‍රතිපාදන පවත්වා ගෙන යාමට රාජ්‍ය බැංකු දෙකකට පක්ෂව, ඇමරිකානු ඩොලර් මිලියන 205.4 සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 27.6 ක අගයක් කාලසීමා තුළ කල්ඉකුත් වූ සහන සැලසීමේ ලිපි නැවත නිකුත් කිරීමට මහා භාණ්ඩාගාරය හරහා ශ්‍රී ලංකා රජයේ  අනුමත වන ලදී. එමෙන්ම සමාලෝචනයට භාජනය වූ වසර තුළ, භාණ්ඩාගාර ඇපකර ලබා දීමට කැබිනට් මණ්ඩල අනුමැතිය මත, රාජ්‍ය බැංකු දෙක කාරක ප්‍රාග්ධන අරමුණු සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 75 ක නව පහසුකමක් සපයා ඇත. තවදුරටත්, යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන තෙක් "ඉදිරිය ගැන සැලකිලිමත්වීම" ලෙස මෙහෙයුම් පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා රජය සමාගමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම පවත්වා ගෙන යනු ලබන බව, 2022 පෙබරවාරි 7 දිනට කැබිනට් අනුමැතිය අනුව ශ්‍රී ලංකා රජය සහ භාණ්ඩාගාර ලේකම් විසින් 2022 පෙබරවාරි 24  දින නිකුත් කළ ලිපිය සනාථ කර ඇත.

## 4. දේපළ, පිරියත සහ උපකරණ

### 4.1 සමූහය

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ උපකරණ | බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම් | ගුවන්යානා ආශ්‍රිත උපකරණ | අත්තිකාරම්/ ප්‍රාග්ධන නොනිම් වැඩ | එකතුව 2021 | එකතුව 2020 |
|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 4,602.00 | 9,741.54 | 2,083.60 | 9,584.14 | 5.77 | **26,017.05** | 28,080.30 |
| අත්පත් කරගැනීම්/නවීකරණයන්/වැඩිදියුණු කිරීම් | 43.65 | 123.82 | - | 167.28 | 27.04 | **361.79** | 654.53 |
| කාර්ය ප්‍රාග්ධනයෙන් මාරු කරන ලද | 9.57 | - | - | - | (9.57) | **-** | - |
| භාවිත හිමිකම් වත්කම් වෙත මාරු කිරීම | - | - | - | - | - | **-** | (2,500.45) |
| ප්‍රතිවර්ගීකරණයන් | (16.21) | 16.21 | - | - | - | **-** | - |
| බැහැරකිරීම්/විශ්‍රාම ගැනීම් | (70.41) | (29.14) | (171.68) | (31.95) | - | **(303.18)** | (217.33) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 4,568.60 | 9,852.43 | 1,911.92 | 9,719.47 | 23.24 | **26,075.66** | 26,017.05 |
| **සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 623.26 | 7,131.33 | 1,912.63 | 7,900.32 | - | **17,567.54** | 17,858.40 |
| වසර සඳහා අයකිරීම් | 362.17 | 700.85 | 54.24 | 462.69 | - | **1,579.95** | 1,514.48 |
| භාවිත හිමිකම් වත්කම් වෙත මාරු කිරීම | - | - | - | - | - | **-** | (1,601.82) |
| ප්‍රතිවර්ගීකරණයන් | (1.57) | 1.57 | - | - | - | **-** | - |
| බැහැරකිරීම්/විශ්‍රාම ගැනීම් | (70.41) | (26.30) | (171.68) | (31.95) | - | **(300.34)** | (203.52) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 913.45 | 7,807.45 | 1,795.19 | 8,331.06 | - | **18,847.15** | 17,567.54 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 3,655.15 | 2,044.98 | 116.73 | 1,388.41 | 23.24 | **7,228.51** | 8,449.51 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 4. දේපළ, පිරියත සහ උපකරණ (සබැදේ)

**4.2** *(ඇ)* සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලි වල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් වන අතර, 2019 මාර්තු 31 දිනට ඉඩම් සහ ගොඩනැගිලි හා පරිපාලිතයෙහි මුළුතැන්ගෙයි උපකරණවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයෙහි සංස්ථාපිත තක්සේරුකරු ජී.එච්.ඒ.පී.කේ ප්‍රනාන්දු මහතා විසින් සිදුකරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේය.

තක්සේරුකරණයේදී ප්‍රකාශිත සමූහයේ ඉඩම් ගොඩනැගිලි සහ වෙනත් පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ;

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරු කරණයේ බලාත්මක දිනය | සැළකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණනයෙන් වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොල අගයන්**<br>නැවත අගය කළ දේපළවල සාධාරණ අගය හඳුනා ගැනීමේදී සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළවල විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මගින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ වෙනස, ස්වභාවය සහ පිහිටීම අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොලෙහි සමාන වත්කම් ඇගැයීම පාදක කරගනී. | 31 මාර්තු 18 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 18 | 643.50 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ/කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන ක්‍රමවේදය**<br>වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය සලකනු ලබයි. | 31 මාර්තු 18 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 643.47 - රු 8,092.50 | 2,083.98 | | |
| පරිපාලිතය | | | | | | |
| ගොඩනැගිලි - කටුනායක | **ආදායම් ක්‍රමවේදය**<br>නිශ්චිත සාධක සමග සම්බන්ධකර, දේපළ මගින් උත්පාදනය කරන ශුද්ධ ආදායම්, එහි සාධරණ අගය ගණනයට භාවිත කරයි. | 31 මාර්තු 19 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 4,000 - රු. 16,000 | 1,565.49 | | |
| පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කල ගුවන් සේවා මුළුතැන්ගෙයි උපකරණ - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන ක්‍රමවේදය**<br>වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය සලකනු ලබයි. | 31 මාර්තු 19 | එක් එක් උපකරණය සඳහා ශුද්ධ ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමවේදය (NRC) යොදා ගනිමින් සාධාරණ අගය ගණනය කෙරිණි. | 1,099.82 | | |

## 4. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

වත්කම් පිරිවැය අඩුකිරීම ක්ෂයවීම් වශයෙන් ධාරණය කරනු ලැබුණි නම්, මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කළ හැකිව පැවති ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වල ධාරණ අගය පහත දැක්වෙන පරිදි වේ:

| වත්කමෙහි පන්තිය | පිරිවැය | වත්කම් පිරිවැය අනුව ධාරණය කරනු ලැබුනේ නම් සමුච්චිත ක්ෂය | ශුද්ධ ධාරණ වටිනාකම 2021 | ශුද්ධ ධාරණ වටිනාකම 2020 |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ඉඩම සහ ගොඩනැගිලි | 3,034.72 | 2,092.68 | **942.04** | 1,041.12 |
| පිරියත සහ උපකරණ | 2,482.77 | 2,123.43 | **359.34** | 411.20 |

(ආ) වසර තුළදී, සමූහය විසින් රුපියල් මිලියන 361.79 ක (2020 රුපියල් මිලියන 654.53) සමස්ත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනිණි. වසර තුළ, දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 319.95 ක වටිනාකමකින් (2020 රුපියල් මිලියන 735.56) යුතු මුදල් ගෙවීම සිදුකරන ලදී.

(ඇ) සමූහයේ දේපළ පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 12,434.05 ක ධාරණ වටිනාකමකින් යුතු (2020 රුපියල් මිලියන 12,029.11) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ද ඇතුළත් වේ.

(ඈ) ඕනෑම දේපළ, පිරියත සහ උපකරණ බැංකු පහසුකම් සඳහා උකස් කිරීමේ සටහන 16.2 හි අනාවරණය කර ඇත.

### *4.3 සමාගම*

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ උපකරණ | බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම් | ගුවන්යානා ආශ්‍රිත උපකරණ | අත්තිකාරම්/ කාර්ය ප්‍රාග්ධනය | එකතුව 2021 | එකතුව 2020 |
|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 3,006.56 | 8,302.49 | 2,083.60 | 9,584.14 | 5.08 | **22,981.87** | 25,363.32 |
| අත්පත් කරගැනීම්/ නවීකරණයන්/වැඩිදියුණු කිරීම් | 43.46 | 104.62 | - | 167.28 | 9.41 | **324.77** | 318.25 |
| කාර්ය ප්‍රාග්ධනයෙන් මරුකරන ලද | 6.94 | - | - | - | (6.94) | **-** | - |
| ප්‍රතිවර්ගීකරණයන් | (16.21) | 16.21 | - | - | - | **-** | - |
| භාවිත හිමිකම් වත්කම් වෙත මාරුකිරීම් | - | - | - | - | - | **-** | (2,500.45) |
| බැහැර කිරීම/විශ්‍රාම ගැනීම් | (70.41) | (22.59) | (171.68) | (31.95) | - | **(296.63)** | (199.25) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 2,970.34 | 8,400.73 | 1,911.92 | 9,719.47 | 7.55 | **23,010.01** | 22,981.87 |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 540.03 | 6,861.61 | 1,912.63 | 7,900.32 | - | **17,214.59** | 17,821.13 |
| වසර සඳහා ගාස්තුව | 277.85 | 394.07 | 54.24 | 462.69 | - | **1,188.85** | 1,194.17 |
| ප්‍රතිවර්ගීකරණයන් | (1.57) | 1.57 | - | - | - | **-** | - |
| භාවිත හිමිකම් වත්කම් වෙත මාරුකිරීම් | - | - | - | - | - | **-** | (1,601.82) |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | (70.41) | (22.59) | (171.68) | (31.95) | - | **(296.63)** | (198.89) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 745.90 | 7,234.66 | 1,795.19 | 8,331.06 | - | **18,106.81** | 17,214.59 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 2,224.44 | 1,166.07 | 116.73 | 1,388.41 | 7.55 | **4,903.20** | 5,767.28 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 4. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

**4.4** *(අ)* සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළදී, ස්වාධීන තක්සේරුකරු රන්ජන් ජේ.සමරකෝන් මහතා විසින් (ඒ.අයි.වී ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) සිදුකරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේය. 2018 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශයන්හි එම ප්‍රත්‍යාගණනයන්වල ප්‍රතිඵලයන් අන්තර්ගත කර ඇත.

තක්සේරුකරණයේ සඳහන් කරන ලද සමාගමේ ඉඩම් සහ ගොඩනැගිලිවල තොරතුරු පහත දැක්වේ;

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරු කරණයේ බලාත්මක දිනය | සැළකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාග ණනයන්වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොල අගයන්**<br>නැවත අගය කළ දේපළවල සාධාරණ අගය හඳුනා ගැනීමේදී සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළවල විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මගින් සලකා බලනු ලබයි. මෙය දේපළ වල ප්‍රමාණයේ වෙනස, ස්වභාවය සහ පිහිටීම අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොලෙහි සමාන වත්කම් ඇගැයීම පාදක කරගනී. | 31 මාර්තු 18 | පර්චසයක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 18 | 643.50 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ/කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන ක්‍රමවේදය**<br>වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය සලකනු ලබයි. | 31 මාර්තු 18 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 643.47 - රු 8,092.50 | 2,083.98 | | |

වත්කම් පිරිවැය අඩුකිරීම, ක්ෂයවීම් වශයෙන් ධාරණය කරනු ලැබුණි නම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කළ හැකිව පැවති ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත දැක්වෙන පරිදි වේ:

| වත්කම් පන්තිය | පිරිවැය<br>රු. මිලියන | වත්කම් පිරිවැය අනුව ධාරණය කරනු ලැබුවේ නම් සමුච්චිත ක්ෂයවීම<br>රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2021<br>රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2020<br>රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 1,239.49 | 932.86 | **306.63** | 332.15 |

(ආ) වසර තුළ, සමාගම විසින් රුපියල් මිලියන 324.77 ක (2020 රුපියල් මිලියන 318.25) සමස්ත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනිණි. වසර තුළ, දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 282.82 ක වටිනාකමකින් (2020 රුපියල් මිලියන 399.28) යුතු මුදල් ගෙවීම් සිදුකරන ලදී.

(ඇ)සමාගමේ දේපළ පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 12,434.05ක ධාරණ වටිනාකමකින් යුතු (2020 රුපියල් මිලියන 12,029.11) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ද ඇතුළත් වේ.

(ඈ)ඕනෑම දේපළ, පිරියත සහ උපකරණ බැංකු පහසුකම් සඳහා උකස් කිරීමේ සටහන 16.2 හි අනාවරණය කර ඇත.

## 5. භාවිත හිමිකම් වත්කම්

### *5.1 භාවිත හිමිකම් වත්කම් සංචලනය*

| සමූහය | ගුවන්යානා සහ අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | වාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2021 රු. මිලියන | එකතුව 2020 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| SLFRS 16 පරිවර්තනය | - | - | - | - | - | 135,890.94 |
| PPE වෙතින් මරුකරන ලද | - | - | - | - | - | 898.63 |
| **2019 අප්‍රේල් 1 දිනට ශේෂය** | 117,134.76 | 1,260.51 | 45.74 | 642.73 | **119,083.74** | 136,789.57 |
| එකතු කිරීම් | - | 72.49 | - | - | **72.49** | 124.61 |
| බැහැර කිරීම් | - | - | (16.75) | - | **(16.75)** | - |
| ගැලපීම් | (11,558.85) | 3.95 | 0.54 | - | **(11,554.36)** | - |
| ක්ෂයවීම් | (14,610.30) | (242.99) | (20.05) | (255.90) | **(15,129.24)** | (17,830.44) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 90,965.61 | 1,093.96 | 9.48 | 386.83 | **92,455.88** | 119,083.74 |

| සමාගම | ගුවන්යානා සහ අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | වාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2021 රු. මිලියන | එකතුව 2020 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| SLFRS 16 පරිවර්තනය | - | - | - | - | - | 135,511.78 |
| PPE වෙතින් මරුකරන ලද | - | - | - | - | - | 898.63 |
| **අප්‍රේල් 1 දිනට ශේෂය** | 117,134.76 | 928.52 | 45.74 | 642.73 | **118,751.75** | 136,410.41 |
| එකතු කිරීම් | - | 72.49 | - | - | **72.49** | 124.61 |
| බැහැර කිරීම් | - | - | (16.75) | - | **(16.75)** | - |
| ගැලපීම් | (11,558.85) | 3.95 | 0.54 | - | **(11,554.36)** | - |
| ක්ෂයවීම් | (14,610.30) | (195.81) | (20.05) | (255.90) | **(15,082.06)** | (17,783.27) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 90,965.61 | 809.15 | 9.48 | 386.83 | **92,171.07** | 118,751.75 |

**කෙටි කාලීන කල්බදු**

සමූහය මගින් මාස 12 ක් හෝ එයට අඩු කල්බදු කාලසීමාවන් සහිත ගුවන් යානා, ඉඩම් හා ගොඩනැගිලි සහ රථවාහන සම්බන්ධ කෙටි කාලීන කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හා කල්බදු වගකීම් හඳුනානොගැනීමට තීරණය කෙරිණි. සමූහය මගින් මෙම කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

| | සමූහය 2021 රු. මිලියන | සමූහය 2020 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන | සමාගම 2020 රු. මිලියන |
|---|---|---|---|---|
| කල්බදු ගුවන්යානා මත කුලී ගෙවීම්/අමතර එන්ජින් | **2,265.02** | 1,393.67 | **2,265.02** | 1,393.67 |
| ඉඩම් හා ගොඩනැගිලි මත කුලී ගෙවීම් | **243.86** | 291.08 | **242.28** | 282.20 |
| රථවාහන මත කුලී ගෙවීම් | **15.68** | 11.37 | **13.68** | 9.38 |

**අඩු වටිනාකමකින් යුතු වත්කම්**

සමූහය මගින් පහළ වටිනාකමකින් යුතු වත්කම් සඳහා භාවිත හිමිකම් වත්කම් හා කල්බදු වගකීම් හඳුනා නොගැනීමට තීරණය කෙරිණි. සමූහය මගින් මෙම කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 6. ගුවන්යානා ගෙන්වීමට පූර්ව ගෙවීම් (predelivery)

2020 මාර්තු 31 දිනට රුපියල් මිලියන 2,528.12 (ඇ.ඩො. මිලියන 19.21) වටිනකමකින් යුතු පූර්ව ලබාදීමේ ගෙවීම් වල, 2020 සහ 2021 ට Airbus A350-900 ගුවන්යානා හතරක් ලබාදීම ඇතුළත් වේ.

එංගලන්තයේ රාජ්‍ය අධිකරණය විසින් Airbus S.A.S. සහ එංගලන්තයේ බරපතල වංචා කාර්යාලය අතර විලම්භිත පැමිණිලි ගිවිසුම අනුමත කරමින්, තීන්දුවක් නිකුත් කර ඇත. එම තීන්දුවේ, A330-300 ගුවන්යානා 6ක් සහ A350-900 ගුවන්යානා 4ක් සහ A350-900 ලීසිං ගුවන්යානා 4ක් මිලදී ගැනීම් සමාගම විසින් සිදු කිරීමට හිටපු ප්‍රධාන විධායක නිළධාරියකුගේ බිරිඳට අයත් සමාගමකට ගෙවීමක් Airbus SE හරහා ගෙවීමට එකඟ වූ බව Airbus SE පිළිගෙන ඇත.

සමාගම විසින් ගරු නීතිපතිගෙන් A330-300 ගුවන්යානා 6ක් සහ A350-900 ගුවන්යානා 4ක් සහ A350-900 ලීසිං ගුවන්යානා 4ක් මිලදී ගැනීම් සමාගම විසින් සිදු කිරීමට, හිටපු ප්‍රධාන විධායක නිළධාරියකුගේ බිරිඳට අයත් සමාගමකට ගෙවීමක් Airbus SE හරහා ගෙවීම පිළිබඳ සමාගම සතු විසදුම් ගැන උපදෙස් ගනු ලැබිණ. ඉංග්‍රීසී නීතිය අනුව පොලිය සමග බෙදාහැරීමට පෙර සිදුකළ ගෙවීම් නැවත ලබා ගැනීමේ හැකියාවක් ඇතැයි නීතිපතිගේ දෙපාර්තමේන්තුව විසින් උපදෙස් දෙන ලදී.

සමාගම විසින් ලන්ඩනයේ සමාගම් නීතිඥයින් හරහා පොලිය සමග බෙදාහැරීමට පෙර සිදුකළ ගෙවීම් නැවත ඉල්ලා සිටිමින් Airbus S.A.S. සහ Airbus SE වෙත එන්තරවාසියක් යවා ඇත. Airbus S.A.S විසින් දැනට Airbus මගින් ඇගයීමට ලක් කරමින් පවතින සමාගමේ ඉල්ලීම පිළිබඳ අතිරේක තොරතුරු ඉල්ලා ඇත. සමාගම, සමාගමෙහි ඉල්ලීමට එයාර්බස් හි ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටී. පොලිය සමග බෙදාහැරීමට පෙර සිදුකළ ගෙවීම් සමාගම විසින් නැවත ඉල්ලා සිටීම, ඉංග්‍රීසි නීති මූලධර්ම පමණක් පදනම් කර ගත්, Airbus S.A.S වෙත විරුද්ධව කරන ලද බලවත් ඉල්ලා සිටීමකි. සමාගමේ එන්තරවාසියට Airbus S.A.S ප්‍රතිචාරයට යටත්ව සහ සමාගමේ ඉල්ලා සිටීම් සමථකරණයකට මඟපෙන්වුවහොත්, පොලිය සමග බෙදාහැරීමට පෙර සිදුකළ ගෙවීම් සමාගම විසින් නැවත ඉල්ලා සිටීමට විරුද්ධව සමථකරණයන් අනුව Airbus S.A.S තත්වයන්ට යටත්ව, බෙදාහැරීමට පෙර සිදුකළ ගෙවීම්වල ප්‍රතිඵලයන් සමාගමට අහිතකර වේයැයි කළමනාකරණයට විශ්වාස කිරීමට තොරතුරු කිසිවක් නොමැති හෙයින් සමාගමට පෙර සිදු කළ ගෙවුම් නැවත ලබාගත හැකියැයි සමාගමට මෙම අවස්ථාවේදී සාධරණ ලෙස උපකල්පනය කළ හැකිය. ඒ අනුව, මෙම වටිනාකම වාර්තාකරණ දිනයට වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ නැවත වර්ගීකරණය කර ඇත.

## 7. ගුවන්යානා නඩත්තු සංචිතය

| සමූහය/සමාගම | 2021<br>රු. මිලියන | 2020<br>රු. මිලියන |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | **48,461.22** | 44,507.42 |
| ගෙවීම් | **4,089.09** | 12,901.46 |
| නැවත භාරදීම හා හිලව් කළ මුදල | **(504.39)** | (6,035.89) |
| අයකර ගැනීම් | **(4,335.62)** | (6,534.07) |
| විනිමය ලාභය | **2,807.41** | 3,622.30 |
| | **50,517.71** | 48,461.22 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදන (සටහන 7.2) | **(15,636.24)** | (13,567.56) |
| **මාර්තු 31 දිනය ශුද්ධ අයකර ගතහැකි ශේෂය (සටහන 7.1)** | **34,881.47** | 34,893.66 |

### 7.1 ජංගම/ජංගම නොවන වර්ගීකරණය

| | දළ | හානිකරණය සඳහා වෙන්කිරීම | ශුද්ධ | එක් වසරක් ඇතුළත අයකර ගත හැකි මුදල | වසරකට පසු අයකර ගත හැකි මුදල |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **2021 මාර්තු 31 දිනට ශේෂය** | 50,517.71 | (15,636.24) | 34,881.47 | 13,635.10 | 21,246.37 |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | 48,461.22 | (13,567.56) | 34,893.66 | 16,290.06 | 18,603.60 |

### 7.2 හානිකරණය සඳහා ප්‍රතිපාදන සංචලනය

| | 2021 | 2020 |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 13,567.56 | 10,779.18 |
| වසර තුළදී අය කරන ලද | 1,181.44 | 4,349.64 |
| නැවත භාරදීම හා හිලව් කළ මුදල | (504.39) | (6,035.89) |
| ගැලපුම්* | 541.96 | 3,397.80 |
| විනිමය අලාභය | 849.67 | 1,076.83 |
| **මාර්තු 31 දිනට ශේෂය** | 15,636.24 | 13,567.56 |

*2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගැලපුම් මගින් විවිධ ගුවන්යානා අළුත්වැඩියා අවස්ථාවන් හේතුවෙන් නඩත්තු සංචිත හා අනාගත ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා ප්‍රතිපාදන අතර මාරුකිරීම් නියෝජනය වේ (2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගැලපුම් තුළ ගුවන්යානයක් කලින් නැවත භාරදීම හේතුවෙන් සහ ඇතැම් සැලසුම්ගත අළුත්වැඩියා කටයුතුවල වෙනස්වීම් හේතුවෙන් නඩත්තු සංචිතයෙන් අනාගත ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය ප්‍රතිපාදන වෙත මාරුකිරීම් නියෝජනය වේ). අදාළ ගැලපුම, ඉදිරි ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා ගාස්තු වල ප්‍රතිපාදන සටහන 17 හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 8. අස්පෘශ්‍ය වත්කම්

| | සමූහය | | | | සමාගම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෘදුකාංග | ප්‍රාග්ධන නොනිමි | එකතුව 2021 | එකතුව 2020 | මෘදුකාංග | ප්‍රාග්ධන නොනිමි | එකතුව 2021 | එකතුව 2020 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය** | | | | | | | | |
| අප්‍රේල් 31 දිනට ශේෂය | 1,410.24 | 17.71 | **1,427.95** | 1,414.76 | 1,321.24 | 17.71 | **1,338.95** | 1,328.94 |
| අත්පත් කරගැනීම්/ නවීකරණයන්/ වැඩිදියුණු කිරීම් | 20.34 | 7.23 | **27.57** | 26.06 | 11.74 | 7.23 | **18.97** | 22.88 |
| නොනිමි වෙතින් මාරුකරන ලද | 7.36 | (7.36) | **-** | - | 7.36 | (7.36) | **-** | - |
| ගැළපුම් | - | (3.22) | **(3.22)** | (7.53) | - | (3.22) | **(3.22)** | (7.53) |
| බැහැරකිරීම් | - | - | **-** | (5.34) | - | - | **-** | (5.34) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 1,437.94 | 14.36 | **1,452.30** | 1,427.95 | 1,340.34 | 14.36 | **1,354.70** | 1,338.95 |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | | | | | | |
| අප්‍රේල් 31 දිනට ශේෂය | 1,324.03 | - | **1,324.03** | 1,282.78 | 1,260.45 | - | **1,260.45** | 1,229.43 |
| වසර සඳහා ගාස්තුව | 36.13 | - | **36.13** | 46.59 | 24.70 | - | **24.70** | 36.36 |
| බැහැරකිරීම් | - | - | **-** | (5.34) | - | - | **-** | (5.34) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 1,360.16 | - | **1,360.16** | 1,324.03 | 1,285.15 | - | **1,285.15** | 1,260.45 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 77.78 | 14.36 | **92.14** | 103.92 | 55.19 | 14.36 | **69.55** | 78.50 |

වාර්තාකරණ දින වන විට සමූහයේ සහ සමාගමෙහි අස්පෘශ්‍ය වත්කම් අතරට, පිළිවෙලින් රුපියල් මිලියන 1,260.85 ක් සහ 1,224.05 ක දළ ධාරණ අගයකින් යුතු (2020 - රුපියල් මිලියන 1,231.53 සහ 1,196.46) පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය වූ වත්කම් ඇතුළත් විය. ප්‍රාග්ධන නොනිමි යටතේ මෘදුකාංග යාත්වකාලීන කිරීම ඇතුළත් වේ.

## 9. ආයෝජන

### 9.1 ජංගම නොවන ආයෝජන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **ශ්‍රී ලංකාවේ පරිපාලිතය තුළ ආයෝජන** | | | | |
| -සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් (940,268,456 කොටස්, 100% හිමිකම්) | - | - | 42.24 | 42.24 |
| (ශුද්ධ වත්කම් වටිනාකම මත අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව රුපියල් බිලියන 7.82 (2020- රුපියල් බිලියන 12.24) | | | | |
| - එයාර්ලංකා (පුද්.) සමාගම (කොටස් 40,000)* | 0.40 | 0.40 | 0.20 | 0.20 |
| | 0.40 | 0.40 | 42.44 | 42.44 |

*එයාර්ලංකා පුද්ගලික සමාගමෙහි කොටස් ප්‍රාග්ධනයෙන් 50% ක් සමාගම මගින් දරනු ලබන අතර ඉතිරි 50% පරිපාලිත සමාගම මගින් දරනු ලැබේ.

එයාර්ලංකා පුද්ගලික සමාගම ආරම්භයේ සිටම අක්‍රීය සමාගමක් වන අතර ප්‍රමාණවත් තරම් නොවන හෙයින් ඒකාබද්ධකරණයට ලක් නොකෙරිණ.

### 9.2 ජංගම ආයෝජන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බැංකුවේ ස්ථාවර තැන්පතු | 1,367.82 | 1,039.24 | 1,114.66 | 613.64 |

## 10. තොග

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ඉංජිනේරු කටයුතු ආශ්‍රිත තොග | 5,943.96 | 6,172.67 | 5,943.96 | 6,172.67 |
| භූමි සේවා ආශ්‍රිත තොග | 498.68 | 497.50 | 498.68 | 497.50 |
| අමුද්‍රව්‍ය හා පරිභෝජනය කළ හැකි දෑ | 946.10 | 894.85 | 639.61 | 548.41 |
| | 7,388.74 | 7,565.02 | 7,082.25 | 7,218.58 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන (සටහන 10.1) | (2,732.99) | (2,436.39) | (2,599.23) | (2,405.17) |
| | 4,655.75 | 5,128.63 | 4,483.02 | 4,813.41 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 10.1 මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| අප්‍රේල් 01 දිනට ශේෂය | (2,436.39) | (2,371.97) | (2,405.17) | (2,362.58) |
| වසර තුළදී සිදුකරන ලද ප්‍රතිපාදනය | (385.28) | (113.58) | (282.74) | (91.75) |
| වසර තුළදී කපා හැරීම් | 88.68 | 49.16 | 88.68 | 49.16 |
| **මාර්තු 31 දිනට ශේෂය** | (2,732.99) | (2,436.39) | (2,599.23) | (2,405.17) |

### 11. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වෙළඳ ලැබිය යුතු දෑ | 8,385.30 | 8,291.73 | 8,164.76 | 7,365.46 |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන්කිරීම (සටහන 11.2) | (1,617.51) | (1,623.40) | (1,534.14) | (1,558.10) |
| | 6,767.79 | 6,668.33 | 6,630.62 | 5,807.36 |
| ගුවන්යානා පෙර බෙදාහැරීම් ගෙවීම් (සටහන 6) | 2,528.12 | - | 2,528.12 | - |
| තැන්පතු, අත්තිකාරම්, පෙරගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 1,763.65 | 2,084.93 | 1,612.21 | 1,836.37 |
| | 11,059.56 | 8,753.26 | 10,770.95 | 7,643.73 |
| සමාගමෙහි නිලධාරීන් වෙත ලබාදුන් ණය සහ අත්තිකාරම් | 51.89 | 67.07 | 39.69 | 39.86 |
රජයේ පාලනය යටතේ පවතින ආයතනයන් වෙතින්/වෙත ශේෂයන් මූල්‍ය ප්‍රකාශයන්හි වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ/ගෙවිය යුතු දෑ සහ පොලී දරන වගකීම් යටතේ දක්වා ඇත.

වාර්තාකරණ දින වන විට සම්බන්ධිත පාර්ශවයන් ආශ්‍රිත හානිකරණය සඳහා, සමූහය සහ සමාගම පිළිවෙලින් රුපියල් මිලියන 1,062.82 සහ රුපියල් මිලියන 994.31 බැගින් (2020 සමූහ සඳහා රුපියල් මිලියන 1,018.10 සහ සමාගම සඳහා රුපියල් මිලියන 1,082.95) විය.

සියළුම රජය මගින් පාලනය කෙරෙන/ආශ්‍රිත ආයතනයන් සමග සිදුකරන ලද සියළු ගනුදෙනු හසුකරගැනීමේ සහ අනාවරණය කිරීමේ ප්‍රායෝගික ගැටළුව සහ ඒවායේ විශාලත්වය හේතුවෙන් ඒකලව සැළකිය යුතු ගනුදෙනු සඳහා LKAS 24 - 'සම්බන්ධිත පාර්ශ්වීය හෙළිදරව් කිරීම්' යටතේ සීමිත හෙළිදරව් කිරීම් සිදු කෙරිණි.

වර්ෂය තුළ සමූහය සමග ගනුදෙනු කර ඇති වෙනත් රජය විසින් පාලන කරන/ අදාළ ආයතන කිහිපයක් පහත දැක්වේ:
- ලංකා විදුලිබල මණ්ඩලය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ඖෂධ සංස්ථාව
- විදේශ කටයුතු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා තැපැල් අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන දායක මුදල් සම්බන්ධ වැඩිදුර ගනුදෙනු සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වලට අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සිදු කරනු ලැබේ.

**සමාගම**
අදාළ පාර්ශවයන් සමග ගනුදෙනු සිදු වූයේ වාණිජමය කොන්දේසි යටතේය.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 30. සම්බන්ධිත පාර්ශව අනාවරණය (සබැඳේ)

### *30.3 සමාගම*

පහත දැක්වෙන කරුණු ඇතුළුව සැලකිය යුතු ගනුදෙනු පරිපාලිතය සහ ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන උප සමාගම් සහ ආයතන සමග සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සිදු කර ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනු වල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2021 | 2020 | 2021 | 2020 |
| | | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ශ්‍රීලංකන් කේටරින් සමාගම | පරිපාලිතය | භාණ්ඩ ප්‍රවාහන සේවා | 97.03 | 16.85 | - | - |
| | | යානාස්ථ ආහාරපාන සැපයීම සහ වෙනත් සේවාවන් | (358.79) | (5,340.65) | (6,131.68) | (10,611.08) |
| | | ලාභාංශ | 3,659.63 | 1,701.25 | - | - |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (5,784.17) | (30,463.50) | (52,281.18) | (51,437.52) |
| | | විලම්බිත සැපයුම්කාර ගෙවීම් | - | - | (3,528.25) | (3,148.50) |
| | | ප්‍රමාද වූ මූල්‍ය පිරිවැය | (2,941.68) | (2,174.30) | (5,405.77) | (2,332.04) |
| එයාර්පෝට් ඇන්ඩ් ඒවියේශන් සර්විසස් පුද් සමාගම | රජයට අයත් | ගොඩබෑම්, නවතා තැබීම්, ගුවන් පාලම්, මගී විවේකාගාර, කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු | (821.44) | (3,027.54) | (2,175.01) | (2,239.95) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයෙන් පාලනය වන | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (466.60) | (10,593.35) | (150.72) | (943.68) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.78 | 2.01 | 852.18 | 770.79 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (657.56) | (673.22) | - | - |
| ලංකා බැංකුව | රජයට අයත් | ණය | 1,413.90 | - | (34,402.50) | (31,880.00) |
| | | කෙටිකාලීන තැන්පතු | - | - | 362.76 | 599.96 |
| | | පොලිය | (3,349.14) | (3,087.13) | - | - |
| | | බැංකු අයිරා | - | - | (18,810.02) | (11,097.05) |
| | | කුලිය | - | (0.66) | - | - |
| මහජන බැංකුව | රජයට අයත් | ණය | 1,387.50 | - | (37,218.60) | (34,703.51) |
| | | කෙටිකාලීන තැන්පතු | - | - | 0.75 | - |
| | | බැංකු අයිරා | - | - | (4,307.11) | - |
| | | පොලිය | (2,903.90) | (3,476.75) | - | - |

## 30. සම්බන්ධිත පාර්ශව අනාවරණය (සබැඳේ)

### *30.3 සමාගම (සබැඳේ)*

වාර්තා කිරීමේ දිනය වන විට සමූහය විසින් බැංකුවේ රු. මිලියන 2,070.55 ක (2020 - රු. මිලියන 2,059.64) බැංකු ඇපකර පහසුකම භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන ආයතනවල සිට/ දක්වා ඇති ශේෂයන් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ / ගෙවිය යුතු මුදල් සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ පොලී දරන වගකීම් යටතේ දැක්වේ.

වාර්තාකරණ දින වන විට සම්බන්ධිත පාර්ශවයන් ආශ්‍රිත හානිකරණය සඳහා වෙන්කිරීම රුපියල් මිලියන 994.31 ක් (2020 - රුපියල් මිලියන 1,018.10) විය.

සියළුම රජය මගින් පාලනය කෙරෙන/අදාළ ආයතනයන් සමග සිදුකරන ලද සියළු ගනුදෙනු හඳුනාගැනීමේ සහ හෙළිදරව් කිරීමේ ප්‍රායෝගික ගැටළුව සහ ඒවායේ විශාලත්වය හේතුවෙන් ඒකලව සැළකිය යුතු ගනුදෙනු සඳහා LKAS 24 - 'සම්බන්ධිත පාර්ශ්වීය අනාවරණය' යටතේ සීමිත හෙළිදරව් කිරීම් සිදු කෙරිණි.

වර්ෂය තුළ සමූහය සමග ගනුදෙනු කර ඇති වෙනත් රජය විසින් පාලන කරන/ අදාළ ආයතන කිහිපයක් පහත දැක්වේ:

- ලංකා විදුලිබල මණ්ඩලය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ඔෟෂධ සංස්ථාව
- විදේශ කටයුතු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා තැපැල් අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන දායක මුදල් සම්බන්ධ වැඩිදුර ගනුදෙනු සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වලට අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සිදු කරනු ලැබේ.

සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු සිදු වූයේ වාණිජමය කොන්දේසි යටතේය.

## 31. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය සහ ණය ගැනීම්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම් වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ මෙහෙයුම් සඳහා මූල්‍ය සම්පාදනයයි. සමූහයේ මූල්‍ය වත්කම් වලින් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ එහි මෙහෙයුම් වලින් සෘජුව ලබාගත් මුදල් සහ කෙටිකාලීන තැන්පතු වලිනි.

සාංගමික කළමනාකරණය වරින් වර, පුළුල් අවදානම් කළමනාකරණ අනුකෘතිය විමර්ශනය කර යාවත්කාලීන කරන අතර සැලකිය යුතු බලපෑමක් ඇති පහත සඳහන් මූල්‍ය අවදානම් හඳුනාගෙන ඇත.

(i) වෙළඳපොළ අවදානම
- පොලී අනුපාත අවදානම
- විනිමය අවදානම

(ii) ද්‍රවශීලතා අවදානම

(iii) ණය අවදානම

වෙළඳපළවල වෙනස්වීම් සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත ක්‍රියාකාරකම් වල වෙනස්කම් පිළිබිඹු වන පරිදි සමූහය සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර මේවා නියම ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අවදානම් හඳුනාගෙන මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මගින් පාලනය වේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**(i) වෙළඳපොළ අවදානම**

**පොලී අනුපාත අවදානම**
පොලී අනුපාත අවදානම යනු වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතවල වෙනස් වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමග සමූහයේ දිගුකාලීන ණය බැඳීම් හා සම්බන්ධ වේ.

පොලී අනුපාත උච්චාවචනයන්හි බලපෑම අවම කිරීම සඳහා ගුවන් යානා කල්බදු ඇතුළු ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය ගැනීම් අතර ප්‍රශස්ත සමබරතාවයක් පවත්වා ගැනීම සමූහයේ ප්‍රතිපත්තියයි.

ණය සහ ණය ගැනීම් සඳහා පොලී අනුපාතවල සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පහත වගුවේ ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විචල්‍යයන් නියතව පැවතුනහොත්, පහත සඳහන් පරිදි පාවෙන අනුපාත ණය ගැනීම් සඳහා වන බලපෑම මගින් බදු වලට පෙර සමූහ / සමාගම් අලාභයට බලපානු ඇත.

| | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| | බදු වලට පෙර අලාභය මත බලපෑම | | බදු වලට පෙර අලාභය මත බලපෑම | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| පොලී අනුපාත ඉහළයාම/(පහළයාම) | | | | |
| +1% | 772.62 | 772.13 | 773.61 | 772.01 |
| -1% | (772.62) | (772.13) | (773.61) | (772.01) |

*පොලී අනුපාත ඉහළයාම අලාභ ඉහළයාම කෙරෙහි හේතු වේ.

**විදේශ විනිමය අනුපාත අවදානම**
විදේශ විනිමය අනුපාත අවදානම යනු විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. එහි විදේශ මුදල් ඒකක මගින් ආදායම, වියදම්, ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය උපකරණ නියම කර ඇති බැවින් සමූහය විදේශ විනිමය අනුපාතයේ උච්චාවචනයන්හි බලපෑමට නිරාවරණය වී ඇත.

සමූහය සිය විදේශ විනිමය නිරාවරණය කළමනාකරණය කරන්නේ හැකිතාක් දුරට ගැලපෙන ප්‍රතිපත්තියක්, අදාල මුදල් ඒකක වලින්ම රිසිට්පත් තැබීම සහ ගෙවීම මඟින් වන අතර හඳුනාගත් විදේශ මුදල් ණය ආරක්ෂා කර ගැනීම සඳහා එහි හෙජිං වලින් හඳුනාගෙන ඇති විදේශ මුදල් ණය, එහි ඉහළ සම්භාවිතාවට, විදේශ මුදල්වල අනාගත ආදායමට විශේෂයෙන් හඳුනාගෙන ඇත.

පහත දැක්වෙන වගුව මගින් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල වෙනස් විය හැකි සංවේදීතාව පෙන්නුම් කරන අතර සෙසු සියලුම විචල්‍යයන් නියතව පවතී. (වාර්තා කරන දිනය වන විට මූල්‍ය තත්වය ප්‍රකාශ කිරීමේදී වාර්තා වී ඇති හිඟ මුදල් වත්කම් සහ වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන්). අනෙකුත් සියලුම මුදල් සඳහා සමූහය විදේශ මුදල් වෙනස්වීම් වලට නිරාවරණය වීම ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරයි.

| | 2021 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වෙනත් විස්තීර්ණ ආදායම (OCI) මත බලපෑම | | බදුවලට පෙර අලාභය මත බලපෑම | | වෙනත් විස්තීර්ණ ආදායම (OCI) වෙත බලපෑම | | බදුවලට පෙර අලාභය මත බලපෑම | |
| | සමූහය | සමාගම | සමූහය | සමාගම | සමූහය | සමාගම | සමූහය | සමාගම |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| රුපියලට සාපේක්ෂව ඇ.ඩො. අගය ඉහළයාම/(පහළයාම) | | | | | | | | |
| +3% | - | - | **10,131.92** | **10,361.06** | 273.54 | 273.54 | 8,439.40 | 8,791.32 |
| -3% | - | - | **(10,131.92)** | **(10,361.06)** | (273.54) | (273.54) | (8,439.40) | (8,791.32) |

*ඇමරිකන් ඩොලරයේ අගය ඉහළයාම අලාභයන් ඉහළයාම කෙරෙහි හේතු වේ.

## 31. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

**(ii) ද්‍රවශීලිතා අවදානම්**

ද්‍රවශීලිතා අවදානම යනු සමූහය විසින් වර්තමාන හා අනාගත මුදල් බැඳීම්, එය ගෙවීමට නියමිත දිනයේදී සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. දෛනික/සතිපතා/මාසික සහ වාර්ෂික මුදල් කළමනාකරණය සහ අයවැය ක්‍රියාවලියක් භාවිත කරමින් සමූහය එහි අරමුදල් හිඟවීමේ අවදානම නිරීක්ෂණය කරනු ලබයි. අවදානම අවම කිරීම සඳහා සමූහය, දිගු කාලීන හා කෙටිකාලීන ණය, බැංකු අයිරා පහසුකම් සහ මූල්‍ය / මෙහෙයුම් කල්බදු ඇතුළු මූල්‍ය ආයතනවලින් විවිධ අරමුදල් ලබා ගනී.

ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව සමූහයේ / සමාගමේ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ පැතිකඩ පහත දැක්වෙන වගුවෙහි සාරාංශගත කොට දැක්වේ.

| 2021 | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉල්ලීම මත | මාස 3 ට අඩු | මාස 3 සිට මාස 12 දක්වා | වසර 1 සිට 5 දක්වා | වසර 5 ට වැඩි | එකතුව | ධාරණ අගය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 23,117.13 | 4,031.93 | 74,760.35 | 35,118.14 | - | 137,027.55 | 137,631.57 |
| කල්බදු වගකීම | 12,698.00 | 7,059.75 | 22,602.74 | 96,414.01 | 67,263.41 | 206,037.91 | 166,172.50 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 1,107.30 | 5,509.11 | 10,722.67 | 16,138.28 | 1,052.88 | 34,530.24 | 34,530.24 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 80,855.81 | - | - | - | 80,855.81 | 80,855.81 |
| | 36,922.43 | 97,456.60 | 108,085.76 | 147,670.44 | 68,316.29 | 458,451.51 | 419,190.12 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 23,117.13 | 3,849.13 | 78,382.09 | 35,118.14 | - | 140,466.49 | 137,630.57 |
| කල්බදු වගකීම | 12,698.00 | 7,016.37 | 22,467.88 | 95,618.50 | 64,635.70 | 202,436.45 | 165,337.26 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 1,107.30 | 5,509.11 | 10,722.67 | 16,138.28 | 1,052.88 | 34,530.24 | 34,530.24 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 86,682.07 | - | - | - | 86,682.07 | 86,682.07 |
| | 36,922.43 | 103,056.68 | 111,572.64 | 146,874.92 | 65,688.58 | 464,115.25 | 424,180.14 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| 2020 | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉල්ලීම මත රු. මිලියන | මාස 3ට අඩු රු. මිලියන | මාස 3 සිට මාස 12 දක්වා රු. මිලියන | වසර 1 සිට 5 දක්වා රු. මිලියන | වසර 5 ට වැඩි රු. මිලියන | එකතුව රු. මිලියන | ධාරණ අගය රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 11,681.41 | 4,031.93 | 74,760.35 | 42,416.77 | - | 132,890.46 | 121,849.82 |
| කල්බදු වගකීම | 299.52 | 8,006.92 | 23,960.43 | 115,565.39 | 73,751.16 | 221,583.42 | 176,327.19 |
| වරණීය කොටස් | - | 1,000.00 | - | - | - | 1,000.00 | 1,000.00 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 5,227.08 | 513.63 | 12,844.16 | 13,743.50 | 1,698.01 | 34,026.38 | 34,026.38 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 69,442.96 | - | - | - | 69,442.96 | 69,442.96 |
| | 17,208.01 | 82,995.44 | 111,564.94 | 171,725.66 | 75,449.17 | 458,985.68 | 402,688.81 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 11,681.41 | 3,998.33 | 74,700.56 | 42,416.77 | - | 132,797.07 | 121,756.42 |
| කල්බදු වගකීම | 299.52 | 7,965.47 | 23,834.15 | 114,805.09 | 70,909.99 | 217,814.22 | 175,447.59 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 5,227.08 | 513.63 | 12,844.16 | 13,743.50 | 1,698.01 | 34,026.38 | 34,026.38 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 79,185.71 | - | - | - | 79,185.71 | 79,185.71 |
| | 17,208.01 | 91,663.14 | 111,378.87 | 170,965.36 | 72,608.00 | 463,823.38 | 410,416.10 |

**(iii) ණය අවදානම**

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට හේතුවන අයුරින් මූල්‍ය උපකරණයක් හෝ සේවාදායක ගිවිසුමක් යටතේ ප්‍රති පාර්ශවයක් විසින් තමන්ගේ බැඳීම් ඉටු නොකිරීමේ අවදානමයි. සමූහය ප්‍රධාන වශයෙන් එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දේ) ණය අවදානමට නිරාවරණය වේ.

ගුවන් මගී විකුණුම් හා ගුවන් භාණ්ඩ ප්‍රවාහනය මූලික වශයෙන් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) බලයලත් අලෙවි නියෝජිතයන් හරහා සිදුකෙරේ. පුළුල් විවිධාංගීකරණය හේතුවෙන් එවැනි විකුණුම්වල ණය අවදානම සාපේක්ෂව සුළුය. මෙම නියෝජිතයින්ගෙන් පියවීම්, අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් සිය ගුවන් මගී හා ගුවන් භාණ්ඩ බේරුම් කිරීමේ යෝජනා ක්‍රමය හරහා එකතු කරගනී. මෙම එක්රැස් කළ අරමුදල් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් සෘජුවම ගුවන් සමාගමට පියවන අතර එමගින් එකී නියෝජිතවරුන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව වැඩි සහතිකකිරීමක් ලබා දෙනු ලැබේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබිය යුතු දේ සහ ගෙවිය යුතු දේ මූලික වශයෙන් පියවනු ලබන්නේ අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ නිෂ්කාශන මධ්‍යස්ථානය (IATA Clearing House) හරහාය. සාමාන්‍යයෙන් ලැබිය යුතු දෑ හා ගෙවිය යුතු දෑ හි ශුද්ධ අගය පියවනු ලබන්නේ සතියක කාල අන්තරයක් සහිතව වන අතර එහිදී ගෙවීම් කඩ කිරීමේ අවදානමෙහි පැහැදිලි අඩුවීමක් සිදුවේ. වෙනත් සේවා සබඳතා සඳහා, සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ විෂය පථය අනුව ඇපකරයක් අවශ්‍ය වේ. ණය ගැතියන්ගේ එවැනි ඇපකරවලට බැංකු ඇපකර සහ සුරැකුම් තැන්පතු සහ වෙනත් යාන්ත්‍රණයන් ඇතුළත් වේ.

අවදානම් හඳුනාගත්විට අඩමාණ ලැබිය යුතු දෑ ගිණුම් සඳහා හානිකරණ ප්‍රතිපාදන සිදුකරයි.

**ප්‍රාග්ධන කළමනාකරණය**

මෙම මූල්‍ය ප්‍රකාශනවල සටහන 3 හි වඩාත් හොඳින් විස්තර කර ඇති ව්‍යාපාරික සැලැස්ම මත පදනම්ව, ණය මුදල් රැස් කිරීම සඳහා ස්වෛරී ඇපකර/ සහනදායී ලිපි මගින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටී.

## 32. සන්සන්දනාත්මක තොරතුරු

මනා ඉදිරිපත් කිරීමක් සාක්ෂාත් කරගනු පිණිස, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් පහත දැක්වෙන අයිතමයන් ප්‍රතිවර්ගීකරණය කරන ලදී.

| | සමූහය | | | සමාගම | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | ප්‍රතිවර්ගීකරණයන් | 2020 ප්‍රතිවර්ගීකරණය කරන ලද | 2020 | ප්‍රතිවර්ගීකරණයන් | 2020 ප්‍රතිවර්ගීකරණය කරන ලද |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය** | | | | | | |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය | (1,544.60) | (17,846.95) | (19,391.55) | (1,214.05) | (17,799.78) | (19,013.83) |
| ගුවන්යානා සහ අමතර එන්ජින් සඳහා කෙටි කාලීන කල්බදු කුලිය | - | (1,393.67) | (1,393.67) | - | (1,393.67) | (1,393.67) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (14,906.24) | (302.45) | (15,208.69) | (13,835.87) | (291.57) | (14,127.44) |
| SLFRS 16 ආදේශ කරගැනීමේ බලපෑම | (19,543.07) | 19,543.07 | - | (19,485.02) | 19,485.02 | - |
| | | - | | | - | |
| SLFRS 16 ආදේශ කරගැනීම හේතුවෙන් මූල්‍යමය ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම | (23,643.08) | 23,643.08 | - | (23,514.38) | 23,514.38 | - |
| වෙනත් මූල්‍ය පිරිවැය | (17,023.79) | 17,023.79 | - | (16,876.21) | 16,876.21 | - |
| මූල්‍ය පිරිවැය | - | (40,666.87) | (40,666.87) | - | (40,390.59) | (40,390.59) |
| | | - | | | - | |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය** | | | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 89,801.58 | (42.46) | 89,759.12 | - | - | - |
| වෙනත් දිගුකාලීන වගකීම් | 21,990.89 | 42.46 | 22,033.35 | - | - | - |
| | | - | | | - | |

# පාරිභාෂික ශබ්ද මාලාව

**ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය (ASK)**

අලෙවිය සඳහා පවතින ආසන ප්‍රමාණය සහ ඒවා ප්‍රවාහනය කරන දුර ප්‍රමාණයේ ගුණිත වේ.

**ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය (ATK)**

මෙය ප්‍රවාහන නිෂ්පාදනයෙහි මිණුම වේ.ගුවන් යානාවක් විසින් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණය, ටොන් ප්‍රමාණයෙන් ගුණ වීමෙන් ගණනය වන ගුවන් යානාවේ බර සඳහා ධාරිතාවයි.

**ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය (RPK)**

ප්‍රවාහනය කළ මගීන් සහ ඔවුන් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණයේ ගුණිතය වේ.

**ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණ (RTK)**

ටොන් වලින් ප්‍රවාහනය කල මගී සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**පැටවුම් සාධකය**

සැපයන ලද ධාරිතාවයට පැටවුමේ සබඳතාවය අනුව ප්‍රතිශතය.

මගී පැටවුම් සාධකය කෙරෙහි ASK සහ RPK අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය කෙරෙහි RTK සහ ATK අදාළ වේ.

**ආදායම් මගී කිලෝමීටර් (RPK) ප්‍රමාණයට ආදායම**

ආදායම සහ ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය අතර සබඳතාවය වේ.

**ඒකක පිරිවැය**

ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (ATK) මූල්‍ය පිරිවැය හා රඳවාගැනීමේ බදු අඩුකළ පසු ගුවන්සේවා මෙහෙයුම් වල මුළු මෙහෙයුම් පිරිවැය ගැලපීමෙන් ඒකක පිරිවැය ගණනය කෙරේ.

**සමස්ත ඵලදාව**

ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (RTK) ශුද්ධ ප්‍රවාහන ආදායම ගැලපීමෙන් සමස්ත ඵලදාව ගණනය කෙරේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම යනු මගී, අතිරේක ගුවන් මළු, ගුවන් බඩු හා තැපැල් යන ඒවායේ, වැඩසටහන්ගත හා වැඩසටහන්ගත නොකළ සේවාවන් වල එකතුවයි.

**සමතුලන පැටවුම් සාධකය**

ගුවන් සමාගමේ මෙහෙයුම්වලින් ලබන ආදායම මෙහෙයුම් පිරිවැය සමච්ඡේදනය වීමට අවශ්‍ය පැටවුම් සාධකය.



# දස අවුරුදු සමාලෝචනය

| | | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රකාශය** | | | | | |
| ආදායම | රු. මිලියන | 92,867.93 | 119,570.90 | 121,585.83 | 131,922.13 |
| මෙහෙයුම් පිරිවැය | රු. මිලියන | 111,775.88 | 146,700.24 | 150,389.46 | 145,983.35 |
| ශුද්ධ ලාභ/(අලාභ) | රු. මිලියන | (19,778.03) | (26,088.57) | (32,408.34) | (16,494.66) |
| **මූල්‍ය තත්ව ප්‍රකාශය** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. මිලියන | 19,432.67 | 32,032.75 | 51,617.44 | 51,617.44 |
| ජංගම නොවන වත්කම | රු. මිලියන | 37,591.58 | 23,338.28 | 25,212.47 | 22,836.77 |
| ජංගම වත්කම | රු. මිලියන | 22,072.71 | 54,905.22 | 37,154.23 | 49,721.49 |
| මුළු වත්කම | රු. මිලියන | 59,664.29 | 78,243.50 | 62,366.70 | 72,558.26 |
| ජංගම වගකීම් | රු. මිලියන | 64,235.43 | 71,346.64 | 88,609.07 | 103,414.31 |
| **ප්‍රතිලාභය /ඒකක පිරිවැය** | | | | | |
| සමස්ත ප්‍රතිලාභ | රු. tkm | 64.47 | 74.31 | 77.26 | 80.32 |
| ඒකක පිරිවැය (මූල්‍ය පිරිවැය සහ WHT හැර) | රු. tkm | 53.26 | 63.15 | 65.00 | 62.00 |
| සමතුලිත පැටවුම් සාධකය | % | 82.61 | 84.98 | 84.13 | 77.18 |
| මගී කි.මී. 1 ක ආදායම | රු./RPK | 6.6 | 7.6 | 7.8 | 8.2 |
| **නිෂ්පාදනය** | | | | | |
| මගී ධාරිතාවය | ASK මිලියන | 14,248.94 | 15,944.31 | 15,780.54 | 16,180.27 |
| සමස්ත ධාරිතාවය | ATK මිලියන | 1,978.33 | 2,186.96 | 2,187.18 | 2,224.87 |
| **ප්‍රවාහනය** | | | | | |
| ප්‍රවාහනය කළ මගීන් | සංඛ්‍යාව දහස් | 3,459 | 4,255 | 4,175 | 4,348 |
| ප්‍රවාහනය කළ මගීන් | RPK මිලියන | 11,270.23 | 12,968.74 | 12,810.95 | 12,963.71 |
| මගී පැටවුම් සාධකය | % | 79.10 | 81.34 | 81.18 | 80.12 |
| ප්‍රවාහනය කළ භාණ්ඩ | ටොන් | 87,750 | 101,100 | 94,410 | 101,878 |
| ප්‍රවාහනය කරන ලද භාණ්ඩ පැටවුම් | RTK මිලියන | 345.67 | 377.75 | 355.59 | 373.32 |
| ප්‍රවාහනය සමස්ත පැටවුම් | RTK මිලියන | 1,338.30 | 1,513.70 | 1,466.74 | 1,519.93 |
| සමස්ත පැටවුම් සාධකය | % | 67.65 | 69.22 | 67.06 | 68.32 |
| **කාර්ය මණ්ඩලය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 5,594 | 6,359 | 6,578 | 6,987 |
| සේවකයෙකුගේ ආදායම | රු. | 16,601,346 | 18,803,412 | 18,483,708 | 18,881,084 |
| සේවකයෙකුගේ ධාරිතාව | ටොන් කි.මී. | 353,652 | 343,916 | 332,499 | 318,430 |
| සේවකයෙකු සඳහා ප්‍රවාහනය කළ පැටවුම | ටොන් කි.මී. | 239,238 | 238,041 | 222,976 | 217,537 |
| **සමස්ත ප්‍රවාහන යානා** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | 7 | 8 | 8 | 6 |
| A321-200 | සංඛ්‍යාව | - | - | - | 2 |
| A320 NEO | සංඛ්‍යාව | - | - | - | - |
| A321 NEO | සංඛ්‍යාව | - | - | - | - |
| A330-200 | සංඛ්‍යාව | 7 | 7 | 7 | 7 |
| A330-300 | සංඛ්‍යාව | - | - | - | 2 |
| A340-300 | සංඛ්‍යාව | 6 | 6 | 6 | 4 |
| Turbo Otter | සංඛ්‍යාව | 2 | 1 | - | - |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | 22 | 22 | 21 | 21 |
| ගුවන් යානා භාවිතය | | | | | |
| ගුවන් යානා | දිනකට පියාසර පැය | 13.48 | 12.82 | 12.76 | 12.90 |

| 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| | | | | | |
| 129,480.41 | 135,491.19 | 161,433.87 | 180,340.32 | 180,151.02 | **50,693.85** |
| 137,311.44 | 146,760.80 | 175,883.85 | 206,344.66 | 190,321.69 | **81,405.99** |
| (12,621.69) | (28,929.99) | (17,213.57) | (44,022.67) | (47,197.86) | **(45,231.46)** |
| | | | | | |
| 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 | **79,352.43** |
| 23,548.01 | 24,660.56 | 37,476.46 | 36,596.59 | 150,013.50 | **122,471.42** |
| 26,901.02 | 26,973.07 | 30,090.50 | 40,742.41 | 31,176.10 | **31,909.99** |
| 50,449.03 | 51,633.63 | 67,566.96 | 77,338.99 | 181,189.60 | **154,381.41** |
| 100,334.44 | 126,302.55 | 130,358.61 | 227,081.67 | 242,821.23 | **253,218.98** |
| | | | | | |
| 79.06 | 80.08 | 84.24 | 91.32 | 99.03 | **146.86** |
| 58.72 | 61.61 | 65.74 | 74.31 | 74.22 | **105.23** |
| | | | | | |
| 74.27 | 76.94 | 78.04 | 81.37 | 74.95 | **71.65** |
| 8.2 | 8.4 | 8.6 | 9.4 | 10.2 | **21.8** |
| | | | | | |
| 15,790.28 | 15,608.10 | 18,487.54 | 18,925.40 | 18,041.41 | **3,816.40** |
| 2,165.21 | 2,167.92 | 2,549.88 | 2,577.53 | 2,454.30 | **794.52** |
| | | | | | |
| 4,328 | 4,446 | 5,839 | 5,663 | 5,256 | **167** |
| 12,727.66 | 12,455.05 | 15,280.78 | 15,689.19 | 14,547.97 | **748.13** |
| 80.60 | 79.80 | 82.65 | 82.90 | 80.64 | **19.60** |
| | | | | | |
| 102,082 | 116,221 | 132,958 | 125,753 | 113,971 | **56,406** |
| 356.76 | 374.46 | 401.66 | 408.71 | 363.31 | **244.93** |
| 1,484.77 | 1,475.29 | 1,749.14 | 1,806.58 | 1,664.49 | **312.26** |
| 68.57 | 68.05 | 68.60 | 70.09 | 67.82 | **39.30** |
| | | | | | |
| 6,959 | 7,021 | 7,019 | 6,794 | 6,693 | **5,965** |
| 18,606,181 | 19,297,991 | 22,999,555 | 26,544,057 | 26,916,333 | **8,498,550** |
| 311,139 | 308,776 | 363,283 | 379,383 | 366,697 | **133,196** |
| 213,359 | 210,126 | 249,201 | 265,908 | 248,691 | **52,349** |
| | | | | | |
| 6 | 6 | 5 | 5 | 5 | **5** |
| 2 | 3 | 3 | 2 | 2 | **1** |
| - | 2 | 2 | 2 | 2 | **2** |
| - | - | 3 | 4 | 4 | **4** |
| 6 | 6 | 6 | 7 | 5 | **5** |
| 7 | 7 | 7 | 7 | 7 | **7** |
| - | - | - | - | - | **-** |
| - | - | - | - | - | **-** |
| 21 | 24 | 26 | 27 | 25 | **24** |
| | | | | | |
| 12.02 | 12.44 | 13.25 | 12.60 | 12.18 | **2.98** |

# ගුවන් මාර්ග සිතියම




දැනට ශ්‍රීලංකන් ගුවන් සමාගම යුරෝපය, මැද පෙරදිග, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග උතුරු ඇමෙරිකාව වැනි කලාප වල රටවල් 55 ක් පුරා ගමනාන්ත 122 ක් සඳහා සේවා සපයයි.


Oslo
Helsinki
Stockholm
Moscow
Edinburgh
Copenhagen
Manchester
Amsterdam
Dublin
Prague
Brussels
Dusseldorf
Kyiv Boryspil
London
Frankfurt
Budapest
Paris
Munich
Geneva
Zurich
Turin
Venice
Belgrade
Milan
Sofia
Istanbul
Madrid
Rome
Barcelona
Thessaloniki
Heydar Aliyev
Palermo
Catania
Athens
Larnaca
Casablanca
Amman
Kuwait
Dammam
Bahrain
Riyadh
Doha
Dubai
Abu Dhabi
Karachi
Muscat
Lahore
Amritsar
New Delhi
Lucknow
Kathmandu
Jaipur
Patna
Guwahati
Dhaka
Bhubaneswar
Mumbai
Bangalore
Hyderabad
Chennai
Coimbatore
Tiruchirappalli
Kochi
Madurai
Trivandrum
Malé
Gan Island
Colombo
Nairobi
Johannesburg
Cape Town
Chitose*
Seoul
Tokyo (Narita)
Tokyo (Haneda)
Osaka (Itami)
Nagoya
Fukuoka*
Osaka (Kansai)
Shanghai
Guangzhou
Hong Kong
Hanoi
Yangon
Bangkok
Phnom Penh
Ho Chi Minh
Phuket
Langkawi
Penang
Kuala Lumpur
Singapore
Jakarta
Darwin
Brisbane
Perth
Sydney
Adelaide
Melbourne
Auckland

# විශේෂ කඩඉම්

## 2011/2012

කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එයාර් බස් A320 ගුවන් යානා හතරක්, එයාර් බස් A330 පුළුල් බඳ ගුවන් යානා දෙකක් සහ එයාර් බස් A340 පුළුල් බඳ ගුවන් යානාවක් භාර ගත්තේය.

ගුවන් සේවය ප්‍රති ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කොටස් ආයෝජනයක් සඳහා කැබිනට් අනුමැතිය හිමි විය.

## 2012/2013

එයාර් බස් A320 නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පළමු A320 පියාසැරි සිමියුලේටරය දියත් කිරීම.

මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එක් එයාර් බස් A320 ගුවන් යානයක් භාර ගත්තේය.

මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කළේය.

2012 මැයි මාසයේ දී සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 175 ක මූල්‍යකරණයක් ලබා ගැනීම සඳහා විදේශීය බැංකු සමූහයක් සමග මූල්‍යකරණ ගිවිසුමකට එළඹුණි.

## 2013/2014

එයාර් බස් A330 නියමුවන් පුහුණු කිරීම සඳහා පියාසැරි සිමියුලේටරය දියත් කිරීම 2013 දෙසැම්බරයේ දී සමාගම මගී සේවා පද්ධතිය ඇමඩියස් ඇල්ටියා (Amadeus Altea) වෙතට මාරු කරන ලදී.

2014 මාර්තු මාසයේදී සමාගම මධ්‍ය කාලීන මූල්‍යකරණය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් ලබා ගැනීම සඳහා බැංකු සමූහයක් සමග මූල්‍යකරණ ගිවිසුමකට එළැඹිනි.

## 2014/2015

සමාගම 2014 මැයි මාසයේ දී වන්වර්ල්ඩ් එකමුතුව සමග ගිවිසුම්වලට එළඹුණි.

2014 ජූනි මාසයේ දී සමාගම පළමු වරට පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කළේය.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනක කොටසක් ලෙස සමාගම විසින් පිළිවෙලින් 2014 ඔක්තෝබර් සහ 2015 මාර්තු මාසවලදී නවතම A330 - 300 ගුවන් යානා තුනක් ලබා ගැනුනි.

## 2015/2016

ගුවන් සේවාවන් හි කීර්තිමත් ගෞරව නාම හතරක් සඳහා ලැයිස්තුගත කර ලදී : එනම් ආසියානු සහ ඔස්ට්‍රේලියා හි කලාපීය හොඳම ගුවන් සේවය, හොඳම ගුවන් යානා තුළ ප්‍රකාශනය, 'හොඳම ගුවන් යානා තුළ (Inflight) වීඩියෝව' සහ ඇපෙක්ස් මගී තේරීම් සම්මාන 2015 හි හොඳම භූමි අත්දැකීම යනුවෙනි. ගුවන් සේවය කාණ්ඩ හතරක් සඳහා නම් කරන ලද පළමු අවස්ථාව මෙයයි. ආසියාවේ සහ ඔස්ට්‍රලේෂියාවේ හි මගී අත්දැකීම් සඳහා විශිෂ්ට ජයග්‍රහණ සම්මානය දිනා ගත්තේය. - 2015 සැප්තැම්බර් ඇපෙක්ස් පෝට්ලන්ඩ් ඔරේගන් සහ හොඳම පූර්ණ සේවා ගුවන් සේවා ත්‍යාගය, මධ්‍යම හා දකුණු ආසියාව - ආසියාවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන 2015, සිංගප්පූරුව.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස සමාගම විසින් අගෝස්තු සහ නොවැම්බර් මාසවලදී අති නවීන A330-300 ගුවන් යානා හතරක් සහ 2015 දෙසැම්බර් මාසයේදී ගුවන් යානා දෙකක් ලබාගන්නා ලදී.

## 2016/2017

2017 පෙබරවාරි සහ 2017 මාර්තු මාසවලදී A320 නව ගුවන් යානා දෙකක් හඳුන්වා දීම - පළමු A320/A321 පවුලේ නව එන්ජින් විකල්ප ගුවන් යානා දෙක සමූහයට එක්විය.

ලාහෝර්, ජකර්තා, ඩකා, කල්කටා, මදුරෙයි, වරනාසි, බුද්ධගයා, මස්කට්, බහරේන්, සීෂෙල්ස් සහ ගාන් දූපත් යන ආකර්ෂණීය නව ගමනාන්ත එකොළහකට ශ්‍රීලංකන් මගින් සේවා අරඹන ලදී.

සමාගමට "දකුණු ආසියාවේ හොඳම ගුවන් සමාගම", ෆියුචර් ට්‍රැවල් එක්ස්පීරියන්ස් විසින් 2016 හි අඛණ්ඩව දෙවන වරටත් "මධ්‍යම හා දකුණු ආසියාවේ හොඳම පූර්ණ සේවා ගුවන් සේවය" යන ඉහළම සංචාරක සම්මාන පිරිනමන ලදි. 7 වන ආසියා හාම්පුතුන්ගේ සන්නාම සම්මාන උළෙලේදී "පුහුණු විශිෂ්ටතා සම්මානය" සහ ව්‍යාපාරයට අනුකූලව හොඳම මානව සම්පත් ක්‍රමෝපාය සඳහා සම්මානයද ගුවන් සමාගම විසින් හිමිකර ගන්නා ලදී.

## 2017/2018

සමාගම විසින් ගුවන් යානා සමූහයේ කොටසක් ලෙස 2017 ජුනි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී නවතම එයාර්බස් A321 -200 neo නව ගුවන් යානා තුනක් ලබා ගන්නා ලදී.

ශ්‍රීලංකන් මගින් මෙල්බර්න්, හයිද්‍රාබාද්, කොයිම්බතූර් සහ විශාකාපට්නම් යන නව ගමනාන්ත හතරකට සේවා අරඹන ලදී.

ගුවන්සේවා මගී අත්දැකීම් සංගමයෙන් (ඇපෙක්ස්) තරු හතරේ විශිෂ්ටතා ශ්‍රේණිගත කිරීමක් ලබාගත් අතර, 2017 සිංගප්පූරුවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන උළෙලේදී ගුවන් සේවය පිට පිට තෙවන වරටත් විශිෂ්ට සේවා සඳහා සම්මානය ලබා ගත්තේය.

සිංගප්පූරුවේ පැවති 2017 ආසියා පැසිෆික් සම්මාන උළෙලේදී "වාණිජ ගුවන් සේවා මැදිරිවල නවෝත්පාදන" සම්මානයද සමාගම දිනා ගත්තේය.

## 2018/2019

සමාගම විසින් 2018 ජුලි මාසයේදී තවත් නවතම එයාබස් A321neo ගුවන් යානයක් ලබා ගන්නා ලද අතර එමගින් නියෝ යානා සමූහයේ ආගමනය පූර්ණ විය.

පියාසැරි දත්ත විශ්ලේෂණ සමාගමක් වන ෆ්ලයිට්ස්ටැට්ස්.කොම් (Flightstats.com.) විසින් ශ්‍රේණිගත කරන ලද 'ගෝලීය ගුවන් සේවා' සහ 'ප්‍රධාන ගුවන් සේවා' යන ප්‍රධාන කාණ්ඩ යටතේ ශ්‍රීලංකන් ගුවන් සේවය 2018 සැප්තැම්බර් මාසයේ දී ලෝකයේ අතිශයින්ම නියමිත වේලාවට කටයුතු කරන්නා වූ ගුවන් සේවය බවට පත්විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් ගුවන් මගී අත්දැකීම් සංගමයේ (ඇපෙක්ස්) අඛණ්ඩව දෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන ගිය අතර ජාත්‍යන්තර සම්මාන කිහිපයක් ද හිමි කර ගත්තේය. මේ අතර අඛණ්ඩව තෙවැනි වරටත් ඉන්දියානු සාගරයට ලොව ප්‍රමුඛ ගුවන් සේවය සම්මානය දිනා ගැනීම සහ අයි.ටී.බී බර්ලිනයේ ගෝල්ඩන් සිටි ගේට් සම්මාන තුනක් ඇතුළත් වේ.

## 2019/2020

ශ්‍රීලංකන් ගුවන් සේවය වසර 2019 දී සිය 40 වැනි සංවත්සරය සැමරීය.

ජාතික ගුවන් සේවය වෙත ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) මගින් ''විශිෂ්ටතම අලෙවි නව හඳුන්වාදීම'' සම්මානය පිරිනැමිනි. ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් අඛණ්ඩව තෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන යන ලදී.

2019 දී ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් 'Two Cities, One Spirit' ප්‍රචාරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ස්වර්ණ සම්මානය දිනා ගන්නා ලද අතර 2019 බර්ලින් ITB ගෝල්ඩ් සිටි සම්මාන උළෙලේදී සම්මාන ත්‍රිත්වයක් දිනා ගැනුනි.

2020 බර්ලින් ITB ගෝල්ඩ් සිටි සම්මාන උළෙලේදී සමාගම ප්‍රථම වරට කාණ්ඩ තුනකින් ("Airline International", "Music International" සහ "Campaign") තරු පහේ සම්මානයට පාත්‍ර විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය වර්ල්ඩ් ට්‍රැවල් අවෝර්ඩ්ස් ඒෂියා ඇන්ඩ් ඕෂනියා (ලෝක චාරිකා සම්මාන ආසියාව හා ඕෂනියාව) හිදී අග්‍රගන්‍ය 'ලොව විශිෂ්ටතම ගුවන් සේවය' සහ 'ඉන්දියන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

## 2020/21

පසු කෝවිඩ් ගුවන් ගමන් වලදී මගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම හේතුවෙන් APEX Health Safety විසින් ප්ලැටිනම් ප්‍රමිති තත්වය පිරිනමන ලදී.

"Future Travel Experience (FTE) Virtual Expo" සම්මාන උළෙලේදී The Airline Passenger Experience Association (APEX) විසින් 2021 වසර සඳහා "ප්‍රධාන නිල ගුවන් සේවය සඳහා තරු හතරක් ශ්‍රේණිගත කිරීම" පිරිනමන ලදී.

ගෝලීය වසංගත තත්වය තුළ ශ්‍රී ලාංකේය අපනයනකරුවන් හට සහය දැක්වීම සඳහා සහ අඩුවන මගී සංචාර හමුවේ විකල්ප ආදායම් මාර්ග සොයා ගැනීමේ අරමුණින් ප්‍රථම වරට ගුවන් භාණ්ඩ යානා, ගමනාගමන කාලසටහනට ඇතුළත් කරන ලදී.

වසංගතය තත්වය හමුවේ දේශසීමා වසා දැමීම හේතුවෙන් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් ආපසු ගෙන්වා ගැනීම සඳහා විශේෂ මගී ගුවන් ගමන් ක්‍රියාත්මක කළ අතර, අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය සඳහා විශේෂ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

# සාංගමික තොරතුරු

**සමාගමේ නම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

**සමාගමේ ලියාපදිංචි අංක**
පී බී 67

**නෛතිකභාවය**
සීමාසහිත පොදු සමාගමකි

**අධ්‍යක්‍ෂ මණ්ඩලය**
අසෝක පතිරගේ මහතා (සභාපති)
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
සංජය මොහොට්ටාල මහතා
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා

**අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව**
සංජය මොහොට්ටාල මහතා (තාවකාලික)
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
(2021 අප්‍රේල් 23 දින කාරක සභාවෙන් ඉවත් විය)
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා
(2021 අප්‍රේල් 23 වන දින පත් කරන ලදී)

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා (සභාපති)
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව**
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා (සභාපති අවදානම් කමිටුව)
මලික් ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
සංජය මොහොට්ටාල මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා

**සමාගම් ලේකම්/ සාංගමික ලේකම් සේවා ප්‍රධානී**
ඩැල්රින් තිරුකුමාර් මහත්මිය (ACIS)

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
මහජන බැංකුව
ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව
සිටි බැංකුව
සම්පත් බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
කොමර්ෂල් බැංකුව
අමානා බැංකුව
කාගිල්ස් බැංකුව
ක්‍රෙඩිට් සුයිස් ඒ.ජී.

**විගණක**
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72
පොල්දුව පාර
බත්තරමුල්ල

**ලියාපදිංචි කාර්යාලය**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම
ගුවන් සේවා මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල
කටුනායක
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය**
www.srilankan.com

optima
Designing Your Year!
Designed & Produced by
Optima Designs (Pvt) Ltd.
A full service design and print company.
www.optimadesigns.lk

Printed by : Printing Section (Logistics & Properties) | SriLankan Airlines Ltd

# වාර්ෂික මහා සභා රැස්වීම් නිවේදනය

පහත දැක්වෙන අරමුණ පාදක කර ගනිමින්, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන්ගේ හතළිස් තුන්වන වාර්ෂික මහා සභා රැස්වීම 2022 මැයි 27, සිකුරාදා ප.ව. 3.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'මිහිලක මැදුර' පරිශ්‍රයේ පැවැත්වෙන බව මෙයින් දන්වා සිටියි.

1. 2021 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශයන සමග ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අත්සන් කළේ
**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2022 මාර්තු 2
කටුනායක

# වාර්ෂික මහා සභා රැස්වීම් නිවේදනය

**සටහන්:**

**1. සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය**

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යංශය (සෞඛ්‍ය අමාත්‍යංශය) විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව රැස්වීමට සහභාගී වන සියලු දෙනාගේ යහපැවැත්ම තහවුරු කරලීම සඳහා පනවා ඇති ප්‍රමිතීන්ට අනුව රැස්වීම පවත්වනු ලැබේ. කරුණාකර එම මාර්ගෝපදේශයන් සහ සම්මතයන්ට අනුකූලව:

අ. සහභාගී වන සියලු දෙනා උෂ්ණත්ව පරීක්ෂාවකට සහභාගි විය යුතුය.

ආ. සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නිර්දේශ කොට ඇති සම්මතයන්ට වඩා වැඩි උෂ්ණත්වයක් වාර්තා කරන පුද්ගලයින්ට රැස්වීමට සහභාගී වීමට අවසර නොලැබේ.

ඇ. කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ අමාරුව වැනි ශ්වසන රෝග හෝ වෙනත් සමාන රෝග ලක්ෂණ පෙන්නුම් කරන පුද්ගලයින්ට රැස්වීම් ශාලාවට ඇතුළුවීමට අවසර නොලැබේ.

ඈ. අතට අත දීම වැනි භෞතික සම්බන්ධතා වලට අවසර නොදෙන අතර රැස්වීම අවසන් වූ පසු සහභාගීවන්නන් හට රැඳී සිටීමට අවසර නොලැබේ.

ඉ. මුඛ ආවරණ පැළඳීම සහ සමාජ දුරස්ථභාවය රැකගනිමින් සෞඛ්‍ය මාර්ගෝපදේශයන් සහ ප්‍රමිතීන්ට අනුකූල නොවන ඕනෑම පුද්ගලිකයෙක් රැස්වීම් ශාලාවෙන් ඉවත් වීම අවශ්‍ය වනු ඇත.

ඊ. රැස්වීමට සහභාගී වීමේ දී නිසි ලෙස මුඛ ආවරණ පළඳින්න.

**2. පෙරකලාසිකරුවකු මාර්ගයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම**

අපගේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම අපට අතිශයින් වැදගත්වන හෙයින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඔවුන්ව නියෝජනය කරමින් ඔවුන් වෙනුවෙන් පෙරකලාසිකරුවකු මාර්ගයෙන් ඡන්දය දීමට සාමාජිකයන් දිරිමත් කරනු ලැබේ. පෙරකලාසි පත්‍රය සහ රැස්වීමේදී ඉදිරිපත් කිරීමට නිශ්චිත යෝජනා පිළිබඳ ඔවුන්ගේ ඡන්ද මනාපයන් සාමාජිකයන්ට සම්පූර්ණ කිරීමට සහ පෙරකලාසි පත්‍රයෙහි අතිරේක කොටසේ සඳහන් විධානයන්ට අනුව එය සමාගමට ඉදිරිපත් කිරීමට සාමාජිකයන්ට උපදෙස් ලබා දෙනු ලැබේ.

**3. රැස්වීමට සහභාගී වීම**

සාමාජිකයෙකු පුද්ගලිකව නියෝජනය හරහා රැස්වීමට සහභාගී වීමට කැමත්තක් දක්වන්නේ නම් (සමාගමේ අධ්‍යක්ෂකවරයෙක් නොවන), එවැනි සාමාජිකයකුගේ පෙරකලාසියෙ හි පහත දෑ අවශ්‍ය වේ:

අ. කලින් පැමිණ ලියාපදිංචි වීම, සෞඛ්‍ය පරීක්ෂාවන් සිදුකිරීම සහ අවශ්‍ය පෝරම පිරවීම මගින් සෙනඟ ගැවසීම අවම කිරීම;

ආ. සමාගම විසින් ක්‍රියාවට නංවනලද සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවයට සහයෝගය දක්වමින් කටයුතු කිරීම, (1) කොටසේ විස්තර කර ඇති සෞඛ්‍ය සහ සුරක්ෂිතතා මිනුම් වලට අනුව රැස්වීමට සහභාගීවන සියලු දෙනාගේ යහපත උදෙසා සිදු කරනු ලැබේ.

සාමාජිකයන් සහ/හෝ පෙරකලාසිකරුවන් යහපත් සෞඛ්‍ය තත්වයෙන් පසුනොවන්නේ නම් රැස්වීමට සහභාගී නොවීමට ඉල්ලා සිටී.

රැස්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ඕනෑම සන්නිවේදන, මාර්ගෝපදේශ, නියෝගයන් හෝ විධානයන් පිළිබඳ සමාගමට තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක, එවැනි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම සමාගමේ වෙබ් අඩවිය වන www.srilankan.com හෝ ජාතික පුවත්පත් මගින් සිදුකරනු ලබයි.

# පෙරකලාසි පත්‍රය

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙ හි සාමාජිකයෙකු/ සාමාජිකයින් වන, ...................................................................................... හි

.............................................................................................................................................................................. වන මම/අපි

.............................................................................................................................................................................................. හි

.......................................................................................................................................... හෝ ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙක්,

අසෝක පතිරගේ මහතා
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
සංජය මොහොට්ටාල මහතා
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා

මගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි 2022 මැයි 27 සිකුරාදා ප.ව. 3.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'මිහිලක මැදුර' පරිශ්‍රයේ පැවැත්වීමට නියමිත හතළිස් තුන්වන කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ එහි කිසියම් කල්තැබීමකදී මම/අපි වෙනුවෙන් ඡන්දය ලබා දීමට සහ මම/අපි නියෝජනයට මෙහිලා පත්කරනු ලබයි.

| | පක්ෂව | විපක්ෂව |
|---|---|---|
| 1. 2021 මාර්තු 31න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සමග, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම. | ☐ | ☐ |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

දෙදහස් විසි දෙකේ ..................................................... මස................................................. දින මෙය අත්සන් කරන ලදී.

......................................................... අත්සන/අත්සන්

**සටහනඃ**

(අ) * අනවශ්‍ය වචනය කපා හරින්න.
වචන කිසිවක් ඉවත් කර නොමැති නම් හෝ පෙරකලාසිකරු ඡන්දය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ (පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීමේදී උපදෙස් ඇතුලත් කර ඇති ආකාරය සම්බන්ධව) පෙරකලාසිකරු හට සැකයක් පවතීනම්, පෙරකලාසිකරු යෝග්‍ය යැයි සිතන පරිදි ඡන්දය භාවිත කරනු ඇත.

**පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්ඃ**

1. ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව සටහන් කිරීමෙන් පසු සපයා ඇති ඉඩෙහි අත්සන් කර, අත්සන් කරන දිනයද සටහන් කර නිවැරැදිව පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කරන්න. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය, ලියාපදිංචි කාර්යාලය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, 'ගුවන් සේවා මධ්‍යස්ථානය', බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක යන ලිපිනයට රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර එනම් 2022 මැයි 25 වන දින ප.ව. 3.00 ට පෙර එවිය යුතුය.
2. නේවාසික/ අනේවාසික කොටස් හිමියන් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමාගමට ලැබුණු පසු මුදා කටයුතු සිදුකරනු ලබයි.

සෞඛ්‍ය හා සුරක්ෂිතතා රෙගුලාසි සඳහා අනෙක්පස බලන්න.

# පෙරකලාසි පත්‍රය

**සටහන්:**

**1. සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය**

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය (සෞඛ්‍ය අමාත්‍යාංශය) විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව රැස්වීමට සහභාගී වන සියලු දෙනාගේ යහපැවැත්ම තහවුරු කරලීම සඳහා පනවා ඇති ප්‍රමිතීන්ට අනුව රැස්වීම පවත්වනු ලැබේ. කරුණාකර එම මාර්ගෝපදේශයන් සහ සම්මතයන්ට අනුකූලව:

- අ. සහභාගී වන සියලු දෙනා උෂ්ණත්ව පරීක්ෂාවකට සහභාගි විය යුතුය.
- ආ. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කොට ඇති සම්මතයන්ට වඩා වැඩි උෂ්ණත්වයක් වාර්තා කරන පුද්ගලයින්ට රැස්වීමට සහභාගී වීමට අවසර නොලැබේ.
- ඇ. කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ අමාරුව වැනි ශ්වසන රෝග හෝ වෙනත් සමාන රෝග ලක්ෂණ පෙන්නුම් කරන පුද්ගලයින්ට රැස්වීම් ශාලාවට ඇතුළුවීමට අවසර නොලැබේ.
- ඈ. අතට අත දීම වැනි භෞතික සම්බන්ධතා වලට අවසර නොදෙන අතර රැස්වීම අවසන් වූ පසු සහභාගීවන්නන් හට රැඳී සිටීමට අවසර නොලැබේ.
- ඉ. මුඛ ආවරණ පැළඳීම සහ සමාජ දුරස්ථභාවය රැකගනිමින් සෞඛ්‍ය මාර්ගෝපදේශයන් සහ ප්‍රමිතීන්ට අනුකූල නොවන ඕනෑම පුද්ගලිකයෙක් රැස්වීම් ශාලාවෙන් ඉවත් වීම අවශ්‍ය වනු ඇත.
- ඊ. රැස්වීමට සහභාගී වීමේ දී නිසි ලෙස මුඛ ආවරණ පළඳින්න.

**2. පෙරකලාසිකරුවකු මාර්ගයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම**

අපගේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම අපට අතිශයින් වැදගත්වන හෙයින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඔවුන්ව නියෝජනය කරමින් ඔවුන් වෙනුවෙන් පෙරකලාසිකරුවකු මාර්ගයෙන් ඡන්දය දීමට සාමාජිකයන් දිරිමත් කරනු ලැබේ. පෙරකලාසි පත්‍රය සහ රැස්වීමේදී ඉදිරිපත් කිරීමට නිශ්චිත යෝජනා පිළිබඳ ඔවුන්ගේ ඡන්ද මනාපයන් සාමාජිකයන්ට සම්පූර්ණ කිරීමට සහ පෙරකලාසි පත්‍රයෙහි අතිරේක කොටසේ සඳහන් විධානයන්ට අනුව එය සමාගමට ඉදිරිපත් කිරීමට සාමාජිකයන්ට උපදෙස් ලබා දෙනු ලැබේ.

**3. රැස්වීමට සහභාගී වීම**

සාමාජිකයෙකු පුද්ගලිකව නියෝජනය හරහා රැස්වීමට සහභාගී වීමට කැමත්තක් දක්වන්නේ නම් (සමාගමේ අධ්‍යක්ෂකවරයෙක් නොවන), එවැනි සාමාජිකයකුගේ පෙරකලාසියෙ හි පහත දෑ අවශ්‍ය වේ:

අ. කලින් පැමිණ ලියාපදිංචි වීම, සෞඛ්‍ය පරීක්ෂාවන් සිදුකිරීම සහ අවශ්‍ය පෝරම පිරවීම මගින් සෙනඟ ගැවසීම අවම කිරීම;

ආ. සමාගම විසින් ක්‍රියාවට නංවනලද සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවයට සහයෝගය දක්වමින් කටයුතු කිරීම, (1) කොටසේ විස්තර කර ඇති සෞඛ්‍ය සහ සුරක්ෂිතතා මිනුම් වලට අනුව රැස්වීමට සහභාගීවන සියලු දෙනාගේ යහපත උදෙසා සිදු කරනු ලැබේ.

සාමාජිකයන් සහ/හෝ පෙරකලාසිකරුවන් යහපත් සෞඛ්‍ය තත්වයෙන් පසුනොවන්නේ නම් රැස්වීමට සහභාගී නොවීමට ඉල්ලා සිටී.

රැස්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ඕනෑම සන්නිවේදන, මාර්ගෝපදේශ, නියෝගයන් හෝ විධානයන් පිළිබඳ සමාගමට තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක, එවැනි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම සමාගමේ වෙබ් අඩවිය වන www.srilankan.com හෝ ජාතික පුවත්පත් මගින් සිදුකරනු ලබයි.

www.srilankan.com
ගුවන් සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.